

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

# වාර්ෂික වාර්තාව 2022



# නවෝත්පාදනය තුළින් පරිවර්තනය

අපි අපගේ ගනුදෙනුකරුවන්ගේ සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස දශක හතරකට ආසන්න කාලයක් කැපවීමෙන් කටයුතු කරමින් සිටිමු. මෙම ඉතිහාසය පුරාවටම අපි මූල්‍ය ක්ෂේත්‍රයන්හි නව්‍ය ප්‍රවේශයන් නිරන්තරයෙන් භාවිතයට ගෙන ඇත්තෙමු. අපගේ අචල සහයෝගය හේතුවෙන් සියලුම පාර්ශවකරුවන්ට සිය ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවී ඇත.

පසුගිය වර්ෂයන්හිදී අපි කඩිනම් හා කාර්යක්ෂම විසඳුම් ක්‍රියාත්මක කිරීමෙන් හා නව්‍ය වැඩිදියුණු කිරීම් හරහා අපගේ ගනුදෙනුකරුවන්ට සහ කාර්ය මණ්ඩලයට මග පෙන්වූ අතරම පහසුකම්ද සැලසුවෙමු.

වර්තමානයේ ඩිජිටල් පරිවර්තනය තුළින් සුමට මූල්‍ය හා මුදල් සේවාවන් කෙරෙහි අවධානය යොමු කරමින් පාර්ශවකරුවන් බලගැන්වීමේ ඊළඟ අදියර කරා පියනග මින් සිටිමු. මෙම ඩිජිටල් ගමන්මග සාම්ප්‍රදායික සීමාවන් අභිබවා යමින් ආරක්ෂිත, කාර්යක්ෂම හා තාක්ෂණිකව වැඩි දියුණු වූ අත්දැකීමක් ලබා දෙමින් වඩාත් සුරක්ෂිත සහ සමෘද්ධිමත් අනාගතයකට මග පාදනු ඇත.

# පටුන


දැක්ම මෙහෙවර ........ 04
අප ගැන ........ 05
අපගේ ගමන්මග / වැදගත් සන්ධිස්ථාන ........ 06
මූල්‍යමය වැදගත් සිදුවීම් ........ 08
සභාපතිතුමාගේ පණිවුඩය ........ 10
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරිගේ සමාලෝචනය ........ 14

**භාරකාරත්වය**

අධ්‍යක්ෂ මණ්ඩලය ........ 20
ආයතනික කළමනාකරණ කණ්ඩායම ........ 26
ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් /
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන් ........ 28
සහකාර සාමාන්‍යාධිකාරීවරුන් / අංශ ප්‍රධානීන් ........ 30

**කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය**

මූල්‍ය සමාලෝචනය ........ 36
පාරිභෝගික සහ සබඳතා සමාලෝචනය ........ 40
තොරතුරු තාක්ෂණ සමාලෝචනය ........ 43
අලෙවිකරණ සමාලෝචනය ........ 44
සමාජ සහ පාරිසරික සමාලෝචනය ........ 49
සේවක සමාලෝචනය ........ 51
විශේෂ අවස්ථා ........ 53
වෙනත් අවස්ථා ........ 56
අවදානම් කළමනාකරණය ........ 60

# පටුන


ආයතනික පාලනය

ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව ........ 72
ආයතනික පාලනය ........ 73
අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා සහභාගීත්වය ........ 93
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ........ 95
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික අනුකමිටුවේ (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු (BNC) වාර්තාව ........ 100
අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු (BAC) වාර්තාව ........ 102
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව ........ 103
ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ වගකීම් ප්‍රකාශය ........ 106
අභ්‍යන්තර පාලන ප්‍රකාශනය පිළිබඳ විගණකාධිපති වාර්තාව ........ 107
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය ........ 109
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ........ 111

මූල්‍ය වාර්තා

විගණකාධිපති වාර්තාව ........ 114
ලාභ හෝ අලාභ ප්‍රකාශනය ........ 117
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ........ 118
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........ 119
හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ........ 120
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ........ 121
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් ........ 123

අතිරේක තොරතුරු

පස් අවුරුදු සාරාංශය ........ 202
ආයෝජක තොරතුරු ........ 204
ශාඛාවල භූගෝලීය ව්‍යාප්තිය ........ 205
සටහන් ........ 208
ආයතනික තොරතුරු ඇතුළත පිටුපස කවරය

## දැක්ම

"ජාතියේ විශ්වාසනීය සංවර්ධන මූල්‍ය සහකරුවා වීම"

## මෙහෙවර

"සංවර්ධනයේ සමස්ත අන්තර්ගතයන් ප්‍රවර්ධනය වන අයුරින් ව්‍යවසායන්ට හා ව්‍යවසායකයින්ට මූල්‍යමය හා එයට අනුශංගික වූ සේවා සැපයීම"

# අප ගැන

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූලාරම්භය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වූ බැංකු ස්ථාපනය කරන ලද 1985 වර්ෂය දක්වා දුරකට විහිදී යයි. 1997 වර්ෂයේදී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 17ක් රජරට, රුහුණු, වයඹ, ඌව, කඳුරට හා සබරගමුව සංවර්ධන බැංකුව වශයෙන් පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන සංවර්ධන බැංකු 6 ක් ලෙස ස්ථාපනය කරන ලදී. 2010 වර්ෂයේ මැයි මාසයේදී මෙම බැංකු 6 ඒකාබද්ධ කරමින් ජාතික තලයේ සංවර්ධන බැංකුවක් ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (**Regional Development Bank or RDB**) යන නමින් ස්ථාපනය කරන ලදී.

ග්‍රාමීය ජනතාවට ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මූල්‍ය සේවා සපයමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම හා එමගින් ග්‍රාමීය ආර්ථිකය නංවාලීම සඳහා ඔවුන්ගේ දායකත්වය ලබාගැනීමේ දීර්ඝ කාලීන අරමුණ පෙරදැරිව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ පූර්ණ රාජ්‍ය හිමිකාරීත්වය සහිත ජාතික තලයේ බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇත.

ග්‍රාමීය බිම් මට්ටමේ බැංකුකරණ මූලධර්මය මත පදනම් වෙමින්, මෙම බැංකුව ආර්ථික පිරමීඩයේ මධ්‍යම හා පහළ ආදායම් කාණ්ඩයට අයත් පුද්ගලයින්ට නව්‍ය, සරල හා කාර්යක්ෂම මූල්‍ය උපකරණ (ප්‍රධාන වශයෙන් බැංකු තැන්පතු සිදු කිරීම දිරි ගැන්වීම හා රැස් කිරීම සහ ණය ලබා දීම) සැපයීමට නිරතුරුව කැපවී කටයුතු කරයි එමෙන්ම ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ක්ෂුද්‍ර ණී කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්, කාන්තා ව්‍යවසායකයින් මෙන්ම කෘෂි කාර්මික, සත්ව පාලන, ධීවර ව්‍යාපාර වැනි රටේ ආර්ථික වර්ධනයට දායකත්වය දක්වන ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා විශේෂ උනන්දුවකින් කටයුතු කරයි එසේම ඉතුරුම් හා ස්ථාවර තැන්පතු සඳහා ඉහළ ප්‍රතිලාභ ලබා දෙමින් ග්‍රාමීය ජනතාව අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා කටයුතු කරමින් සිටින අතර පාසල් ළමුන් හා බාලවයස්කරුවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහාද කටයුතු කරයි.

අද වන විට මිලියන 6 ඉක්මවන ගිණුම් හිමියන් සංඛ්‍යාවක්, ශාඛා 272 කින් සහ වෘත්තීයමය වශයෙන් නිපුණ ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයින් 2,530 කට අධික සංඛ්‍යාවකින් බලගන්වා ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අපගේ රටේ සමාජ ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කර ගැනීමට දායක වන ව්‍යවසායකයින් පෝෂණය කිරීමේ අභිලාසය සඵල කර ගැනීමට අවශ්‍ය සියලු සම්පත්වලින් අනූන වූ බැංකුවකි.

# අපගේ ගමන් මග / වැදගත් සන්ධිස්ථාන

පළාත් සංවර්ධන බැංකු හයක් ජාතික තලයේ සංවර්ධන බැංකුවක් වශයෙන් ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව ලද සාර්ථකත්වය පිළිබඳව ආශ්වාදජනක කතාව.

මුළු වත්කම් වර්ධනය

**595%**

රු.බි.41 සිට රු.බි. 285 දක්වා

මුළු තැන්පතු වර්ධනය

**556%**

රු.බි. 32 සිට රු.බි. 210 දක්වා

මුළු ණය සහ අත්තිකාරම් වර්ධනය

**616%**

රු.බි.30 සිට රු.බි. 215 දක්වා

මෙහෙයුම් ලාභ වර්ධනය

**438%**

රු.මි.371 සිට රු.මි. 1,998 දක්වා

මුළු හිමිකම් වර්ධනය

**433%**

රුබි 3 සිට රුබි 16 දක්වා

1985-2009 කාලය තුළ පළාත් සංවර්ධන බැංකු හයක් (රජරට, රුහුණ, වයඹ, කඳුරට, ඌව සහ සබරගමුව යන සංවර්ධන බැංකු) මගින් අත්කර ගන්නා ලද ප්‍රතිඵල එකී පළාත් සංවර්ධන බැංකු සියල්ල ඒකා-බද්ධ කරමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB) 2010 වර්ෂයේ දී ස්ථාපනය කිරීමෙන් අනතුරුව වසර දොළහකට වැඩි කාලයක් තුළ (2010-2022) සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

2010 මැයි සිට 2022 දෙසැම්බර් දක්වා

- ප්‍රා.සං. බැංකුවේ මුළු තැන්පතු වටිනාකම රු. මි. 32,350 සිට රු. මි. 210,301 දක්වා රු. බි. 178 කින් ඉහළ ගොස් ඇත.
- ප්‍රා.සං. බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම් රු.මි. 30,311 සිට රු. මි 215,373 දක්වා රු. බි.185 කින් ඉහළ ගොස් ඇත
- ප්‍රා.සං. බැංකුවේ මුළු වත්කම් වටිනාකම රු.මි. 41,018 සිට රු.මි. 285,395 දක්වා රු.බි.244 කින් ඉහළ ගොස් ඇත

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඉතිහාසය**

**1985** ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු 17ක් ස්ථාපනය කිරීම

**1997** පළාත් සංවර්ධන බැංකු 06ක් ස්ථාපනය කිරීම

**2010** ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස එක් ජාතික මට්ටමේ ආයතනයක් ස්ථාපනය කිරීම

**2018** ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව අත්පත් කර ගැනීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූලාරම්භය 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකු ස්ථාපනය කළ 1985 වසර දක්වා ඈතට දිව යයි. ඉන් අනතුරුව 1997 වසරේදී, 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතක් රජරට, රුහුණ, වයඹ, කඳුරට, ඌව සහ සබරගමුව සංවර්ධන බැංකු පළාත් මට්ටමේ සංවර්ධන බැංකු හයක් ලෙස එකාබද්ධ කරන ලදී. 2018 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත හඳුන්වා දීමත් සමඟින් එකී පළාත් මට්ටමේ බැංකු හය 2010 මැයි 01 දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන එක් ජාතික මට්ටමේ බැංකුවක් ලෙස ඒකාබද්ධ කරන ලදී.

රජයේ හිමිකාරිත්වය යටතේ පවතින ජාතික මට්ට-මේ බැංකුවක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැං-කුවේ අරමුණු වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් වෙත මූල්‍ය සහාය ලබාදීම තුළින් කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළඳ කටයුතු, වාණිජ සත්ත්ව පාලනය, ධීවර කර්මාන්තය

වැනි සංවර්ධන ක්‍රියාදාමයන් ප්‍රවර්ධනය කිරීම හා කාන්තාවන් සවිබල ගැන්වීම ඔස්සේ රටේ සමස්ත ආර්ථික සංවර්ධනයට සහාය දැක්වීමයි.

## මූල්‍යමය වශයෙන් වැදගත් සිදුවීම්

- සංවර්ධන බැංකුකරණය උදෙසාම කැපවූ මූල්‍ය ආයතනයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙරට සමාජ හා ආර්ථික සංවර්ධන කටයුතු නගා සිටුවීම සඳහා නිරතුරුව ප්‍රමුඛ මෙහෙවරක නිරත වී සිටි. මූල්‍ය සේවා සම්පාදකයෙකු වශයෙන් ප්‍රමුඛ භූමිකාවක නිරත වෙමින් දිවයිනේ සංවර්ධන කටයුතු සියල්ලම ආශ්‍රිතව පෙරමුණේ රැඳී සිටීමට අප බැංකුවට හැකි වී ඇත. අප සතු ප්‍රධානතම වත්කම වන්නේ උතුරු නැගෙනහිර පළාත් ද ඇතුළුව මෙරට පුරාවට විසිරී පැතිරී සිටින මිලියන හයක් පමණ වූ පාරිභෝගික පදනමයි. අප බැංකුවේ ප්‍රධාන ඉලක්කය වන්නේ ද අප රට සහ එහි ජනතාව සංවර්ධනය කිරීමයි. මේ නිසා ඔවුන් සවිබල ගැන්වීම තුළින් අපගේ දීප ව්‍යාප්ත 272ක ශාඛා ජාලයක් හරහා ජාතිය සංවර්ධනය කිරීම වෙනුවෙන් අප බැංකුව කැප වී සිටියි.

- බැංකුවේ මුළු ආදායම පූර්ව වර්ෂය හා සැසඳීමේ දී 48% කින් ඉහළ ගොස් ඇත. 2022 වර්ෂයේ දී, මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 1,998 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2021 දී වාර්තා වූ රුපියල් මිලියන 1,927ක් වූ මෙහෙයුම් ලාභයට වඩා 3.70% ක වර්ධනයකි. 2021 වර්ෂයේ දී 0.78% ක් ලෙස වාර්තා වූ බදුවලට පෙර වත්කම් මත ප්‍රතිලාභය (ROA) සමාලෝචිත වර්ෂයේ දී 0.47% ලෙස වාර්තා වේ

## ගනුදෙනුකරුවන් සඳහා වූ උපකාරක සේවා එන්ඩීබී බැංකුව හා එක්ව වෙස්ටර්න් යුනියන් සේවාව

වෙස්ටර්න් යුනියන් හරහා මුදල් හුවමාරුව ඕනෑම විදෙස් රටක සිට අප රට වෙත පූර්ණ සුරක්ෂිතභාවයක් සහිතව මුදල් එවීමට ඇති වඩා පහසු හා කඩිනම් ක්‍රමවේදයක් වන අතර ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශවල ව්‍යාප්තව පවතින ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ඕනෑම ශාඛාවක් වෙතින් එම මුදල් ලබාගැනීමේ අවස්ථාව ගනුදෙනුකරුවන්ට හිමි වේ.

## ඩීඑෆ්සීසී බැංකුව සමඟ ලංකා මනි ට්‍රාන්සර් (LMT)

ලංකා මනි ට්‍රාන්ස්වර් සේවය මගින් කිසිදු සේවා ප්‍රමාදයකින් තොරව සෘජුවම හා ක්ෂණිකව ගනුදෙනුකරුවන්ගේ බැංකු ගිණුම් වෙත මුදල් ප්‍රේෂණය කිරීම සිදු කරයි. ලංකා මනි ට්‍රාන්ස්වර් සේවය ලොව පුරා ස්ථාන 275 කට වඩා වැඩි ප්‍රමාණයක් ආවරණය කෙරෙන පුළුල් ජාත්‍යන්තර ජාලයකින් යුක්ත වන අතර මෙම සේවාව දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා 272 කින් ලබා ගත හැකිය.

## ශ්‍රී ලංකා ටෙලිකොම්, ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම), ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB) සමඟ උපයෝගිතා බිල්පත් සේවාව

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එකම පියසක් යට උපයෝගිතා බිල්පත් ගෙවීමට පහසුකම් සපයයි. ඒ අනුව, පාරිභෝගිකයින්ට සිය විදුලි බිල්පත්, ජල බිල්පත් සහ විදුලි සංදේශ බිල්පත් ප්‍රාදේශීය සංවර්ධන බැංකු ශාඛා ජාලය හරහා මෙන්ම අපගේ දොරින් දොර නියෝජිත සේවාව හරහා පහසුවෙන් ගෙවිය හැකිය.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම (ATM)

දිවයින පුරා ස්ථාපනය කර ඇති 4000කට අධික ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ඕනෑම එකකින් තම මුදල් ලබා ගැනීමට අපගේ ගනුදෙනුකරුවන්ට හැකියාව ඇත. මේ වන විට ආසන්න වශයෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් 350,000ක් පමණ ගනුදෙනුකරුවන් වෙත නිකුත් කර ඇත

## පොදු ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරු (CEFT) පද්ධතිය

අපගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් අන්තර් බැංකු මුදල් හුවමාරු පහසුකම් විවෘතව පවතී.

## මුදල් තැන්පතු යන්ත්‍ර (CDM)

තෝරා ගත් ශාඛා ආශ්‍රිතව ස්ථාපනය කර ඇත.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ QR කේත හඳුන්වා දීම

2021 වර්ෂයේදී ව්‍යාපාරිකයින් සඳහා ("RDB QR") කේත ක්‍රමවේදය ආරම්භ කරන ලදී. ඒඅනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ව්‍යාපාරික ගනුදෙනුකරුවන්ට මුදල් හෝ කාඩ්පත් භාවිතා නොකර QR කේතය හරහා ගනුදෙනු කිරීමට හැකියාව ඇත. මෙය ව්‍යාපාරිකයින්ට මෙන්ම මිලදී ගන්නන්ට ඉතා පහසු ගනුදෙනු ක්‍රමවේදයකි.

# මූල්‍යමය වැදගත් සිදුවීම්

| | 2022 රු.000 | 2021 රු.000 | වෙනස % |
|---|---|---|---|
| **වසරට අදාළ මෙහෙයුම් ප්‍රතිඵල** | | | |
| දළ ආදායම | 36,202,750 | 24,492,769 | 47.81% |
| බදු පෙර මෙහෙයුම් ලාභය | 1,998,116 | 1,926,782 | 3.70% |
| බදුකරණය | 648,721 | 1,620,479 | -59.97% |
| බදු පසු ලාභය | 1,349,395 | 306,303 | 340.54% |
| කොටස් හිමියන්ට හිමි විය යුතු ලාභය | 1,458,769 | 279,005 | 422.85% |
| | | | |
| **වත්කම් හා බැරකම්** | | | |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු | 210,301,323 | 187,752,465 | 12.01% |
| ණය සහ ලැබිය යුතු දෑ | 215,372,502 | 189,039,666 | 13.93% |
| මුළු වත්කම් | 285,395,150 | 245,889,512 | 16.07% |
| මුළු වගකීම් | 269,169,023 | 230,496,189 | 16.78% |
| කොටස්හිමි අරමුදල | 16,226,127 | 15,393,322 | 5.41% |
| | | | |
| **ලාභදායීතාව** | | | |
| වත්කම් මත ප්‍රතිලාභ (මෙහෙයුම් ලාභ) | 0.47% | 0.78% | -0.31% |
| ස්කන්ධය මත ප්‍රතිලාභ | 8.54% | 8.32% | 0.22% |
| අක්‍රිය ණය අනුපාතිකය | 8.46% | 8.71% | -0.25% |

## නියාමන අනුපාත

| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (බාසල් III අනුව) | 2022 (%) | අවම අවශ්‍යතාව | 2021 (%) | අවම අවශ්‍යතාව |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව පොදු ස්කන්ධ ස්ථර 1 | 8.29% | 7.5% | 8.72% | 7.5% |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව මුළු ස්ථර 1 | 8.29% | 8.5% | 8.72% | 8.5% |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව මුළු ප්‍රාග්ධන අනුපාතය | 15.22% | 12.5% | 14.27% | 12.5% |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතිකය | 27.83% | 20.0% | 26.18% | 20.0% |

**දළ ආදායම**
**රු. මි. 36,203**




**බදු පෙර මෙහෙයුම් ලාභය**
**රු. මි. 1,998**




**බදු පසු ලාභය**
**රු. මි. 1,349**




**ගනුදෙනුකරුවන්ගේ තැන්පතු**
**රු. මි. 210,301**




**ණය සහ ලැබිය යුතු දෑ**
**රු. මි. 215,373**




**කොටස් හිමි අරමුදල**
**රු. මි. 16,226**



# සභාපතිතුමාගේ පණිවිඩය



හිතාදර පාර්ශවකරුවනි,

ශ්‍රී ලංකාව මුහුණ දුන් අභියෝගාත්මක වසරක නිමාව පිළිබඳව අප යළි මෙනෙහි කරන විට, වසරේ මුල් භාගයේ ඇති වූ ආර්ථික අස්ථාවරත්වය සහ දේශපාලන කැළඹිලි, පුද්ගලයින් සහ සමාජ කණ්ඩායම් සඳහා විශාල බලපෑම් ඇති කළ බවත්, එහි වැඩිම බලපෑමට ලක්වූයේ සමාජයේ වඩාත්ම අවදානමට ලක්විය හැකි සහ අඩු ආදායම් ලබන සාමාජිකයින් බවත් පැහැදිලි වේ.
මෙම අභියෝග හමුවේ, ග්‍රාමීය ප්‍රජාවන් සවිබල ගැන්වීම උදෙසා කැපවී සිටින සංවර්ධන බැංකුවක් ලෙස, මෙම සිදුවීම් සමුදායේ අහිතකර ප්‍රතිවිපාකවලට මුහුණ දීමට අපට සිදු විය. මෙවන් දුෂ්කර වාතාවරණයක් මධ්‍යයේ වුවද, තිරසාර වර්ධනයක් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අපගේ දරාගැනීමේ හැකියාව සහ අධිෂ්ඨානය මෙම කාල පරිච්ඡේදයේදී පරීක්ෂාවට ලක්කෙරුණි. මෙම කාලය පුරාවටම අපි අපගේ මූලික අරමුණු කෙරෙහි නිරතුරුව අවධානය යොමු කළෙමු. මෑත ඉතිහාසයේ අභියෝගාත්මක මාස (12) ක් සාර්ථකව පසු කරමින්, අපගේ විශ්වසනීය ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය ආරක්ෂා කරමින්, ඔවුන්ගේ මූල්‍ය දුෂ්කරතා කළමනාකරණය කිරීම සඳහා ඔවුන්ට උපකාර කළ බව මම ඉමහත් සතුටින් සඳහන් කරමි. මෙවන් ව්‍යාකූල කාල පරිච්ඡේදයක් තුළ අපව මෙහෙයවූ අප සතු ශක්තිය සහ නොපසුබට උත්සාහය පිළිබිඹු කරමින්, 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන මහත් අභිමානයෙන් ඔබ වෙත ඉදිරිපත් කරමි.

ආර්ථික අර්බුදය සැලකිය යුතු බාධාවන් ඇති වීමට හේතු විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ පළාත් ඇස්තමේන්තුවලට අනුව. 2022 පළමු භාගයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය පෙර වසරට අනුව 4.8%කින් හැකිලී ගිය අතර එය 2021 වර්ෂයේ එම කාලය තුළ පැවති 9.3%ක වර්ධනයට සාපේක්ෂව තියුණු පහත වැටීමකි. වසර ආරම්භයේදී ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කරනු ලැබුවද, අර්බුදය තීව්‍ර වීමත් සමඟ දෙවන කාර්තුව වන විට මෙම ගම්‍යතාව ආපසු හැරවුන අතර, විදේශ විනිමය අර්බුදයෙන් පැන නැගුන අවිනිශ්චිතතාවයන් වර්ධනය වීමත් සමඟ එය තවදුරටත් උග්‍ර විය. මෙය සියලු ප්‍රධාන ආර්ථික අංශවල හැකිලීමකට තුඩු දුන් අතර, එම අංශවලට බොහෝ අභියෝගවලට මුහුණ දීමට සිදුවිය. උද්ධමනය අනවරතව වේගයෙන් ඉහළ ගිය අතර. ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය.

මෙම පරිසරය තුළ, බැංකු ක්ෂේත්‍රයට විශාල අභියෝගවලට මුහුණ දීමට සිදු වූ අතර, ඒ තුළ රුපියල අවප්‍රමාණය වීම, උද්ධමනය ඉහළ යාම සහ අක්‍රීය ණය ( NPLs) වර්ධනය වීමේ තර්ජනය ආදී කරුණු විය. වෙළඳපල පොලී අනුපාතවල තියුණු වැඩිවීම මගින් බැංකුවලට ප්‍රබල ණය අවදානමකට මුහුණ දීමට සිදු විය. ණය ගැණුම්කරුවන් අත්විඳින අතිශය දුෂ්කර මූල්‍ය තත්ත්වයන් පිළිබිඹු කරමින් අක්‍රීය ණය අනුපාතය තියුණු ලෙස ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, බැංකුවල මූල්‍ය තත්ත්වය සැලකිය යුතු පීඩනයකට ලක්විය. මෙම අභියෝග අවම කිරීම සඳහා, සුදුසුකම් ලත් ණයගැතියන්ට සිය ආදායම් උත්පාදනය කිරීමේ ක්‍රියාකාරකම් අඛණ්ඩව කරගෙන යාමට සහ එමගින් ක්‍රමයෙන් ඔවුන්ගේ ණය ආපසු ගෙවීම නැවත ආරම්භ කිරීමට උපකාර කිරීම පිණිස ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් මෙන්ම පුද්ගලයන් සඳහාද සහනදායී පියවර හඳුන්වා දෙන ලදී.

# අපගේ ප්‍රවේශය

සංවර්ධන බැංකුවක් ලෙස, අපගේ සියලුම සේවාදායකයින් ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) විසින් නියම කරන ලද සහනදායී රෙගුලාසිවලට හිමිකම් කියයි. එම නිසා, විවිධ අංශ හරහා බලපෑමට ලක් වූ ණයගැතියන්ට සහන සැලසීම සඳහා අපි බැඳී සිටිමු. මෙම සහන අතරට ණය සහන, ණය ප්‍රතිව්‍යුහගත කිරීම හෝ ප්‍රතිලේඛනගත කිරීම, අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම, අඩු පොලී සහිත කාරක ප්‍රාග්ධන ණය ලබාදීම සහ විශේෂයෙන් කෘෂිකර්මාන්තය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල නියැලී සිටින කාන්තාවන් ඇතුළු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන්හි සේවාදායකයින්ට ඔවුන්ගේ විශේෂිත බැංකු ගනුදෙනු සඳහා ගාස්තු නිදහස් කිරීම් සිදුකිරීම ද ඇතුළත් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වාණිජ බැංකු විසින් පිරිනමනු ලබන ඉහළ පොලී අනුපාත යෝජනා කිරීමට හෝ ණය කොන්දේසි සඳහා ස්ථාවර ණය අනුපාත සකස් කිරීමට අපට නොහැකි විය. මෙම තත්ත්වය අපගේ මූල්‍ය කාර්යසාධනය කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කරන ලදී. ඊට අමතරව, පවතින අර්බුදය හේතුවෙන් අක්‍රීය ණය ඉහළ යාම නිසා, ණය ලබා දීමට පෙර ණයගැණුම්කරුවන්ගේ ශක්‍යතාව තක්සේරු කිරීමේදී වඩාත් විධිමත් ණය අයකර ගැනීමේ පියවර ක්‍රියාත්මක කිරීමට සහ වඩාත් ප්‍රබල ඇගයීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට අපට සිදුවිය.

මෙම අභියෝගාත්මක කාලපරිච්ඡේදය තුළ, වඩාත් ඵලදායී ප්‍රවේශයන් භාවිතා කරමින් දුෂ්කර තත්වයන් මගහරවා ගැනීමේදී, අපගේ ගනුදෙනුකරුවන්ට සහාය වීමට අපි ඉමහත් කැපවීමෙන් කටයුතු කළෙමු. මෙම ප්‍රයත්නයේ කොටසක් ලෙස, අපි තෝරාගත් නිෂ්පාදන සඳහා වසරක් දක්වා විශේෂ පොලී අනුපාත හඳුන්වා දුන් අතර අංශ දෙකක, එනම් 'තිලිණ (පුද්ගලික ණය) සහ 'දෙටුසවි' (විශ්‍රාමික ණය) පොලී අනුපාත සඳහා සුළු වැඩිවීම් (2-3%) පමණක් සිදු කළෙමු. ඊට අමතරව, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා අපි රජයේ අනුග්‍රහය ලත් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම අඛණ්ඩව ලබා දුන්නෙමු.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඩිජිටල් පරිවර්තනය

බැංකු ක්ෂේත්‍රයේ තාක්ෂණය කෙරෙහි වැඩිවන අවධානය සහ ඩිජිටල් මූල්‍ය ගනුදෙනු සඳහා වැඩි වෙමින් පවතින ඉල්ලුම පිළිබඳ සලකා බලමින්, අපි ඕනෑම ජංගම යෙදුමක් හරහා (QR) ගෙවීම් ක්‍රමය සහ (Just Pay) ගෙවීම් පහසුකම සාර්ථකව ආරම්භ කළෙමු. තවද, අපි නව ණය ප්‍රභව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත්තෙමු, කාර්යක්ෂමතාව තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා පොලී පිරිවැය අඩු කිරීමට උපකාරී වන පරිදි අපගේ තැන්පතු මිශ්‍රණය ප්‍රශස්ත කිරීම සඳහා අපි උපාය මාර්ග අනුගමනය කළෙමු. මෙම ක්‍රියාමාර්ග හරහා පාරිභෝගික පහසුව සහ තෘප්තිය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වනු ඇති අතර. අපගේ සේවා ප්‍රමිතීන් නව මට්ටමකට ඉහළ නැංවෙනු ඇතැයි අපි විශ්වාස කරමු.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කාර්යසාධනය

මෙම උපායමාර්ගික ක්‍රියාමාර්ග හරහා, ග්‍රාමීය ප්‍රජාවන් සවිබල ගැන්වීම පිණිස අපගේ කැපවීම අඛණ්ඩව පවත්වා ගනිමින්, අපගේ ගනුදෙනුකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කිරීම පිණිස අපි අඛණ්ඩව කටයුතු කර ඇත්තෙමු. වසර පුරා අපගේ භාණ්ඩාගාර මෙහෙයුම්වල 203% ක සුවිශේෂී වර්ධනයක් ලබමින් අපි ශක්තිමත් ප්‍රතිඵල අත්කර ගත්තෙමු. තැන්පතු අනුපාත වැඩිවීම බැංකුවට වැඩි අරමුදල් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වූ අතර ද්‍රවශීලතාවය ඉහළ යාමට ද එය හේතු විය. ගනුදෙනුකරුවන්ගේ තැන්පතු 12% කින් වර්ධනය වූ අතර ණය සහ ලැබිය යුතු මුදල් 13.93% කින් ඉහළ යන ලදී.

පූර්ව වර්ෂයට සාපේක්ෂව, බැංකුවේ මෙහෙයුම් ලාභය (3.70%) ක සුළු වැඩිවීමක් වාර්තා කළද, දළ ආදායම රුපියල් බිලියන 36 ක වැඩිවීමක් වාර්තා කරන ලදී.

උචිත උපාය මාර්ගික පියවර ක්‍රියාත්මක කිරීමෙන් සහ කාලෝචිත මැදිහත්වීම් සිදු කිරීමෙන් වෙනස් වෙමින් පවතින ව්‍යාපාරික පරිසරයට අනුවර්තනය වෙමින් අපි මෙම කාලපරිච්ඡේදය තුළ අපගේ ස්ථාවරය ශක්තිමත් කළෙමු. අපට අර්බුදය සාර්ථකව මගහරවා ගැනීමට සහ අපගේ සේවාදායක පදනම ආරක්ෂා කර ගනිමින් ශක්තිමත් කාර්යසාධනයක් පවත්වා ගැනීමට මෙම ප්‍රවේශය අවකාශ සැලසීය. මෙම අභියෝගාත්මක කාලය තුළ අපගේ සේවාදායකයින්ට සහාය වීම අපගේ ප්‍රමුඛතාවය බවට පත් වූ අතර ඔවුන්ගේ අවශ්‍යතා අපගේ අවශ්‍යතාවලට වඩා ප්‍රමුඛස්ථානයෙහිලා කටයුතු කරන ලදී. අපගේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු කණ්ඩායමේ අචල කැපවීම සහ බැංකුවේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අප හා එක්ව කටයුතු කරන ගනුදෙනුකරුවන් සමඟ පවත්වාගෙන යනු ලබන අපගේ සමීප සම්බන්ධතාවය තුළින් මෙය යථාර්තයක් බවට පත් කළ හැකි විය.

## ආයතනික පාලනය

අපගේ වර්ධනය සහ සාර්ථකත්වය ඇතිකරනු ලබන්නේ ශක්තිමත් පාලන රාමුවක් මගින් වන අතර එය අපගේ මෙහෙයුම්වල පදනම වේ. එමගින් අපගේ මෙහෙයුම්වල සෑම අංශයකම විනිවිදභාවය, වගවීම සහ සදාචාරාත්මක භාවිතයන් සහතික කරයි. ඒ හේතුවෙන්, අපි අදාළ සියලුම පාලන ප්‍රමිතීන් සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන්නෙමු. මෙම ශක්තිමත් පාලන පදනම, විශ්වාසය ගොඩනගා ගැනීම, අවංකභාවය පවත්වා ගැනීම සහ සුවිශේෂී සේවා ප්‍රමිතීන් පවත්වා ගැනීම මගින් අපගේ ගනුදෙනුකරුවන්ට වටිනාකමක් ලබා දීමේ හැකියාව වැඩි දියුණු කර ඇත.

## ඉදිරි ගමන් මග

ඉදිරි මූල්‍ය වර්ෂයේ දී වැඩිදියුණු වන මෙහෙයුම් පරිසරයත් සමඟ ඇති විය හැකි වර්ධන අවස්ථා අත්පත් කර ගැනීම සඳහා අපි උත්සුක වෙමු. දුෂ්කරම අවස්ථාවලදී දැඩි ඉවසීමෙන් හා උපායමාර්ගික දුරදක්නා බවකින් කටයුතු කර ඇති අපි දැන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වර්ධනයේ ඊළඟ අදියරට පිවිසීමට සූදානමින් සිටිමු. බිම් මට්ටමේ ව්‍යවසායකයින්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි ණය පහසුකම් ලබා දීමෙන් ඔවුන්ට සහාය වීම සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු කරනු ඇත. මෙය සිදු කිරීමේ දී, අපගේ ගනුදෙනුකරුවන්ගේ ගතික අවශ්‍යතා සපුරාලීම පිණිස අපගේ නිෂ්පාදන පිරිනැමීම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් වනු ඇත.

අපගේ ගනුදෙනුකරුවන්ගේ වෙනස් වන අවශ්‍යතා ප්‍රශස්ත අයුරින් සපුරාලීම සඳහා අපගේ නිෂ්පාදන කළඹ වැඩිදියුණු කිරීමටත්, ඩිජිටල් බැංකුකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමටත්, අපගේ ඉලක්කගත පාරිභෝගික පදනම වැඩි වශයෙන් පවතින කලාපවලට අපගේ ශාඛා ජාලය ව්‍යාප්ත කිරීමටත් අපි කටයුතු කරන්නෙමු, රටේ ග්‍රාමීය ආර්ථිකයට වඩාත් ඵලදායී ලෙස සේවය කිරීමේ අපගේ ධාරිතාව වැඩි දියුණු කිරීම පිණිස රජයේ නියෝගවලට අනුකූලව, වෙනත් මූල්‍ය ආයතනයක් සමඟ අපගේ සැලසුම්ගත ඒකාබද්ධ කිරීම මගින් මෙම ක්‍රියාදාමය තවදුරටත් ශක්තිමත් වනු ඇත.

## ස්තූතිය

මෙවැනි අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් තුළ අපගේ කාර්යයන් සඵලකර ගැනීම සඳහා ස්ථිරසාර නායකත්වයක් ලබාදුන් අපගේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ අවංක කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. මෙම අභියෝගාත්මක කාලය පුරාවට අපගේ විශ්වසනීය ගනුදෙනුකාර භවතුන් සහ පාර්ශවකරුවන් අප වෙත දක්වන ලද අඛණ්ඩ සහයෝගය අගයමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම ඔවුන් වෙත හෘදයාංගම ස්තූතිය පළ කරමි. තවද, අපගේ සේවාදායකයින්ට අඛණ්ඩ සේවාවක් ලබා දීම සඳහා සුවිශේෂී මෙහෙවරක් ඉටුකිරීම වෙනුවෙන් අපගේ කළමනාකරණ කණ්ඩායමට සහ සේවක මඩුල්ලට මගේ හෘදයාංගම කෘතඥතාව පළ කරමි. වඩාත්ම අභියෝගාත්මක කාලපරිච්ඡේදය පසු කර ඒමෙන් අනතුරුව ශක්තිමත් පාලන පදනමකින් ශක්තිමත් වූ අප සැමගේ කැපවීම, අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ එතුළින් රටේ ආර්ථික වර්ධනයට අර්ථවත් දායකත්වයක් ලබා දීම සඳහා අපව මෙහෙයවනු ඇතැයි මම විශ්වාස කරමි.



මහින්ද සාලිය
සභාපති

## සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය

2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම ඉතා සතුටු වෙමි. පසුගිය වසර රටේ ආර්ථිකයට විශේෂයෙන් අභියෝගාත්මක වසරක් විය. එය සියලු අංශයන්ට මුහුණ දීමට සිදුවූ උග්‍ර මූල්‍ය අර්බුදයක් නිර්මාණය වූ වසරක් වූ අතර එමගින් බහුතරයකට සැලකිය යුතු දුෂ්කරතා ඇති විය. මෙම අභියෝග මධ්‍යයේ වුවද, දුෂ්කර තත්වයන්ට මුහුණ දීම සඳහා මෙන්ම අපගේ වර්ධනය පවත්වා ගැනීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කරමින් බැංකුව තම දරා ගැනීමේ හැකියාව පෙන්නුම් කරන ලදී. දැරිය හැකි ණය පහසුකම් සඳහා අවකාශ සලසමින් හා එමගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට දායක වෙමින් ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම උදෙසා වූ අපගේ මෙහෙවරෙහි අපි නොසැලී කටයුතු කළෙමු.

2022 මූල්‍ය වර්ෂය ආරම්භයේදී, දිගු කලක් පැවති වසංගතයෙන් ජාතිය යළි යථා තත්ත්වයට පත්වෙමින් පැවැති අතර, දෛනික ජීවිතය මෙන්ම ආර්ථිකයද ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් තිබුණි. කෙසේ වුවද, වසරේ දෙවන කාර්තුවේදී නිදහසින් පසුව ඇතිවූ දරුණුතම ආර්ථික අර්බුදයකට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් එම යළි පිබිදීම කෙටි කාලයකට සීමා විය. මෙම අර්බුදය ආර්ථිකයේ 78% ක හැකිලීමකට තුඩු දුන් අතර රටේ සියලුම ප්‍රධාන අංශවල පහත වැටීමක් සිදු විය. දිගුකාලීන විදුලිය ඇනහිටීම්, අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය සහ සැපයුම් දාමයට ඇතිවූ බාධා හේතුවෙන් ඇතිවූ ඉන්ධන සහ අමුද්‍රව්‍ය හිඟය ඇතුළු අභියෝග තවදුරටත් උත්සන්න වූ අතර එමගින් පුද්ගලයන්ට මෙන්ම ව්‍යාපාරවලට ද බලපෑමක් සිදු විය. මෙම කාලය තුළ, ඉහළ යන උද්ධමනය සහ ජීවන වියදම ඉහළ යාම මගින් ක්‍රය ශක්තිය මත සැලකිය යුතු බලපෑමක් ඇති කළ අතර, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. මෙම තත්ත්වය අඩු ආදායම්ලාභී පුද්ගලයන් කෙරෙහි දැඩි බලපෑමක් ඇති කළ අතර එය වසර පුරා පුළුල් සමාජ අර්බුද සහ විරෝධතා ඇතිවීමට හේතු සාධක විය.

බැංකු ක්ෂේත්‍රය ද මෙම අභියෝගවල බලපෑම්වලින් නිදහස් නොවීය. ඉහළ පොලී අනුපාතය සහ ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අඩුවීම මගින් මෙම අංශයට අහිතකර බලපෑමක් සිදු විය. අප මුහුණ දුන් එක් ප්‍රධාන ගැටළුවක් වූයේ ඉහළ යන වෙළඳපල අනුපාතවලට අනුකූලව අපගේ ණය පොලී අනුපාත සකස් කිරීමේ අවශ්‍යතාවයයි, එය අපගේ ලාභදායිතාවයට සැලකිය යුතු මට්ටමකින් බලපෑ අතර ආදායම් ආන්තිකවල සැලකිය යුතු අඩුවීමකට ද හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) බැංකු ක්ෂේත්‍රයට සහාය දැක්වීම අරමුණු කර ගත් නියාමන පියවර ක්‍රියාත්මක කිරීමට අඛණ්ඩ කටයුතු කළ අතර, අංශයේ ස්ථාවරත්වය සහ ශක්තිමත් බව පවත්වා ගනිමින් ආර්ථිකයට ණය කාර්යක්ෂමව ගලා යාම සහතික කරන ලදී.



## උපායමාර්ග සහ කාර්යසාධනය

මෙම කාලපරිච්ඡේදය වූකලී අභියෝග මධ්‍යයේ බැංකුව මෙහෙයවීමට සහ එහි තිරසාර වර්ධනය පවත්වාගෙන යාමට ඉතා සැලකිල්ලෙන් උපායමාර්ගික ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වූ කාල පරිච්ඡේදයක් විය. මහ බැංකුවේ මඟ පෙන්වීම සහ මූල්‍ය ආධාර හරහා ග්‍රාමීය ව්‍යවසායකයින්ට සහාය වීම පිළිබඳව වන අපගේ අචල කැපවීමත් සමඟ, මෙම දුෂ්කර කාලවලදී අපගේ වටිනා සේවාදායකයින්ට උපකාර කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. මෙම සහන පියවරයන් සඳහා සුදුසුකම් ලැබූ ගනුදෙනුකරුවන් මත මූල්‍යමය බර අඩු කිරීම සඳහා, අඩු පොලී අනුපාත ණය නිෂ්පාදන, ණය සහන සහ නම්‍යශීලී ගෙවීම් නියමයන් ඇතුළු විවිධ සහන අපි ලබා දුන්නෙමු.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල ග්‍රාමීය ගනුදෙනුකරුවන් මෙන්ම කෘෂිකර්මාන්තය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල නියැලී සිටින කාන්තාවන් සවිබල ගැන්වීම කෙරෙහි අපගේ අවධානය යොමු වී ඇති හෙයින්, අනෙකුත් වාණිජ බැංකු විසින් පිරිනමනු ලබන ඉහළ පොලී අනුපාත සමඟ තරඟ කිරීමේදී අපට අභියෝගවලට මුහුණ දීමට සිදු විය. මීට අමතරව, අපගේ ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙකුට ස්ථාවර පොලී අනුපාත ණය තිබුණු අතර, එමඟින් අපගේ ණය දීමේ අනුපාත නියම කිරීම දුෂ්කර විය. රටේ පවතින වාතාවරණය හේතුවෙන් අපගේ ගනුදෙනුකරුවන් මත වැඩිවන ආර්ථික පීඩනය පිළිබඳව අපි මනා අවබෝධයකින් සිටි අතර ඔවුන්ගේ මූල්‍ය බර ලිහිල් කිරීම සඳහා කැපවී කටයුතු කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස, 'තිලිණ (පුද්ගලික ණය) සහ 'දෙටුසවි' (විශ්‍රාමික ණය) යන නිෂ්පාදන දෙක සඳහා පමණක් පොලී අනුපාතය සුළු වශයෙන් (2-3%)කින් ඉහළ නැංවීමට අපි තීරණය කළෙමු.

අප විසින් වසරක් දක්වා වූ කාලයක් සඳහා පමණක් අදාළ වන පරිදි තෝරාගත් නිෂ්පාදන සඳහා විශේෂ අනුපාත ද පිරිනමන ලදී. ඊට අමතරව, ණය කළඹ සඳහා රජයේ අනුග්‍රහය ලත් ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රමය සමඟ නිශ්චිත අංශවලට අපි අඛණ්ඩව සහයෝගය ලබා දුන්නෙමු.

මෙම කාලපරිඡෙඡේදය තුළ ණය ගෙවීම් පැහැර හැරීම් ඉහළ යාමත් සමග, ණය අය කර ගැනීම බැංකුවට සැලකිය යුතු අභියෝග යක් බවට පත් වූ අතර, හිඟව පවතින ගෙවීම් අයකර ගැනීම සඳහා උපායමාර්ගික පියවර ක්‍රියාත්මක කිරීමට අපට සිදු විය. සමාලෝචිත කාලපරිච්ඡේදය පුරාම අපගේ ශුද්ධ අක්‍රීය ණය (NPL) අනුපාතය 6.5% ක් ලෙස පැවතුනි. මේ හේතුවෙන්, අපි විශේෂ අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ආරම්භ කළ අතර, නව ණය ලබා දීමට පෙර ණය ගැණුම්කරුවන්ගේ ගෙවීම් ශක්‍යතාව පිළිබඳව හොඳින් තක්සේරු කිරීම සඳහා අපගේ ණය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කළෙමු.

මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද, තැන්පතු අනුපාත ඉහළ යාමෙන් බැංකුවට ප්‍රතිලාභ ලැබුණු අතර, එය නව ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීමට සහ පවතින ගනුදෙනුකරුවන්ගේ තැන්පතු රඳවා ගැනීමට උපකාරී විය. එහි ප්‍රතිඵලයක් ලෙස, අපගේ භාණ්ඩාගාර මෙහෙයුම් සැලකිය යුතු දියුණුවක් වාර්තා කළ අතර, අයවැයගත ඉලක්කවලින් 203% ක් ඉටු කර ගැනීමට හැකි විය. අනෙකුත් ක්ෂේත්‍රවල පහත වැටීම් මධ්‍යයේ මෙම මූල්‍ය ලාභය මගින් බෙහෙවින්ම අවශ්‍ය වූ සහනයක් ලබා දෙන ලදී. මූල්‍ය වර්ෂය සඳහා අපි රුපියල් මිලියන 1,349 ක ඉහළ බදු පසු ලාභයක් වාර්තා කළ අතර එය පෙර වසරේ රුපියල් මිලියන 306 ට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයකි. පාරිභෝගික තැන්පතු 12% කින් වර්ධනය වී රුපියල් බිලියන 210 ක් දක්වා ඉහළ ගිය අතර ණය සහ ලැබිය යුතු දෑ 13,93% කින් වර්ධනය වී රුපියල් බිලියන 215 දක්වා ඉහළ යන ලදී. අපගේ මුළු වත්කම් 16,07% කින් වැඩි වූ අතර, අපගේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය කර්මාන්තයේ අවම අවශ්‍යතාවයට වඩා ඉහළින් සාර්ථක අන්දමින් පවත්වා ගැනීමට අපට හැකි විය.
මෙම කාලපරිච්ඡේදය තුළ, බැංකුව සිය පිරිවැය පදනම අඩු කිරීම සඳහා දැඩි පිරිවැය පාලන පියවර ක්‍රියාත්මක කළ අතර, රජය සතු ආයතන සඳහා මුදල් අමාත්‍යාංශය විසින් නියම කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව අඩු අයවැයක් සමඟ ක්‍රියාත්මක වෙමින් අත්‍යවශ්‍ය නොවන වියදම් කපා හැරීමට කටයුතු කරන ලදී.

## ප්‍රධාන සන්ධිස්ථාන

අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් මධ්‍යයේ වුවද, අපි අපගේ වර්ධන අරමුණු කෙරෙහි මනා අවධානයක් යොමු කළෙමු, ශාඛා නැවත සන්නාමකරණය හරහා අපි පාරිභෝගික අත්දැකීම වැඩිදියුණු කළ අතර ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා ඇතැම් ශාඛා නැවත ස්ථානගත කළෙමු.තාක්ෂණය සම්බන්ධයෙන් ගත් කල, මූල්‍ය වර්ෂය තුළ මධ්‍යගත එකතු කිරීමේ කළමන-ාකරණ පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව අපි ණය ජනන පද්ධතියක් ආරම්භ කළෙමු. ඊට අමතරව, ඉදිරි මූල්‍ය වර්ෂයේදී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට නියමිත (RDB) ගෙවීම් යෙදුම ද අපි ආරම්භ කළෙමු. තවද, වීසා ණය පත් ක්‍රමයක් හඳුන්වාදීමේ ක්‍රියාවලිය ද දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

වසර තුළ තොරතුරු තාක්ෂණ අංශයේ අපගේ ක්‍රියාකාරකම් කීර්තිමත් සම්මාන කිහිපයක් හරහා ඇගයීමට ලක් විය. (2023) ලංකා-පේ තාක්ෂණ නවෝද්‍යා සම්මාන උළෙලේදී රන් සම්මානය, වසරේ හොඳම ලංකා-පේ කාඩ්පත් ක්‍රියාත්මක කරන්නා සඳහා රන් සම්මානය සහ වසරේ හොඳම පොදු (ATM) සබලකරු සඳහා කුසලතා සම්මානය මීට ඇතුළත් විය.

තවත් කැපී පෙනෙන ජයග්‍රහණයක් වූයේ 2023 මාර්තු මාසයේදී මහ බැංකු ශ්‍රවණාගාරයේදී පැවති දිරි අභිමානී වැඩසටහනයි. මෙම වැඩසටහනේ අරමුණ වූයේ දිස්ත්‍රික්, පළාත් සහ ජාතික මට්ටමින් විශිෂ්ට කාන්තා ව්‍යවසායකයින් හඳුනාගෙන ඔවුන්ට මූල්‍ය ත්‍යාග සහ අනෙකුත් දිරි දීමනා ලබා දීමයි.

LMD සන්නාම වාර්ෂික වාර්තාවට අනුව, බැංකුවේ ශ්‍රේණිගත කිරීම 2021 දී 44 වන ස්ථානයේ සිට 2022 දී 43 වන ස්ථානය දක්වා වර්ධනය විය.

## අනාගත පෙර දැක්ම

වසර අවසාන වන විට ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කිරීමත් සමඟ කෘෂිකර්මාන්තය, පශු සම්පත් සහ ධීවර යන ක්ෂේත්‍රවල කාන්තාවන් ඇතුළු ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ ප්‍රධාන පහසුකම් සපයන්නෙකු ලෙස ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි කාර්යභාරය රටේ ආර්ථික වර්ධනය ඉදිරියට ගෙන යාමේදී වඩාත් තීරණාත්මක විය. එබැවින්, මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීමේදී අභියෝගවලට මුහුණ දෙන මෙම අංශවල අඩු සේවාලාභී කොටස් වෙත ප්‍රවේශ වීමට අපි කැපවී සිටින්නෙමු. මීට අමතරව, පාරිභෝගික සේවය වැඩිදියුණු කිරීම සඳහා අපගේ ණය ලබාදීමේ පද්ධතිය සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කිරීමෙන් අනතුරුව අපි අපගේ තාක්ෂණික දියුණුව වේගවත් කිරීමට අඛණ්ඩව කටයුතු කරන්නෙමු් නව මූලික බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියකද අපි නිරතව සිටිමු.

බැංකුව ද ඉදිරියට යමින් පුළුල් පාරිභෝගික පදනමක් ස්ථාපනය කර ගැනීම අරමුණුකොට ගෙන දෘශ්‍යතාව වැඩි කර ගැනීම සහ ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩිදියුණු කිරීම සඳහා නව භූගෝලීය ප්‍රදේශවලට බැංකුවේ ශාඛා ජාලය පුළුල් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බලමින් සිටී. මෙම ව්‍යාපෘතියේ කොටසක් ලෙස, අපි පේදුරුතුඩුව සහ චාවකච්චේරි ප්‍රදේශවල නව ශාඛා දෙකක් විවෘත කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටිමු. ඊට අමතරව, බැංකුවේ දිගු කාලීන ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා රජයේ උපදෙස්වලට අනුකූලව තවත් මූල්‍ය ආයතනයක් සමඟ ඒකාබද්ධ වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මේ වන විට සලකා බලමින් සිටී.

## ස්තූතිය

අවසාන වශයෙන්, අභියෝගවලින් ගහන වූ කාල පරිච්ඡේදයක් තුළ බැංකුව නිවරදි දිශානතියකට මෙහෙයවීම පිණිස ලබාදුන් සිය අගනා මග පෙන්වීම සහ නායකත්වය වෙනුවෙන් සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට මගේ අවංක කෘතඥතාව පළ කරමි. මූල්‍ය වර්ෂය පුරාවටම මාහට මෙන්ම අප බැංකුවට අඛණ්ඩව සහයෝගය සහ සහයෝගීතාවය ලබා දුන් ශ්‍රී ලංකා මහ බැංකුවේ, මුදල් අමාත්‍යාංශයේ සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට මගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

අපගේ ගෞරවනීය ගනුදෙනුකරුවන් අප කෙරෙහි සහ ඔවුන්ගේ මූල්‍ය යහපැවැත්මට සහාය වීම සඳහා අපගේ කැපවීම කෙරෙහි තැබූ අචල විශ්වාසය පිළිබඳව මාගේ කෘතඥතාවය ඔවුන් වෙත පුදකරමි. මූල්‍ය අභියෝග ජය ගැනීමට සඳහා ඔවුන්ට උපකාර කරමින් සහ ශක්තියක් ලබා දෙමින් දුෂ්කර කාලවලදී ඔවුන්ට සහාය වීමට අපි කැපවී සිටින්නෙමු.

අවසාන වශයෙන්, බැංකුවේ මූලික අරමුණු සාක්ෂාත් කර ගැනීමට ප්‍රයත්න දරන අතරම, අපගේ ගනුදෙනුකරුවන්ට මූල්‍යමය වශයෙන් සවිබල ගැන්වීම පිණිස උපකාර කිරීමේදී දක්වන ලද නොසැලෙන කැපවීම සහ අප්‍රතිහත ධෛර්යය වෙනුවෙන් අපගේ සියලුම සේවක භවතුන්ට මාගේ හෘදයාංගම කෘතඥතාව පළ කිරීමට කැමැත්තෙමි. අප කණ්ඩායම විසින් දරන ලද සාමූහික ප්‍රයත්නයන් දුෂ්කර කාලවලදී බැංකුව මෙහෙයවීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කර ඇත. හෙට දිනය පිළිබඳ සලකා බැලීමේ දී, නුදුරු අනාගතයේ දී වැඩිදියුණු වන මෙහෙයුම් පරිසරය මගින් බිහිකරනු ලබන අවස්ථාවන් පිළිබඳව මම අතිශය ප්‍රීතියට පත් වෙමි.



පී.එස්. එදිරිසූරිය
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී
(වැඩ ආවරණ)



## භාරකාරත්වය


අධ්‍යක්ෂ මණ්ඩලය........................................................................ 20
ආයතනික කළමනාකරණ කණ්ඩායම........................................................ 26
ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් /ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන් ................................................................... 28
සහකාර සාමාන්‍යාධිකාරීවරුන් / අංශ ප්‍රධානීන් ....................................... 30

# අධ්‍යක්ෂ මණ්ඩලය



## එම් මහින්ද සාලිය මහතා

සභාපති
(2022.12.31) දින විශ්‍රාම ලැබීය)

මහින්ද සාලිය මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධාරියෙකි. ඒ මහතා මූල්‍ය ප්‍රතිපත්ති, රාජ්‍ය මූල්‍ය, සංඛ්‍යානය මෙන්ම වාර්ෂික රාජ්‍ය අයවැය පිළියෙළ කිරීම ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මනා පළපුරුද්දක් ඇති වෘත්තිකයෙකි.

වසර (34) ක කාලයක් පුරාවට රාජ්‍ය අංශයේ වෘත්තීන්හි නිරතව සිටි ඒ මහතා එම කාලය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික විද්‍යාඥයෙකු, ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂවරයෙකු සහ ප්‍රාදේශීය කළමනාකරුවෙකු ලෙස සේවය කර ඇත. එමෙන්ම ඔහු මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, අයවැය අධ්‍යක්ෂ සහ රාජ්‍ය ගිණුම් පිළිබඳ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙසද සේවය කර ඇත. ඔහු මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු ලෙස රජයේ ආයතන කිහිපයකම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කර ඇත.

රජරට සංවර්ධන බැංකුව, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය, රක්නා ලංකා ආරක්ෂක සමාගම, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව, ටවර් හෝල් රඟහල පදනම සහ සැලසිනේ රූපවාහිනී ආයතනය සාලිය මහතා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය නියෝජනය කළ රාජ්‍ය ආයතන කිහිපයකි.

## කේ රවීන්ද්‍රන් මහතා



ස්වාධීන නොවන / විධායක
නොවන අධ්‍යක්ෂ
(2023.10.13) දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස්විය)

රවීන්ද්‍රන් මහතා මේවන විට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශාඛා මෙහෙයුම්, මූල්‍ය හා සැලසුම්, විශ්‍රාම වැටුප් සහ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් අධීක්ෂණය කරමින් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස සේවය කරයි.
බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 24කට වැඩි පළපුරුද්දක් ඇති ඒ මහතා ඉන් වසර 19 කට අධික කාලයක් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සේවය කර ඇත. ඉහත කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දරන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වශයෙන් රාජකාරි භාර ගැනීමට පෙර, ඔහු මූල්‍ය, විගණන සහ පර්යේෂණ සහ සංවර්ධන ක්ෂේත්‍රවල සහකාර සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී යන තනතුරුවල සේවය කර ඇති ඒ මහතා බැංකුවේ අවදානම් කළමනාකරණ කාර්යය අධීක්ෂණය කිරීමේ වගකීමද ඉටුකර ඇත. රවීන්ද්‍රන් මහතා ජාතික ඉතිරිකිරීමේ බැංකුවට සම්බන්ධ වීමට පෙර පීපල්ස් මර්චන්ට් බැංකුවේ ආයතනික මූල්‍ය අංශයේ මූල්‍ය විශ්ලේෂකයෙකු ලෙස සහ (CDIC Sasoon) (Cumberbatch) (Stockbrokers) හි පර්යේෂණ විශ්ලේෂකයෙකු ලෙස ද සේවය කර ඇත.

රවීන්ද්‍රන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කර ඇත. එසේම, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA Sri Lanka) විසින් පවත්වනු ලබන විභාගයේ මූල්‍ය කළමනාකරණය විෂය පිළිබඳ විශිෂ්ට මෙන්ම බහුශ්‍රැත කථිකාචාර්යවරයෙකු ද වේ.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන් ගේ ආයතනයේ (CMA) ආරම්භක (අධිසාමාජික) සාමාජිකයෙකු ද වේ. රවීන්ද්‍රන් මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (විශේෂ) ගෞරව උපාධිධාරියෙකු වන අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් බැංකුකරණය හා මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

දැනට දරන අනෙකුත් තනතුරු

- ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ පාලක මණ්ඩලයේ සාමාජික
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ විකල්ප සාමාජික

# අධ්‍යක්ෂ මණ්ඩලය

## ඩබ්ලිව්.එම් කරුණාරත්න මහතා

ස්වාධීන /විධායක නොවන අධ්‍යක්ෂ
(20221231) දින විශ්‍රාම ගන්නා ලදී)



ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන/විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස (2020.01.03) දින පත් කරන ලදී. බැංකුකරණයේ වසර 30 කට අධික කාලයක පළපුරුද්දක් ඇති කරුණාරත්න මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සහකාර අධිපතිවරයෙකු ද වේ.

ඒ මහතා මුදල් අමාත්‍යාංශය විසින් පරිපාලනය කරන ලද ලෝක බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක වන "ගුදම් කුවිතාන්සි මූල්‍ය ව්‍යාපෘතියේ" උපදේශකවරයෙකු ලෙස ද වසර තුනක කාලයක් සේවය කර ඇත. මීට අමතරව, කරුණාරත්න මහතා අනුරාධපුර ග්‍රාමීය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරී මෙන්ම රුහුණු සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කර ඇත, එපමණක් නොව, ඔහු කැනේඩියානු රජය විසින් අනුග්‍රහය දක්වන ලද අගය දාම සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා අගය දාම මූල්‍ය විශේෂඥයෙකු ලෙස වසර 03 ක කාලයක් සේවය කර ඇත.

ඔහු කණ්ඩායම් ණය දීම සහ ග්‍රාමීය ඉතුරුම් දිරිගැන්වීම පිළිබඳ ග්‍රන්ථ දෙකක්, දරිද්‍රතා ණය දීම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා මූල්‍යකරණය, ආරෝහ වාරිමාර්ග ක්‍රම, ගෙවතු වගාව, කිරි ගව සංවර්ධනය, මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ ග්‍රන්ථ හයක් මෙන්ම ගුදම් කුවිතාන්සි මූල්‍යකරණය පිළිබඳ ග්‍රන්ථයක් ද පළ කර ඇත.

කරුණාරත්න මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිධාරියෙකු වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ නීතිවේදී (ගෞරව) උපාධිධාරියෙකු ද වේ. තවද, කරුණාරත්න මහතා (2002) වසරේ සිට නීතිඥවරයෙකු ලෙස ද කටයුතු කරයි.

## මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව් ආරියරත්න හේරත්

ස්වාධීන/ විධායක නොවන අධ්‍යක්ෂ
(2022.12.31 දින විශ්‍රාම ගන්නා ලදී)



පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී විශේෂ උපාධියක් ලබා ඇති මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් මහතා නෝර්වීජියානු ජීව විද්‍යා විශ්වවිද්‍යාලයෙන් සංවර්ධන හා සම්පත් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ ශාස්ත්‍රපති උපාදියක් සහ පශ්චාත් උපාධි ආයතනයෙන් දර්ශනය පිළිබඳ ආචාර්ය උපාධියක් ද ලබා ඇත.ඒ මහතා සංවර්ධන ආර්ථික විද්‍යාව, මුදල් සහ බැංකුකරණය, ව්‍යාපෘති විශ්ලේෂණය යන ක්ෂේත්‍රවල ප්‍රමුඛ පෙළේ විද්වතෙකු හා පර්යේෂකයෙකුද වේ.

ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සහ අනතුරුව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු ලෙස මෙන්ම මහාචාර්යවරයෙකු ලෙස ද වසර 27 ක පමණ කාලයක් සේවය කර ඇත. මෙම කාලසීමාව තුළ ඔහු පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ (අධ්‍යයන හා සංවර්ධන) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස ද සේවය කර ඇත. වර්තමානයේ ඒ මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි.

උපදේශකවරයෙකු වශයෙන්ද සේවය කර ඇති මහාචාර්ය එච්.එම්. ඩබ්ලිව්. ආරියරත්න හේරත් මහතා (Pathifinder Foundation Colombo¦ Plan International Sri Lanka¦ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල, කුසලතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය, කොළඹ සහ මධ්‍යම පළාත් සභාව වැනි ජාතික හා ජාත්‍යන්තර සංවිධාන රැසක් සඳහා වාර්තා සම්පාදනය කර ඇත.

ඔහු විවිධ ක්ෂේත්‍රයන් අළලා රචනා කරන ලද ශාස්ත්‍රීය කෘති ඇතුළත් ග්‍රන්ථ කිහිපයක් ප්‍රකාශයට පත් කර ඇත. මූලධර්ම සහ ව්‍යාපෘති සැලසුම්කරණය සහ ඇගයීම, ක්ෂුද්‍ර මූල්‍යඃ න්‍යාය සහ ප්‍රායෝගිකත්වය, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට ප්‍රතිචාරාත්මක අයවැයකරණ ක්‍රියාවලිය ඉන් සමහරකි. මහාචාර්ය හේරත් මහතා විසින් විවිධ ජාතික හා ජාත්‍යන්තර නිර්දේශිත සඟරාවල පර්යේෂණ ලිපි රාශියක් ද ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩලය



## ලලිත් අබේසිරිවර්ධන මහතා

ස්වාධීන /විධායක නොවන අධ්‍යක්ෂ
(2023.02.01 දින නැවත පත් කරන ලදී)

ලලිත් අබේසිරිවර්ධන මහතා (2020/01/03) දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරන ලදී. අබේසිරිවර්ධන මහතා (1996) සිට වෘත්තියෙන් නීතිඥවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා ඇත.

වර්තමානයේ අබේසිරිවර්ධන මහතා ලීඩ් බිස්නස් ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්) සමාගම, අර්බන් ෆුඩ්ස් (පුද්) සමාගම, ලීඩ් හාඩ්වෙයාර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම,
වෙරාසෝ හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම, සහ ස්පෙයාර් ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්) සමාගම වැනි පෞද්ගලික ආයතන කිහිපයක අධ්‍යක්ෂ තනතුර දරයි.



## ආචාර්ය නිර්මාල් ද සිල්වා

ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2022.04.04) දින සිට ඉල්ලා අස්විය)

ආචාර්ය නිර්මාල් ද සිල්වා යනු ලොව පුරා දශදෙකකට ආසන්න කාලයක් (C) මට්ටමේ' පළපුරුද්ද ලබා ඇති සම්මානලාභී ව්‍යාපාරික වෘත්තිකයෙකු සහ ව්‍යවසායකයෙකු වන අතර ඔහු බහු ජාතික සහ ෆෝචූන් 500 සමාගම් ගණනාවකට නායකත්වය ලබා දී තිබේ, පසුගිය වසර කිහිපය මුළුල්ලේ ඔහු සිය අවධානය දේපළ වෙළඳාම් කර්මාන්තය, උපායමාර්ග උපදේශනය සහ අලුතින් ආරම්භ කරන ව්‍යාපාර කෙරෙහි යොමු කර ඇත.

ආචාර්ය ද සිල්වා මහතා වර්තමානයේ පැරමවුන්ට් රියල්ටි ආයතනයේ සම-නිර්මාතෘ / ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරයි. උපාය මාර්ග" නායකත්වය" බලපෑම් ආයෝජනය, උපායමාර්ගික බල ක්‍රීඩාව සහ පරිවර්තනීය මැදිහත්වීම් (විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා) සහ සමාජ ව්‍යවසායන් කෙරෙහි අවධානය යොමු කරන ලද උපදේශන සමාගමක් වන (TYNA Consulting) හි සමාරම්භකයාද වේ.

ඊට අමතරව, ආචාර්ය ද සිල්වා මහතා කෘෂිකර්මාන්තය, ආහාර හා පාන, තාක්ෂණය, අත්කම්, අධ්‍යාපනය, ඉගෙනුම් සහ සංවර්ධනය, පහසුකම් කළමනාකරණය, කළඹ ආයෝජන, වෘත්තීය සේවා, ඩිජිටල් විනෝදාස්වාදය, පාරිභෝගික භාණ්ඩ සහ ලයිෆ්ස්ටයිල් සේවා වැනි විවිධ කර්මාන්ත රැසක් නියෝජනය කරන සමාගම් ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරයි.
ඔහු ගෞරවාදරයට පාත්‍ර වූ චින්තන නායකයෙකු පමණක් නොව, බොහෝ දෙනෙකු විසින් සේවා අපේක්ෂා කරන ව්‍යාපාරික උපදේශකයෙකු. බලපෑම් ආයෝජකයෙකු සහ ප්‍රසිද්ධ කථිකයෙකු ද වේ. එපමණක් නොව, ඔහු මෙරට තුළ ආරම්භක ව්‍යාපාර සහ සමාජ ව්‍යවසාය පරිසර හැඩගැස්වීමේ දී වැදගත් බලපෑම් කරන්නෙකු ද වේ.
අධ්‍යයන ක්ෂේත්‍රය තුළ ආචාර්ය ද සිල්වා මහතා දේශීය හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ගණනාවක ආචාර්ය උපාධි වැඩසටහන් සඳහා සහකාර මහාචාර්යවරයෙකු, බාහිර කථිකාචාර්යවරයෙකු සහ නිබන්ධන අධීක්ෂකවරයෙකු ලෙස සේවය ලබා දෙයි.

අනෙකුත් සුදුසුකම්

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය (මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ)
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඕස්ට්‍රේලියාව)
- ව්‍යාපාර කළමනාකරණ උපාධිය (ඕස්ට්‍රේලියාව)
- සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී (ඕස්ට්‍රේලියාව)
- අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (CIM-UK)
- ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඇමෙරිකා එක්සත් ජනපදය)
- අධිසාමාජික - Association Project Management (UK)
- අධිසාමාජික - American Association Project Management (USA).
- වරලත් වෘත්තීය කළමනාකරුවන්ගේ සාමාජික ආයතනය (ශ්‍රී ලංකාව)
- යාවජීව සාමාජික ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM)

# අධ්‍යක්ෂ මණ්ඩලය

## ජී.ඒ. ජයශාන්ත මහතා

ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ ((2023.09.11) දින සිට ඉල්ලා අස්විය)



බැංකු ක්ෂේත්‍රයේ වසර (24) කට වැඩි සේවා පළපුරුද්දක් ඇති ජයශාන්ත මහතා සිය වෘත්තීය ජීවිතයේ ආරම්භයේ දී ශාඛා බැංකුකරණ සේවය නිරත වූ අතර අනතුරුව භාණ්ඩාගාර ගනුදෙනු සහ ප්‍රාථමික අලෙවිකරණ ඒකකය (PDU) වත්කම් සහ වගකීම් කළමනාකරණ ඒකකය (ALM) අවදානම් කළමනාකරණය, ආයතනික ප්‍රතිසාධනය, අක්වෙරළ බැංකුකරණය සහ ශාඛා මෙහෙයුම් යන අංශ පිළිබඳ විශේෂඥතාවක් ලබා ඇත.

1994 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) පළමු පන්තියේ උපාධියක් ලබා ගත් ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. ඊට අමතරව ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ඔහු සතුවේ. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

ජයශාන්ත මහතා විවිධ කළමනාකරණ කමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල සාමාජිකයෙකු / නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරන අතර ඒවායේ දී ප්‍රතිපත්තිමය කරුණු / උපායමාර්ගික තීරණ පිළිබඳ සිය අත්දැකීම් බෙදා ගනී.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන අවදානම් නිලධාරී යන තනතුරුවල රාජකාරි භාර ගැනීමට පෙර ජයශාන්ත මහතා විසින් සහකාර සාමාන්‍යාධිකාරී (ආයතනික ප්‍රතිසාධනය). (අවදානම් කළමනාකරණය), (බස්නාහිර පළාත - දකුණ) සහ (අක්වෙරළ බැංකුකරණය) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (රීටේල් බැන්කිං රෙන්ජ් - (II) යන තනතුරු හොබවන ලදී.

ජයශාන්ත මහතා ශ්‍රී ලංකා මර්චන්ට් බැංකු සහ මූල්‍ය පොදු සමාගම, BOC දේපළ සංවර්ධන සහ කළමනාකරණ (පුද්ගලික) සමාගම, සීබෑන්ක් වත්කම් කළමනාකරණ සමාගම යන ආයතනවල අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරයි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ද වේ.

## හිරන්ති කරුණාරත්න මහත්මිය

ස්වාධීන / විධායක නොවන (2023.09.13 දින සිට ඉල්ලා අස්විය)



1985 ඔක්තෝබර් මාසයේ සිට ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ලෙස සේවය කළ ඇය වසර 36 කට අධික කාලයක් මුළුල්ලේ නීති ක්ෂේත්‍රයේ මනා පළපුරුද්දක් (දේශීය හා ජාත්‍යන්තර) ලබා ඇත.

ඇය සැම්බියා ජනරජයේ නීති අධ්‍යක්ෂවරයාට අනුයුක්තව රාජ්‍ය නීතිඥවරියක් ලෙස සේවය කළ අතර කෙන්යා ජනරජයේ නීතිපති මණ්ඩලයේ (සිවිල් දෙපාර්තමේන්තුවේ) ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නීතිඥවරියක් ලෙස ද සේවය කළාය.

එමෙන්ම, 2003 සිට 2014 දක්වා ඇය පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පොදු සමාගමේ (කුරුණෑගල කලාපයේ) බැංකු නීතිඥ මණ්ඩලයේ සේවය කළාය.

තවද, එම මහත්මිය කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පොදු සමාගමේ බැංකු නීතිඥ මණ්ඩලයේ ද (කුරුණෑගල කලාපය - 2003 සිට 2014 දක්වා, මහනුවර කලාපය - 2014 සිට 2020 දක්වා සහ කොළඹ කලාපය- 2020 සිට) සේවය කළාය.
ඇය සම්පූර්ණ ලිඛිත ලේඛන සමාලෝචනය කිරීමට, නිගමනවලට එළඹීමට සහ නෛතික අධිකාරීන් අතර සම්බන්ධතා ඇති කර ගැනීමට සුවිශේෂී දක්ෂතාවයක් දක්වයි.

තාර්කික ප්‍රවේශයට ප්‍රමුඛත්වය ලබාදී ගැටළු විසඳීමට නිපුණතාවයක් දක්වන ඇය විසින් සංකීර්ණ නීතිමය ලේඛන පිළිබඳ පර්යේෂණ කිරීම සහ විශ්ලේෂණය කිරීම සහ සියලු වර්ගවල නීතිමය ලේඛන සකස් කිරීමේ කාර්යය හැසිරවීම සිදු කරනු ලබන අතර, සන්නිවේදන කාර්යයේදී ප්‍රමුඛ වේ.

ණය ගැනීම සඳහා සුරැකුමක් ලෙස බැංකුවලට ඉදිරිපත් කරනු ලබන දේපළ පිළිබඳ හිමිකම් පරීක්ෂා කිරීම සහ බැංකුවල යහපත පිණිස වන කරුණු සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීම සඳහා ඇය මූලික වශයෙන් සහාය විය. වෘත්තියට සම්බන්ධ ආචාර ධර්ම පිළිබඳ උසස් පරමාදර්ශ පවත්වා ගැනීම සහ පවරා දී ඇති කාර්යය දැඩි කැපවීමකින් කටයුතු කරන අතරම සේවාදායකයින් සමඟ අන්තර් ක්‍රියා කිරීමේදී ඉහළම මට්ටමේ වෘත්තීයභාවය පවත්වාගෙන යාම ඇය තුළින් විද්‍යාමාන වන සුවිශේෂී ලක්ෂණයන්ය.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා



ස්වාධීන නොවන / විධායක නොවන (2022.07.29 දින සිට ඉල්ලා අස්විය)

1991 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට එක්වූ එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. රාජ්‍ය සේවයේ වසර 25 කට වැඩි පළපුරුද්දකින් සපිරි ඒ මහතා අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ගණනාවක විධායක මට්ටමේ තනතුරු කිහිපයක් හොබවා ඇත. ඔහු සිය සේවා කාලය තුළ මහා භාණ්ඩාගාරය යටතේ පවතින රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළ සේවය කර ඇත. තවද, ඒ මහතා මුදල් අමාත්‍යාංශයේ මානව සම්පත් අධ්‍යක්ෂ ජනරාල් ධූරයේ ද කටයුතු කර ඇත.

සමන් ප්‍රනාන්දු මහතා කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජවේදී උපාධිධාරියෙක් වන අතර ඔහු විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ද ලබා ඇත. (2003) දී ඔහු නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දුන් අතර ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ස්ලිට් ආයතනය වෙතින් තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා ඇත.

## වී.කේ. නාරංගොඩ මහත්මිය



ස්වාධීන නොවන / විධායක නොවන (2022.12.22) දින සිට ඉල්ලා අස්විය)

1987 වර්ෂයේදී කළමනාකරණ අභ්‍යාසලාභිනියක් ලෙස මහජන බැංකුවට සම්බන්ධ වූ ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය බැංකු ක්ෂේත්‍රයේ වසර 35 කට වැඩි සේවා කාලයක් සපුරා ඇත. ඇය විවිධ කළමනාකරණ හැකියාවන් සහිතව ශාඛා බැංකුකරණය, විදේශීය පාරිභෝගික සේවා, විදේශ වෙරළ බැංකුකරණය සහ ආයතනික බැංකුකරණය යන ක්ෂේත්‍ර ආවරණය කළ අතර වර්තමානයේ වාණිජ ණය, වාණිජ බැංකුකරණය, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර, සංවර්ධන මූල්‍ය සහ ක්ෂුද්‍ර මූල්‍ය යන ක්ෂේත්‍ර ආවරණය කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ධූරයේ සිය රාජකාරී ඉටු කරයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ගෞරව උපාධියක් (ව්‍යාපාර පරිපාලනවේදී දෙවන පෙළ ඉහළ) සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයෙන් ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. තවද, එතුමිය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවක් ද වේ. ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය පිළිබඳ උසස් සහතිකයක් ද ලබා ගත්තාය.

බැංකුකරණ ක්ෂේත්‍රයේ සිය වෘත්තීය ජීවිතය තුළ ඇය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විවිධ බැංකු/කළමනාකරණ වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. ඇය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරියක් වශයෙන් පත් කරන ලද අතර ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ලියාපදිංචි පරීක්ෂකවරියක්ද වේ.

# අධ්‍යක්ෂ මණ්ඩලය

## ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා

ස්වාධීන නොවන /
විධායක නොවන
(2023.09.27 දින සිට ඉල්ලා අස්විය)



ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ වසර 36 කට වැඩි පළපුරුද්දක් සහිත රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු වන ඩබ්ලිව්.ඒ සරත් කුමාර මහතා 2022 අගෝස්තු 01 වන දින භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ධූරයේ සිය රාජකාරී භාර ගත්තේය.

ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය සහ තක්සේරුකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයෙන් (SLIDA) රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් (ශාස්ත්‍රපති) උපාධියක් ලබා ඇත. ඔහු පසුගිය වසර පහ පුරාවට ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ජ්‍යෙෂ්ඨත්ව ලැයිස්තුවේ පළමුවැන්නා ද වූ අතර වර්තමානයේ එම සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් හොබවයි.

1986 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බැඳුණු ඒ මහතා දශක තුනකට අධික කාලයක් වූ තම සේවා කාලය තුළ විවිධ තනතුරුවල රාජකාරී ඉටු කළේය. සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී සහ නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් (මූල්‍ය) ලෙස සේවය කළ ඔහු පසුව 2005 දී විදේශ කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන විමර්ශන සහ අයවැය පාලන අධ්‍යක්ෂ ධූරයට පත් වූ අතර එහිදී ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල කළමනාකරණය, පරිපාලනය සහ අධීක්ෂණ අංශ හසුරුවමින් සිය රාජකාරී ඉටු කළේය. ඉන්පසු ඔහු 2008 සිට 2012 දක්වා රියාද්-සෞදි අරාබි තානාපති කාර්යාලයේ අමාත්‍ය, නියෝජ්‍ය තානාපති සහ භාරකාර කටයුතු නිලධාරී ලෙස කටයුතු කළේය.

රාජ්‍ය තාන්ත්‍රික සේවාවන්හි වසර පහක සේවයෙන් අනතුරුව, සරත් කුමාර මහතා 2013 දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස සේවය කළ අතර (2014) වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී ලෙස ධූරයේ රාජකාරී ආරම්භ කළේය.

භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තනතුරට නිදහස් වීමට පෙර, ඔහු අග්‍රාමාත්‍ය කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරේ වසර 7 කට අධික කාලයක් සේවය කළේය.

දශක තුනකට අධික කාලයක් ගණකාධිකාරී සේවයේ නියැලී සිටින සරත් කුමාර මහතා, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය සහ ගිණුම්කරණය, වාර්ෂික අයවැයකරණය, මුදල් ප්‍රවාහ ප්‍රකාශන කළමනාකරණය මෙන්ම පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්පාදනය කිරීම යන ක්ෂේත්‍රවල සුවිශේෂී අත්දැකීම් ලබා ඇති අතර, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ විධායක තනතුරු ද හොබවා ඇත.

වෘත්තීය ජීවිතය තුළ ඔහු විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති රාශියක මූල්‍ය විශේෂඥයෙකු ලෙස රාජකාරී ඉටු කර ඇති අතර, විවිධ අමාත්‍යාංශවල අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවල (CAPC) සාමාජිකයෙකු ද විය. එමෙන්ම, ඔහු විවිධ තනතුරු හොබවමින් බොහෝ පාලක මණ්ඩලවල ද සේවය කර ඇත.

# ආයතනික කළමනාකරණ කණ්ඩායම



## පී.එස්. එදිරිසූරිය මහතා

**සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (වැඩ ආවරණ) සහ ප්‍රධාන මූල්‍ය නිලධාරී**

එදිරිසූරිය මහතා (1992) දී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් හිමිකර ගෙන ඇත. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජිකත්වය දරන ඒ මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. එදිරිසූරිය මහතා අර්නස්ට් ඇන්ඩ් යන්ග්, ජාතික සංවර්ධන බැංකුව සහ සෙලාන් බැංකුව ඇතුළු ප්‍රමුඛ ආයතනවල විගණනය, ගිණුම්කරණය, බදුකරණය, කළමනාකරණ උපදේශන සහ බැංකුකරණය සහ මූල්‍ය යන ක්ෂේත්‍රවල වසර 32 කට වැඩි කාලයක වෘත්තීය පළපුරුද්දක් ලබා ඇත. ඒ මහතා (2017) ජනවාරි මාසයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක් විය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරට පත්වීමට පෙර එතුමා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිලධාරී, අනුකූලතා නිලධාරී සහ වැඩබලන සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී යන තනතුරු හොබවා ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරට අමතරව, 2022 සැප්තැම්බර් 05 වන දින සිට ඔහු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී තනතුරේ රාජකාරි සහ වගකීම් ආවරණය කිරීම සඳහා පත් කරන ලදී.



## ඩී.එම්.ටී.එස්. කුමාර මහතා

**අංශ ප්‍රධානී අයකිරීම්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ බැංකු සහාය සේවා (වැඩ ආවරණ)**

කුමාර මහතා බැංකු ක්ෂේත්‍රයේ වසර (31) කට අධික පළපුරුද්දක් ඇති වෘත්තිකයෙකි. 1991 වර්ෂයේ දී බැංකුවේ සේවයට (මින් පෙර පොළොන්නරුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව යනුවෙන් හැඳින්වූ) සම්බන්ධ වූ ඔහු බැංකු සහකාර, කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ ඌව සහ වයඹ පළාත්වල ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන තනතුරුවල ද සේවය කර තිබේ. ඒ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය සාර්ථකව සම්පූර්ණ කර ඇති අතර කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධියක් ද හිමිකරගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙන් අන්තර්මධ්‍ය විභාගයද සමත් වී ඇත.



## ඒ.එච්.එම්.ජී. අබේරත්න මහතා

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ණය සහ විශේෂ ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම්**

ඒ.එච්.එම්.ජී අබේරත්න මහතා (1986) දී කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී විශේෂ උපාධියක් ලබා ඇත. එමෙන්ම ඒ මහතා (2016) වර්ෂයේ දී වයඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය සාර්ථකව සම්පූර්ණ කර ඇත. ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද ක්ෂුද්‍ර මූල්‍ය පාඨමාලාව සාර්ථකව නිම කර තිබේ.

වර්ෂ 1987 දී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට එක් වූ ඒ මහතා ශාඛා කළමනාකරු, ප්‍රධාන කළමනාකරු, සහකාර සාමාන්‍යාධිකාරී සහ සබරගමුව සහ උතුරු මැද පළාත්වල ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී යන තනතුරුවල සේවය කර ඇත. මේවන විට ඔහු බැංකු ක්ෂේත්‍රයේ වසර 35 කට වැඩි පළපුරුද්දක් ලබා තිබේ.

# ආයතනික කළමනාකරණ මණ්ඩලය



## ඩී.කේ.එස්. සේරසිංහ මහතා

ප්‍රධාන මානව සම්පත් නිලධාරී

1999 වර්ෂයේ සිට මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර (21) කට වැඩි පළපුරුද්දක් සහිත ක්‍රිෂාන්ත සංජීව සේරසිංහ මහතා, (2021) ජනවාරි මාසයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සේවයට එක් විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇති ඒ මහතා එම විශ්ව විද්‍යාලයෙන්ම කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධියක් ද ලබා ඇත. තවද, ඔහු ජපානයේ ටෝකියෝ හි සමස්ත තත්ත්ව කළමනාකරණය ඔස්සේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ අධිසාමාජිකත්ව වැඩසටහන සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත. ක්‍රිෂාන්ත මහතා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනික සහ මධ්‍යම කළමනාකරණ තනතුරුවලින් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය.

2014/2015 දී ඔහු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-මානව සම්පත් සංවර්ධන ලෙස සේවය කර තිබේ.



## ඊ.ඒ.ඩී. ජනිත ප්‍රියශාන්ත මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජිකයෙකු වන ප්‍රියශාන්ත මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු සහ ඕස්ට්‍රේලියාවේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකුද වේ. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ්‍යවේදී විශේෂ දෙවන පෙළ ඉහළ උපාධියක් ලබා ඇත.

ඒ මහතා මහජන බැංකුවේ සහ රාජ්‍ය අංශයේ ආයතනවල බැංකු මූල්‍ය සහ විගණනය පිළිබඳ වසර (30) කට වැඩි පළපුරුද්දක් ලබා ඇත.

ජනිත ප්‍රියශාන්ත මහතා (2022) ජූනි මාසයේ සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක් විය.

# ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් /ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්

## ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන්



1. ජී.ඩී.එස්. ද සිල්වා මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරී - ණය පරිපාලන
විද්‍යාවේදී ව්‍යාපාර පරිපාලන (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර

## ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරුන්



1. ආර්.එම්.ආර්. රත්දෙණිය මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - වයඹ පළාත

- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිය
- බැංකු හා මූල්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



2. බී.ජී.ඩබ්ලිව්.ඒ. කුමාර මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - ඌව පළාත
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - නැගෙනහිර පළාත (වැඩ ආවරණ)

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
- කැලණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්ව



3. එම්.එම්.එම්.එස්. ආනන්ද මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - උතුරු මැද පළාත

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය



4.එම්.ඒ. ඥානරත්න මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - දකුණු පළාත

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



5. කේ.සී.ඩී. ධර්මප්‍රිය මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - මධ්‍යම පළාත

- ශාස්ත්‍රවේදී උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ ආශ්‍රිත සාමාජික



6.ජී.එම්.බී.සී. ද සිල්වා මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - ඌව පළාත

- වාණිජවේදී උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජිකත්වය
- බැංකු සහ මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
- ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව



7 පී.එච්. විජේතිලක මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී - සබරමුව පළාත

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය
- විද්‍යාවේදී (දේපළ කළමනාකරණ සහ තක්සේරුකරණ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වයී



8 සී.එල්.සී මුතුබණ්ඩා මහතා
ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී-නැගෙනහිර පළාත

- ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ) උපාධිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය

# ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් / ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී-වරුන්

## අංශ ප්‍රධානීන්



විජේරත්න මිය

සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතා

- ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය -පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- ව්‍යවහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



2. එච්.එම්.එන්.එම් හේරත් මිය

සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණ

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - වයඹ විශ්ව විද්‍යාලය.
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ආශ්‍රිත සාමාජික
- ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අධි සාමාජික
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධිසාමාජික
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ භාණ්ඩාගාර සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව



3. ආර්.එම්.ටී රාජපක්ෂ මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

- නීතිවේදී උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
- මානව හිමිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ
- ප්‍රසිද්ධ නොතාරිස්
- සමාගම් ලේකම්



4. ඒ.ආර්.ආර් පියසේකර මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී - නීති

- නීතිඥ
- ලියාපදිංචි සමාගම් ලේකම්
- ප්‍රසිද්ධ නොතාරිස් සහ දිවුරුම් කොමසාරිස්
- නීතිපති උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය
- විද්‍යාපති උපාධිය- මොරටුව විශ්වවිද්‍යාලය
- කම්කරු අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිවේදී උපාධිය (විශේෂ) - කොළඹ විශ්වවිද්‍යාලය
- අනුකූලතා ඩිප්ලෝමාව- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ආයතනික බැංකුකරණය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- වරලත් සාමාජික - ශ්‍රී ලංකා වරලත් ක්‍රමෝපාය හා ප්‍රවාහන ආයතනය
- යාවජීව සාමාජික - ශ්‍රී ලංකාවේ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය

# සහකාර සාමාන්‍යාධිකාරීවරුන්



1 ඩී.එස්.පී.සී හඳුන්හේවා මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් සහ බැංකු සහාය සේවා

- ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය

- CBF - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



2 පී.එස්.ටී. රණතුංග මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - ණය

- ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්වවිද්‍යාලය
- ශාස්ත්‍රපති උපාධිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



3. කේ.බී. විජේරත්න මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - මධ්‍යම පළාත

- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ (විශේෂ) උපාධිය- රජරට විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය
- අන්තර්මධ්‍ය විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය



4. ඩබ්ලිව්.පී.එම්.කේ. දසන්ත මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු

- මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ඉංජිනේරු) - ගෞරව උපාධිය
- තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉදිකිරීම් කළමනාකරණය)- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
- ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය - කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආයතනික සාමාජික සහ වරලත් ඉංජිනේරු
- ශ්‍රී ලංකා ව්‍යුහාත්මක ඉංජිනේරු සංගමයේ ආශ්‍රිත සාමාජික
- වරලත් ක්‍රමෝපාය සහ ප්‍රවාහන ආයතනය (එක්සත් රාජධානිය) වරලත් සාමාජික



5 මේජර් ජෙනරාල් ජගත් පක්ෂවීර

ප්‍රධාන ආරක්ෂක නිලධාරී RSP, VSV, USP (විශ්‍රාමික)



6 ඩබ්ලිව්.එම්.අයි.කේ. අබේරත්න මිය

සහකාර සාමාන්‍යාධිකාරී ප්‍රසම්පාදන

- විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධිය- පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- රාජ්‍ය ප්‍රසම්පාදන කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය



7 එච්.එම්.පී.ජී.ජී.යූ. බණ්ඩාර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී- ඌව පළාත

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව- රජරට විශ්වවිද්‍යාලය



### 8. ආර්.එම්.ඩී.එස්.පී. මහානාම මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - බස්නාහිර පළාත

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව- පේරාදෙණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- අලෙවිකරණ ආයතනයේ ආශ්‍රිත සාමාජික



### 9. ආචාර්ය ඒ.එස්.කේ.බී. රත්නායක

සහකාර සාමාන්‍යාධිකාරී -තොරතුරු තාක්ෂණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණ

- විද්‍යාවේදී - MIS - අයර්ලන්ත ජාතික විශ්වවිද්‍යාලය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය -ලීඩ්ස් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය
- ආචාර්ය උපාධිය - ඇල්ඩර්ස්ගේට් විද්‍යාලය



### 10. එම්.ඩී.ජී. කරුණාරත්න මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - තොරතුරු තාක්ෂණ

- විද්‍යාවේදී උපාධිය- කැලණිය විශ්වවිද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



### 11. එස්.ජී.ජී. ලක්ෂ්මි මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
- බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය
- ආවසරික මට්ටමේ විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය



### 12. කේ.ඩී.එච්.ඒ. ද සිල්වා මහතා

- ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව
- බැංකු හා මූල්‍ය පිළිබඳ ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ආසියානු විශ්ව විද්‍යාලය, මැලේසියාව
- කෙටුම්පත් ශිල්පය පිළිබඳ ජාතික සහතිකපත්‍ර පාඨමාලාව - ශ්‍රී ලංකා තාක්ෂණික විද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජික



### 13. පී.ජී.ඩී.එස්. පෙරේරා මහත්මිය

සහකාර සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සංවර්ධන සහ සේවා

- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික
- බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි විධායක ඩිප්ලෝමාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



### 14. බී.ඩබ්ලිව්.එම්.ඒ.එන්. ඩබ්ලිව් කුමාරසිරි මහතා

සහකාර සාමාන්‍යාධිකාරී -විමර්ශන

- වාණිජවේදී (විශේෂ) උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය
- ණය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව- ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනය
- සහතිකලත් රජයේ විගණන වෘත්තික පුහුණුකරු සහ උපදේශක



## 15. එල්.ඒ.ආර්. ප්‍රනාන්දු මහතා

සහකාර සාමාන්‍යාධිකාරී -අලෙවිකරණය

- ශාස්ත්‍රවේදී උපාධිය- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය- කොළඹ විශ්ව විද්‍යාලය
- ශාස්ත්‍රපති උපාධිය (ජන සන්නිවේදනය) - කැලණිය විශ්ව විද්‍යාලය
- ලේඛකත්වය සහ සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව- ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජික



## 16. ඩබ්ලිව්.යූ.එස්. අබේසිංහ මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - සබරගමුව පළාත

- රාජ්‍ය පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය



## 17. ඊ.පී. රංජිත් කුමාර මහතා

සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන

- වාණිජවේදී (විශේෂ) උපාධිය - කැලණිය විශ්වවිද්‍යාලය

- ව්‍යාහාරික බැංකු සහ මූල්‍ය අන්තර් පාඨමාලාව - ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය



# කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය


මූල්‍ය සමාලෝචනය ........ 36

පාරිභෝගික සහ සබඳතා සමාලෝචනය ........ 40

තොරතුරු තාක්ෂණ සමාලෝචනය ........ 43

අලෙවිකරණ සමාලෝචනය ........ 44

සමාජ සහ පාරිසරික සමාලෝචනය ........ 49

සේවක සමාලෝචනය ........ 51

විශේෂ අවස්ථා ........ 53

වෙනත් අවස්ථා ........ 56

අවදානම් කළමනාකරණය ........ 60

# මූල්‍ය සමාලෝචනය

සංවර්ධනය සඳහාම කැප වූ මූල්‍ය ආයතනයක් වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මෙරට සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාකාරකම් නඟා සිටුවීම සඳහා නිරතුරුව, ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය සේවා සම්පාදකයෙකු වශයෙන් අප බැංකුව දිවයිනේ බොහෝ සංවර්ධන වැඩසටහන්වල පෙරමුණේ රැඳී සිටිමින් අනුපමේය මෙහෙයක් ඉටු කරයි. වර්තමානයේ බොහෝ මූල්‍ය ආයතන ක්‍රියාකාරීව සේවා ලබා දීමට මැලිකමක් දක්වන ආර්ථිකයේ  සංවේදී හා නවීන අංශවලට සේවා ලබා දෙමින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව දිවයිනේ ප්‍රාදේශීය සංවර්ධනය උදෙසා උරදෙන අද්විතීය මූල්‍ය ආයතනයක් ලෙස ඉස්මතු වී ඇත අප සතු ප්‍රධාන වත්කම වන්නේ උතුරු හා නැගෙනහිර පළාත්ද ඇතුළුව මෙරට පුරා විසිරී සිටින මිලියන හයකට අධික අපගේ පාරිභෝගික පදනමයි. අප රට සහ එහි ජනතාවගේ සංවර්ධනය කිරීම අප බැංකුවේ ප්‍රධාන අරමුණයි. එබැවින්, ඔවුන් සවිබල ගැන්වීම තුළින් ශාඛා 272 කින් යුත් අපගේ දීප ව්‍යාප්ත ශාඛා ජාලය හරහා ජාතිය සංවර්ධනය වෙනුවෙන් බැංකුව කැපවී සිටී.

## ලාභදායිතාවය

පූර්ව වර්ෂයට සාපේක්ෂව බැංකුවේ බදුවලට පසු ලාභය 340.54% කින් ඉහළ ගොස් ඇත. 2022 වසරේදී බැංකුවේ මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 1,998 දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2021 වර්ෂයේදී වාර්තාවූ රුපියල් මිලියන 1,926 ක මෙහෙයුම් ලාභයට වඩා 3.70%ක වැඩිවීමකි 2021 වර්ෂයේ දී 0.78% ක් ලෙස වාර්තා වූ බදුවලට පෙර වත්කම්. මත ප්‍රතිලාභය සමාලෝචිත වර්ෂයේදී 0.47% ක් ලෙස වාර්තා වී ඇත. එසේම, 2022 දෙසැම්බර් 31 වන විට බැංකුවේ මුළු වත්කම් වටිනාකම රුපියල් බිලියන 285 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා 16.07% ක වර්ධනයකි.

අයවැයට සාපේක්ෂව ලාභය

| අයිතමය | තථ්‍ය රු.000 | අයවැයගත රු.000 | වෙනස |
|---|---|---|---|
| දළ ආදායම | 36,202,705 | 32,713,897 | 10.7% |
| මෙහෙයුම් ලාභය | 1,998,116 | 5,649,666 | -64.6% |
| බදුවලට පසු ලාභය | 1,349,395 | 2,059,285 | -34.5% |



## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය

2022 වසර තුළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය මඳ වශයෙන් වර්ධනය වී ඇත.

| අයිතමය | 2022 රු.000 | | | | 2021 දෙසැ. 31 රු.000 |
|---|---|---|---|---|---|
| | දෙසැ.31 | සැප්.30 | ජූනි.30 | මාර්.31 | |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 13,355,357 | 9,939,538 | 6,438,480 | 3,321,852 | 11,030,507 |
| බදුවලට පෙර ලාභය | 359,115 | 884,482 | 652,393 | 442,532 | 1,926,781 |
| බදුවලට පසු ලාභය/(අලාභය) | 1,349,394 | 241,378 | 208,151 | 212,039 | 306,302 |
| ණය හා ලැබිය යුතු දෑ | 198,008,145 | 197,167,550 | 190,010,530 | 183,039,517 | 189,039,666 |
| ගනුදෙනුකරුවන්ගේ තැන්පතු | 210,301,323 | 207,365,025 | 204,908,444 | 190,694,583 | 187,752,465 |
| මුළු වත්කම් | 285,395,150 | 284,091,435 | 272,363,082 | 258,438,595 | 245,889,512 |
| කොටස් හිමි අරමුදල | 16,226,127 | 15,634,702 | 15,601,475 | 17,708,727 | 15,393,322 |

### ආදායම

බැංකුවේ මුළු ආදායම රුපියල් බිලියන 24.49 සිට රුපියල් බිලියන 36.20 ක් දක්වා 47.81%ක සැලකිය යුතු ප්‍රමාණයකින් වර්ධනය වී ඇත. රටේ පැවති දුෂ්කර ආර්ථික තත්ත්වය මධ්‍යයේ වුවද, බැංකුවේ මුළු ආදායම පෙර මූල්‍ය වර්ෂයට වඩා වර්ධනයක් අත්පත් කර ගන්නා ලදී.

### ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

2022 මූල්‍ය වර්ෂය තුළ ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම 27.55% පහත වැටුණි. එය 2021 මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 623 ක ප්‍රමාණය හා සැසඳීමේ දී රුපියල් මිලියන 451ක් දක්වා අඩු විය.




### මුළු ආදායමේ සංයුතිය

| අයිතමය | 2022 රු.000 | 2021 රු.000 | වෙනස |
|---|---|---|---|
| පොළී ආදායම | 35,273,433 | 23,545,299 | 49.81% |
| ගාස්තු හා කොමිස් ආදායම | 806,548 | 935,136 | -13.75% |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 122,768 | 12,332 | 895.52% |
| මුළු ආදායම | 36,202,768 | 24,492,767 | 47.81% |

### ශුද්ධ පොලී ආදායම (NII)

2022 මූල්‍ය වර්ෂයේදී ශුද්ධ පොලී ආදායම රුපියල් මිලියන 13,652 සිට රුපියල් මිලියන 15,634 දක්වා වැඩිවෙමින් 14.52% ක වර්ධනයක් වාර්තා කරන ලදී.




### බදුකරණය

| අයිතමය | 2022 රු.000 | 2021 රු.000 | වෙනස |
|---|---|---|---|
| මූල්‍ය සේවා මත වැට් බදු | 1,561,475 | 1,151,277 | 35.6% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 77,526 | - | - |
| ආදායම් බදු | (990,279) | 469,201 | - 311.1% |
| මුළු බදු වියදම් එකතුව | 648,722 | 1,620,479 | -60.0% |

2022 මූල්‍ය වර්ෂය තුළ බැංකුව මූල්‍ය කටයුතු සඳහා එකතු කළ අගය මත බද්ද වශයෙන් රුපියල් මිලියන 1,561 ක් සහ ආදායම් බදු ප්‍රතිවර්තනය වශයෙන් රුපියල් මිලියන 990 ක් ගෙවා ඇත. වසර තුළ බදු ලෙස රුපියල් මිලියන 648 ක් වැය කර ඇත.

# මූල්‍ය සමාලෝචනය

## වත්කම් මත ප්‍රතිලාභය (ROA)

2021 මූල්‍ය වර්ෂයේදී වත්කම් මත ප්‍රතිලාභ මෙහෙයුම් ලාභ 0.78% ක් ලෙස වාර්තා කළද, 2022 මූල්‍ය වර්ෂයේදී එය 0.47% ක් ලෙස වාර්තා කර ඇත.




## කොටස්හිමියන්ගේ මුළු හිමිකම් වටිනාකම

2021 වසරේදී රුපියල් මිලියන 15,393 ක් ලෙස වාර්තා වූ බැංකුවේ මුළු කොටස් හිමියන්ගේ හිමිකම් වටිනාකම 2022 වසරේදී රුපියල් මිලියන 16,226 ක් ලෙස වාර්තා විය.




## ස්කන්ධය මත ප්‍රතිලාභය

2022 මූල්‍ය වර්ෂයේදී බදුවලට පසු ලාභය රුපියල් මිලියන 1,043 කින් වැඩිවීම හේතුවෙන් ගතවූ මූල්‍ය වර්ෂය හා සැසඳීමේදී ස්කන්ධය මත ප්‍රතිලාභය 1,99% සිට 8,54% දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත.




## වත්කම්වල ගුණාත්මකභාවය

ගතවූ වසර අවසානයේ දී 8.71% ක් ලෙස පැවති බැංකුවේ අක්‍රිය ණය අනුපාතය 2022 දෙසැම්බර් 31 වන දින වන විට 8.46%ක් දක්වා මඳ වශයෙන් පහත බැස ඇත.




## මුළු වත්කම්

ගතවූ වසරට සාපේක්ෂව 2022 මූල්‍ය වර්ෂය අවසානයේදී මුළු වත්කම්වල 16,07% ක වර්ධනයක් බැංකුව විසින් වාර්තා කරන ලදී. ඒ අනුව, මූල්‍ය වර්ෂය තුළ මුළු වත්කම් පදනමේ වටිනාකම රුපියල් බිලියන 245 සිට රුපියල් බිලියන 285 දක්වා වර්ධනය විය. 2022 වසර තුළ රටේ පැවැති දුෂ්කර වාතාවරණය මධ්‍යයේ වුවද, බැංකුව සිය ද්‍රවශීලතා මට්ටම් නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් පවත්වා ගෙන යාමට සමත් වී ඇත.

2022 වසර පුරා රටේ පැවති අවිනිශ්චිත තත්ත්වය මධ්‍යයේ වුවද, බැංකුව සිය ද්‍රවශීලතා මට්ටම් නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් පවත්වා ගෙන ගොස් ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම් වර්ගීකරණය මත පදනම්ව, බැංකුවේ අක්‍රීය ණය පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ.

අක්‍රිය ණය සංයුතිය




## ද්‍රවශීලතාවය

| අයිතමය | 2022 | 2021 |
|---|---|---|
| **ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (SLAR)** | **27.83%** | 26.18% |

# පාරිභෝගික සහ සබඳතා සමාලෝචනය

## ණය හා අත්තිකාරම් වර්ධනය




## ණය හා අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව

| කාණ්ඩය | 2022 රු.මි. | 2021 රු.මි. |
|---|---|---|
| කෘෂි හා ධීවර කර්මාන්තය | 77,426 | 51,315 |
| නිෂ්පාදන | 30,675 | 28,605 |
| කල්බදු | 1,382 | 969 |
| ප්‍රවාහන | 76 | 78 |
| ඉදිකිරීම්/නිවාස | 19,646 | 24,484 |
| වෙළඳුන් | 30,800 | 31,526 |
| පාරිභෝජන/තැන්පතුවලට එදිරිව/කායර් මණ්ඩල/සංචාරක | 55,368 | 52,062 |
| එකතුව | 215,373 | 189,040 |

## ණය හා අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදිතය අනුව

| කාණ්ඩය | 2022 රු.මි. | 2021 රු.මි. |
|---|---|---|
| උකස් | 42,234 | 20,174 |
| කායර් මණ්ඩල ණය | 5,501 | 4,615 |
| කල්බදු | 1,398 | 969 |
| කෙටි කාලීන | 13,717 | 9,989 |
| දිගු කාලීන | 152,523 | 153,292 |
| එකතුව | 215,373 | 189,040 |

## ණය හා අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - කර්මාන්තය අනුව




## ණය හා අත්තිකාරම් කළඹ විශ්ලේෂණය - නිෂ්පාදිතය අනුව




## අයකරගැනීම්

2022 වසර අවසානයේ මුළු කළඹෙන් 8,46% ක් පමණ වූ බැංකුවේ අක්‍රීය ණය කළඹ කළමනාකරණය කිරීම පිළිබඳව 2022 වර්ෂයේදී බැංකුව විසින් විශේෂ අවධානයක් යොමු කරන ලදී, එලෙස බැංකුව විසින් ගන්නා ලද විශේෂ ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් ලෙස, රටේ ආර්ථික තත්ත්වයෙහි දැඩි අස්ථාවරත්වය හේතුවෙන් ඇති වූ පීඩනය යුහුසුළුව කළමනාකරණය කිරීමට බැංකුව සමත් විය. ඒ අනුව. ණය කළඹෙහි සුළු වර්ධනයක් ද අත්කර ගනිමින් 2022 දෙසැම්බර් 31 වන දින වන විට අක්‍රීය ණය අනුපාතය 8,46% ක් ලෙස පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

| අක්‍රිය ණය කාණ්ඩය | 2022 රු.මි. | 2021 රු.මි. |
|---|---|---|
| විශේෂයෙන් සඳහන් කළ ණය | 2,471 | 1,230 |
| අවප්‍රමාණ | 1,501 | 3,367 |
| අඩමාන | 2,183 | 2,223 |
| පාඩු | 11,662 | 9,501 |
| මුළු අක්‍රිය ණය | 17,817 | 16,322 |
| අක්‍රිය ණය අනුපාතිකය (%) | 8,46% | 8.71% |

## තැන්පතු වර්ධනය

බැංකුවේ තැන්පතු පදනම රුපියල් බිලියන 210 දක්වා ඉහළ ගොස් ඇති අතර එය ගතවූ වසරට සාපේක්ෂව 12,01% ක වර්ධනයකි. ස්ථාවර තැන්පතු 25%කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධානතම හේතුව  වූ අතර ඉතිරිකිරීමේ තැන්පතු 9% කින් අඩු වී තිබුණි.




## තැන්පතු මිශ්‍රණය

| තැන්පතු වගර්ය | 2022<br>රු.මි. | 2021<br>රු.මි. |
|---|---|---|
| ඉතුරුම් තැන්පතු | 65,852 | 72,159 |
| ස්ථාවර තැන්පතු | 144,449 | 115,593 |
| එකතුව | 210,301 | 187,752 |

තැන්පතු කළඹ විශ්ලේෂණය - නිෂ්පාදනය අනුව




## ණය සහ ණය අයකිරීම්

ණය වූ කලී සිය අරමුණ සපුරාලීම සඳහා බැංකුව විසින් භාවිතා කරන වැදගත්ම කාර්යය සහ මෙවලම වේ. කෘෂිකර්මාන්තය, කුඩා කර්මාන්ත, ධීවර කර්මාන්තය, සත්ව පාලනය, නිවාස සහ සේවා අංශ වැනි ආර්ථිකයේ වැදගත් අංශ දිරිමත් කරමින් ඒ හරහා මෙම අංශ ජාතික ආදායමට ලබා දෙන දායකත්වය වැඩි දියුණු කිරීම සඳහා ණය භාවිතා කළ හැකිය. අප බැංකුවේ කැපී පෙනෙන සුවිශේෂී කාරණයක් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල පවතින එහි පුළුල් ව්‍යාප්තියයි. එය 1985 දී ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ආරම්භයේ සිටම අඛණ්ඩව පවත්වාගෙන යන තත්ත්වයකි.

එබැවින් ණය ලබාදීම ද ඇතුළුව, බැංකුව සිය සියලුම ක්‍රියාකාරකම්වල දී අදාළ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගයක් ක්‍රියාත්මක කර ඇත. ණය සඳහා සහනදායී පොලී අනුපාත, පහසු ඇප අවශ්‍යතා, සහන කාල සීමාවන් සමඟ පහසු නැවත ගෙවීමේ සැලසුම් ආදිය හඳුන්වාදී අවශ්‍යතා ඇති අංශවලට ගැළපෙන පරිදි ණය පහසුකම්වල නියමයන් හා කොන්දේසි සැලසුම් කර තිබේ. ඊට අමතරව, ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුව, කළමනාකරණය සහ අලෙවිකරණය පිළිබඳ උපදේශන සේවා වැනි ණය සහ පහසුකම්වලට අමතර සේවා ද බැංකුව විසින් සපයන ලදී. ණය දීමේ අවදානම අඩු කිරීමට සහ එමඟින් ණය දීම සඳහා සුරකුම් මත රඳා පැවතීමට සිදුවීමේ අවශ්‍යතාවය අඩු කිරීමට ද මෙම අමතර සේවා උපකාරී වේ.

ඊට අමතරව, ණය සහ අයකිරීම් යටතේ බැංකු රක්ෂණ ඒකකය ලෙස හැඳින්වෙන ඉතා ලාභදායී ඒකකයක් ක්‍රියාත්මක වේ. (2022) වසර තුළ බැංකුව විසින් ලබා දුන් ණයවලට අදාළ රක්ෂණ ක්‍රියාකාරකම් මෙහෙයවීමෙන් බැංකුව විසින් අඛණ්ඩව කොමිස් ආදායම් උත්පාදනය කරන ලදී. කොමිස් මුදල් පිළිබඳ විස්තර පහත පිරිදි වේ.

| අනු අංකය | රක්ෂණ සමාගම | 2022.1.01. සිට 2022.12.31 දක්වා | % |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලංකා රක්ෂණ (ජීවිත) | 36,695.91 | 0.12% |
| 2. | ශ්‍රී ලංකා රක්ෂණ (සාමාන්‍ය) | 1,199,994.89 | 3.80% |
| 3. | සණස (ජීවිත) | 1,036,998.60 | 3.28% |
| 4. | සණස (සාමාන්‍ය) | 548,757.55 | 1.74% |
| 5. | සමූපකාර | 3,633,811.89 | 11.50% |
| 6. | සෙලින්කෝ (ජීවිත) | 1,414,553.95 | 4.48% |
| 7. | සෙලින්කෝ (සාමාන්‍ය) | 2,058,279.91 | 6.52% |
| 8. | අලියන්ස් (ජීවිත) | 933,062.48 | 2.95% |
| 9. | අලියන්ස් (සාමාන්‍ය) | 291,585.93 | 0.92% |
| 10 | සොෆ්ට් ලොජික් (ජීවිත) | 13,795,564.69 | 43.68% |
| 11 | ඇග්‍රිරියන් | 0.00 | 0.00 |
| 12 | පීපල්ස් | 1,141,090.19 | 3.61% |
| 13 | එල්ඕඑල්සී (ජීවිත) | 3,367,549.60 | 10.66% |
| 14 | එල්ඕඑල්සී (සාමාන්‍ය) | 726,661.50 | 2.30% |
| 15 | ජනශක්ති (ජීවිත) | 293,249.68 | 0.93% |
| 16 | ෆෙයා ෆස්ට් | 209,340.98 | 0.66% |
| 17 | ආපරීකෝ | 896,223.50 | 2.84% |
| | එකතුව | 31,586,637.39 | 100.00% |

# පාරිභෝගික සහ සබඳතා සමාලෝචනය

## ප්‍රතිමූල්‍ය සහ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම

ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, කර්මාන්ත අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය යනාදී ආයතන කිහිපයක් සමඟ පහත සඳහන් ප්‍රතිමූල්‍ය හා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. විශේෂයෙන් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශය වැඩිදියුණු කිරීම සඳහා ඉතා වැදගත් ප්‍රතිමූල්‍ය හා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රියාත්මක කිරීම පිණිස බැංකුව ආසියානු සංවර්ධන බැංකුව සමඟ සම්බන්ධ වී ඇත.

| | | |
|---|---|---|
| SAUBHAGYA | SMILE 111 RF | SWASHAKTHI |
| SMELoC WE fi | SEPI PHASE 11 | Moagahakanda |
| SMELoC RF | DAD | Mahaweli saviya |
| PAMP | KRUSHI SHAKTHI | NCRCS |
| KAPRUKA AYOJANA | RSPGLOC | STARR |
| KAPRUKA JAYAISURU | SAPP | Thuru Diriya |

## ආසියානු සංවර්ධන බැංකුව සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම

ආසියානු සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් දෙකක් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය අතිරේක මූල්‍ය අදියර III (SMELoC Additional Financing III) හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SRDBP) ක්‍රියාත්මකව පවතී

SRDBP යටතේ බැංකුව ශක්තිමත්ව පවත්වා ගැනීමත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති / ව්‍යවසායන් සංවර්ධනය කිරීමත් සඳහා ණය පහසුකම් ලබාදීමට කටයුතු කරයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය අතිරේක මූල්‍ය අදියර III (SMELoC Additional Financing III) ණය යෝජනා ක්‍රමය යටතේ කොවිඩ් වසංගත තත්වයෙන් බලපෑමට ලක් වූ ව්‍යවසායන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයද, කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනා ක්‍රමයද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ආයෝජන අවශ්‍යතා සඳහා සුළු හා මධ්‍ය පරිමාණ (SME) ණය යෝජනා ක්‍රමයද ක්‍රියාත්මක කරන ලදී.

## පාරිසරික හා සමාජ කළමනාකරණ පද්ධතිය (ESMS)

2019 වසරේ නොවැම්බර් මස දී ආරම්භ කරන ලද ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (Strng the ning the Regional Development Bank project – SRDBP) යටතේ ක්‍රියාත්මක කරනු ලබන SRDBP ණය යෝජනා ක්‍රමයේ අරමුදල් උපයෝජනය කරමින් මූල්‍යනය වන ව්‍යාපෘතින්හි ශක්‍යතා අධ්‍යයන කටයුතුවලට සමගාමීව එම ව්‍යාපෘතින්ගේ පාරිසරිකව හා සමාජයීයව සිදුවන බලපෑමද තක්සේරු කිරීම ආරම්භ කෙරුනු අතර ඒ සඳහා පාරිසරික හා සමාජයීය කළමනාකරණ පද්ධතියක් (Environmental Social Management System – ESME) හඳුන්වා දෙන ලදී.

ව්‍යාපෘති මූල්‍යනය කිරීමේ දී, මූල්‍ය ඇගයීම මෙන්ම පාරිසරික හා සමාජයීය අවදානම තක්සේරු කිරීමේ වැදගත්කම හා අවශ්‍යතාව මෙමගින් අවධාරණය කෙරේ.

මෙම පාරිසරික හා සමාජයීය කළමනාකරණ පද්ධතිය හඳුන්වා දීම තුළින් බැංකුව හරහා මූල්‍යයනය කරනු ලබන ව්‍යාපෘතීන්, ජාතික මෙන්ම අරමුදල් සපයන අනෙකුත් ආයතනයන්හි පාරිසරික හා සමාජයීය ප්‍රමිතීන්ට අනුකූලව තක්සේරු කිරීමට ලක් කරන බව සහතික කරනු ඇත.

මේ වන විට, SRDBP ණය යෝජනා ක්‍රමයට පමණක් සිදුකරනු ලබන මෙම පාරිසරික හා සමාජයීය ඇගයීම බැංකුව හරහා ක්‍රියාත්මක වන සියලුම ණය යෝජනා ක්‍රම සඳහා ආදේශ කිරීමට අපේක්ෂිත අතර පළමුව බස්නාහිර පළාත මූලික කරගෙන ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

| විස්තරය | මුළු ණය ප්‍රමාණය | මුළු ණය ප්‍රතිශතය | ලබා දුන් ප්‍රමාණය | මුළු ණය ලබාදීම්වල ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| SRDBP සමුච්චිත ප්‍රදානය කිරීම | 9,709 | 100% | 8055.92 | 100% |
| ප්‍රථම ණය ලබා ගැනීම (මීට පෙර ණය ලබාගෙන නොමැත) | 232 | 2.38% | 191.1 | 2.37% |
| කාන්තා මූලික ව්‍යාපාර | 3,036 | 31.26% | 1,334.30 | 16.56% |
| කොළඹින් පිටත | 9,650 | 98.47% | 7,256.80 | 90.08% |
| කාරක ප්‍රාග්ධන ණය | 66 | 0.68% | 54.4 | 0.68% |

### ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කල්බදු පහසුකම්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කල්බදු පහසුකම් සම්බන්ධ කටයුතු 2022 වර්ෂයේ දී ඉතා සාර්ථකව ක්‍රියාත්මක වී ඇත. සියලුම ශාඛා තම ශාඛාවල කල්බදු කළඹ ඉතා සාර්ථකව වැඩි දියුණු කිරීම සඳහා සිය උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමට පෙළඹී ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2022.12.31 වන විට කල්බදු කළඹ රු බිලියන 1.3ක් විය.

### ණය අයකිරීම්

2022 වසර තුළ රටේ දුෂ්කර වාතාවරණයක් පැවතියදී, එහි අක්‍රමික ණය කළඹ කළමනාකරණය කිරීම සඳහා බැංකුව විසින් විශේෂ අවධානයක් යොමු කරන ලදී. අපගේ ගනුදෙනුකරුවන් බොහෝ දෙනෙකු අත්විඳින ලද යම් යම් අවාසනාවන්ත තත්ත්වයන් හේතුවෙන් ඇති වූ පීඩනයට අනලස්ව මුහුණ දීම සහ ගනු ලැබූ විශේෂ ප්‍රයත්නයන් හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 වන විට අක්‍රීය ණය අනුපාතය 8.46% ක මට්ටමක පවත්වා ගැනීමට බැංකුව සමත් විය.

# තොරතුරු තාක්ෂණ සමාලෝචනය

## 2022 වසරේ අත්කරගත් තොරතුරු තාක්ෂණ ජයග්‍රහණ

2022 වර්ෂය තුළ බැංකුව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළව තීරණාත්මක අවස්ථාවක් සනිටුහන් කරන ලදී. එය අපගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවන්හි සංවර්ධනය සඳහා පමණක් නොව, තාක්ෂණික දියුණුව තුළින් සේවාදායක සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා ද උපායමාර්ගික තෝරාගැනීම් සිදු කිරීමට අපට අවකාශ සැලසීය. ඩිජිටල් බැංකුකරණය සහ තාක්ෂණික යටිතල පහසුකම් ක්ෂේත්‍රය තුළ අප විසින් සිදු කරන ලද පරිවර්තනීය වෙනස පිළිබඳව අපි තවදුරටත් සොයා බලමු.

## ඩිජිටල් බැංකුකරණ කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩිජිටල් බැංකුකරණ මාර්ග සිතියමට අනුකූලව අපි ඕනෑම ජංගම යෙදුමක් හරහා ක්‍රියාත්මක කළ හැකි 'RDB QR' ගෙවීම් ක්‍රමවේදය සහ 'Just Pay' ගෙවීම් පහසුකම සාර්ථකව හඳුන්වා දුන්නෙමු. මෙම එකතු කිරීම් මගින් අපගේ ගනුදෙනුකරුවන් සඳහා ගනුදෙනු විධිමත් කිරීම සිදු වූවා පමණක් නොව අති නවීන විසඳුම් පිළිගැනීම පිළිබඳව අපගේ කැපවීම ද පෙන්නුම් කරන ලදී.

## EMV චිප් පාදක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත්

2022 දී, අපි EMV චිප් පාදක ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පත් 58,000 කට අධික ප්‍රමාණයක් නිකුත් කළ අතර වසර අවසන් වන විට අපගේ මුළු ක්‍රියාකාරී ටෙලර් යන්ත්‍ර කාඩ්පත් පදනම සුවිශේෂී ලෙස 348,548ක් දක්වා ඉහළ නැංවීය. මෙමගින් අපගේ පුළුල් වන පාරිභෝගික පදනම සඳහා සුරක්ෂිත සහ කාර්යක්ෂම මූල්‍ය ගනුදෙනු සම්පාදනය සඳහා වන අපගේ කැපවීම මනාව ප්‍රකට කරයි.

## රැස්කිරීම් කළමනාකරණය

2022 නොවැම්බර් මාසයේදී රැස්කිරීම් කළමනාකරණ පද්ධතියක් භාවිතා කර ණය අයකර ගැනීමේ කාර්යයන් සිදුකිරීම පිළිබඳව විශේෂයෙන් අවධානය යොමු කරමින් අපගේ පළමු ඇමතුම් මධ්‍යස්ථානය ආරම්භ කිරීමට අප සමත් විය.

## අනුකූලතාව සහ ආරක්ෂාව

අනුකූලතා අවශ්‍යතා සපුරාලීම සඳහා, අපි මුදල් විශුද්ධිකරණයට එරෙහි මෘදුකාංගය හඳුන්වා දුන් අතර නව 'GOAML' ව්‍යාපෘතියට අනුකූලව ගනුදෙනු තොරතුරු වාර්තා සඳහා පද්ධති ක්‍රියාත්මක කළෙමු. මෙම පියවරයන් මගින් අපගේ ආයතනය සහ අපගේ අගනා ගනුදෙනුකරුවන් යන දෙපාර්ශවයම ආරක්ෂා කරමින් ඉහළම මූල්‍ය ආරක්ෂාව සහතික කෙරේ.

## සන්නිවේදන පද්ධති සහ සයිබර් සුරක්ෂිතතාව

තාක්ෂණික දියුණුවේ පෙරමුණේම රැඳී සිටීමට දක්වන ලද අපගේ කැපවීම පෙරළිකාර වැඩිදියුණු කිරීම් සඳහා හේතු විය. අපගේ ශාඛා හරහා 'SD-WAN' සාර්ථකව ස්ථාපනය කිරීම මගින් සන්නිවේදනයේ විප්ලවීය වෙනසක් ඇති කළ අතර එමගින් ධාරිතාව ඉහළ නැංවීම මෙන්ම කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීමද සිදුවිය. එපමණක් නොව, 'WEB' ප්‍රවේශ (firewall) ක්‍රියාත්මක කිරීම මගින් අපගේ සයිබර් ආරක්ෂාව තර කරනු ලබන අතර අපගේ සියලුම ගනුදෙනුකරුවන් සඳහා ආරක්ෂිත සහ දැරිය හැකි ඩිජිටල් පරිසරයක් සහතික කරයි.

## සර්වර් අවිස්සරණය (Server Virtualization)

2022 වර්ෂයේදී සේවාදායක අවිස්සරණය (Server Virtualization) හඳුන්වාදීම මගින් කාලය, පරිපාලන පිරිවැය සහ නව මෘදුකාංග පරීක්ෂා කිරීම සහ සේවාදායක (Server) සවි කිරීම සඳහා අවශ්‍ය වූ ඉඩ ප්‍රමාණය අඩු විය. මෙම පියවර පිරිවැය ඵලදායී ප්‍රවේශයක් සඳහා වැදගත් වනවා පමණක් නොව එය අනාගත තාක්ෂණික අවශ්‍යතා සඳහා අපව සූදානම් කරයි.

## විද්‍යුත් තැපැල් සේවා පුළුල් කිරීම සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය

අපගේ පවතින විද්‍යුත් තැපැල් සේවාව වැඩිදියුණු කිරීමේදී අපගේ සියලුම සේවකයින්ට විද්‍යුත් තැපැල් පහසුකම් සැපයීමට කටයුතු කිරීම හරහා අභ්‍යන්තර සන්නිවේදනය වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් වන අපගේ කැපවීම ප්‍රකට විය. මීට අමතරව, අපගේ ස්ථාපිත ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය උපයෝගී කර ගනිමින්, 2022 වසරට අදාළ ශ්‍රේණිගත කිරීම් සඳහා අපි මාර්ගගත පරීක්ෂණ පැවැත්වූ අතර අපගේ ක්‍රියාවලීන්හි විනිවිදභාවය සහ කාර්යක්ෂමතාව වැඩි කළෙමු.

මෙතෙක් පැමිණි ගමනේ තවදුරටත් ඉදිරියට යාමේදී විශිෂ්ටත්වය ළඟාකර ගැනීම සඳහා වන අපගේ අචල කැපවීම ස්ථාවරව පවතී. අපගේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා වඩා යහපත් වූ අයුරින් තවදුරටත් ඉටු කිරීමට සහ ඔබ අප කෙරෙහි තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීමට අපි නව තාක්ෂණයන්ගෙන් සන්නද්ධ වූයෙමු. 2022 වසර තාක්ෂණික දියුණුවේ වසරක් පමණක් නොව එය නවෝත්පාදනය, තොරතුරු ආරක්ෂණය සහ විශිෂ්ටත්වය කරා නිරතුරුව පිය මැනීම පිළිබඳ අපගේ කැපවීම සම්බන්ධ සාක්ෂියක් ද විය.

# අලෙවිකරණ සමාලෝචනය

## නිෂ්පාදන සහ සේවා

### RDB කැකුළු බාල වයස්කාර ඉතුරුම් ගිණුම

RDB කැකුළු ගිණුම වයස අවුරුදු 14 ට වඩා අඩු ළමුන් සඳහා පමණක් සකස් කර ඇති ඉතුරුම් ගිණුමකි. ළමුන්ගේ ආකර්ෂණය සඳහා ආරම්භ කරන සෑම නව ගිණුමක් සඳහාම කැටයක් පිරිනැමීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව කටයුතු කරයි. තවද, විවිධ මට්ටම්වල ගිණුම්වල ශේෂයන් සඳහා සුවිශේෂී ලෙස නිර්මාණය කරන ලද ලිපි ද්‍රව්‍ය ඇසුරුම්, පාසල් බෑග් සහ තෑගි වවුචර් වැනි පුළුල් පරාසයක තෑගි අයිතම බැංකුව විසින් පිරිනමනු ලැබේ. ඊට අමතරව, කුඩා අවධියේ සිටම ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කර ගැනීමට දරුවන් පෙළඹවීම අරමුණු කර ගෙන ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පාසල් තුළ ඉතුරුම් මධ්‍යස්ථාන ස්ථාපනය කරයි. පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් විශිෂ්ටම ප්‍රතිඵල ලබා ගන්නා ගිණුම් හිමියන් සඳහා බැංකුව විසින් ත්‍යාග ලබා දෙයි. එමෙන්ම, එකී විභාගයට පෙනී සිටින ගිණුම් හිමියන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණ සංවිධානය කිරීම ද බැංකුව විසින් සිදු කරනු ලැබේ.

### RDB 4 TEEN PLUS ගිණුම

RDB 4 teen Plus ගිණුම යනු යොවුන් වියේ ප්‍රජාව අතර ඉතිරි කිරීමේ පුරුදු ඇති කිරීම අරමුණු කොට ගෙන වයස අවුරුදු 14 සහ ඊට වැඩි යෞවනයන් සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද ගිණුමකි. තම ගිණුමේ ශේෂයේ වර්ධනයට සාපේක්ෂව අමතර ප්‍රසාද පොලියක් මෙන්ම ඉහළ පොලී අනුපාතයක් RDB 4 teen Plus ගිණුම මඟින් පිරිනමනු ලැබේ. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර කාඩ්පතක් ද නිකුත් කරන හෙයින් වයස අවුරුදු 14 ට වැඩි දරුවන්ට තම හදිසි මූල්‍ය අවශ්‍යතා සඳහා මුදල් ආපසු ගැනීමට අවස්ථාවක් උදාවී ඇත. එමෙන්ම ATM කාඩ්පතෙන් මුදල් ආපසු ගැනීමක් සිදුකරන සෑම අවස්ථාවකම මුදල් ආපසු ගැනීමට අදාළ විස්තර සහිත කෙටි පණිවිඩයක් භාරකරුගේ ජංගම දුරකථනය වෙත යවනු ලැබේ. නිවසක්, වාහනයක්, ගෘහ භාණ්ඩ, හිමිකර ගැනීම, ව්‍යාපාරයක් ඇරඹීම, ඉලෙක්ට්‍රොනික උපකරණ සහ උපාංග මිලදී ගැනීම, අධ්‍යාපනික අවශ්‍යතා, විදේශ සංචාර ආදී සිය සිහින සැබෑ කර ගැනීම සඳහා මෙමගින් තරුණ ප්‍රජාවට ණය පහසුකම් ලබා ගත හැකිය.

### RDB ලිය සවිය - කාන්තා ඉතුරුම් ගිණුම

මෙය ශ්‍රී ලංකාවේ දිරිය කාන්තාවන් ඉලක්ක කර ගනිමින් හඳුන්වා දී ඇති ගිණුමකි. මූල්‍ය පහසුකම් ලබාදීමට අමතරව ස්වයං රැකියාවල නිරතවීම හරහා රටේ ආර්ථිකය ගොඩනැගීමට දායක වන කාන්තාවන් සඳහා බැංකුව විසින් අවශ්‍ය උපදේශක සේවා සැපයීම සිදුකරනු ලබයි. ඉහළ පොලී අනුපාතය, ප්‍රසාද පොලිය සහ තරඟකාරී පොලී අනුපාත මත අත්තිකාරම් ලබාදීම යනාදිය මෙම ගිණුමේ ඇති සුවිශේෂී ලක්ෂණ වේ එමෙන්ම, ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව සෑම වසරකම කාන්තා ව්‍යවසායකයින් සඳහා විශේෂ සම්මන්ත්‍රණ, කුසලතා සංවර්ධන වෘත්තීය පුහුණු වැඩසටහන් සහ තවත් බොහෝ ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ වැඩමුළු පවත්වනු ලැබේ.

### RDB ලිය සවිය ප්ලස් - කාන්තා ආයෝජන ඉතුරුම් ගිණුම

RDB ලිය සවිය ප්ලස් කාන්තා ආයෝජන ගිණුම යනු සුරක්ෂිත මධ්‍ය කාලීන ආයෝජන අවස්ථාවක් සහ විශේෂ ණය යෝජනා ක්‍රම තුළින් කාන්තාවන් සවිබල ගැන්වීම අරමුණු කර ගෙන වයස අවුරුදු 18 ට වැඩි කාන්තාවන් සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද ආයෝජන ඉතුරුම් ක්‍රමයකි. මෙය ආකර්ශනීය තෑගි පිරිනමන පස් අවුරුදු ආයෝජන සැලැස්මකි. මෙම ගිණුම් හිමියන්ට "දිරි අභිමානී- හොඳම කාන්තා ව්‍යවසායිකාව තරඟයට" ඇතුළත් වීමට සුදුසුකම් හිමිවේ.

### RDB වික්ටරි ගිණුම

බැංකුව විසින් විශේෂ ඉතුරුම් ගිණුමක් ලෙස RDB වික්ටරි ගිණුම හඳුන්වා දී ඇති අතර මෙම ගිණුමෙන් තැන්පතු ආපසු ලබා ගැනීමේදී ඉහළ පොලියක් සහිතව ලබා ගත හැකිය. එමෙන්ම විශේෂ ප්‍රතිලාභයක් ලෙස මෙම ගිණුම හරහා ප්‍රසාද පොලියක් පිරිනමනු ලැබේ. තවද, ගිණුම් හිමියන්ට විශේෂ ණය පහසුකම් ද ලබා ගත හැකි අතර ඒ අනුව, සිය ගිණුමේ ශේෂය මෙන් දස ගුණයක ණයක් ඔවුන්ට ලබා ගත හැකිය.

## RDB නිව් ලයිෆ් විශ්‍රාම වැටුප් සැලැස්ම

RDB නිව් ලයිෆ් විශ්‍රාම වැටුප් සැලැස්ම ඉහළ පොලියක් ලබා ගත හැකි විශේෂ ඉතුරුම් ගිණුමක් ලෙස හඳුන්වා දී ඇත. මෙය වූකලී සුවිශේෂ විශ්‍රාම වැටුප් සැලැසුමකි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන මාස 6 ක සාමාන්‍ය බරිත තැන්පතු අනුපාතය අනුව පොලී අනුපාතය වාර්ෂිකව සංශෝධනය කෙරේ. ගිණුම් හිමියා වයස අවුරුදු 55 හෝ 60 ට සම්පූර්ණ කරන අවස්ථාවේ මෙමගින් වාරික විශ්‍රාම වැටුප් ප්‍රතිලාභයක් පිරිනමයි. ගිණුම් හිමියා මිය යන තෙක් එම ප්‍රතිලාභය ගෙවනු ලැබේ. මෙම ගිණුම වයස අවුරුදු 16 දී විවෘත කළ හැකි අතර ගිණුම් හිමියාගේ මුදල් ප්‍රවාහය අනුව මුදල් තැන්පත් කිරීම සිදු කළ හැකිය. විශ්‍රාම යාමේදී, මෙම ඉතිරිකිරීම්වලින් කොටසක් හෝ සම්පූර්ණයෙන් නිත්‍ය විශ්‍රාම ආදායමක් උත්පාදනය කිරීම සඳහා භාවිතා කළ හැකිය. ගිණුමේ ශේෂය මාසිකව විශ්‍රාම වැටුප් ප්‍රතිලාභය සඳහා භාවිතා කරනු ඇත.

## RDB උත්තම ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතුරුම් ගිණුම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සිය උත්තම ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ ගිණුම සඳහා තරගකාරී පොලී අනුපාතයක් ලබා දෙයි. මෙම ගිණුම රු. 500/- ක මූලික තැන්පතුවකින් ආරම්භ කළ හැකි අතර වයස අවුරුදු 55 ඉක්මවූ ඕනෑම පුද්ගලයෙක් ජ්‍යෙෂ්ඨ පුරවැසි ඉතිරිකිරීමේ ගිණුම විවෘත කිරීමට සුදුසුකම් ලබයි. එසේම, මෙය හරහා සේවා ගාස්තු නොමැතිව තමන්ගේම උපයෝගිතා බිල්පත් ගෙවීමට ගිණුම් හිමියන්ට අවස්ථාව ලැබේ. මෙම ගිණුම් හිමියන්ට වෛද්‍ය පරීක්ෂණ නොමිලේ සිදුකර ගැනීම සඳහා හිමිකම් ලැබෙන අතර විශ්‍රාමිකයෝ "RDB දෙටුසවි" ණය පහසුකම ලබා ගැනීමට හිමිකම් ලබති.

## RDB ආයෝජන ගිණුම

මෙය ණය පහසුකම් ලබන ගනුදෙනුකරුවන් සඳහා බැංකුව විසින් හඳුන්වා දී ඇති සාමාන්‍ය ආයෝජන ගිණුමයි. තැන්පතු සඳහා ආකර්ෂණීය පොලී අනුපාතයක් සහ ඉලක්කගත අංශ සඳහා ඔබින පරිදි සකස් කරන ලද විශේෂ ණය යෝජනා ක්‍රම පැවතීම මෙහි විශේෂ ලක්ෂණ වේ.

## DB ජය නිධාන ඉතුරුම් හතිකය

මෙය සියලු ආර්ථික මට්ටම්වල ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් හඳුන්වා දෙන ලද ඉතුරුම් නිපැයුමකි. මෙය ඉතුරුම් සහතිකයක් වන අතර එකී සහතික රු 5,000/-, රු 10,000/-, රු 25,000/-, රු 100,000/-, රු 500,000/-, රු 1,000,000/- වැනි මුහුණත වටිනාකම්වලින් යුක්ත වේ. මෙම ඉතුරුම් සහතිකයේ සුවිශේෂී ලක්ෂණයක් වන්නේ එය කල්පිරීමේදී ඒවන විට පවතින පොලී අනුපාතයට අලුත් කළ හැකි වීමයි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ජය නිධාන සහතික පුද්ගලික තැන්පතු සඳහා පමණක් කේවල තැන්පතු වශයෙන් මෙන්ම හවුල් තැන්පතු වශයෙන් ද විවෘත කිරීමට හැකියාව පවතී.

## RDB ස්ථාවර තැන්පතු

RDB ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතු එහි කේවල මෙන්ම ආයතනික ගනුදෙනුකරුවන් අතර ද ජනප්‍රිය ආයෝජන ක්‍රමයක් ලෙස හඳුනාගෙන ඇත. මාස 1, 2, 3, 4 සහ 6 කාල පරිච්ඡේද සඳහා මෙන්ම අවුරුදු 1-5 ක කාලයක් සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ස්ථාවර තැන්පතු ලබා ගත හැකිය. අනෙකුත් බැංකු හා සැසඳීමේදී ආරම්භයේ සිටම ඉතා ආකර්ෂණීය පොලී අනුපාත ලබා දීමට බැංකුව සමත් විය. වසර 1 ක් හෝ ඊට වැඩි කාලයක් තුළ කල් පිරෙන ස්ථාවර තැන්පතු සඳහා විශේෂ පොලී අනුපාත පිරිනමනු ලැබේ.

## RDB MAX ස්ථාවර තැන්පතුව

බැංකුවේ තැන්පතු පදනම වැඩි කිරීමේ අරමුණ පෙරදැරිව නව දිගුකාලීන තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් තරගකාරී පොලී අනුපාතයක් සහිත "RDB Max" ස්ථාවර තැන්පතුව හඳුන්වා දෙන ලදී.

## RDB දොරින් දොර සහනදායී බැංකු සේවාව

ශ්‍රී ලංකාවේ දොරින් දොර බැංකු සේවා සපයන්නන්ගේ පුරෝගාමියා වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලබාදෙන ප්‍රමුඛතම සේවාව මෙයයි. නිරන්තරයෙන් සේවයට කැපවූ සේවා සපයන්නන් සමූහයක් හරහා මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වන අතර ඔවුන් දිනපතා එම ශාඛාවලට අදාළ ප්‍රදේශවල ව්‍යාපාරික පරිශ්‍ර සහ නිවාස වෙත බැංකු සේවා සඳහා පැමිණේ. දොරින් දොර සේවාව තැන්පතු එකතු කිරීමට පමණක් සීමා නොවන අතර එය ඉලක්කගත ගනුදෙනුකරුවන්ට සංවර්ධන අරමුණු සඳහා ණය ලබා ගැනීම, සේවා අවශ්‍යතා සඳහා සහ ඔවුන්ගේ පහසුව අනුව වාරික සහ පොලිය කඩිනමින් ගෙවීම ආදී කටයුතු සඳහා උපකාරී වේ. ඊට අමතරව, උපයෝගිතා බිල්පත් ගෙවීම් කටයුතුද මෙම සේවාව හරහා සිදුකළ හැකියි මෙම ගනුදෙනු අතේ ගෙන යා හැකි ඉලෙක්ට්‍රොනික උපාංගයක් හරහා සිදු කරනු ලබන අතර අදාළ ගනුදෙනුව ස්වයංක්‍රීයව බැංකුවේ පද්ධතියට උඩුගත කෙරේ.

## RDB ලීසිං

“RDB ලීසිං” යනු ක්ෂුද්‍ර ව්‍යවසායන්, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන්, වෘත්තිකයන්, ඉහළ ශුද්ධ වත්කම් ඇති පුද්ගලයින්, රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයින් සඳහා ඔවුන්ගේ ව්‍යාපාර සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා අත්‍යවශ්‍ය ලියාපදිංචි සහ ලියාපදිංචි නොකළ වාහන මිලදී ගැනීම සඳහා වන නිපැයුමකි.

## RDB රන් සරණ

ගනුදෙනුකරුවන්ගේ හදිසි මුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා රත්තරන් සුරැකුම් වශයෙන් තබා ණය පහසුකම් ලබා ගැනීම පිණිස RDB රන් සරණ " නිර්මාණය කර ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අවම පොලී අනුපාතයක් යටතේ ස්වෛරී ණයක් සඳහා ඉහළම වටිනාකමක් ලබා දෙන අතර මෙම පහසුකම සඳහා නම්‍යශීලී ආපසු ගෙවීමේ අවස්ථාද ඇත.

## ගබඩා පහසුකම්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් උපුල්දෙනිය, මුරුන්කන්, බුත්තල, කිලිනොච්චි සහ මැදිරිගිරිය යන ප්‍රදේශවල ගබඩා පහසුකම් පහක් පවත්වාගෙන යනු ලබන අතර ඒ ප්‍රදේශ අවට ගොවීන්ට අස්වැන්නේ වර්ගය අනුව ඉතා අවම ගාස්තුවක් යටතේ තම අස්වැන්න ගබඩා කර තබාගැනීමට අවස්ථාව සලසා ඇත. මෙම ගබඩා වියළන යන්ත්‍ර, බොයිලේරු, හලර් වැනි නවීන යන්ත්‍රෝපකරණ වලින් සමන්විත වන අතර අස්වැන්නේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ද ස්ථාපිත කර ඇත.
අස්වැන්න ගබඩා කිරීම සඳහා ආරක්ෂිත ස්ථානයක් සැපයීමට අමතරව, බැංකුව විසින් ගොවීන්ට තරඟකාරී මිලකට තම අස්වැන්න විකිණීමට ද සහාය ලබා දෙනු ලැබේ.
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අඩු පොලී අනුපාතයකට ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ පහසුකම යටතේ ගබඩා කළ නිෂ්පාදන සඳහා මූල්‍ය ආධාර සපයයි.



## RDB බැන්ක් ඇෂුවරන්ස්

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සිය බැංකු රක්ෂණ ඒකකය හරහා ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අභිලාසයන්ට සරිලන පරිදි සකස් කළ රක්ෂණ නිෂ්පාදන හෝ ප්‍රතිලාභ විවිධ රක්ෂණ සේවා සපයන්නන් අතරින් තෝරා ගැනීමට පහසුකම් සලසනු ලැබේ.




## ජංගම බැංකු ඒකකය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට සෘජුවම බැංකු කවුන්ටරයක් මගින් බැංකු සේවා සැපයීම සඳහා ජංගම බැංකු ඒකකය හඳුන්වා දී ඇත. අභ්‍යන්තර බැංකු කවුන්ටරයකින් සමන්විත එම පහසුකම හරහා මුදල් තැන්පතු, මුදල් ආපසු ගැනීම, ගිණුම් විවෘත කිරීම, උපයෝගිතා බිල්පත් ගෙවීම්, ප්‍රේෂණ ගෙවීම් සහ තවත් බොහෝ අවශ්‍යතා ඉටුකර ගත හැකිය. මීට අමතරව, එම ඒකකය ආපදා අවස්ථාවන්හිදී යළි යථා තත්ත්වයට පත්වීම සඳහා පහසුකම් සලසන ජංගම ඒකකයක් ලෙසද සේවය කරයි.



## ATM සහ CDM යන්ත්‍ර

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ගනුදෙනුකරුවන්ට LankaPay ලාංජනය සහිත ඕනෑම ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මගින් RDB ස්වංක්‍රීය ටෙලර් කාඩ්පත භාවිතයෙන් තම ගිණුම්වලින් මුදල් ලබා ගැනීමට හැකිය. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ බොහෝ ගනුදෙනුකරුවන් ග්‍රාමීය සහ අර්ධ නාගරික ව්‍යවසායකයින් වන හෙයින් මෙම ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම ඔවුන්ට වැඩි පහසුවක් මෙන්ම ආරක්ෂාවක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වර්තමානයේ බැංකුව දිවයින පුරා RDB ස්වංක්‍රීය ටෙලර් යන්ත්‍ර යන්ත්‍ර 51 ක් ස්ථාපනය කර ඇත.

ඊට අමතරව, ප්‍රාදේශීය සංවර්ධන බැංකු විසින් 2018 වර්ෂයේදී මුදල් තැන්පතු යන්ත්‍ර ජාලය CDM හඳුන්වා දෙන ලදී. ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා මෙම යන්ත්‍ර බොහෝ කාර්යබහුල නගරවල ස්ථාපනය කර ඇත. එමෙන්ම, නිසි පරිදි බැංකු සේවා නොමැති පදවි පරාක්‍රමපුර සහ වැලිඔය යන ප්‍රදේශවලද ස්වයංක්‍රීය බැංකු මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කර තිබේ.

## SEILAMA.LK

අප ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සහ සේවා අන්තර්ජාලය හරහා ප්‍රවර්ධනය කිරීමේ අභිලාසයෙන් යුතුව බැංකුව විසින් Seilama.lk නමින් වෙබ් අඩවියක් ආරම්භ කරන ලදී. අපගේ වෙළඳ ප්‍රජාවට සහ ගනුදෙනුකරුවන්ට QR ගනුදෙනු හඳුන්වාදීමට සමගාමීව Seilama.lk වෙබ් අඩවියේ ධාරිතාව වැඩි කිරීමට කටයුතු කිරීමෙන් ප්‍රවර්ධන කටයුතු වේගවත් කර ඇත. සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ව්‍යවසායකයින්ගේ හඳුනා ගැනීම, තොරතුරු රැස් කිරීම සහ එම තොරතුරු වෙබ් අඩවියට ඇතුළත් කිරීම Seilam.lk ආරම්භයේදීම සිදු කරන ලදී. මෙමගින් ඉදිරියේදී ව්‍යවසායකයින්ට සහ ගැනුම්කරුවන්ට මිලදී ගැනීමේ සහ විකිණීමේ අවස්ථා ලබා දීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අපේක්ෂා කරයි.

## නව නිෂ්පාදන සංවර්ධනය කිරීම

RDB MAX

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් RDB Max ස්ථාවර තැන්පතු යෝජනා ක්‍රමය යටතේ ආකර්ෂණීය පොලී අනුපාත සහිත RDB Max දින 100, RDB Max මාස 6 සහ RDB Max මාස 10 යන ස්ථාවර තැන්පතු ක්‍රම හඳුන්වා දී ඇත.

RDB මිතුරු ප්ලස් ණය යෝජනා ක්‍රමය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් කොළඹ පිටකොටුවේ ව්‍යාපාරික ප්‍රජාව සඳහා මිතුරු ප්ලස් ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. මෙමගින් පිටකොටුව වෙළඳපොලේ වෙළෙන්දන්හට අඩු පොලී අනුපාතයකට මූල්‍ය ආධාර සපයන අතර ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි දිනපතා, සතිපතා හෝ මාසිකව මෙම ණය පහසුකම නැවත පියවිය හැකිය.

# සමාජ සහ පාරිසරික සමාලෝචනය

## ආයතනික සමාජ වගකීම – CSR

### පැළ බෙදා හැරීමේ වැඩසටහන

74 වන නිදහස් දිනය සමරනු වස් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියලුම ශාඛා විසින් 2022 පෙබරවාරි 3 වන දින ශාඛා පරිශ්‍රයේදී  සිය අගනා ගනුදෙනුකරුවන් සඳහා පැළ බෙදා දෙන ලදී.



### අවුරුදු වෙළඳ පොළ

සිය ව්‍යවසායකයින්ට තම නිෂ්පාදන සහ සේවා අලෙවි කිරීම සඳහා වෙළඳපොළ සොයා ගැනීමට සහ විකුණුම් ප්‍රමාණය වැඩි කිරීමට සහාය වීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සෑම පළාතකම ප්‍රධාන නගරවල වෙළඳ පොළවල් පවත්වා ඇත.

### කල්ලඩි පරණ පාලම, මඩකලපුව



### Cultural Arcade, බෝගම්බර, මහනුවර



### ඇඹිලිපිටිය නව ක්‍රීඩා පිටිය



### අම්බලන්තොට ප්‍රාදේශීය සභා භූමිය



# සමාජ හා පාරිසරික සමාලෝචනය

## දිරි අභිමානී වැඩසටහන




ශ්‍රී ලංකාවේ කාන්තා ව්‍යවසායකයින්ගේ ප්‍රයත්නයන් සහ කැපවීම් තවදුරටත් සවිබලගැන්වීම සඳහා දිරි අභිමානී 2022 නම් වූ වැඩසටහන 2022 මාර්තු 08 දින පවත්වන ලදී. මෙම වැඩසටහන යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මග පෙන්වීම, උපදේශන සේවා සහ පුහුණු කටයුතු සඳහා අවකාශ සැලසීම තුළින් ව්‍යාපාරික ලෝකයේ මෙන්ම තම පෞද්ගලික ජීවිතයේ ද අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා කාන්තා ව්‍යවසායකයින් යොමු කරවනු ලබයි.

## RDB "පුස්තක සත්කාර" වැඩසටහන

පාසල් දරු දැරියන් අතර පාඨකත්වය වැඩි දියුණු කිරීම අරමුණු කර ගෙන දුෂ්කර ප්‍රදේශවල පවතින පාසල් පුස්තකාල සඳහා පොත් පරිත්‍යාග කිරීම පිණිස (RDB) "පුස්තක සත්කාර" වැඩසටහන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පවුලේ සහ එහි වටිනා ගනුදෙනුකරුවන්ගේ සහාය ඇතිව ආරම්භ කරන ලදී.



## වැනිලා වගාකරුවන් සඳහා රචිත "වැනිලා වගාකරුවන් සඳහා වූ මාර්ගෝපදේශ අත්වැල" නම් වූ කෘතිය




වැනිලා වගාකරුවන්ගේ දැනුම තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් "වැනිලා වගාකරුවන් සඳහා මාර්ගෝපදේශ" නම් වූ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදී. වැල්ලවාය නිකපොත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන ජයන්ත ද සිල්වා මහතා විසින් මෙම ග්‍රන්ථය රචනා කර ඇත.

## ඉන්ධන සඳහා QR අවසර පත්‍ර




ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තෝරාගත් ශාඛා විසින් ඉන්ධන පිරවුම්හලෙන් ඉන්ධන ලබා ගැනීම සඳහා නොමිලේ QR බලපත්‍රයක් නිකුත් කිරීමේ ප්‍රජා සත්කාරක වැඩසටහනක් සංවිධානය කර ඇත.

# සේවක සමාලෝචනය

## හැඳින්වීම

ජාතියේ සංවර්ධන බැංකුකරු ලෙස බැංකුවේ දැක්මට අනුකූල වෙමින්, ආයතනික විශිෂ්ටත්වය සඳහා දායක වන ඉහළ අභිප්‍රේරණයක් සහිත, සුවිශේෂී ගතිකත්වයකින් යුත්, සවිබල ගැන්වූ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමට සහ පවත්වාගෙන යාමට මානව සම්පත් දෙපාර්තමේන්තුව අරමුණු කරයි.
ප්‍රශස්ත මානව සම්පත් මෙවලම්, නිසි ප්‍රතිපත්ති භාවිතයන් සහ ක්‍රියාවලීන් තුළින් කුසලතා අත්පත් කර ගැනීමේ දී, සංවර්ධනය කිරීමේ දී සහ සේවයේ යෙදවීමේ දී උපායමාර්ගිකව ඒකාබද්ධ ප්‍රවේශයක් යෙදීමෙන් පරමාදර්ශී මානව ප්‍රාග්ධනයේ අවශ්‍යතාව සහ බැංකු සේවකයින්ගේ යහපැවැත්ම සපුරාලීම සහතික කිරීම සඳහා මානව සම්පත් අංශය නිරන්තරයෙන් කැපවී සිටී.
මෙමඟින් අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කිරීමට සහ ආයතනික අරමුණු සඳහා වටිනාකමක් එක් කිරීමට ද සේවකයන් දිරි ගන්වන අතර අවසානයේ සේවකයින්ගේ වෘත්තීය අභිලාෂයන් සපුරා ගැනීමට ද සේවකයින් දිරි ගන්වයි.

### මානව සම්පත් හා සම්බන්ධ ප්‍රධාන මූල්‍ය කාර්යසාධන දර්ශක 2018-2022

| | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| මුළු මෙහෙයුම් ලාභය (රු. මිලියන) | 3,606 | 2,960 | 3,164 | 1,926 | 1,998 |
| මුළු ආදායම (රු. මිලියන) | 26,071 | 27,508 | 24,210 | 24,492 | 36,203 |
| ණය කළඹ (රු. මිලියන) | 137,770 | 144,560 | 164,771 | 189,039 | 215,373 |
| තැන්පතු කළඹ (රු. මිලියන) | 141,560 | 149,600 | 169,264 | 187,752 | 210,301 |
| මුළු සේවක සංඛ්‍යාව | 2,345 | 2,735 | 2,660 | 2,600 | 2,531 |
| FTE අනුව ආදායම (රු. මිලියන) | 11.02 | 10.06 | 9.10 | 9.42 | 14.30 |
| FTE අනුව ලාභය (රු. මිලියන) | 1.43 | 1.08 | 1.19 | 0.74 | 0.79 |
| FTE අනුව තැන්පතු කළඹ (රු. මිලියන) | 58.82 | 52.90 | 61.94 | 72.21 | 83.09 |
| FTE අනුව ණය කළඹ (රු. මිලියන) | 57.78 | 54.70 | 63.63 | 72.71 | 85.09 |

(FTE - පූර්ණ කාලීන සේවකයා)

## පිරිස් බල ශක්තිය

බැංකුවේ පිරිස් බලය ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත සේවක සංඛ්‍යා තනතුරු සඳහා යොදවා ඇති සේවකයින්ගෙන් සමන්විත වේ. ඊට අමතරව, දොරින් දොර සේවා ලබා දෙන ක්ෂේත්‍ර සහකාරවරුන් (නිශ්චිත කාලීන කොන්ත්‍රාත් පදනම මත) සහ ග්‍රාමීය නායකයන් (ක්ෂුද්‍ර මූල්‍ය පද්ධතියට සම්බන්ධ) බැංකුව වෙත මිනිස් බල සේවා සපයනු ඇත.
එසේම, විශ්ව විද්‍යාල කාර්මික විද්‍යාල, පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවල පාඨමාලා සඳහා වන පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් සහ විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් පාසල් අධ්‍යාපනය අවසන් කළ සිසුන් සඳහා මාස 6-12 දක්වා පුහුණු වැඩසටහන් ද අභ්‍යාසලාභීන් වෙත ලබා දීමට බැංකුව කටයුතු කරයි. මෙම සේවක කාණ්ඩ බැංකුවේ කාර්යසාධනය උදෙසා වටිනා කාර්යභාරයක් ඉටු කරයි.
ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී පිරිස්බල සේවක ශක්තිය පහත දැක්වේ.

| පිරිස් බල කාණ්ඩය | සේවක සංඛ්‍යාව | |
|---|---|---|
| | 2021 | 2022 |
| ස්ථිර හා කොන්ත්‍රාත් සේවකයන් | 2,600 | 2,531 |
| දොරින් දොර සේවා ලබා දෙන ක්ෂේත්‍ර සහකාරවරුන් | 455 | 445 |
| ග්‍රාමීය නායකයන් | 171 | 216 |
| මුළු එකතුව | 3,226 | 3,192 |

කළමනාකරණ මට්ටමට අනුව සේවක සංඛ්‍යාවේ ව්‍යාප්තිය පහත දැක්වේ.

| කළමනාකරණ මට්ටම | සේවක ව්‍යාප්තිය | |
|---|---|---|
| | 2021 | 2022 |
| ආයතනික කළමනාකරණය | 7 | 8 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය | 31 | 30 |
| විධායක කළමනාකරණය | 154 | 127 |
| විධායක සේවකයින් | 923 | 1073 |
| ලිපිකරු සහ ආශ්‍රිත ශ්‍රේණි | 1356 | 1176 |
| වෙනත් ශ්‍රේණි | 129 | 117 |
| මුළු එකතුව | 2600 | 2531 |

ස්ත්‍රී සහ පුරුෂ යන ද්විත්වයටම බැංකුව විසින් සමාන වෘත්තීය අවස්ථා ලබා දෙයි. 2022 වර්ෂයේ දී පිරිස් බල කාණ්ඩයේ සංයුතිය පහත අයුරින් දක්වා ඇත.

| ස්ත්‍රී / පුරුෂභාවය | 2021 | | 2022 | |
|---|---|---|---|---|
| | සේවක සංඛ්‍යාව | % | සේවක සංඛ්‍යාව | % |
| පුරුෂ | 1447 | 55.65 | 1409 | 55.67 |
| ස්ත්‍රී | 1153 | 44.35 | 1122 | 44.33 |
| එකතුව | 2600 | 100.00 | 2531 | 100.00 |

# සේවක සමාලෝචනය

බැංකුවේ සේවකයන්ගේ වයස සහ පළපුරුද්ද පිළිබඳව පහත දැක්වේ.

## සේවකයන්ගේ වයස් කළඹ

| වයස් කාණ්ඩය | සේවක සංඛ්‍යාව | % |
|---|---|---|
| අවුරුදු 21ට වඩා අඩු | 0 | 0 |
| අවුරුදු 21-30 දක්වා | 250 | 9.88 |
| අවුරුදු 31-40 දක්වා | 960 | 37.93 |
| අවුරුදු 41-50 දක්වා | 405 | 16.00 |
| අවුරුදු 51-55 දක්වා | 545 | 21.53 |
| අවුරුදු 55ට වඩා වැඩි | 371 | 14.66 |
| මුළු එකතුව | 2531 | 100.00 |

## සේවක පළපුරුද්ද

| පළපුරුද්දට අනුව කාණ්ඩය | සේවක සංඛ්‍යාව | % |
|---|---|---|
| අවුරුදු 30ට වඩා වැඩි | 526 | 20.78 |
| අවුරුදු 20-29 දක්වා | 484 | 19.12 |
| අවුරුදු 10-19 දක්වා | 935 | 36.94 |
| අවුරුදු 05-09 දක්වා | 241 | 9.52 |
| අවුරුදු 05ට අඩු | 345 | 13.63 |
| මුළු එකතුව | 2531 | 100.00 |

## වෘත්තීය ප්‍රගමණය

කාර්ය මණ්ඩලයේ වෘත්තීය ආකල්ප සාධනීය ලෙස වෙනස් කිරීම සහ දැනුම ලබා දීම, බැංකු මෙහෙයුම් කටයුතු සම්බන්ධ ප්‍රායෝගික ඉගෙනුම් අත්දැකීම් ලබා දීම සහ නායකත්ව හැකියාවන් වැඩි දියුණු කිරීමට සහ වඩාත් ප්‍රශස්ත පාරිභෝගික සේවාවක් ලබා දීම සඳහා පුහුණු අවස්ථා ලබා දෙමින් බැංකුව සියලුම සේවකයින්ගේ අඛණ්ඩ සංවර්ධනය වෙනුවෙන් කැපවී සිටියි. සෑම වසරකම, බැංකුව මෙම කටයුතු වෙනුවෙන් බැංකුවේ අයවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් වෙන් කරයි. වසර තුළ 1358 දෙනෙකු සඳහා සමස්තයක් වශයෙන් පුහුණු පැය 19,712 ක් සහිත වැඩසටහන් 44 ක් පවත්වන ලදී. වසර තුළ පුහුණුව සඳහා සිදු කරන ලද මුළු ආයෝජනය රු මිලියන 244ක් විය.

## කාර්යසාධනය ඇගයීම

වර්ෂය තුළ, සේවක තෘප්තිය ඉහළ නැංවීම සඳහා ද, බැංකුව තුළ වඩාත් කැපවූ ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා ද බැංකුව විසින් සේවක කාර්යසාධනය ඇගයීම් පද්ධතිය වෙනස් කර ඇත. එය නිර්මාණය කර ඇත්තේ පුද්ගලයකුගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) මත පදනම්ව පුද්ගල කාර්යසාධනය මැනීම සඳහාය.

## මානව සම්පත් මණ්ඩල උප කමිටු

ආයතනික පාලන පරිචයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියමය පරිදි, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව ලෙස වෙනම උප කමිටු 02ක් ස්ථාපනය කරන ලදී.

අදාළ වර්ෂයේ දී, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික අනුකමිටුව හා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාමික අනුකමිටුවල සභාපතිත්වය එම්. මහින්ද සාලිය මහතා විසින් හොබවනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා මෙම කමිටුවල ලේකම්වරයා ලෙස කටයුතු කරයි. 2022 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු රැස්වීම් හතරක් 04 සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික අනුකමිටු රැස්වීම් හයක් (06) පවත්වන ලදී.

# විශේෂ අවස්ථා

## ශාඛා ප්‍රතිස්ථාපනය කිරීම

### ඇහැළියගොඩ ශාඛාව



ඇහැළියගොඩ ශාඛාව ඉහළ මට්ටමේ පාරිභෝගික සේවා- වක් සැපයීම සඳහා වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 පෙබරවාරි 17 වන දින සභාපති මහි- න්ද සාලිය මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා සහ කළමන- ාකාරිත්වය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

### මුන්දලම ශාඛාව



නවීකරණය කරන ලද සේවාවක් සැපයීම සඳහා මුන්දලම ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 මාර්තු 29 වන දින සභාපති මහින්ද සාලිය මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා සහ කළමනාකාරිත්වය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

### බදුල්ල ශාඛාව



කඩිනම් සේවාවක් සැපයීම සඳහා බදුල්ල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 මාර්තු 28 වන දින සභාපති මහින්ද සාලිය මහතා සහ ඌව ප්‍රා- දේශීය සාමාන්‍යාධිකාරී බී.ජී.ඩබ්ලිව්. අතුල කුමාර මහතා සහ කාර්ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

### ගොඩකවෙල ශාඛාව



ඉහළ මට්ටමේ පාරිභෝගික සේවාවක් සැපයීම සඳහා ගොඩකවෙල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 මැයි 4 වන දින සබරගමුව ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී සී.එස්. වේරගොඩ මහත්මිය සහ කාර්ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

# විශේෂ අවස්ථා

## ගල්ගමුව ශාඛාව



කඩිනම් සේවාවක් සැපයීම සඳහා ගල්ගමුව ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර 2022 මැයි 9 වන දින වයඹ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී බී.ආර්.ඩී. පුෂ්පා කුමාරි මහත්මිය සහ කාර්ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## නාරම්මල ශාඛාව



ඉහළ මට්ටමේ පාරිභෝගික සේවාවක් සැපයීම සඳහා නාරම්මල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 සැප්තැම්බර් 12 වන දින වයඹ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී බී.ආර්.ඩී. පුෂ්පා කුමාරි මහත්මිය සහ කාර්ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## පඹුරන ශාඛාව



ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 ජූලි 11 වන දින සභාපති මහින්ද සාලිය මහතා සහ දකුණු පළාත් සාමාන්‍යාධිකාරී කේ. ආරියතිලක මහතා සහ කාර්ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## නිවිතිගල ශාඛාව



නවීකරණය කරන ලද සේවාවක් සැපයීම සඳහා නිවිතිගල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර 2022 සැප්තැම්බර් 26 වන දින සබරගමුව ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී සී.එස්. වේරගොඩ මහත්මිය සහ කාර්ය මණ්ඩලය සමඟ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (වැඩ ආවරණ) සුමේධ එදිරිසූරිය මහතා විසින් මෙම ශාඛාව උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## වලස්මුල්ල ශාඛාව




කඩිනම් සේවාවක් සැපයීම සඳහා වලස්මුල්ල ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 ඔක්තෝබර් 25 වන දින සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (වැඩ ආවරණ), සුමේධ එදිරිසූරිය මහතා සහ දකුණු ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී කේ. ආරියතිලක මහතා සහ කාර්ය මණ්ඩලය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

## දොඩන්ගොඩ ශාඛාව



ඉහළ මට්ටමේ පාරිභෝගික සේවාවක් සැපයීම සඳහා දොඩන්ගොඩ ශාඛාව වඩාත් පහසු ස්ථානයකට ගෙන යන ලද අතර එය 2022 නොවැම්බර් 28 වන දින සභාපති මහින්ද සාලිය මහතා සහ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (වැඩ ආවරණ) සුමේධ එදිරිසූරිය මහතා සහ කළමනාකාරිත්වය විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

# වෙනත් අවස්ථා

## සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීම

2022 පෙබරවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී ලෙස ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා පත් කර ඇත.



## ජාතික කර්මාන්ත ප්‍රදර්ශනය 2022

ආර්ථික ක්‍රියාකාරකම්වල විවිධාංගීකරණය වූ ක්ෂේත්‍රවල නියැලී සිටින ව්‍යවසායකයින්ට සහ ව්‍යවසායන් සඳහා සහාය දැක්වීමේ දැක්මක් සහිතව, 2022 පෙබරවාරි 3 සිට 6 දක්වා කොළඹ BMICH හිදී ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් සංවිධානය කරන ලද 2022 ජාතික කර්මාන්ත ප්‍රදර්ශනයට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව එක් විය.



## ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියලුම ශාඛා ඔවුන්ගේ කාන්තා ගනුදෙනුකරුවන් සමඟ ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහන සමරන ලදී. ඒ අනුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියලුම ශාඛාවල දී කාන්තාවන් කේන්ද්‍ර කර ගත් වැඩසටහන් සහ උත්සව මාලාවක් පවත්වන ලදී. කාන්තා ව්‍යවසායකයින් කේන්ද්‍ර කර ගනිමින් පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා ණය පහසුකම් ලබා දීම ද මෙම උත්සව අවස්ථාවලට ඇතුළත් විය.



මෙම මහා වැඩසටහන 2022 මාර්තු 8 වන දින රාජගිරියේ බැංකු අධ්‍යයන මධ්‍යස්ථානයේදී කළමනාකාරිත්වය□ කාර්ය මණ්ඩලය සහ ගනුදෙනුකරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. "දිරි අභිමානී" කාන්තා ව්‍යවසායක තරඟය - 2022 ආරම්භ කිරීමට සමගාමීව, එම අවස්ථාවේදී පහත දැක්වෙන විශේෂ අවස්ථා ද පවත්වන ලදී.

- දිරි අභිමානී (2021) වැඩසටහනේ ජාතික සහ පළාත් මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග ප්‍රදානය කරන ලදී.

- ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

- කාන්තා ව්‍යවසායකයින් අතර ණය පහසුකම් බෙදා දීම



## ලංකා පේ ටෙක්නොවේෂන් සම්මාන 2022(රන්)




වසරේ විශිෂ්ටම ලංකා-පේ කාඩ්පත් ක්‍රියාත්මක කරන්නා සඳහා වන ලංකා-පේ ටෙක්නොවේෂන් සම්මානය 2022 (රන්) දිනා ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමත් විය. 2022 මාර්තු 29 වන දින Lanka Pay Pvt Ltd විසින් සංවිධානය කරන ලද කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ පැවති උත්සවයේදී මෙම සම්මානය ප්‍රදානය කරන ලදී.

## ව්‍යවසාය 2022 වෙළඳ සහ අධ්‍යාපනික ප්‍රදර්ශනය

සමකාලීන ව්‍යවසායක සංස්කෘතියක් බිහි කිරීමේ අරමුණින්, 2022 වර්ෂයේ අප්‍රේල් 1 සිට 3 දක්වා කොළඹ BMICH හිදී කුඩා ව්‍යවසාය සංවර්ධන අංශය විසින් සංවිධානය කරන ලද ව්‍යවසාය 2022 - වෙළඳ සහ අධ්‍යාපනික ප්‍රදර්ශනයට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සහභාගී විය.




## "පැයෙන් පැයට බඩු මල්ල" වැඩසටහන



සිංහල සහ දෙමළ අලුත් අවුරුදු වැඩසටහනට සමගාමීව 2022 අප්‍රේල් 18 වන දින ජයග්‍රාහකයින්ට දෛනික අත්‍යවශ්‍ය ද්‍රව්‍ය පිරවූ බෑගයක් බෙදා දීම සඳහා පසුගිය වර්ෂවලදී පවත්වනු ලැබූ පරිදි, සියලුම ප්‍රාදේශීය සංවර්ධන ශාඛාවල "පැයෙන් පැයට බඩු මල්ල" වැඩසටහන පවත්වන ලදී.

## අනුරාධපුර මහමෙව්නාවේදී පවත්වන ලද දානමය පිංකම

පසුගිය වර්ෂවලදී ද සිදුකරනු ලැබූ පරිදි, අනුරාධපුර මහමෙව්නාවේදී පවත්වන ලද පිරිත් සජ්ඣායනා පිංකමේ අවසාන දිනය වූ 2022 ජුනි 18 වන දින ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් මෙම දානමය පිංකම සංවිධානය කරන ලදී.



## ලෝක ළමා දින වැඩසටහන්

ලෝක ළමා දිනය සැමරීම තුළින් දරුවන් අතර ඉතිරිකිරීමේ පුරුදු ඇති කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සියලුම ශාඛා විශේෂ වැඩසටහන් පවත්වන ලදී.





## "සිත්තම් පැංචා චිත්‍ර තරඟය" ත්‍යාග පිරිනැමීම

2022 ලෝක ළමා දිනයට සමගාමීව පවත්වන ලද "සිත්තම් පැංචා චිත්‍ර තරඟය 2021" හි ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග පිරිනමන ලදී.






## CIB සමඟ "පාට සිත්තම්" ළමා චිත්‍ර තරඟය - 2022 පැවැත්වීම

2022 ළමා දිනය සැමරීම සඳහා දරුවන් සහ ඔවුන්ගේ දෙමාපියන් සමඟ "පාට සිත්තම්" ළමා චිත්‍ර තරඟය - 2022 ඔවුන්ගේ අලෙවිසැල්වල පැවැත්වීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව CIB ජාලය සමඟ ඒකාබද්ධව කටයුතු කරන ලදී.





## ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී

නව නිපැයුම්කරුවන්ට දේශීය හා ගෝලීය වෙළඳපොළට ප්‍රවේශ වීම සඳහා මෙන්ම, ඔවුන්ගේ නිෂ්පාදන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර සැපයීම පිණිස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.



# අවදානම් කළමනාකරණය

## තවත් අභියෝගාත්මක වසරක්

2019 අප්‍රේල් මාසයේ පාස්කු ඉරිදා ප්‍රහාරයේ දිගුකාලීන බලපෑම්වලින් සහ 2020 මාර්තු මාසයේ අවස්ථා කිහිපයක දී පැතිරුණු COVID-19 වසංගතය මගින් ද ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව පීඩාවට පත්විය. COVID-19 වසංගතය පැතිරීම අවසන් වීමත් සමඟ රට යථා තත්ත්වයට පත්වීමෙන් පසු. ආර්ථිකය යථා තත්ත්වයට පත්වෙමින් පැවතුනද, ආනයන සඳහා ගෙවීමට විදේශ සංචිත නොමැති වීම සහ රටේ විදේශ ණය පැහැර හැරීම හේතුවෙන් 2022 වසර තුළ ආර්ථිකය දැඩි බාධකවලට මුහුණ දුන් අතර අවිනිශ්චිතතාවයන් ද ඉහළ මට්ටමකට ගොස් තිබුණි. ශ්‍රී ලංකාව තවමත් තම ණයහිමියන් සමඟ ණය පිළිබඳ සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියක නිරතව සිටියි. 2022 වර්ෂයේ දී, මෙතෙක් පැවති ගැඹුරුම ආර්ථික හා දේශපාලන අර්බුදයට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු විය.

අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය, ඉහළ උද්ධමනය සහ දේශපාලන අස්ථාවරත්වය සමඟ ඇති වී ඇති ආර්ථික අර්බුදය මගින් අප දිවයිනේ ආර්ථික කටයුතු අඩපණ කර තිබේ. දේශපාලන තත්ත්වය නිරන්තරයෙන් සහ අනපේක්ෂිත ලෙස වෙනස් වීම සහ ඉහළ යන මූල්‍ය, බාහිර සහ මූල්‍ය අංශයේ අසමතුලිතතාවයන් මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ සැලකිය යුතු අවිනිශ්චිතතාවයක් ඇති කර තිබේ. ඉතිහාසයේ වෙනත් කිසිදු කාලයකට වඩා වෙනස්ව, මෙම අර්බුදය මගින් සියලු ප්‍රජා වෙත බලපෑමක් සිදු කර ඇති අතර රටේ දුගීභාවය ද තවදුරටත් ඉහළ නංවා ඇත. මෙම ආර්ථික, මූල්‍ය සහ දේශපාලන අර්බුදය රටේ මූල්‍ය අංශයට ඍණාත්මක බලපෑමක් ඇති කිරීමට හේතු විය.

බැංකු අංශය අපගේ ආර්ථිකයේ වැදගත්ම අංශයකි. අවදානම් කළමනාකරණ දෘෂ්ටිකෝණයට අනුව, ද්‍රවශීලතා අවදානම හා පොළී අනුපාත අවදානම ආශ්‍රිතව ඇති වන අවදානම, ගෙවීම් පැහැර හැරීම් අඛණ්ඩව ඉහළ යාමේ හැකියාව, විදේශ මුදල් හිඟය හේතුවෙන් ඇති වන විදේශ විනිමය අවදානම ඇතුළු අභියෝගවලට මුහුණ පෑමට බැංකුවට සිදු වී ඇත. රටේ මූල්‍ය අංශයට ඇති වන අවදානම අඩු කිරීම සඳහා මහ බැංකුව විසින් නව රීති හා රෙගුලාසි හඳුන්වා දී අතර එහි ප්‍රතිපත්ති පොළී අනුපාත ද සීමා කර ඇත.

අස්ථාවර මෙහෙයුම් පරිසරය හේතුවෙන්, බැංකුව අවදානම් කළමනාකරණය සඳහා පූර්ව ක්‍රියාකාරී ප්‍රවේශ ක්‍රියාත්මක කර ඇත. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ආර්ථික අර්බුදවල බලපෑම අවම කිරීමට, අවම බාධා සහිතව පාරිභෝගිකයන්ට සේවය කිරීමට සහ වත්කම්වල ගුණාත්මකභාවය සහ එහි මෙහෙයුම්වල ශක්‍යතාව පවත්වා ගැනීමට බැංකුව මගින් කාලෝචිත පියවර ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කමිටුවේ මඟ පෙන්වීම සහ අවදානම් කළමනාකරණය කිරීමේදී ඔවුන්ගේ කණ්ඩායම් සමඟ සමීපව කටයුතු කරන පළපුරුදු සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකුගේ (අවදානම් කළමනාකරණ) මඟ පෙන්වීම යටතේ දැවැන්ත මෙහෙයුම් සහ මූල්‍ය ප්‍රතිඵල සඳහා අවදානම සහ ප්‍රතිලාභ සමතුලිත කිරීම පිණිස ඵලදායී හා යාවත්කාලීන කළ අවදානම් කළමනාකරණ පියවර සහ භාවිතයන් අප විසින් ස්ථාපනය කර ඇත. ඵලදායී අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මගින් බැංකුවේ අනපේක්ෂිත අවදානම කළමනාකරණය කිරීමට සහ අවම කිරීමට වඩාත් සාර්ථක තීරණයක් ගැනීමට සහ එහි උපායමාර්ගික සහ මෙහෙයුම් අරමුණු වැඩිදියුණු කිරීමෙන් තිරසාර වර්ධනයක් අත්කර ගැනීමටද බැංකුවට හැකියාව ලැබේ. වත්මන් ආර්ථික අර්බුද, රජයේ බදු ප්‍රතිපත්ති සහ මහ බැංකු නියම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

අවදානම් කළමනාකරණ අංශය වශයෙන් අපට අවදානම වෙනස් ආකාරයකින් හඳුනාගෙන අවදානම අවම කිරීම සඳහා නිර්දේශ සලකා බැලීමට සහ ප්‍රත්‍යක්ෂ අනාගතයක් සඳහා උපාය මාර්ග හඳුනා ගැනීමට ද හැකි විය.

## බැංකුවේ අවදානම කළමනාකරණ රාමුව

බැංකුවේ අවදානම නිරීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම සංවර්ධනය කිරීම සහ බැංකුව නිරාවරණය වන විවිධ අවදානම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම සහතික කිරීම සඳහා බැංකුව විසින් යාවත්කාලීන කරන ලද අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපනය කර ඇත.

බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව මගින්

- බැංකුව විසින් පිළිගත් අවදානම බැංකුවේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ගත යුතු අවදානමේ ප්‍රමාණය සහ වර්ගය තුළ මෙන්ම අවදානම් කළමනාකරණ පැතිකඩ තුළ ද පවතින බව සහතික කිරීම.
- සංවිධානය පුරා ඉහළ මට්ටමේ අවදානම් දැනුවත්භාවයක් සඳහා පහසුකම් සැලසීම සහ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම ස්වාධීනව අධීක්ෂණය කිරීම.
- ඉතා ඵලදායී අවදානම් තීරණ මෙහෙයවනු ලබන වටිනාකම්, විශ්වාසයන්, ආකල්ප සහ භාවිතයන් ඇතුළත් කළ අවදානම් කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා අවශ්‍ය ආයතනික සංස්කෘතිය ස්ථාපිත කිරීම.
- බැංකුවේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ගත යුතු අවදානමේ ප්‍රමාණය සහ වර්ගය සහ අවදානම දරා ගැනීමේ මට්ටම් අනුව අපේක්ෂිත අවදානම් පැතිකඩ නිර්වචනය කිරීම.
- අවදානම් පිළිගැනීම, මාරු කිරීම, අඩු කිරීම සහ අවම කිරීම සම්බන්ධ තීරණ සඳහා ක්‍රියාකාරී වගකීම ස්ථාපනය කිරීම සහ එසේ කිරීමට වඩාත් යෝග්‍ය ක්‍රම නිර්දේශ කිරීම.
- අඛණ්ඩ පදනමක් මත අනුමත බැංකුවේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ගත යුතු අවදානමේ ප්‍රමාණය සහ වර්ගයට එදිරිව අවදානම් පැතිකඩ ඇගයීමට ලක් කිරීම.
- උපකල්පනය කරන ලද අවදානම් නිරාවරණයන්ගෙන් ඇති විය හැකි විභව පාඩු ඇස්තමේන්තු කිරීම, අභ්‍යන්තර පාලන සමීපව නිරීක්ෂණය කිරීම සහ පසු විපරම් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, අවදානම් හිඟ මුදල් පිළිබඳ ආතති පරීක්ෂණ.
- ගිවිසුම්ගත බැඳීම්වලට ගරු කිරීම සහ අනපේක්ෂිත පාඩු සපුරාලීම සඳහා බැංකුව සතුව ද්‍රවශීලතා සහ ප්‍රාග්ධනය මත ප්‍රමාණවත් ස්වාරක්ෂක ඇති බව සහතික කිරීම සඳහා වරින් වර ආතති පරීක්ෂණ පැවැත්වීම.
- එක් එක් සිද්ධියේ නිශ්චිත තත්වයන් මත තීරණ තනි තනිව ගනු ලැබීම මත පදනම්ව නිශ්චිත ණය යෝජනාවල සමස්ත අවදානම් තත්ත්වය ඇගයීම, හඳුනා ගැනීම සහ නිර්දේශ කිරීම.




අවදානම කළමනාකරණය සඳහා ප්‍රවේශය



# අවදානම් කළමනාකරණය

## අවදානම් පාලනය

අවදානම් කළමනාකරණ පිළිවෙත් ඉහළ ප්‍රමිතියකින් යුත් පාලනයක් පිළිබිඹු කරන බව සහතික කිරීමට බැංකුව කැපවී සිටියි. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් පාලන ව්‍යුහය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ආරම්භ වී අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි, කමිටු සහ පවරන ලද අධිකාරී මට්ටම් හරහා ශාඛා මට්ටම දක්වා පහළට විහිදී යයි. සමස්ත බැංකුවේ අවදානම පාලනය කිරීමේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය අවසාන වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIMC) අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව (BHRRC)අධ්‍යක්ෂක මණ්ඩල IT අනුකමිටුව සහ අධ්‍යක්ෂක මණ්ඩල විගණන අනුකමිටුව (BAC) සහ කළමනාකරණ කමිටුව (MC) සමස්ත අවදානම් කළමනාකරය අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන අතර බැංකුවේ ව්‍යාපාරික රේඛාවෙන් ස්වාධීන පුද්ගලයෙකු වන ප්‍රධාන අවදානම් නිලධාරියා (CRO) සියලුම ව්‍යාපාර මට්ටම්වල දෛනික ක්‍රියාකාරිත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට නිතිපතා වාර්තා සපයයි.

ප්‍රධාන අවදානම් නිලධාරියා (CRO) යනු බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සහ අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට (BOD) සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත සහාය ලබා දීමේ වගකීම දරන ස්වාධීන පුද්ගලයෙකි. ප්‍රධාන අවදානම් නිලධාරියා (CRO) විසින් මෙහෙයවනු ලබන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව (RMD) විසින් පොළී අනුපාතය සහ වෙළඳපොළ අවදානම, ණය අවදානම, මෙහෙයුම් අවදානම, සයිබර් ආරක්ෂණ අවදානම, විදේශ විනිමය අවදානම සහ ද්‍රවශීලතා අවදානම යන අවදානම් කළමනාකරණ කාර්යයන් හයක් වෙන වෙනම ඉටු කරනු ලබයි.



## අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ අවදානම් කළමනාකරණ කමිටු

▪ **අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC)** - විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) මුලසුන හෙ-ාබවන අතර එම කමිටුව බැංකු අවදානම් කළමනාකරණ රාමුව පිළිබඳ තීරණ ගැනීම සඳහා සහාය ලබා දෙයි. මෙම කමිටුව විසින් බැංකුවේ සමස්ත අවදානම් පැතිකඩ පිළිබඳ නිර්දේශ ලබා දුන් අතර බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) නිර්දේශ කරන ලදී. ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ප්‍රධාන අවදානම් නිලධාරියා CRO සහ ඔහුගේ අංශය මගින් කලින් කල සකස් කර, සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) වෙත ඉදිරිපත් කරනු ලබයි.

▪ **අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව** (BAC) - අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව (BAC) මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ නියාමන අනුකූලතාව පරීක්ෂා කරයි. මෙම කමිටුව විසින් බැංකුවේ අභ්‍යන්තර විගණනයේ කාර්යසාධනය, නිරවද්‍යතාවය සහ ස්වාධීනත්-වය ද තක්සේරු කරයි.

▪ **අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව** (BHRRC) - අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව (BHRRC) විසින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ බැං-කුවේ ප්‍රධාන කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) තීරණය කළ යුතු වන්නේය. තවද, මෙම කමිටුව මගින් අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ මට්ටමේ නිලධාරීන් සඳහා ඉලක්ක සහ අරමුණු නියම කළ යුතු අතර, නියමිත ඉලක්ක සහ අරමුණුවලට එදිරිව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමන-ාකරණ මට්ටමේ නිලධාරීන්ගේ කාර්යසාධනය කලින් කල ඇගයීමට ලක් කළ යුතුය. පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ කාර්යසාධන පාදක දිරිගැන්-වීම් පිළිබඳ වෙනත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම තීරණය කළ යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාට අදාළ කරුණු සාකච්ඡා කරන අවස්ථාවක හැර, කමිටුවේ සියලුම රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරියා සහභාගී විය යුතුය.

▪ **අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනු කමිටුව** (BNC) - අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ මට්ටමේ නිලධාරීන් තෝරා ගැනීම / පත් කිරීම සඳහා කමිටුව ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතු අතර, මණ්ඩලයේ වගකීම් සමස්තයක් ලෙස ඉටු කිරීම සඳහා අදාළ අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන ලද කාර්යසාධනය සහ දායකත්වය සැලකිල්ලට ගනිමින්, වත්මන් අධ්‍යක්ෂවරුන් නැවත තේරී පත්වීම නිර්දේශ කළ යුතුය (නැතහොත් නිර්දේශ නොකළ යුතුය)

- **අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව** - තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව යනු බැංකුවේ තොරතුරු සහ තොරතුරු පද්ධතිවල ප්‍රධාන පාලන ව්‍යුහයයි. සියලුම තාක්ෂණික නිලධාරීන් සහ ප්‍රධාන අවදානම් නිලධාරියා (CRO) නියෝජනය කරන බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරිවරයාගේ (CIO)ප්‍රධානත්වයෙන් යුත් තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවක් 2013 වර්ෂයේ දී බැං-කුව විසින් ස්ථාපනය කර ඇති අතර බැංකුවේ සියලුම තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ගැටළු කලින් කල සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ සහ විසඳුම් ලබා දෙයි. බැංකුව මුහුණ දෙන තාක්ෂණය සහ සයිබර් අවදානම අඩු කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන මුලපිරීම් සැලකිල්ලට ගෙන ඇත.

  සයිබර් ආරක්ෂණ අවදානම් සහ විනිවිද යාම පිළිබඳ තක්සේරුවට අදාළ රාජකාරි ඉටු කිරීම සඳහා තොරතුරු ආරක්ෂක කළමනාකරණ නිලධාරි තනතුරක් ඇති කරන ලදී.

  ජාල ආරක්ෂාව ශක්තිමත් කිරීම.

  වැඩි දියුණු කළ පද්ධති ආරක්ෂාව, ලබා ගත හැකි බව, පාලනය සහ පද්ධතියේ අක්‍රිය කාලය නිරීක්ෂණය කිරීම.

## කළමනාකරණ මට්ටමේ අවදානම් කළමනාකරණ කමිටු

- **විධායක ණය කමිටුව** (ECC) - විධායක ණය කමිටුව යනු ණය අවදානම් සහ ණය කාර්යයන්හි ණය සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු කළමනාකරණ මට්ටමේ කමිටුවයි. විධායක ණය කමිටුව විසින් කලින් කල බැංකුවේ ණය ප්‍රතිපත්ති සමාලෝචනය/ක්‍රියාත්මක කරයි. කමිටුව වෙත පවරා ඇති අධිකාරි සීමාවන් තුළ ණය අනුමත කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ණය පහසුකම් නිර්දේශ කිරීමේ කාර්යයෙහි නිරත වේ.

- **වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව** (ALCO) - වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව යනු බැංකුවේ වෙළඳපල අවදානම සහ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු කළමනාක-රණ මට්ටමේ කමිටුවයි. පූර්වයෙන් නිර්ණය කළ අවදා-නම්/ප්‍රතිලාභ අනුපාතයක් වෙත ළඟා වීම සඳහා වත්කම් සහ වගකීම්වල පරිමාව, මිශ්‍රණය, කල් පිරීම, අනුපාත සං-වේදීතාව, ගුණාත්මකභාවය සහ ද්‍රවශීලතාවය කළමනාක-රණය කිරීම එම කමිටුවේ අරමුණයි. කෙටි කාලීන ලාභ, දිගු කාලීන ඉපැයීම් සහ බැංකුවේ දිගුකාලීන ද්‍රවශීලතා-වය ස්ථාවර කිරීමේ අරමුණින් ප්‍රාග්ධන ව්‍යුහය, නිෂ්පාදන මිලකරණය, අරමුදල් සැපයීම සහ ආයෝජන සලකා බලා ශේෂ පත්‍රයේ ඇතුළත් සහ ඇතුළත් නොවන තත්ත්වය-න් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීරණ ගැනීම වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුවේ කාර්යයන් අතරට ඇතුළත් වේ.

- **මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව** (ORMC) - මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) බැංකුවේ මෙහෙයුම් අවදානම කළමනාකරණය කරන අතර මෙහෙයුම් අවදානම් කළමනාකරණ ශිල්පීය ක්‍රම ක්‍රියාත්මක කරන අතර බැංකුවේ මෙහෙයුම් පාඩු අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන්හි අඛණ්ඩතාව පවත්වා ගැනීමට, ගනුදෙනු සැකසීමේදී දෝෂ අඩු කිරීමට, වංචා වැළැක්වීම ආදිය සඳහා පියවර ගනියි.
- **තොරතුරු ආරක්ෂණ කමිටුව** ISC - තොරතුරු ආරක්ෂණ කමිටුව ISC යනු බැංකුවේ තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ස්ථාපනය කර ඇති කළමනාකරණ මට්ටමේ කළමනාකරණ කමිටුවකි. සියලුම තොරතුරු පද්ධති සහ තීරණාත්මක තොරතුරු බැංකුව පුරා ආරක්ෂිතව සහ සුරක්ෂිතව පවතින බවත් පෞද්ගලිකත්වය සහ පාරිභෝගික විශ්වාසයට අනුකූලව පවතින බවත් තොරතුරු ආරක්ෂණ කමිටුව (ISC) අධීක්ෂණය කරයි.
- **කළමනාකරණ කමිටුව** MC - කළමනාකරණ කමිටුව (MC) යනු බැංකුවේ සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී විසින් ප්‍රධානත්වය දරන, එමෙන්ම, බැංකුවේ සියලුම විධායක මට්ටමේ කාර්ය මණ්ඩලය නියෝජනය කරන කමිටුවයි, කමිටුව කලින් කල සහ අවශ්‍ය අවස්ථාවල ක්‍රියාත්මක වෙයි. අවදානම සහ අවිනිශ්චිතතාව අවම කිරීම සඳහා කමිටුව කලින් කල බැංකුවේ සියලුම මෙහෙයුම් මට්ටමේ වාර්තා සමාලෝචනය කරයි.

**අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව** (RMD) - ප්‍රධාන අවදානම් නිලධාරී විසින් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ (RMD) ප්‍රධානත්වය දරන අතර ණය අවදානම, මෙහෙයුම් අවදානම සහ වෙළඳපොළ සහ පොළී අනුපාත අවදානම යන වෙනම කාර්යයන් තුනක් අවදානම් කළමනාකරණයට අයත් වේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ගත යුතු අවදානමේ ප්‍රමාණය සහ වර්ගය, අවදානම් පැතිකඩ, උපායමාර්ගය, අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන රාමුව, අවදානම් ප්‍රතිපත්ති, සීමාවන් සහ පවරා ඇති අධිකාරිය පිළිබඳව කලින් කල සමාලෝචනය කර මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරයි.
බැංකුවේ අවදානම් සම්බන්ධ ක්ෂේත්‍රය මූලික අවදානම් කාණ්ඩ කිහිපයකින් සහ සම්බන්ධිත අවදානම් සම්බන්ධ ක්ෂේත්‍ර සමඟ සෘජුවම සම්බන්ධ වේ. මේවා හඳුනාගෙන ඇති අතර බැංකුව වෙත ඒවායින් සිදු වන බලපෑම ද හඳුනාගෙන ඇති අතර එම අවදානම් මගින් අඛණ්ඩව මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා බැංකුව සතු හැකියාවට සහ ව්‍යාපාර වර්ධනය කිරීම සඳහා බලපෑම් කිරීමේ හැකියාවක් පවතී. බැංකුවේ අවදානම් දෙපාර්තමේන්තුව, අදාළ කළමනාකරණ කමිටු මෙම අවදානම් සම්බන්ධයෙන් බැංකුවේ තත්ත්වය අඛණ්ඩව නිරීක්ෂණය කරන අතර මෙහෙයුම් සිදු කිරීම සහ මෙහෙයුම්වල ප්‍රතිඵල මෙන්ම බාහිර මෙහෙයුම් පරිසරය මත පදනම්ව ඒවාට නිරාවරණය වීම් පිළිබඳව සලකා බලයි.

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන අවදානම් සාධක සහ පාලන ව්‍යුහය පිළිබඳ සමාලෝචනය

### ණය අවදානම

රජයේ සංවර්ධන බැංකු අතර ප්‍රමුඛ බැංකුව වන්නේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවයි. බැංකුව සතු ප්‍රධාන ව්‍යාපාරික මාර්ගය වන්නේ ණය ආශ්‍රිත මෙහෙයුම් වේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සමස්ත ණය ආවරණය අප සතු මුළු වත්කම්වලින් 73.6% කි. බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික කාර්යය වන්නේ ණය ලබා දීම වන හෙයින් කළමනාකරණය කරගත යුතු ඉතාම වැදගත් අවදානම් වර්ගය වන්නේ ණය අවදානමයි. එබැවින්, බැංකුව ණය අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය කෙරෙහි සැලකිය යුතු බර තැබීමක් සිදු කරයි, කොවිඩ් 19 සහ පශ්චාත් ආර්ථික අර්බුද තත්ත්ව යටතේ ණය සහ අත්තිකාරම් අනුපාතය 2021 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දින වන විට රු. (210,563) දහසක් දක්වා අඩු වන අනුපාතයකින් වැඩි වී ඇත.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ණය අවදානම් කළමනාකරණය සඳහා වන ප්‍රධාන මාර්ගෝපදේශය වන අතර එය මණ්ඩලය විසින් අනුමත කර වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන අතර එහි ණය අවදානම හඳුනා ගැනීම, කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා වන සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ ක්‍රම ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ කමිටු සහ කළමනාකරණ මට්ටමේ කමිටු ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය අවදානම් පාලනය කිරීමේ නිරත වේ. අවදානම් කළමනාකරණ දෙපරේතමේන්තුවට සම්බන්ධ ණය අවදානම් පරිපාලන ඒකකය ආරක්ෂක අවදානම, මූල්‍ය වෙළඳපොළ ප්‍රවණතා, අක්‍රිය ණය අවදානම සහ ණය අධීක්ෂණය හඳුනා ගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතුය, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ ඇති ණය අවදානම් කළමනාකරණ කණ්ඩායම මගින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය කළඹ පිළිබඳ සමාලෝචනය කලින් කලට මණ්ඩලයට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

දෛනික පාරිභෝගික විශ්ලේෂණය සහ අයකර ගැනීමේ ක්‍රියාවලීන් හරහා බිම් මට්ටමේ (ශාඛා මට්ටමින්) ශාඛා කළමනාකරු / ණය නිලධාරීන් සහ තනි ණය පහසුකම් මගින් ණය කළඹ සමීපව අධීක්ෂණය කරනු ලැබේ. කෙසේ වුවද, ප්‍රධාන කාර්යාල මට්ටමින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් බැංකුවේ ණය කළඹ විශ්ලේෂණය කර මාසිකව ස්වාධීන නිරීක්ෂණ සමඟ KRI (ප්‍රධාන අවදානම් දර්ශක) වාර්තාව යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. KRI වාර්තාවට මුළු ණය කළඹ විශ්ලේෂණය, අක්‍රිය වත්කම් විශ්ලේෂණය සහ ණය ප්‍රතිපාදන විශ්ලේෂණය ආදිය ඇතුළත් වේ. අවදානම් කළමනාකරණ අංශය මගින් සුවිශේෂී හැසිරීම් සහිත පාරිභෝගිකයන් සමීපව නිරීක්ෂණය කර මාසික පදනමින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

### ණය පරිපාලන ඒකකය

ණය ආරක්ෂාව සම්බන්ධයෙන් හඳුනාගත් අවදානම් හේතුවෙන් බැංකුව විසින් ස්වාධීන ණය පරිපාලන අංශයක් ස්ථාපනය කර ඇති
2022 වර්ෂයේ දී අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවෙන් වෙන් වූ දෙපාර්තමේන්තුව ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරයාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ ණය පරිපාලන ක්‍රියාවලිය සුමටව ක්‍රියාත්මක කිරීම සහ ණය අවදානම අඩු කිරීම සඳහා පළපුරුද්ද සහ සුදුසුකම් ලත් අතිරේක කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරමින් ණය පරිපාලන ඒකකය පුළුල් කර ශක්තිමත් කරන ලදී

### ණය සමාලෝචන යාන්ත්‍රණය (LRM)

2017 වර්ෂයේ සිට, ගුණාත්මක ණය කළඹක් පවත්වා ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පුළුල් ණය සමාලෝචන යාන්ත්‍රණයක් ස්ථාපනය කර ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ණය සමාලෝචන ප්‍රතිපත්තිය මඟින් ගුණාත්මක හා ප්‍රමාණාත්මක ණය පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා ණය සමාලෝචන යාන්ත්‍රණය සඳහා පොදු රාමුවක් ස්ථාපනය කෙරේ මෙම සමාලෝචනය සීමාවට වඩා ඉහළින් ඇති සියලුම ක්‍රියාකාරී ණය මත විය යුතු අතර එය බැංකුවේ ණය කළඹෙන් 40% කට වඩා වැඩි විය යුතුයි ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (IRMC) නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සීමාව තීරණය කළ යුතුය/අනුමත කළ යුතුය.

### අවදානම් ශ්‍රේණිගත කිරීම

බැංකුව 2016 අගෝස්තු මාසයේ සිට බැංකුවට සුවිශේෂී වූ ආකෘතියක් මත පදනම්ව පාරිභෝගික ශ්‍රේණිගත කිරීම හඳුන්වා දී ඇති ගනුදෙනුකරුවන් AAA, AA, A සහ BBB ලෙස ශ්‍රේණිගත කර ඇති චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස්වලට අනුව, BBB ශ්‍රේණිගත කිරීමෙන් පහළ ශ්‍රේණිගත කිරීමක් සහිත පාරිභෝගිකයා බැංකුවෙන් ණය පහසුකමක් ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි අවදානම් දෙපාර්තමේන්තුව යෝජිත ණය ප්‍රභව පද්ධතිය (LOS) ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට සෘජුවම සම්බන්ධ වී ඇති අතර ඉහත සඳහන් කළ ණය ප්‍රභව පද්ධතියට (LOS) අවදානම් ශ්‍රේණිගත කිරීම ඇතුළත් වේ.

### අවදානම් පාදක මිලකරණය

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේ සිට බැංකුවේ ණය පහසුකම් සඳහා අවදානම් පාදක මිලකරණයක් හඳුන්වා දෙන ලදී. පාරිභෝගික අවදානම් ශ්‍රේණිගත කිරීම මත පදනම්ව, බැංකුව පහසුකමේ මිල ගළපා ඇති මෙම මිලකරණ ක්‍රමය බැංකු අරමුදල් යටතේ සලකා බලන පහසුකම් සඳහා පමණක් අදාළ වන අතර ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම යටතේ සලකා බලන අනෙකුත් පහසුකම් අවදානම් පාදක මිලකරණයෙන් නිදහස් කර ඇත.

## ණය අලාභ ප්‍රතිපාදන (හානිකරණ ප්‍රතිපාදන සහ ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිපාදන)

ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල වීම සඳහා බැංකුව ණය අලාභ පදනම සඳහා හානිකරණය ක්‍රම දෙක මත ගණනය කර ඇත.

- තනි පුද්ගල හානිකරණය
- සාමූහික හානිකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ CBSL මාර්ගෝපදේශවලට අනුව, බැංකුව ප්‍රතිපාදන ක්‍රම දෙකක් අනුගමනය කරයි. එම ප්‍රතිපාදන කාණ්ඩ වන්නේ:

- සාමාන්‍ය ප්‍රතිපාදන (ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශවලට අනුව)
- විශේෂිත ප්‍රතිපාදන (ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශවලට අනුව)

බැංකුවේ වෙන් කිරීම් ආවරණ අනුපාතය සහ බැංකුවේ විවෘත ණය නිරාවරණ අනුපාතය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කලින් කල ගණනය කර විශ්ලේෂණය කරනු ලැබේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මෙම අනුපාත සහ ඒ සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.

## SLFRS 9 ක්‍රියාත්මක කිරීම

2018 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත SLFR 9 සමඟ අනුකූල වීම සඳහා බලපත්‍රලාභී බැංකුවේ ණය පහසුකම් වර්ගීකරණය, හඳුනා ගැනීම, මැනීම පිළිබඳ බැංකු පනතේ 13 සහ 14 නියම බැංකුව මගින් ක්‍රියාත්මක කර ඇත. මෙම වෙන්කිරීම් ක්‍රමය පදනම් වී ඇත්තේ පැහැර හැරීමට ලක්වූ නිරාවරණ EAD ණය පැහැර හැරීමේ සම්භාවිතාව (PD) අලාභ ගෙන එන ලද පැහැර හැරීම් සහ 1 වැනි සහ 2 වැනි වාරික හිඟවීම් භාවිත කරමින් දරන ලද ණය අලාභය මත වූ ඉදිරි දැක්ම මතය.

## ආංශික සීමා සහ සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මගින් ණය ලබා ගැනීම සඳහා බැංකුව විසින් අනුමත කරන ලද ආංශික සීමා ස්ථාපනය කර ඇත. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් කලින් කල ආර්ථික හා කර්මාන්ත ප්‍රමිතීන්ට අනුව මෙම සීමා අනුමත කරන ලදී. ව්‍යාපාරික ඒකක මෙම ආංශික සීමාවන්ට අනුව ඔවුන්ගේ තනි ණය කළඹ කළමනාකරණය කරයි.

## ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

අර්ථ දක්වා ඇති ද්‍රවශීලතාවය තුළ බැංකුව ක්‍රියාත්මක වන බව සහතික කිරීම බැංකුවේ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව මගින් සිදු කෙරේ.

බැංකුවේ ද්‍රවශීලතා ප්‍රතිපත්ති, CBSL නියාමන අවශ්‍යතා සහ භාවිතයන්ට අනුකූලව සීමා කර පවත්වාගෙන යයි.

මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීමෙන් පියවනු ලබන බැංකුවේ මූල්‍ය බැඳීම් සපුරාලීමේදී මුහුණ දීමට සිදු වන දුෂ්කරතා බැංකුව මුහුණ දෙන අවදානමයි. ද්‍රවශීල වත්කම් අනුපාතය LAR මත 20% ක් වන නියාමන අවශ්‍යතාවයට වඩා වැඩි සහ ද්‍රවශීලතා ආවරණ අනුපාතය LCR 90%) ට වඩා ඉහළ, මනා ද්‍රවශීලතා තත්වයක් පවත්වා ගැනීම බැංකුවේ ප්‍රතිපත්තියයි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, බැංකුව අඛණ්ඩ පදනමක් මත ද්‍රවශීල වත්කම් සහ වගකීම් ඇගයීම සහ අධීක්ෂණය සිදු කරයි. ප්‍රාග්ධනය ප්‍රවේශමෙන් කළමනාකරණය කිරීම, වත්මන් ආර්ථික අර්බුදවලට ප්‍රතිචාර වශයෙන් නියාමකයා විසින් සහනශීලී පියවර අනුගමනය කිරීම සහ සිල්ලර හා ආයතනික ගනුදෙනුකරුවන්ගෙන් ශක්තිමත් තැන්පතු වර්ධනය මගින් වසර තුළ බැංකුව ශක්තිමත් ද්‍රවශීලතා තත්වයක් පවත්වා ගෙන යන ලදී.

බැංකුවේ ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කරනු ලබන්නේ නියාමන අවශ්‍යතා සහ කොටස් ප්‍රවේශය සහ ප්‍රවාහ ප්‍රවේශය යටතේ අවශ්‍යතා යන දෙකම යටතේ ප්‍රධාන ද්‍රවශීලතා දර්ශක අධීක්ෂණය කිරීමෙනි. සෑම අවස්ථාවකදීම අපේක්ෂිත ද්‍රවශීලතා මට්ටම පවත්වා ගෙන යන බවත්, බැංකුවේ ඉලක්කය සපුරා ගැනීම සඳහා ගත යුතු අවදානමේ ප්‍රමාණය සහ වර්ගයට අනුකූල වන බවත් සහතික කිරීම සඳහා වත්කම් සහ වගකීම් දෙකෙහිම වෙනස්කම් මනිනු ලබන්නේ අරමුදල් අවශ්‍යතාවලට සාපේක්ෂව වේ. එමගින් උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් සහ විවිධ අරමුදල් ප්‍රභවයන්හි ප්‍රමාණවත් අමතර මට්ටම් පවත්වා ගැනීමෙන් ද්‍රවශීලතා අවදානම අවම කරනු ලැබේ.

බැංකුවේ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේ ප්‍රධාන වගකීම පැවරෙන්නේ වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) වෙතය. වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) යනු බැංකුවේ ආයතනික සහ විධායක මට්ටමේ සේවකයින්ගෙන් සමන්විත වන විධායක මට්ටමේ කමිටුවකි. කමිටුව අවම වශයෙන් මසකට වරක් හෝ අවශ්‍යතා පදනම මත නිතර රැස්වේ. ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් අධීක්ෂණ ශිල්පීය ක්‍රම සහ ප්‍රවේශයන් භාවිතා කරයි.

- ප්‍රවාහ ප්‍රවේශය
- ද්‍රවශීලතාවය පිළිබඳ ආතති පරීක්ෂාව
- කොටස් ප්‍රවේශය

| සියලු සංඛ්‍යා රු. 000' වලින් | | කම්පන | | |
|---|---|---|---|---|
| | 2022.12.31 දිනට ශේෂය | සුළු | මධ්‍යම | ප්‍රධාන |
| කම්පනයේ විශාලත්වය | - | 10% | 15% | 20% |
| ද්‍රවශීල වත්කම් | 55,790,668 | 55,790,668 | 55,790,668 | 55,790,668 |
| මුළු වගකීම් | 200,505,077 | 200,505,077 | 200,505,077 | 200,505,077 |
| මුළු වගකීම් මත වටිනාකම පහත වැටීම | - | 20,050,508 | 30,075,762 | 40,101,015 |
| කම්පනයෙන් පසු සංශෝධිත මුළු වගකීම් | - | 180,454,569 | 170,429,315 | 160,404,061 |
| කම්පනයෙන් පසු සංශෝධිත ද්‍රවශීල වත්කම් | - | 35,740,160 | 25,714,907 | 15,689,653 |
| ද්‍රවශීල වත්කම් අනුපාතය | 27.83% | 19.81% | 15.09% | 9.78% |
| ද්‍රවශීල වත්කම් අවශ්‍යතාවය | 40,101,015 | - | - | - |
| පවතින ද්‍රවශීල වත්කම් | 55,790,668 | 35,740,160 | 25,714,907 | 15,689,653 |
| අතිරික්ත ද්‍රවශීලතාවය / අතිරේක අවශ්‍යතාවය | 15,689,653 | (4,360,855) | (14,386,109) | (24,411,363) |

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් විවිධ බරපතල තත්ත්වයන්ට සම්බන්ධ අවස්ථා තුනක් යටතේ බැංකු ද්‍රවශීලතාවය පිළිබඳ ආතති පරීක්ෂණ විධිමත්ව සිදු කරයි. කාලෝචිත මූල්‍ය වෙළඳපොළ වෙනස්කම්, අනෙකුත් ආර්ථික වෙනස්කම් සහ ප්‍රතිපත්ති වෙනස්කම් අනුව, සෑම මසකම, දෙපාර්තමේන්තුව ආතති පරීක්ෂණයේ ප්‍රතිඵලය ඇගයීමට ලක් කරන අතර අනපේක්ෂිත තත්ත්ව මගින් බැංකුවේ ද්‍රවශීලතාවයට ඇති විය හැකි බලපෑම් ද තක්සේරු කරයි. ආතති පරීක්ෂණයේ ප්‍රතිඵලයට අනුව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වත්කම් සහ වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) මගින් එවැනි තත්වයන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග සහ අරමුදල් සැකසීම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලබයි.

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

2022 මූල්‍ය වර්ෂයේ ආර්ථික අර්බුද සහ ආර්ථික පාලන අරමුණු සඳහා රජයේ ප්‍රතිපත්ති බැංකුවේ ක්‍රියාකාරිත්වයට සෘජුවම බලපෑමක් සිදු කර තිබුණි. වර්තමානයේ බැංකුව මගින් මුළු රටම ආවරණය වන පරිදි ශාඛා 276 ක් ස්ථාපනය කර ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් 2531කට අධික සංඛ්‍යාවක් සේවයේ නිරතව සිටින අතර සහ සහායක සේවා සඳහා මනා ප්‍රමිතියෙන් යුත් තාක්ෂණික විසඳුම් (CORE) බැංකු පද්ධතිය, ATM සහ CDM සහ මානව සම්පත් පද්ධතිය ස්ථාපනය කර ඇත. නව ණය ආරම්භක පද්ධතියේ (LOS) හැකියාවන් ඇගයීම සහ නව මෙහෙයුම් ඵලදායී සංවර්ධන තීරණ සඳහා ඉදිරියට ගත යුතු පියවර ඇස්තමේන්තු කරනු ලබයි. එබැවින්, මෙහෙයුම් අවදානම යනු බැංකුවේ මෙහෙයුම් ක්‍රියාවලියේ ආවේණික අවදානම වන අතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2013 වර්ෂයේ දී විස්තීර්ණ අවදානම් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් ස්ථාපනය කර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මෙය බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඳහා ප්‍රධාන මඟ පෙන්වීමක් වන අතර එය කලින් කල සමාලෝචනය කරනු ලැබේ. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් අතරතුර ඇති වන මෙහෙයුම් අවදානම් සිදුවීම් අධීක්ෂණය කිරීම සහ ආවරණය කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් එහි අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය මනාව ස්ථාපනය කර ඇත.

2012 වර්ෂයේ සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අධීක්ෂණය යටතේ මෙහෙයුම් අවදානම් උප කමිටුවක් ස්ථාපනය කර ඇති අතර එම කමිටුව මගින් මෙහෙයුම් අලාභය පිළිබඳ කාලානුරූප වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මණ්ඩලයට (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩලයට කාර්තුමය සහ මාසික පදනමින් ඉදිරිපත් කරයි.

## ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම BCP සහ ආපදා ප්‍රතිසාධන DR ප්‍රතිපත්තිය

අනපේක්ෂිත තත්වයක් තුළ මෙහෙයුම් අවදානම් සිදුවීම් අවම කිරීම සඳහා බැංකුව විසින් විස්තීර්ණ හා යාවත්කාලීන කරන ලද ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP) සහ ආපදා ප්‍රතිසාධන (DR) ප්‍රතිපත්ති ස්ථාපනය කර ඇති අතර මෙම ප්‍රතිපත්ති දෙක ආපදා ප්‍රතිසාධන (DR) පරීක්ෂා කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (BCP) පරීක්ෂා කිරීම මගින් කලින් කල යාවත්කාලීන වේ.

## පොළී අනුපාත අවදානම

පොළී අනුපාත වෙනස් වීම හේතුවෙන් බැංකුවේ ඉපැයීම් මෙන්ම බැංකුවේ වත්කම්, වගකීම් (බැරකම්) සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමවල පවතින ආර්ථික වටිනාකම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. රජයේ මූල්‍ය ප්‍රතිපත්තිවල වෙනස්වීම් හේතුවෙන් පොළී අනුපාත අවදානම ඇති විය. වර්තමාන වටිනාකමෙහි වෙනස්වීම් සහ කල් පිරෙන තෙක් රඳවා ගැනීමට අපේක්ෂා කරන බැංකුවක ශේෂ පත්‍රයේ වත්කම් අනාගත මුදල් ප්‍රවාහවල නොගැළපීම මගින් බැංකුවක ප්‍රාග්ධනයට සහ ඉපැයීම්වලට සෘණාත්මක ලෙස බලපෑ හැකි පොළී අනුපාතවල වෙනස්කම් බැංකුවේ ප්‍රාග්ධනය සහ ඉපැයීම් කෙරෙහි ද බලපෑමක් සිදු කළ හැකිය. (2022) වර්ෂය මුළුල්ලේ ප්‍රතිපත්ති අනුපාත සුළු වශයෙන් ඉහළ ගොස් තිබුණු අතර එමගින් පොළී අනුපාත වැඩි වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පොළී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියට අනුව, බැංකුවේ පරතරය සහ කාල සීමා විශ්ලේෂණය මත පදනම්ව පොළී අනුපාත තීරණය කිරීමේ වගකීම වත්කම් හා වගකීම් කමිටුව (ALCO) වෙත පැවරේ. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පොළී අනුපාත උච්චාවචනයන් පිළිබඳ අවදානම් ඇගයීම සිදු කරනු ඇත. කෙසේ වුවද, දැනට වත්කම් හා වගකීම් කමිටුව (ALCO) විසින් වෙළඳපල තත්ත්ව සහ ණය තැන්පතු අනුපාතය මත පදනම්ව ණය සහ තැන්පතු යන දෙකම සඳහා පොළී අනුපාත තීරණය කරයි.

## තොරතුරු අවදානම සහ සයිබර් ආරක්ෂණ අවදානම්

මෙය බැංකුවේ එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීම, ගිණුම් පොත් සැසඳීම සහ තොරතුරු සහ වාර්තා ගබඩා කිරීම සහ ලබා ගැනීම සඳහා පරිගණක පද්ධති භාවිතා කිරීමට අදාළ වේ. සයිබර් ආරක්ෂණ අවදානම් ඇති වන්නේ පද්ධති, ජාල හෝ දත්ත සමුදායන්වලට සයිබර් ප්‍රහාර එල්ලවීමෙන් හෝ ඒ සඳහා ප්‍රවේශ වීමේ අධිකාරිය නොලත් පුද්ගලයන් ඒ වෙත ප්‍රවේශ වීම හේතුවෙන් පාරිභෝගික දත්ත නැතිවීම, මෙහෙයුම් කටයුතුවලට බාධා වීම හෝ කීර්ති නාමයට හානි සිදු වීම මගින් 2014 වර්ෂය අවසානය දක්වා බැංකුව විවිධ තොරතුරු තාක්ෂණ වේදිකා හතරක කටයුතු කරන ලදී. දැනට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මධ්‍යගත තොරතුරු තාක්ෂණික විසඳුමක කටයුතු කරන අතර ඔවුන්ගේ පාරිභෝගිකයින් සඳහා ඩිජිටල් බැංකුකරණ විකල්ප ලබා දෙයි. 2015 වර්ෂයේ සිට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව Lanka Pay Network සහ එහිම ATM මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ වී සිටින දිවයින පුරා සිටින ගනුදෙනුකරුවන් සඳහා ATM ජාල පහසුකම් සපයා ඇත. වර්තමානයේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව තම ගනුදෙනුකරුවන් සඳහා පාරිභෝගික තැන්පතු යන්ත්‍ර CDM පහසුකම් ද සපයා ඇත.

තවද, බැංකුව ස්වකීය සේවක දත්ත පදනම සහ සේවක වැටුප් ලැයිස්තුව කළමනාකරණය කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් මගින් මෙහෙයුම් කටයුතු සිදු කරයි. 2022 වර්ෂය තුළ බැංකුව QR කේතය සහ ප්‍රතිසාධන කළමනාකරණ පද්ධතිය වැනි නව තොරතුරු පද්ධති සමඟ එහි මෙහෙයුම් කටයුතු සිදු කරයි.

## තොරතුරු තාක්ෂණ පාලන ව්‍යුහය

## තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව

තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව බැංකුවේ තොරතුරු සහ තොරතුරු පද්ධතිවල ප්‍රධාන පාලන ව්‍යුහය වේ. 2013 වර්ෂයේ දී බැංකුවේ ප්‍රධාන තොරතුරු නිලධාරිගේ ප්‍රධානත්වයෙන් යුත් තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුවක් ස්ථාපනය කර ඇති අතර සියලුම තාක්ෂණික නිලධාරීන් සහ ප්‍රධාන අවදානම් නිලධාරී එම කමිටුව නියෝජනය කරයි.

## තොරතුරු තාක්ෂණ ආරක්ෂක ප්‍රතිපත්තිය

යාවත්කාලීන කරන ලද සහ පැහැදිලිව අර්ථ දක්වා ඇති තොරතුරු තාක්ෂණය ආශ්‍රිත ප්‍රතිපත්ති නියාමන අධිකාරියට අනුකූල වන පරිදි තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන අතර ප්‍රධාන තොරතුරු නිලධාරියා මෙම ප්‍රතිපත්ති පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වගකිව යුතු වේ.

## විධිමත් තොරතුරු තාක්ෂණ අවදානම් ඇගයීම

ස්වාධීන පාර්ශවයක් විසින් සිදු කරනු ලබන VAPT පරීක්ෂණය, IT මෙහෙයුම්වලට අදාළ ආරක්ෂක අවදානම අවම කිරීමේ එක් ක්‍රමයකි.

## තොරතුරු තාක්ෂණ විගණන

ස්වාධීන පාර්ශව විසින් සිදු කරනු ලබන තොරතුරු තාක්ෂණ විගණනය.

## තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතිය (ISMS)

2015 වර්ෂයේ සිට බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරියාගේ අධීක්ෂණය යටතේ බැංකුවේ දත්ත සහ තොරතුරු සඳහා මෙහෙයුම් අවදානම අධීක්ෂණය කිරීම සහ අවම කිරීම සහ බැංකුවේ ඇති තොරතුරු සහ දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා බැංකුවේ තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධතියේ (ISMS) කාර්යය ක්‍රියාත්මක වේ.බැංකුවේ තොරතුරුවල ආරක්ෂාව සහ තොරතුරු පිළිබඳ අභ්‍යන්තර පාලන පියවර පවත්වා ගැනීම සඳහා තොරතුරුවල ආරක්ෂාව සහ පිළිගත හැකි භාවිත ප්‍රතිපත්ති පවත්වාගෙන යාම සහ අනුමත කිරීම සඳහා බැංකුවේ තොරතුරු ආරක්ෂක නිලධාරියා (ISO) වගකිව යුතු වේ.

## තොරතුරු ආරක්ෂණ කමිටුව

2022 වර්ෂයේ සිට, 2021 බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුවට අනුකූල වීම සඳහා බැංකුව තොරතුරු ආරක්ෂක කමිටුව ස්ථාපනය කර ඇත.

## අනුකූලතා අවදානම් කළමනාකරණය

බැංකුව කෙරෙහි ඇති වගකීම් අසාර්ථක වීම හෝ උල්ලංඝනය වීම වළක්වා ගැනීම සඳහා බැංකුව එහි ප්‍රඥප්තිය සහ මුදල් අධිකාරිය සහ අනෙකුත් නෛතික / රාජ්‍ය ආයතන විසින් පනවා ඇති නීති රීතිවලට අනුකූලව කටයුතු කරන බව සහතික කිරීම සඳහා බැංකුවේ කළමනාකාරිත්වය විශාල අවධානයක් යොමු කරයි අනුකූලතා නිලධාරීන්ගේ ප්‍රධානම අරමුණු වන්නේ අභ්‍යන්තර පාලන/නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීමයි. අනුකූලතා අවදානම යනු කර්මාන්ත නීති සහ රෙගුලාසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති හෝ නියමිත මනා පරිචයන්ට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් වීම හේතුවෙන් බැංකුවට නෛතික දණ්ඩන, මූල්‍යමය රාජසන්තක කිරීම් සහ ද්‍රව්‍යමය අලාභයන්ට නිරාවරණය වීමේ විභවයයි, මෙමඟින් නියාමන සම්බාධක, මූල්‍යමය දණ්ඩන, ව්‍යාපාරයට සිදු වන බාධා, මෙහෙයුම් සහ කීර්ති නාමයට හානි වීමට හේතු විය හැකිය. බැංකුවේ අනුකූලතා කාර්යය සහකාර සාමාන්‍යාධිකාරී (අනුකූලතා) ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මණ්ඩලයේ BIRMC විෂය පථයට අයත් වේ. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, ඔහු අනුකූලතා අවශ්‍යතා අධීක්ෂණය සහ ඇගයීම සිදු කරන අතර බැංකුවේ අනුකූලතා තත්ත්වය පිළිබඳ කාර්තුමය වාර්තා සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මණ්ඩලය BIRMC වෙත ඉදිරිපත් කරයි. අනුකූලතා නිලධාරියා විසින් බැංකුවේ අවශ්‍ය ව්‍යවස්ථාපිත වාර්තා නියාමකයා වෙත කාලෝචිත ලෙස ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂා කරයි. අනුකූලතා අවදානමට මුහුණ දීම සඳහා ඵලදායී පාලන රාමුවක් සමඟ බැංකුව අවදානම් ඇගයීම සඳහා නවීන සහ නව්‍ය උපාය මාර්ග අනුගමනය කරනු ලබන අතර මූල්‍ය ස්ථාවරත්වය සහ ව්‍යාපාරය කරගෙන යන ආකාරය පවත්වා ගැනීම සඳහා බැංකුව ආරක්ෂාව සහ අඛණ්ඩතාව සහතික කරයි.

- බලයලත් පාර්ශවයන් විසින් ලබා දෙන අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි හඳුනා ගැනීම සහ ඒවා කාලෝචිත ලෙස සමාලෝචනය කිරීම සහතික කිරීම.
- බැංකුවේ ශාඛා, අංශ සහ නිෂ්පාදන සඳහා අනුකූලතාව පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඇගයීම.
- පුහුණු සැසි හරහා දැනුවත් කිරීම.

## ප්‍රාග්ධන අවදානම් කළමනාකරණය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) මගින් බැංකුවක අවදානම් මත බර තැබූ වත්කම්වලට සාපේක්ෂව බැංකුවේ ප්‍රාග්ධනය මනිනු ලබයි. අවදානම් මත බර තැබූ වත්කම්වලට ප්‍රාග්ධන අනුපාතය බැංකුවේ මූල්‍ය ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරයි. එබැවින්, ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) යනු බැංකුවක ශක්තිමත්භාවය සහ ස්ථාවරත්වය පෙන්නුම් කරන ප්‍රධාන මූල්‍ය දර්ශකවලින් එකකි. මෙමඟින් බැංකුව විසින් සිදු කරනු ලබන විවිධ ආර්ථික ක්‍රියාකාරකම් අතරතුර, අනපේක්ෂිත පාඩු තත්ත්වයකදී, බැංකුවට අඛණ්ඩව පැවතීමේ හැකියාව මනිනු ලබයි. බාසල් කමිටුව බැංකුවේ ප්‍රාග්ධනය පිළිබඳ මිනුම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව, 2010 දෙසැම්බර් මාසයේදී නිකුත් කරන ලද BASLE III ගිවිසුම මගින් බාසල් II ගිවිසුම ප්‍රතිස්ථාපනය කරන ලද අතර එය බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා BASLE III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ 2016 අංක 01 දරන මහ බැංකු නියමය මත පදනම්ව 2017 ජූලි 1 වන දින ශ්‍රී ලංකාව තුළ බලාත්මක කර ක්‍රියාත්මකව ඇත. නියාමන අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා පූර්ව ක්‍රියාකාරී ප්‍රාග්ධන කළමනාකරණයක් ඇති කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සිය ප්‍රාග්ධන වර්ධන සැලැස්ම වරින් වර සංශෝධනය කර ඇත. 2017 දෙවන කාර්තුව අවසන් වන තෙක් බැංකුව බාසල් II ගිවිසුම්වලට අනුකූලව කටයුතු කර ඇති අතර අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතාවය වූ 10% පවත්වා ගෙන ගොස් ඇත. කෙසේ වුවද, 2017 ජූනි මාසයේ සිට බාසල් III හඳුන්වාදීමත් සමඟ, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මගින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක මට්ටම අවම වශයෙන් 125% ක අනුපාතයකින් සපුරාලීම සඳහා එහි ප්‍රාග්ධනය වැඩි කිරීමට සිදු වී ඇත.

# විදේශ විනිමය අවදානම
2022 වසර තුළ විදේශ විනිමය වෙළෙඳපොළේ අනපේක්ෂිත හා පුරෝකථනය කරන ලද උච්චාවචනයන්ගෙන් ඉපැයීම් සහ ප්‍රාග්ධන ලාභ කෙරෙහි විදේශ විනිමය අනුපාතිකයෙන් බලපෑමක් සිදු විය. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, බාහිර මූලාශ්‍රවලින් විදේශ මුදල් ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පියවර කිහිපයක් ගන්නා ලදී. තවද, සංචිත වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී.

# නෛතික අවදානම
නෛතික අවදානම මෙහෙයුම් අවදානමේ ප්‍රධාන කොටසකි. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් පිළිබඳව දැනුවත්භාවය නොමැතිකම හෝ වරදවා වටහා ගැනීම සහ විෂමාචාරය හේතුවෙන් නෛතික අවදානමක් ඇති විය හැකිය. සාවද්‍ය ලේඛනගත කිරීම් සහ කෙටුම්පත් කිරීමේ අඩුපාඩු හේතුවෙන් අධිකරණයක් මගින් බලාත්මක කළ නොහැකි කොන්ත්‍රාත්තු හේතුවෙන් සිදුවන පාඩු මෙයට ඇතුළත් විය හැකිය, එමගින් දඩ, දණ්ඩන සහ දණ්ඩනීය හානි හෝ වගකීමක් හෝ අලාභයක් සිදුවිය හැකි බැංකුවට එරෙහිව හිමිකම් පෑමක් හෝ සිදු විය හැකිය. නීති අංශය ව්‍යාපාර අංශවලට මඟ පෙන්වන අතර බැංකුවේ නෛතික අවදානම උපායමාර්ගිකව කළමනාකරණය කිරීමේ නිරත වේ. නීති අංශය අනෙකුත් ව්‍යාපාරික අංශ සමඟ සහයෝගයෙන් විභව්‍ය නෛතික අවදානම් සහ ගැටළු හඳුනා ගැනීමට සහ බැංකුවේ අයිතිය ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් සහ සුදුසු අවම කිරීමේ පියවර අනුගමනය කිරීම සහතික කිරීමට පූර්ව ක්‍රියාකාරීව කටයුතු කරයි. වර්තමාන ආර්ථිකයේ ආතතිමය තත්ත්වය තුළ, බේරුම්කරණ නියමයන්ට ගරු කිරීමට සේවාදායකයින් අපොහොසත් වීම හේතුවෙන් වසර පුරා රිට් ආඥා ක්‍රියාත්මක කිරීමට බැංකුව අසමත් වීම සහ අධිකරණවල නඩු කල් දැමීම හේතුවෙන් බැංකුවට නීතිමය අවදානම් වැඩි විය.

# ලේඛනගත කිරීම සහ මුදල් ලබා දීම
■බැංකුවේ සෑම මෙහෙයුමක් සඳහාම සම්පූර්ණ කරන ලද සහ නිවැරදි ලේඛන ආකෘතිය භාවිතා කිරීම ඉතා වැදගත් වේ. මේවා අතර, නිවැරදි ණය ආරක්ෂණ ලේඛන, ණය අයදුම්පත්, (KYC) ලේඛන, උකස්/ඇප බැඳුම්කර, අනෙකුත් නෛතික ලේඛන සහ රක්ෂණ සහතික සහ අනෙකුත් ලේඛන භාවිතය ඉතා වැදගත් වේ.

■ණය පරිපාලන දෙපාර්තමේන්තුව සහ නීති දෙපාර්තමේන්තුව යාවත්කාලීන කරන ලද ආකෘතිය සහ වෙනස්කම් පිළිබඳව ණය නිලධාරීන්, ශාඛා කළමනාකරු සහ අනෙකුත් අදාළ පාර්ශවයන්ට දැනුම් දෙනු ලැබේ. ඉහත සඳහන් කළ වෙනස්කම් සමීපව අධීක්ෂණය කර අවශ්‍ය උපදෙස් ලබාදෙයි.

■ණය නිදහස් කිරීම ද්විත්ව පාලනයට යටත් වේ. මෙමගින් පාරිභෝගික අවශ්‍යතාවයන්ට අනුව අවශ්‍ය අරමුදල් ඇති බව සහතික කිරීම.

# බැංකුවේ අවදානම් කළමනාකරණය සඳහා ආර්ථික අර්බුදයේ බලපෑම
අඛණ්ඩ මූල්‍ය හා ජංගම ගිණුම් හිඟය, ඉහළ යන ණය සහ දුර්වල පාලනය හේතුවෙන් ශ්‍රී ලංකාව වර්තමානයේ ආර්ථික අර්බුදයකට සහ දරිද්‍රතා මට්ටම් ඉහළ යාමේ ප්‍රවණතාවයකට මුහුණ දී සිටියි. COVID-19 වසංගතය සහ පශ්චාත් ආර්ථික අර්බුදය හේතුවෙන් රටේ ආර්ථිකයට සහ ජනතාවගේ ජීවනෝපායට ඇති වූ ද්විතියික බලපෑම් මගින් තත්වය තවදුරටත් උග්‍ර විය. අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යාමත් සමඟ දුප්පතුන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට සහ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වීමට ඉඩ ඇති අතර එමගින් රටේ දරිද්‍රතා මට්ටම ඉහළ ගොස් ඇත.

මූල්‍ය අංශය ඕනෑම ආර්ථිකයක වැදගත්ම අංශය වන අතර ආර්ථිකයක නොපෙනෙන බලවේගයකි. එබැවින් ඕනෑම ආර්ථික අර්බුදයක්/ආර්ථික පසුබෑමක් මගින් රටේ බැංකු කටයුතුවලට ක්ෂණික බලපෑමක් ඇති කරයි. මෙම තත්ත්වය තුළ, මධ්‍යම පරිමාණ සංවර්ධන බැංකුවක් ලෙස ආර්ථික අර්බුද පැතිරීම හේතුවෙන්, අපට ඉතා දුෂ්කර මෙහෙයුම් තත්වයන්ට මුහුණ දීමට සිදු විය. අනපේක්ෂිත ලෙස අගුලු දැමීම සහ විදේශ විනිමය සංචිත හිඟය හේතුවෙන් ශ්‍රී ලංකාවේ සෑම කර්මාන්තයකටම විශාල හානිවලට මුහුණ දීමට සිදු විය. එබැවින් ආර්ථිකයේ මෙම ආතති තත්වයත් සමඟ අපගේ බැංකුවේ පාරිභෝගික පදනම ද මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය.

විදේශ මුදල් සංචිත ගැටළුව හේතුවෙන් සමහර නිෂ්පාදන ආනයනය සීමා කර ඇත. මේ හේතුවෙන් ආහාර, ඉන්ධන, පොහොර, ඖෂධ සහ සෞඛ්‍ය අයිතම හිඟයක් ඇති වී ඇත. දිවයින පුරා විසිරී සිටින ජනගහනය ඉන්ධන හිඟය හේතුවෙන් දීර්ඝ විදුලි කප්පාදුවකින් පීඩා විඳින අතර එම ගැටළුව රටේ සෑම කර්මාන්තයකටම සහ අංශවලටම බලපෑමක් සිදු කර ඇත. මෙම තත්ත්වය ණය ආපසු ගෙවීමේ අවදානම වැඩි කිරීමට සහ බැංකුවේ ණය කළඹේ ගුණාත්මකභාවය පිරිහීමට හේතු වී තිබේ.

| දර්ශක | 12/31/2021 | 12/31/2022 |
|---|---|---|
| අක්‍රිය ණය අනුපාතය | 8.71% | 8.46% |

නිෂ්පාදන අනුව නිරාවරණය (2021/12/31)




නිෂ්පාදන අනුව නිරාවරණය (2022/12/31)



ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සහ සත්‍ය ද්‍රවශීලතා ආවරණ අනුපාතය



මුළු වත්කම්වලට එදිරිව මුළු අත්තිකාරම්



දළ අක්‍රිය වත්කම්වලට එදිරිව මුළු අත්තිකාරම්



ස්ථාවර තැන්පතුවලට එදිරිව සාමාන්‍ය ඉතුරුම්




| | 2021 දෙසැම්බර් | 2022 මාර්තු | 2022 ජුනි | 2022 සැප්තැම්බර් | 2022 දෙසැම්බර් |
|---|---|---|---|---|---|
| ස්ථර 1 ප්‍රාග්ධනය | 8.72% | 8.44% | 7.93% | 7.38% | 7.85% |
| අවශ්‍ය ස්ථර 1 මට්ටම | 8.50% | 8.50% | 8.50% | 8.50% | 8.50% |
| මුළු ප්‍රාග්ධනය | 14.27% | 15.49% | 15.73% | 13.23% | 15.72% |
| අවශ්‍ය මුළු ප්‍රාග්ධන මට්ටම | 12.5% | 12.5% | 12.5% | 12.5% | 12.5% |

ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය




තැන්පතු සඳහා මුළු අත්තිකාරම් (ප්‍රතිමූල්‍ය ණය නොමැතිව)





## ආයතනික පාලනය


ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව ................................ 72
ආයතනික පාලනය ...................................................................... 73
අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා
සහභාගීත්වය............................................................................... 93
අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.................................................... 95
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික අනුකමිටු (BHRRC),
අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු (BNC) වාර්තාව................................ 100
අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු (BAC) වාර්තාව.............................. 102
**අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව**......... 103
ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ වගකීම් ප්‍රකාශය..... 106
**අභ්‍යන්තර පාලන ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව**........................ 107
මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව ..................................................................... 109
මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම.............................. 111

# ආයතනික පාලනය පිළිබඳ විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } BAN/E/RDB/CG/2022 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 21 November 2023 |

සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2022 දෙසැම්බර් 31 වැනි දින නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ නියමය වෙත අනුකූලතාව දැක්වීමේ අවශ්‍යතාව පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අදාළ සිද්ධි වාචක ප්‍රතිඵල පිළිබඳ විගණකාධිපති වාර්තාව.

— — — — — — — — — — — — — — — — — — — — — — —

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද පාලන නියමයන්ට අනුකූලතාව දැක්වීමේ අවශ්‍යතාවය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිළියෙළ කරන ලදුව ඉදිරිපත් කරන ලද ආයතනික පාලන වාර්තාවට අදාළව මා විසින් මෙම වාර්තාවේ ඇමුණුමෙහි දක්වා ඇති ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලදී මාගේ කාර්යභාරය ඉටු කරන ලද්දේ එකඟ වූ ක්‍රමවේදීය සංවිධානයන්ට අදාළ වන සම්බන්ධිත සේවා පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති ීබීසී 4400) වල දක්වා ඇති මූලධර්මවලට අනුකූලව වේ එම ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලද්දේ හුදෙක්ම ආයතනික පාලන අනුකූලතා නියමයන්හි අවශ්‍යතාව පවත්වා ගනු පිණිස වේ.

මාගේ සොයා ගැනීම් මෙම වාර්තාවේ ඇමුණුමේ වාර්තා කරන්නෙමි.

ඉහත කී ක්‍රමවේද යොදා ගැනීම මගින් සමාලෝචන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන ලද විගණනයක් හෝ සමාලෝචනයක් සිදු නොවන හෙයින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන නියමයන්වලට දක්වා ඇති අනුකූලතාව සම්බන්ධයෙන් මා විසින් කිසිදු සහතිකයක් ප්‍රකාශයට පත් නොකරමි.

මා විසින් අතිරේක ක්‍රමවේද ක්‍රියාත්මක කරන ලද්දේ නම් හෝ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති හෝ සමාලෝචන කටයුතු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිතිවලට අනුව විගණනයක් හෝ සමාලෝචන කටයුත්තක් කරන ලද්දේ නම් ඔබ වෙත ඉදිරිපත් කරන්නට ඉඩ තිබුණු අනෙකුත් කාරණා මාගේ අවධානයට ලක් වන්නට ඉඩ තිබුණි.

මාගේ වාර්තාව හුදෙක්ම මෙම වාර්තාවෙහි පළමු ඡේදයෙහි දක්වා ඇති අරමුණ හා ඔබේ දැන ගැනීම පිණිස පමණක් වන අතර එය වෙනත් අරමුණක් සඳහා භාවිත කිරීම හෝ වෙනත් කවර හෝ පාර්ශවයක් වෙත බෙදා හැරීම හෝ පිණිස නොවන්නකි.

මෙම වාර්තාව සම්බන්ධ වන්නේ ඉහත නිශ්චය කොට දක්වා ඇති අයිතමයන්ට පමණක් වන අතර සමස්තයක් ලෙස ගත් කළ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කිසිවකට මෙය අදාළ නොවේ.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# ආයතනික පාලනය

## සිද්ධි වාචක ප්‍රතිඵල පිළිබඳ වාර්තාවේ ඇමුණුම

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(1) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්** | |
| 3(1)(i) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ සුරක්ෂිතභාවය සහ අඛණ්ඩතාව ශක්තිමත් කළ බව සහතික කිරීම සඳහා එකඟ වූ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම. | |
| | (අ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය<br>බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික සාරධර්ම | **පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත**<br>2022 – 2024 කාලය සඳහා පිළියෙල කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතන-ික සැලැස්ම ක්‍රියාත්මකව පැවතිණි, ඊට අමතරව, බැංකුවේ උපාය මාර්ගික අරමුණු, වාර්ෂිකව ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අයවැයට සංගෘහිත කර තිබේ<br>එම අරමුණු බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික වටිනාකම් හා සංගත වේ. |
| | බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික සාරධර්ම බැංකුව පුරා සන්නිවේදනය කර තිබේද යන වග. | බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික සාරධර්ම දැනටමත් සියලුම ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත දැනුම් දී ඇති අතර ප්‍රධාන කාර්යාල මට්ටමින් මෙන් ම පළාත් මට්ටමින් දැනුවත් කිරීමේ රැස්වීම් මගින් අනෙකුත් කාර්ය මණ්ඩලය වෙත දැනුම් දෙනු ලැබේ. |
| | (ආ) බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලැස්මට (2022-2024) බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපායමාර්ගය ඇතුළත් කර ඇත. |
| | සමස්ත ව්‍යාපාරික උපායමාර්ගයට සමස්ත අවදානම් ප්‍රතිපත්තිය, අවදානම් කළමනාකරණ ක්‍රමවේද හා යාන්ත්‍රණ ඇතුළත් වීම සහ ඒවා ලේඛනගත කර තිබීම | සමස්ථ අවදානම් ප්‍රතිපත්ති සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි සකස් කර ඇති අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරන කමිටු නිර්දේශය ඇතිව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එය වරින් වර සමාලෝචනය කෙරේ. |
| | සමස්ත ව්‍යාපාරික උපායමාර්ගයේ අවම වශයෙන් ඉදිරි වසර තුනක කාලය සඳහා මැනිය හැකි අරමුණු අන්තර්ගත වීම. | 2023-2025 කාල සීමාව සඳහා ආයතනික සැලැස්මේ මැනිය හැකි ඉලක්ක යාවත්කාලීන කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අපේක්ෂා කෙරේ. |
| | (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගෙන ඇති අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති විචක්ෂණ වන බව හා ඒවා නිසි ලෙස ක්‍රියාත්මක කර ඇති බව. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇතග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා ක්‍රමවේදවලට අඛණ්ඩ හා විචක්ෂණ තක්සේරු ක්‍රියාවලියක් ඇතුළත් වේ. එසේම එය අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. පහත වාර්තා මේ සම්බන්ධව තවදුරටත් විස්තර සපයයි.<br>▪ අවදානම් කළමනාකරණ වාර්තාව<br>▪ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව |
| | (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස් හිමියන් සහ ණය ගැණුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තැන්පත්කරුවන් ණයහිමියන් කොටස් හිමියන් සහ ණය ගැණුම්කරුවන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය කිරීමේ ප්‍රතිපත්තියක් අනුමත කර ක්‍රියාත්මක කර ඇත. කෙසේ වුවද ප්‍රතිපත්ති ලේඛනයේ සඳහන් පරිදි සන්නිවේදන ප්‍රතිපත්තිය සමාලෝචනය කළ යුතුව ඇත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
| --- | --- | --- |
| | (ඉ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතිවල ප්‍රමාණාත්මකතාව සහ අඛණ්ඩවතාව සමාලෝචනය කර ඇත. | **පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත**<br>බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපනය කිරීම සහ එය යාවත්කාලීන කිරීම සම්බන්ධයෙන් විශේෂයෙන් ම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් ඇතුළු ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සියලු දෙනාම වගකීම දරයි.<br>එසේම, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධති සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මතාව සහ අඛණ්ඩතාව සමාලෝචනය කරයි. කෙසේ වුවද, මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් විය යුතුය.<br>තවද අභ්‍යන්තර විගණන වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට (BAC) ඉදිරිපත් කරනු ලබන අතර ප්‍රධාන සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. |
| | (ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්වචනය කර ඇති පරිදි, අධ්‍යක්ෂ මණ්ඩලය විසින්,<br>(i) ප්‍රතිපත්තිවලට සැලකිය යුතු බලපෑමක් සිදු කළ හැකි,<br>(ii) ක්‍රියාකාරකම් මෙහෙයවිය හැකි,<br>(iii) ව්‍යාපාරික ක්‍රියාකාරකම්, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් පාලනයක් පවත්වා ගැනීමට හැකි පුද්ගලයින් හඳුනාගෙන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් ලෙස පත් කර තිබීම, | **පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත**<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හඳුනාගෙන ඔවුන් නම් කර ඇත |
| | (උ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එහි අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අදාළ වන ප්‍රධාන අධිකාරිත්ව ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් නිශ්චය කර ඇත. | **පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.**<br>අධ්‍යක්ෂ මණ්ඩලය සහ සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සඳහා අදාළ ප්‍රධාන අධිකාරිත්ව ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් නිශ්චය කර ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය ක්‍රියාත්මක වේ.<br>ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අදාළ අධිකාරිත්ව ක්ෂේත්‍ර සහ ප්‍රධාන වගකීම් ඔවුන්ගේ රැකියා විස්තර වල සඳහන් කර ඇත. |
| | (ඌ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රතිපත්තිවලට අනුකූලව බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කටයුතු නිසි පරිදි අධීක්ෂණය කර තිබීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇතග<br>අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු මගින් බැංකුවේ කටයුතු පිළිබඳ සුදුසු අධීක්ෂණයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.<br>අවශ්‍ය අවස්ථාවල අමතර පැහැදිලි කිරීම් ලබා දීම සඳහා කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයින්ට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ආරාධනා කරනු ලැබේ. |
| | (එ) පහත දක්වා ඇති කාර්යයන් ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන්ට අදාළ පාලන පරිචයන්වල කාර්යක්ෂමතාව කලින් කලට තක්සේරු කර තිබීම.<br>(i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම, නම් කිරීම සහ තෝරා පත් කර ගැනීම<br>(ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය කිරීම.<br>(iii) දුර්වලතා හඳුනාගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී වෙනස්කම් සිදු කිරීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඔවුන්ගේ කාර්යක්ෂමතාවය තක්සේරු කර ඇත. |
| | (ඒ) ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව විසින් 2022.09.29 දින අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලැස්ම ක්‍රියාත්මක වේ. |
| | (ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග ස්ථාපනය කිරීම සහ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ නිතිපතා රැස්වීම් සැලසුම් කර ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත<br>ආයතනික අරමුණුවල ප්‍රගතිය සාකච්ඡා කිරීමට සහ සමාලෝචනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව රැස්වන අතර වැඩිදුර තොරතුරු සහ උපදෙස් ලබා ගැනීම සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට එම රැස්වීම්වලට සහභාගී වීම සඳහා ආරාධනා කරයි. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | (ඕ) නියාමන පරිසරය අවබෝධ කරගැනීම සඳහා සහ බැංකුව නියාමකයින් සමඟ මනා සබඳතාවක් පවත්වාගෙන යන බව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි ක්‍රියාමාර්ග ගැනීම සහ ක්‍රියාවලීන් පවත්වාගෙන යෑම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. නියාමන පරිසරය අවබෝධ කරගැනීම සඳහා ද, නියාමකයින් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිසි පියවර සහ ක්‍රියාදාමයන් ගෙන ඇත. |
| | (ක) බාහිර විගණකවරුන් බඳවා ගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ක්‍රියාවලියක් පැවැතීම. | අදාළ නොවේ.<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වැනි වගන්තිය යටතේ, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. |
| 3(1)(ii) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරියා (CEO) පත් කරනු ලැබීම.<br>සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් සහ වගකීම් මෙම 35 නියමයන්ට අනුකූල වීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. මණ්ඩලය විසින් බැංකුවේ සාමාන්‍යාධිකාරීවරයෙකු/ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කළ යුතුය. ඒ අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව 2022.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි ස්ථිර සාමාන්‍යාධිකාරීවරයෙකු/ප්‍රධාන විධායක නිලධාරියෙකු පත් කර ඇති නොවැළැක්විය හැකි හේතුවක් මත ප්‍රධාන මූල්‍ය නිලධාරිවරයා 2022.09.05 දින සිට බලපැවැත්වෙන පරිදි සාමාන්‍යාධිකාරී /ප්‍රධාන විධායක නිලධාරි තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා පත් කර ඇති එසේම මෙම පත්වීම 2022 වර්ෂය තුළ පහත පරිදි කිහිප වතාවක් අලුත් කර ඇත.<br><br>1 2022.09.05 සිට 2022.09.27 දක්වා<br>2 2022.09.27 සිට 2022.11.30 දක්වා<br>3 2022.11.30 සිට 2022.12.01 දක්වා<br>4 2022.12.01 සිට 2023.02.28 දක්වා<br><br>ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව භාරව සිටින ගරු අමාත්‍යතුමා විසින් 2020.02.26 දින සිට බලපැවැත්වෙන කාලපරිච්ඡේදය සඳහා සභාපතිවරයාව පත් කර ඇත.<br><br>සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරයේ එදිනෙදා කළමනාකරණය භාර විධායක නිලධාරියා ලෙස කටයුතු කරයි. කෙසේ වුවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 3 වන වගන්තියට අනුකූලව, 2018 නොවැම්බර් 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීමේ තීරණයට අනුව, බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ අනෙකුත් උපකරණ අත්සන් කිරීම සඳහා සභාපතිවරයා සම්බන්ධ වේ. |
| 3(1)(iii) | අධ්‍යක්ෂ මණ්ඩලය නිරතුරුව රැස්විය යුතු අතර ආසන්න වශයෙන් මාසික විරාම සහිතව යටත් පිරිසෙයින් වසරකට දොළොස් වතාවක් වත් අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. සාමාන්‍යයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් මාසයකට දෙවරක් බැගින් පැවැත්වේ ඊට අතිරේකව හා අවශ්‍ය අවස්ථාවන්වලදී විශේෂ රැස්වීම් පවත්වනු ලැබේ. 2022 වර්ෂය තුළ රැස්වීම් 21ක් පවත්වා ඇත. |
| 3(1)(iv) | බැංකුවේ ව්‍යාපාර ප්‍රවර්ධනය හා අවදානම් කළමනාකරණයට අදාළ කරුණු සහ යෝජනා ඇති අවස්ථාවලදී, එකී කරුණු හා යෝජනා නිත්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයන්හි ඇතුළත් කිරීමට සියලු අධ්‍යක්ෂවරුන්ට හැකිවන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය සතුව ක්‍රියා පටිපාටියක් පවතී. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br><br>විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලසුම් කර ඇති අතර, විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි සෑම ලිත් වර්ෂයක් ආරම්භයේදීම අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දෙනු ලැබේ. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(1)(v) | සියලුම අධ්‍යක්ෂවරුන්ට සහභාගී වීමට අවස්ථාව ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිත්‍ය වශයෙන් පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට අවම වශයෙන් දින 7කට පෙර අදාළ දැනුම් දීම සිදුකළ යුතු අතර අනෙක් සියලුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා ද දැනුම් දීමක් සිදු කිරීම. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br>රැස්වීම් පිළිබඳ දැන්වීම වසර ආරම්භයේ දී වාර්ෂික දින දර්ශනයක් හරහා ලබාදෙනු ලැබේ.<br>හදිසි ලිපි ලේඛන ඉදිරිපත් වීමට ඉඩ ඇති අවස්ථා හැර, අධ්‍යක්ෂ මණ්ඩල සහ අනුකමිටු රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍ර සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීම්වලට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත සුරක්ෂිත විද්‍යුත් විසඳුමක් (අධ්‍යක්ෂ කමිටු වෙත උඩුගත කිරීම) මගින් බෙදා හරිනු ලැබේ.<br>ඕනෑම විශේෂ රැස්වීමකට පෙර සාධාරණ දැනුම් දීමක් සිදුකරනු ලබන අතර විශේෂ රැස්වීමක් පැවැත්වීමට පෙර සියලුම අධ්‍යක්ෂවරුන්ගේ කැමැත්ත ලබා ගනු ලැබේ. |
| 3(1)(vi) | මීට පෙර මාස 12 ක කාලය තුළ අවම වශයෙන් තුනෙන් දෙකක රැස්වීම්වලට සහභාගී නොවූ හෝ ඊට පෙර පැවති අඛණ්ඩ රැස්වීම් තුනකට සහභාගී නොවූ අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ වුවද, විකල්ප අධ්‍යයක්ෂ-වරයෙකු හරහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී විම ද සහභාගි වීමක් ලෙස පිළිගත හැකිය. | විධායක නොවන, ස්වාධීන අධ්‍යක්ෂවරියක් වන හිරන්ති කරුණාරත්න මහත්මිය අඛණ්ඩව පැවති රැස්වීම් තුනකට සහභාගී වී නොමැති අතර බැංකුව මේ සම්බන්ධයෙන් අනතුරු ඇඟවීමේ ලිපියක් නිකුත් කර ඇත. |
| 3(1)(vii) | 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තියේ විධිවිධාන සපුරාලන සමාගම් ලේකම්වරයෙකු මණ්ඩලය විසින් පත් කර ඇති අතර, සමාගම් ලේකම්වරයාගේ මූලික වගකීම් වන්නේ අධ්‍යක්ෂ මණ්ඩල සහ කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේකම් කාර්යාල සේවාවන් මෙහෙයවීම සහ ප්‍රඥප්ති සහ වෙනත් රෙගුලාසිවල දක්වා ඇති අනෙකුත් කාර්යයන් ඉටු කිරීමයි. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වන වගන්තිය අනුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයෙකු මණ්ඩලය විසින් පත් කර ඇත. ලේකම් පූර්ණකාලීන පදනම මත වූ නිලධාරියෙකු විය යුතුය. |
| 3(1)(viii) | සියලුම අධ්‍යක්ෂවරුන්ට සමාගම් ලේකම්ගේ උපදෙස් හා සේවාවන් ලබාගැනීමට හැකි වන පරිදි ප්‍රවේශය ලබා දී තිබීම. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.සියලුම අධ්‍යක්ෂවරුන්ට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්ගේ උපදෙස් හා සේවා සඳහා ප්‍රවේශය ඇත. |
| 3(1)(ix) | සමාගම් ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා පවත්වාගෙන යනු ලබන අතර අධ්‍යක්ෂවරුන් විසින් එවැනි වාර්තා පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් පවතී. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වාර්තා පවත්වාගෙන යනු ලැබේ. තවද, එවැනි රැස්වීම් වාර්තා ඕනෑම අධ්‍යක්ෂකවරයෙකුගේ ඉල්ලීම මත පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. |
| 3(1)(x) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවල පහත සඳහන් කාරණා හෝ යොමු ඇතුළත් වේ.<br>(අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය සාකච්ඡාවල දී භාවිතා කරන ලද දත්ත සහ තොරතුරුවල සාරාංශයක්<br>(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බලන ලද කරුණු.<br>(ඇ) සත්‍ය සෙවීමේ සාකච්ඡා සහ අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණභාවයෙන් යුතුව සිය වගකීම් ඉටු කළේද යන්න පැහැදිලි කළ හැකි ප්‍රතිවාද හෝ විසම්මුතිය පිළිබඳ කරුණු.<br>(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග සහ ප්‍රතිපත්ති-වලට අනුකූල වීම සහ අදාළ නීති හා රෙගුලාසි පිළිපැදීම දැක්වෙන කරුණු.<br>(ඉ) බැංකුව නිරාවරණය වන අවදානම් පිළිබඳ අවබෝධය සහ අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග පිළිබඳ දළ විශ්ලේෂණයක් සහ<br>(ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පහත සඳහන් අවශ්‍යතා ආවරණය කරනු ඇත.<br>I විශේෂිත විෂයයන් මත ගනු ලබන ව්‍යාපාරික තීරණ<br>II විශේෂ විෂයයන් පිළිබඳ සම්මත වූ යෝජනා.<br>III කළමනාකාරීත්වය වෙත යොමු කරන ලද උපදෙස් සහ කරුණු.<br>IV කරුණු පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම්<br>V අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා පිළිබඳ නිර්දේශ<br>VI අවදානම් කළමනාකරණ පියවර පිළිබඳ දළ විශ්ලේෂණය.<br>VII අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග සහ ප්‍රතිපත්තිවලට අනුකූල වීම. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(1)(xi) | සාධාරණ ඉල්ලීමක් මත, බැංකුවේ වියදමින් සුදුසු අවස්ථාවල ස්වාධීන වෘත්තීය උපදෙස් ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ ක්‍රියා පටිපාටි තිබේ. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ක්‍රියාපාටියක් තිබේ. |
| 3(1)(xii) | අධ්‍යක්ෂවරුන්ට සම්බන්ධව බැඳියා පිළිගැටුම් සම්බන්ධයෙන් තීරණය කිරීමට, වාර්තා කිරීමට, නිරාකරණය කිරීමට සහ එවැනි ගැටුම් හෝ ඒවා උද්ගත වීමට ඇති ඉඩ වළක්වා ගැනීම උදෙසා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රමවේදයක් ඇත.<br>කිසියම් අධ්‍යක්ෂවරයෙකු විසින්, ඔහු/ඇය හෝ ඔහුගේ / ඇයගේ සමීප සම්බන්ධතාවයක් හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු තරමේ බැඳියාවක් පවතින ඕනෑම අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක් සඳහා ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා අවශ්‍ය ගණපූරණයේ ඔහු / ඇය සැලකිල්ලට ගෙන තිබේද? | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ට පෞද්ගලිකව බැඳියාවක් පවතින යම් කරුණක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී යෝජනාවක් සම්මත වූ විට, ඔහු / ඇය යෝජනාවට ඡන්දය දීමෙන් වැළකී සිටියි.<br>කවර හෝ කරුණක් පිළිබඳව පෞද්ගලික බැඳියාවක් පවතින අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අදාළ න්‍යාය පත්‍ර අයිතමය සඳහා වූ ගණපූරණය සඳහා සලකා නොබැලේ. කෙසේ වුවද, වසර තුළ එවැනි අවස්ථා සිදු වී නැත. |
| 3(1)(xiii) | බැංකුවේ මෙහෙයවීම සහ පාලනය හඳුනා ගැනීම සඳහා ගන්නා තීරණය වෙනුවෙන් තමන් වෙත විශේෂයෙන් වෙන් කර ඇති කරුණු පිළිබඳ විධිමත් කාර්ය සැලැස්මක් මුළුමනින් ම අධ්‍යක්ෂ මණ්ඩල අධිකාරිත්වය යටතේ පැවතිය යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට ඇතුළත් වේ. |
| 3(1)(xiv) | බැංකුවට සිය වගකීම් ඉටු කිරීමට නොහැකි බව හෝ එසේ වගකීම් ඉටු නොකිරීමට ඉඩක් ඇති බව හෝ නුබුන්වත්භාවයට පත්වීමට හෝ තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවිය යුතු ගෙවීම් අත්හිටුවීමට නියමිතව ඇති අවස්ථාවකදී යම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර බැංකුවේ තත්ත්වය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා වෙත වහාම දැනුම් දිය යුතුය. | එවැනි තත්ත්වයක් උද්ගත වී නොමැති වුවද, බැංකුව බංකොලොත් වීමට යන්නේ නම් හෝ එහි තැන්පත්කරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට ගෙවීම් අත්හිටුවීමට යන්නේ නම්, යම් තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට පෙර, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා දැනුවත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවබෝධයෙන් පසුවේ. |
| 3(1)(xv) | මුදල් මණ්ඩලයට අවශ්‍ය මට්ටම දක්වා බැංකුව ප්‍රාග්ධනීකරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළ යුතුය. | මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතිකය පවත්වා ගැනීමට බැංකුව සමත් වී ඇත. කෙසේ වුවද, මුළු ස්ථර 1 ප්‍රාග්ධනය යටතේ ඇතැම් අවස්ථා අවශ්‍ය මට්ටමට වඩා අඩුවෙන් වාර්තා විය. |
| 3(1)(xvi) | මෙම නියමයන්හි 3 වන නියමයට අනුකූල වීම පිළිබඳ වාර්ෂික ආයතනික පාලන වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආයතනික පාලන නියෝගයට අනුකූලවීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් දක්වන අනුකූලතාව පැහැදිලි කරන ආයතනික පාලන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට ඇතුළත් වේ. |
| 3(1)(xvii) | වාර්ෂිකව එක් එක් අධ්‍යක්ෂවරයා විසින් සිදු කරනු ලබන ස්වයං ඇගයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත්, එකී ඇගයීම් පිළිබඳ වාර්තා පවත්වා ගැනීමටත් අධ්‍යක්ෂක මණ්ඩලය කටයුතු කළ යුතු වීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. මෙම වසර තුළ ඉල්ලා අස්වූ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගේ හැර, අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ස්වයං තක්සේරු ආකෘති පත්‍ර ලබා ගත හැකිය. |
| 3(2) | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය** | |
| 3(2)(i) | අධ්‍යක්ෂවරු 7 දෙනෙකුට නොඅඩු සහ අධ්‍යක්ෂවරුන් 11 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. 2022.12.31 දිනට අධ්‍යක්ෂවරුන් 09 දෙනෙකුගෙන් සමන්විත වන මෙම අධ්‍යක්ෂ මණ්ඩලය වසර පුරා අධ්‍යක්ෂවරුන් 7ට නොඅඩු සහ 11ට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ. |
| 3(2)(ii) | (අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුර දරන අධ්‍යක්ෂකවරයෙකු හැර වෙනත් අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර නවයක් නොඉක්මවිය යුතුය.<br><br>(ආ) යම් අධ්‍යක්ෂවරයෙකු වසර 9කට වඩා සේවය කරන්නේ නම්, අදාළ සංක්‍රාන්තීය විධිවිධානවලට අනුකූල වේ දැයි පරීක්ෂා කිරීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. කිසිදු අධ්‍යක්ෂවරයකු නියමයෙහි විස්තර කර ඇති පරිදි වසර නවය ඉක්මවා නැත.<br><br>අදාළ නොවේ.<br>එවැනි තත්ත්වයක් උද්ගත වී නොමැත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(2)(iii) | ප්‍රධාන විධායක නිලධාරියා ඇතුළු විධායක අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් එකක් නොඉක්මවිය යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරුන් නොසිටියහ |
| 3(2)(iv) | අවම වශයෙන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු හෝ මුළු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් යන දෙකින් වැඩි සංඛ්‍යාව සහිත විධායක නොවන අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඇතුළත් විය යුතුය. විධායක නොවන අධ්‍යක්ෂවරයකු ස්වාධීන ලෙස සැලකිය හැක්කේ ඔහු හෝ ඇයඃ<br><br>අ) බැංකුවේ සියයට 1කට වඩා සෘජු හා වක්‍ර කොටස් හිමිකාරිත්වයක් දරයි නම්;<br><br>ආ)අධ්‍යක්ෂ ලෙස පත් කරනු ලැබීමෙන් පසුව එළඹෙන ආසන්නතම වසර දෙකක කාලය තුළ මෙහි 3(7) නියමයෙහි විස්තර කර ඇති පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන කවර හෝ ගනුදෙනු-වක් සිදුකර ඇත්නම්;<br><br>ඇ)  අධ්‍යක්ෂවරයා ලෙස පත් කිරීමට පෙර ආසන්නතම වසර දෙකක කාලය තුළ බැංකුවේ සේවකයකු ලෙස සේවයේ යෙදී සිටීම.<br><br>ඈ) බැංකුවේ හෝ වෙනත් බැංකුවක, අධ්‍යක්ෂවරයෙකු, ප්‍රධාන විධායක නිලධාරයෙකු, ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු සමඟ සමීප සම්බන්ධතාවයක් පැවැතීම. (මේ සඳහා "සමීප සම්බන්ධතාවයක් "යන්නෙන් අදහස් කරන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් අධ්‍යක්ෂවරයාගෙන් යැපෙන දරුවෙකු වේ)<br><br>ඉ) බැංකුවේ සුවිශේෂී පාර්ශවකරුවෙකු නියෝජනය කිරීම.<br><br>ඊ) සමාගමක හෝ ව්‍යාපාරික සංවිධානයක සේවක-යකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස් හිමියෙකු වීම.<br><br>I  3(7) නියමයෙහි දක්වා ඇති පරිදි, අනෙකුත් ඕනෑම අධ්‍යක්ෂකවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සිය-යට 10 ඉක්මවන ගනුදෙනු සබඳතාවයක් බැංකුව සමඟ පවත්වා ගනු ලබන හෝ,<br>II බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරුන්ගෙන් කවරෙකු හෝ සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරුන් හෝ කොටස් හිමියන් වන හෝ,<br>III 3(7) විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් ඕනෑම අයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් සියයට 10 ඉක්මවන ගනුදෙනු සබඳතාවක් බැංකුව සමඟ පවත්වා ගනු ලබන | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. අවම වශයෙන් ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ-වරුන් පස් දෙනෙකු වසර පුරා අධ්‍යක්ෂක මණ්ඩලය නියෝජනය කර තිබුණි 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව,  එක් කොටස් හිමි බැං-කුවකින් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු පත් කරනු ලබන අතර මහා භාණ්ඩාගාරයෙන් එක් ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබේ. |
| 3(2)(v) | ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇත්නම්ෘ එසේ පත් කරන ලද පුද්ගලයා ස්වාධීන අධ්‍යක්ෂවරයාට අදාළ වන නිර්ණායක සපුරාලන්නේ දැයි පරීක්ෂා කරන්න | අදාළ නොවේ.<br>2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව, විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීමට ප්‍රතිපාදන නොමැත |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(2)(vi) | ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියාවලියක් බැංකුව සතුව පවතින්නේ ද යන්න. | අදාළ නොවේ.<br>ස්වාධීන අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍ය-වරයා විසිනි. |
| 3(2)(vii) | බැංකුවේ නියම කර ඇති ගණපූරණයට අධ්‍යක්ෂවරුන්ගෙන් 50%ක් ඇතුළත් වන්නේ ද යන්න සහ එම ගණපූරණ-යෙන් 50%කට වඩා වැඩි ප්‍රමාණයක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන්නේ ද යන්න. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 16 වැනි වගන්තියට අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 7 දෙනෙකුගෙන් සමන්විත වන්නේ නම් ගණපූරණය 5ක් ද, අධ්‍යක්ෂ-වරුන් 7කට වැඩි සංඛ්‍යාවක් නම්, ගණපූරණය 6 ක්ද වශයෙන් වේ<br>- සියලු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. |
| 3(2)(viii) | සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ-වරුන්ගේ නම් ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩ අනුව වාර්ෂික ආයතනික පාලන වාර්තාවේ අනාවරණය කරන්නේ ද යන්න. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහ ඔවුන්ගේ තොරතුරු වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇත. |
| 3(2)(ix) | අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත්කිරීමේ ක්‍රියා පටිපාටිය. | අදාළ නොවේ.<br>අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යවරයා විසිනි. |
| 3(2)(x) | අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත් කරන ලද සියලුම අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ පත්වීමෙන් පසු පළමු මහා සභා රැස්වීමේ දී කොටස් හිමියන් විසින් ඡන්දයෙන් තෝරා පත් කර ගැනීමට යටත් වේ. | අදාළ නොවේ.<br>අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සහ ඉවත්කිරීම් සිදුකරනු ලබන්නේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යතුමා විසිනි. |
| 3(2)(xi) | අධ්‍යක්ෂවරයෙකු ඉල්ලා අස් වුවහොත් හෝ තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත පියවර ගත යුතු වේ;<br><br>(අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම සහ බැංකුව සමඟ අදාළ අධ්‍යක්ෂවරයාගේ විසම්මුතියක් වේ නම්, එකඟ නොවීම සම්බන්ධ තොරතුරු ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී එවැනි ඉවත් කිරීමට හෝ ඉල්ලා අස්වීමට හේතු නිවේදනය කිරීම. සහ<br>(ආ) කොටස් හිමියන්ගේ අවධානයට යොමු කළ යුතු කරුණු තිබේද නැද්ද යන්න තහවුරු කරන ප්‍රකාශයක් නිකුත් කිරීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන් පත්කිරීම් සහ ඉවත් කිරීම් සිදුකරනු ලබන්නේ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන අනුව ගරු අමාත්‍යතුමා විසිනි.<br>ඉල්ලා අස්වන අධ්‍යක්ෂවරයා / වරිය සිය ඉල්ලා අස්වීම ලිපියක් මගින් බැංකුවට දැනුම් දෙන අතර එම ලිපිය මත පදනම්ව අධ්‍යක්ෂවරයා ඉල්ලා අස් වී ඇති බව බැංකුව විසින් අමාත්‍යාංශයට දැනුම් දෙයි.<br>බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම් විද්‍යුත් තැපෑල මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට දැනුම් දී ඇත. |
| 3(2)(xii) | බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර, ඡන්දයෙන් තේරී පත්වන්නේ ද නැතහොත් නම් කරන්නේ ද යන්න හඳුනාගැනීමේ ක්‍රියාවලියක් තිබේදැයි පරීක්ෂා කිරීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස් අනුව ගරු අමාත්‍යවරයා විසින් බැවින් එවැනි තත්ත්වයක් ඇති නොවනු ඇති එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ගෙන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් ලබාගත් ප්‍රකාශ මත පදනම්ව යෝග්‍යතාවය සහ උචිත බව තක්සේරු කරයි. |
| 3(3) | අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිත බව ඇගයීමට අනුකූලතා මට්ටම යොදා ගැනෙන නිර්ණායක | |
| 3(3)(i) | අධ්‍යක්ෂ ලෙස සේවය කරන පුද්ගලයෙකුගේ වයස අවුරුදු (70) නොඉක්මවිය යුතුයි<br><br>(අ) සංක්‍රාන්තීය විධිවිධානවලට අනුකූලව කටයුතු කර තිබේද යන්න. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු අධ්‍යක්ෂවරයකුගේ වයස අවුරුදු 70ට වඩා වැඩි නැත.<br>අදාළ නොවේ. |
| 3(3)(ii) | යම් පුද්ගලයෙක් බැංකුවේ අනුබද්ධ සමාගම් හෝ පරිපාලිත සමාගම් ඇතුළුව සමාගම් / අස්තිත්ව/ ආයතන 20කට වැඩි ගණනක අධ්‍යක්ෂවරයෙකු ලෙස නිලතල දරන්නේ නම් | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන් කිසිවෙක් ඔවුන්ගේ ප්‍රකාශයන්ට අනුව සමාගම් 20ක අධ්‍යක්ෂ ධූර දරන්නේ නැත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(3)(iii) | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියකු ලෙස පෙර සේවයේ නියුතු තැනැත්තෙකු වෙනත් බලපත්‍රලාභී බැංකුවක අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස පත් කිරීමට පෙර බලපත්‍රලාභී බැංකුවක ඔහුගේ/ඇයගේ ධුරය අවසන් වූ දින සිට මාස 6ක විරාම කාලයක් ලබා තිබිය යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. එවැනි තත්ත්වයක් උද්ගත වී නොමැත. |
| 3(4) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරනු ලබන කළමනාකරණ කාර්යයන් | |
| 3(4)(i) | වගකීම් පැවරීමේ විධිවිධාන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ කටයුතුවලට අදාළ කරුණු අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වෙත ද, ප්‍රධාන විධායක නිලධාරී සහ අනෙකුත් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත ද පවරා ඇත. |
| 3(4)(ii) | එවැනි වගකීම් පවරනු ලබන අවස්ථාවල දී පවා අධ්‍යක්ෂ මණ්ඩලය 3(1)(i) හි කරුණු සම්බන්ධයෙන් වගකීම භාරගත යුතුයි | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. එවැනි වගකීම් පවරනු ලබන අවස්ථාවල දී පවා අධ්‍යක්ෂ මණ්ඩලය 3(1) (අ) හි කාරණා සම්බන්ධයෙන් වගකීම දරයි. |
| 3(4)(iii) | වගකීම් පැවරීමේ ක්‍රියාවලිය බැංකුවේ අවශ්‍යතාවලට අදාළව පවතින බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලාන්තර පදනමක් මත වගකීම් පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කළ යුතු වීම. | අධ්‍යක්ෂ මණ්ඩලය කාලාන්තර පදනමක් මත වගකීම් පැවරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කර අනුමත කරන අතර අවසාන සමාලෝචිත දිනය 2022.07.01 විය. අධිකාරිත්වයේ මට්ටම අනුව අනුමත කිරීමේ සීමා තීරණය කර ඇත. |
| 3(5) | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී. | |
| 3(5)(i) | සභාපතිවරයාගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරය වෙන් වෙන්ව පවතින අතර එකම පුද්ගලයා විසින් ඉටු නොකරනු ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී තනතුරු එකින් එක වෙන්කර එකී කාර්යභාර පුද්ගලයන් දෙදෙනෙකු විසින් ඉටු කරනු ලබයි. සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරයේ දෛනික කළමනාකරණය භාර විධායක නිලධාරියා වශයෙන් කටයුතු කරයි. කෙසේ වුවද, ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ පනතේ 3 වන වගන්තියට අනුකූලව, 2018 නොවැම්බර් 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීමේ තීරණයට අනුව, සභාපතිවරයා බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ වෙනත් උපකරණ සඳහා අත්සන් තබයි. |
| 3(5)(ii) | සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ. සභාපතිවරයා ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන අවස්ථාවක, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොමු කිරීමේ නියමයන් සුදුසු පරිදි ලේඛනගත කොට ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයා ලෙස නම් කරන්නේ දැයි පරීක්ෂා කිරීම. ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. සභාපතිවරයා ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර බැංකුව විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු ලෙස කිසිදු අධ්‍යක්ෂවරයෙකු නම් කර නොමැත. |
| 3(5)(iii) | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර කිසියම් සම්බන්ධතාවයක් (මූල්‍ය, ව්‍යාපාර, පවුල හෝ වෙනත් සැලකිය යුතු/ අදාළ සම්බන්ධතාවක්/සම්බන්ධතා ඇතුළුව) පවතී නම්, ඒ බව මණ්ඩලයේ සාමාජිකයන් ද ඇතුළුව එකී සම්බන්ධතාවයේ ස්වභාවය වාර්ෂික වාර්තාවේ කොටසක් වන ආයතනික පාලන වාර්තාවේ හඳුනාගෙන හෙළිදරව් කිරීමේ ක්‍රියාවලියක් අධ්‍යක්ෂක මණ්ඩලය සතුව තිබිය යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. එවැනි සබඳතා හඳුනා ගැනීමට වාර්ෂික ප්‍රකාශනයන් උපකාරී වේ. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
| --- | --- | --- |
| 3(5)(iv) | අධ්‍යක්ෂ මණ්ඩලයට ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් ඇති අතර එහි දී සභාපතිවරයා:<br>(අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයයි.<br>(ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස ක්‍රියාකරන බව සහ එහි වගකීම් ඉටු කරන බව සහතික කරයි: සහ<br>(ඇ) සියලුම වැදගත් සහ යෝග්‍ය ගැටළු මණ්ඩලය විසින් නියමිත වේලාවට සාකච්ඡා කරන බව සහතික කරයි. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලය ස්වයං තක්සේරු ක්‍රියාවලිය හරහා ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ |
| 3(5)(v) | සභාපති විසින් අනුමත කරන විධිමත් න්‍යාය පත්‍රයක් බෙදා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් කටයුතු කළ යුතු වීම. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් සඳහා ම න්‍යාය පත්‍රය සභාපතිවරයා සමග සාකච්ඡා කර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් සකස් කර බෙදා හරිනු ලැබේ. |
| 3(5)(vi) | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී පැන නගින ගැටළු පිළිබඳව නිසි පරිදි සියලුම අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීම සඳහා නියමිත වේලාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සභාපතිවරයා සහතික විය යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල දී සාකච්ඡාවට ගත යුතු හදිසි කාරණා හැර අනෙකුත් කරුණු රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් දින 07කට පෙර රැස්වීම පිළිබඳ දැන්වීමද සමග  අධ්‍යක්ෂකවරුන් අතර බෙදා හරිනු ලැබේ. |
| 3(5)(vii) | අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා පූර්ණ සහ ක්‍රියාකාරී දායකත්වයක් ලබාදීමට සියලුම අධ්‍යක්ෂවරුන් දිරිමත් කරන ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් මණ්ඩලය සතු වන අතර බැංකුවේ යහපත වෙනුවෙන් ක්‍රියාකිරීමට සභාපති-වරයා පෙරමුණ ගත යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි සාමාජිකයන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ. |
| 3(5)(viii) | විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය ඇගයීමට ලක් කරන ස්වයං ඇගයීම් ක්‍රියාවලියක් අධ්‍යක්ෂ මණ්-ඩලය සතුව ඇත. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ස්වයං ඇගයීමේ ක්‍රියාවලිය මගින් අධ්‍යක්ෂ මණ්ඩලය එහි සාමාජිකයන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කර තිබේ. |
| 3(5)(ix) | සභාපතිවරයා ප්‍රධාන කළමනාකාරිත්වයේ හෝ වෙනත් විධායක රාජකාරිවල සෘජු අධීක්ෂණය සම්බන්ධ ක්‍රිය-ාකාරකම්වල නිරත වේ. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>සභාපතිවරයා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ඔහු ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සෘජුව අධීක්ෂණය කිරීමට සම්බන්ධ නොවේ. කෙසේ වුවද ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 3 වන වගන්තියට අනුකූලව, 2018 නොවැම්බර් 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටු රැස්වීමේ තීරණයට අනුව, සභාපති-වරයා බැංකුව වෙනුවෙන් ගිවිසුම්, බැඳුම්කර, ඔප්පු සහ වෙනත් උපකරණ සඳහා අත්සන් තබයි. |
| 3(5)(x) | කොටස් හිමියන් සමග ඵලදායි සන්නිවේදනයක් සිදු කිරීමේ ක්‍රියාවලියක් පැවතිය යුතු අතර කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දිය යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට අනුව, කොටස් හිමි බැංකු තුනක් මහා භාණ්ඩාගාරය නියෝජනය කරමින් නිල බලයෙන් සාමාජිකයින් හතර දෙනෙකු පත් කර ඇත. එබැවින්, ඔවුන් අධ්‍යක්ෂ මණ්-ඩලය සහ කොටස් හිමියන් අතර සම්බන්ධ කිරීමේ මාර්ග යක් ලෙස ක්‍රියා කරයි. |
| 3(5)(xi) | ප්‍රධාන විධායක නිලධාරියා බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාරවල එදිනෙදා කළමනාකරණය පිළිබඳ ඉහළම විධායක නිලධාරියා ලෙස ක්‍රියා කරයි. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රධාන විධායක නිලධාරියා යනු බැංකු මෙහෙයුම් කටයුතුවල දෛනික කළමනාකරණය භාරව සිටින විධායක නිලධාරියෙකි. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(6) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු | |
| 3(6)(i) | මෙම 3(6)(ii) 3(6)(iii) 3(6)(iv) සහ 3(6)(v) නියමයන්හි දක්වා ඇති පරිදි බැංකුව විසින් අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් ස්ථාපනය කර තිබිය යුතුය.<br>සෑම අධ්‍යක්ෂ මණ්ඩල කමිටු වාර්තාවක්ම සෘජුව ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර ඇත්දැයි පරීක්ෂා කළ යුතුය.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් කමිටුවේ රාජකාරී සහ කාර්යභාර පිළිබඳ කාර්යසාධන වාර්තාවක් වාර්ෂිකව මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කළ යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br>3(6)(ii) 3(6)(iii) 3(6)(iv) සහ 3(6)(v) නියමයන්හි දක්වා ඇති පරිදි මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන පහත අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු බැංකුව විසින් ස්ථාපනය කර ඇත<br><br>අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව<br>අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව<br>අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව<br>ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව<br><br>එක් එක් කමිටුවේ රාජකාරී සහ කාර්යභාර පිළිබඳ කාර්යසාධන වාර්තාව වාර්ෂික වාර්තාවට ඇතුළත් කෙරේ එසේම,වාර්ෂික වාර්තාව වාර්ෂික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලැබේ. |
| 3(6)(ii) | විගණන කමිටුව<br>අ) විගණන කමිටුවේ සභාපති නිසි සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතුය. | විගණන කමිටුවේ සභාපතිවරයා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වූ අතර නියෝගයට අනුකූල වීම සඳහා ඔහුව 2022.08.29 දින සිට පත් කරන ලදී කෙසේ වුවද, ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු 2022.02.28 සිට 2022.07.29 දක්වා සභාපති ධූරය දරන ලදී |
| | ආ) කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇති කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ |
| | ඇ) කමිටුව විසින් පහත කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර ඇත; | |
| | (i) අදාළ ප්‍රඥප්තිවලට අනුකූලව විගණන සේවා සඳහා බාහිර විගණකවරයා පත් කළ යුතුය. | අදාළ නොවේ<br>2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වන වගන්තියට අනුව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ. |
| | (ii) විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කළ යුතුය.<br><br>(iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ කර ගැනීම: සහ<br><br>(iv) විගණන සහකරුගේ සේවය වසර පහකට නොවැඩි විය යුතු බවත, පූර්ව සේවා කාලය අවසන් වූ දින සිට වසර තුනක් ඉකුත් වීමට පෙර එම විගණන සහකරු නැවත විගණනය සඳහා සම්බන්ධ කර නොගන්නා බවත් යන කොන්දේසිවලට යටත් ව විගණකගේ සේවා කාලය, විගණන ගාස්තුව සහ විගණකවරයාගේ යම් ඉල්ලා අස්වීමක් හෝ සේවයෙන් පහ කිරීමත් සිදුකළ යුතු වේ.<br><br>ඈ) කමිටුව විසින් බාහිර විගණකවරුගෙන් ඔවුන්ගේ ස්වාධීනත්වය පිළිබඳ ප්‍රකාශන ලබාගෙන ඇති අතර, විගණනය කටයුතු ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව සිදු කරනු ලැබේ.<br><br>ඉ) කමිටුව විසින් අදාළ රෙගුලාසිවලට අනුකූලව විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකවරයෙකු සම්බන්ධ කර ගැනීම පිළිබඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබිය යුතුය. | රජයේ විගණකවරයා ආරාධනය මත අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නියෝජනය කරන අතර අදාළ වන රජයේ / මහ බැංකු මාර්ගෝපදේශ කලින් කලට විගණකවරුන් වෙත නිකුත් කරනු ලබන අතර අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් අදාළ රැස්වීම්වල දී සාකච්ඡා කෙරේ.<br><br>අදාළ නොවේ.<br>2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 33 වැනි වගන්තියට අනුව, විගණකාධිපතිවරයා බැංකුවේ බාහිර විගණකවරයා වේ.<br><br>අදාළ නොවේ<br>විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වන බැවින් එවැනි තත්ත්යක් උද්ගත වී නොමැත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | ඊ) කමිටුව විසින් විගණනය ආරම්භ වීමට පෙර ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව බාහිර විගණකවරුන් සමඟ විගණනයේ ස්වභාවය සහ විෂය පථය සාකච්ඡා කර තීරණය කළ යුතුය | අදාළ නොවේ<br>1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්ති මගින් විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා විගණකාධිපතිවරයාට අභිමතානුසාරී බලතල ලබා දෙයි. |
| | උ) බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව□ එහි වාර්ෂික වාර්තාව□ හෙළිදරව් කිරීම සඳහා පිළියෙළ කර ඇති ගිණුම් සහ ත්‍රෛමාසික වාර්තාවල අඛණ්ඩතාව අධීක්ෂණය කිරීම සඳහා බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමේ සහ ප්‍රීමීනී වෙතින් පහත සඳහන් තොරතුරු ලබාගැනීමේ ක්‍රියාවලියක් කමිටුව සතු විය යුතුය | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br><br>ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර, ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්, අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් නීතිමය අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කාර්තුමය වශයෙන් සහ වාර්ෂිකව සමාලෝචනය කරයි<br><br>තවද, හෙළිදරව් කිරීම් සහිත විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. |
| | (i) ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍ර;<br><br>(ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්හි යම් වෙනසක් තිබේද;<br><br>(iii) අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය; සහ<br><br>(iv) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම සහ;<br><br>(v) වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණනයෙන් පැන නගින සැලකිය යුතු ගැළපීම්. | |
| | ඌ) විගණනයට අදාළව විධායක කළමනාකාරිත්වය නොමැති අවස්ථාවක කිසියම් ගැටළුවක් සම්බන්ධයෙන් කමිටුව බාහිර විගණකවරුන් සමඟ සාකච්ඡා කළ යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br>විධායක කළමනාකාරීත්වය නොමැතිව කමිටුව විසින් බාහිර විගණක සමඟ රැස්වීම් දෙකක් පවත්වා තිබුණි. |
| | එ) කමිටුව විසින් බාහිර විගණකගේ කළමනාකරණ ලිපිය සහ ඒ සඳහා කළමනාකරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කර ඇත. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br>2021 වර්ෂය සඳහා වූ කළමනාකරණ ලිපිය සහ ඒ සඳහා ලබා දී ඇති ප්‍රතිචාර ඉදිරි මණ්ඩල විගණන කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබේ. |
| | ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සම්බන්ධයෙන් කමිටුව පහත පියවර ගත යුතුය. | |
| | I අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය□ කාර්යයන් සහ සම්පත්වල ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සහ ස්වකීය වගකීම ඉටු කිරීම පිණිස අවශ්‍ය අධිකාරිත්වය දෙපාර්තමේන්තුව සතුව පවතින බවට සෑහීමකට පත්වීම. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත |
| | II අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික වීම: | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br>අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සහ අදාළ නිර්දේශ සමාලෝචනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසිනි උදා: 2022.05.31 දිනට අභ්‍යන්තර විගණන වැඩසටහනේ ප්‍රගතිය 2022.06.20 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීමේ දී සමාලෝචනය කර ඇත. |
| | III අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ කාර්යසාධනය පිළිබඳ කිසියම් තක්සේරුවක් හෝ ඇගයීමක් සමාලෝචනය කිරීම | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත<br>2022.06.27 දින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා පත් කරන ලද බැවින, 2023.08.15 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් 2022 වර්ෂය සඳහා වන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාගේ කාර්යයන් සම්බන්ධ තක්සේරුව සමාලෝචනය කර ඇත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | IV අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ එකී කාර්යභාරය සඳහා බාහිරින් පත්කරන ලද සේවා සපයන්නන්ගේ කිසියම් පත්වීමක් හෝ සේවයෙන් පහ කිරීමක් නිර්දේශ කිරීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ නිර්දේශය මත සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම පත්වීම අනුමත කරන ලදී. |
| | V ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිරින් ලබාගත් සේවා සපයන්නන් ඇතුළු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කළ යුත අතර ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිරින් සේවා සපයන්නන්ට ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදීම; | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත එවැනි තත්වයක් උද්ගත වී නොමැත |
| | VI'අභ්‍යන්තර විගණන කාර්යය එය විගණනය කරනු ලබන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන වේ. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත අභ්‍යන්තර විගණන කාර්යය එය විගණනය කරනු ලබන ක්‍රියාකාරකම්වලින් ස්වාධීන වන අතර ප්‍රධාන නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට වාර්තා කරනු ලැබේ |
| | ඒ) අභ්‍යන්තර විමර්ශනවල ප්‍රධාන සොයාගැනීම් සහ ඒ සඳහා කළමනාකාරීත්වයේ ප්‍රතිචාර කමිටුව විසින් සලකා බලා තිබේද යන්න තීරණය කිරීමට රැස්වීම් වාර්තා පවත්වා ගත යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත ප්‍රධාන අභ්‍යන්තර විගණන සොයාගැනීම් සහ කළමනාකරණ ප්‍රතිචාර විගණන කමිටුව විසින් සාකච්ඡා කරන ලද අතර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී. |
| | ඔ) විධායක අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වයෙන් තොරව කමිටුව විසින් අවම වශයෙන් බාහිර විගණකවරුන් සමඟ රැස්වීම් දෙකක් පවත්වා තිබේ ද යන්න.<br><br>ඕ) පහත සඳහන් කරුණු සහතික කිරීම සඳහා කමිටුවේ යොමු කිරීමේ නියමයන්:<br><br>(i) එහි යොමු කිරීමේ නියමයන් තුළ ඕනෑම කරුණක් විමර්ශනය කිරීමට පරම අධිකාරිය;<br>(ii) ඒ කිරීම සඳහා අවශ්‍ය සම්පත් කවරේදී<br>(iii) තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය ‍: සහ<br>(iv) බාහිර වෘත්තීය උපදෙස් ලබාගැනීමට සහ අවශ්‍ය නම් අදාළ පළපුරුද්ද ඇති පිටස්තර පුද්ගලයින්ට සහභාගී වන ලෙස ආරාධනා කිරීමේ අධිකාරිය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත කමිටුව මගින් විධායක අධ්‍යක්ෂවරුන් නොමැතිව බාහිර විගණකවරයා සමඟ එක් රැස්වීමක් පවත්වා ඇත.<br><br>පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත විගණන කමිටුවේ "යොමුකිරීමේ අනුදේශ" මගින් මෙම සියලු ක්ෂේත්‍ර ආවරණය කරයි. |
| | බ) කමිටුව අවම වශයෙන් හතර වතාවක්වත් රැස්වී අදාළ රැස්වීම් වාර්තා පවත්වා ගත යුතු වීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. 2022 වර්ෂය තුළ කමිටු රැස්වීම් 05ක් පවත්වා තිබුණු අතර රැස්වීම් වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි. |
| | ග) අධ්‍යක්ෂ මණ්ඩලය වාර්ෂික වාර්තාවේ පහත කරුණු අනාවරණය කර ඇත.<br><br>(i) විගණන කමිටුවේ කටයුතු පිළිබඳ විස්තර;<br>(ii) වර්ෂය තුළ පැවති විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව කොපමණ ද යන්න සහ<br>(iii) එවැනි රැස්වීම්වලට එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහභාගිවීම පිළිබඳ විස්තර. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර, වසර තුළ පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගිත්වය පිළිබඳ විස්තර වාර්ෂික වාර්තාවේ අනාවරණය කර ඇත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | ච) කමිටුවේ ලේකම්වරයා සමාගම් ලේකම්වරයා හෝ අභ්‍යන්තර විගණන කාර්ය භාර ප්‍රධානියා ලෙස කටයුතු කළ යුතු වීම | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා විගණන කමිටුවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. |
| | ට) "විස්ල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය මගින් පහත කාරණාවලට අදාළ ක්‍රියාවලිය ආවරණය කෙරේ;<br><br>i මූල්‍ය වාර්තාකරණයෟ අභ්‍යන්තර පාලනය හෝ වෙනත් කාරණාවල නුසුදුසුකම්.<br><br>ii ඉහත (i) අදාළව, සාධාරණ හා ස්වාධීන විමර්ශනයක් සිදු කිරීම සඳහා නිසි විධිවිධාන ක්‍රියාත්මක වන බවට කමිටුව සහතික කළ යුතුය<br><br>iii සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද "විස්ල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ |
| 6)(iii) | මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවට පහත සඳහන් රීති අදාළ වන්නේ ද: | |
| | අ) කමිටුව විසින් "යොමු කිරීමේ නියම" සහ රැස්වීම් වාර්තා සමාලෝචනය කිරීම මගින්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී, සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍යමය ගෙවීම්) තීරණය කිරීමට කමිටුව විසින් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර තිබේද යන්න. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත, අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පාලනය වන්නේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ මගිනි, කමිටුව විසින් ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට අදාළ පාරිශ්‍රමික, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම් තීරණය කිරීම සඳහා පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් අනුමත කර ඇත.<br><br>යාවත්කාලීන කරන ලද පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කෙරේ අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර, ඔවුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රඥාප්තියට අනුව ක්‍රියා කරයි කෙසේ වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයට අරමුණු සහ ඉලක්ක සැකසීමේ කෙටුම්පත් ලේඛනය මීළඟ (BHHRC) වෙත ඉදිරිපත් කරනු ඇත. |
| | ආ) අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා පවරා ඇති අරමුණු සහ ඉලක්ක ලේඛනගත කර තිබිය යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් (KMP) සඳහා වන අරමුණු සහ ඉලක්ක වාර්ෂික අයවැය සහ ආංශික ක්‍රියාකාරී සැලැස්ම හෝ ඔවුන්ගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක අනුව ලේඛනගත කර ඇත. |
| | ඇ) ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ කාර්යසාධනය මත පදනම් වූ දිරිදීමනා සංශෝධනය කිරීමේ පදනම තීරණය කිරීම සඳහා නියමිත ඉලක්ක සහ අරමුණුවලට සාපේක්ෂව ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් කමිටුව විසින් වරින් වර සලකා බලා ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br><br>ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනය මණ්ඩලයේ මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව විසින් ඇගයීමට ලක් කරනු ලබන අතර, ස්වාධීන කාර්යයන්හි නියැලී සිටින ප්‍රධාන අවදානම් කළමනාකරණ නිලධාරීෟ අනුකූලතා නිලධාරී සහ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිලධාරී යන නිලදාරීන්ගේ කාර්යසාධන ඇගයීම අදාළ අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු විසින් සමාලෝචනය කර ඇගයීමට ලක් කරනු ලැබේ. |
| | ඈ) ප්‍රධාන විධායක නිලධාරියාට අදාළ කරුණු රැස්වීම් වාර්තා සමාලෝචනය කිරීම මගින් සාකච්ඡා කරන කමිටු රැස්වීම්වලට ප්‍රධාන විධායක නිලධාරියා නොපැමිණිය යුතු බව "යොමු කිරීමේ නියම" මගින් සපයයි. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇති මෙම විධිවිධාන අනුව ප්‍රධාන විධායක නිලධාරියා සම්බන්ධ කරුණු සාකච්ඡා කරන විට, ප්‍රධාන විධායක නිලධාරියා එම කමිටුවේ රැස්වීම්වලට සහභාගී නොවේ. |
| 6)(iv) | නාම යෝජනා කමිටුවට පහත සඳහන් නීති අදාළ වන්නේද; | |
| | අ) කමිටුව විසින් නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම / පත් කිරීම සඳහා ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කර තිබීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන විධායක නිලධාරියා පත් කරනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් පත් කිරීම ගරු අමාත්‍යවරයා විසින් ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව සිදු කරනු ලබයි. කමිටුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් තෝරා ගැනීම/පත් කිරීම/උසස් කිරීම සඳහා නිර්ණායක සකසයි. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | ආ) වත්මන් අධ්‍යක්ෂවරුන් නැවත තෝරා පත් කිරීම පිළිබඳව කමිටුව විසින් සලකා බලා නිර්දේශ ලබා දී තිබීම් (හෝ නිරදේශ ලබා දී නොතිබීම) | අදාළ නොවේ.<br>මහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ උපදෙස්වලට අනුව ගරු අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබයි. |
| | ඇ) කමිටුව විසින් ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරී තනතුරු සඳහා පත් කිරීම හෝ උසස් කිරීම සඳහා සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ යෝග්‍යතාවය සඳහා අවශ්‍ය ප්‍රධාන ගුණාංග වැනි නිර්ණායක රකියා විස්තර සමාලෝචනය කිරීම මගින් නියම කර ඇත. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රධාන විධායක නිලධාරී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී තනතුරු සඳහා තෝරා ගැනීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත මගින් නිශ්චය කර ඇති ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා සුදුසුකම් / තේරීමේ නිර්ණායක නාමයෝජනා කමිටුව / අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. |
| | ඈ) මෙම 3(3) නියමයෙහි දක්වා ඇති පරිදි සහ අදාළ ව්‍යවස්ථාවන්හි දක්වා ඇති පරිදි, අධ්‍යක්ෂවරු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් එම නිලතල දැරීමට යෝග්‍ය හා සුදුසු පුද්ගලයින් බවට ඔවුන්ගේ අත්සන් සහිත ප්‍රකාශ ලබාගැනීමට කමිටුව කටයුතු කළ යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ යෝග්‍යතාවය සහ සුදුසුකම් පිළිබඳ ප්‍රකාශන බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබාගෙන අනුමත කරන ලද අතර ඒවා තනතුරු / සුදුසුකම් වෙනස් වන විට බැංකුව විසින් යාවත්කාලීන කර ඇත. |
| | ඉ) විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් කමිටුව විසින් සලකා බලා තිබීම. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරන ලද, යාවත්කාලීන කරන ලද අනුප්‍රාප්තික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ අධ්‍යක්ෂවරුන් සඳහා අනුප්‍රාප්තික විධිවිධාන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත අනුව ගරු අමාත්‍යතුමා විසින් සකස් කරනු ලැබේ.<br>2022.09.29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීමේ දී ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගේ අනුප්‍රාප්තික සැලැස්ම කමිටුව විසින් සමාලෝචනය කර ඇත. |
| | ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු විසින් කමිටුවේ මුලසුන දැරිය යුතු අතර බහුතරය ස්වාධීන අධ්‍යක්ෂවරුන් විය යුතුයි ආරාධනයක් ලැබීම අනුව ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම්වලට සහභාගී විය යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් රැස්වීම්වල මුලසුන දරා ඇත. යොමු කිරීම් අනුදේශවලට අනුව, ප්‍රධාන විධායක නිලධාරී රැස්වීම්වලට සහභාගී වන්නේ ආරාධනයකට අනුවය. කෙසේ වුවද, ප්‍රධාන විධායක නිලධාරී සියලුම රැස්වීම්වලට සහභාගී වී ඇත. |
| 6)(v) | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව IRMC සම්බන්ධයෙන් පහත සඳහන් නීති අදාළ වන්නේ ද: | |
| | අ) කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය, ප්‍රධාන විධායක නිලධාරී, ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාව, මෙහෙයුම් සහ උපාය මාර්ගික යන පුළුල් අවදානම් කාණ්ඩ අධීක්ෂණය කරන කමිටුව වෙත පවරා ඇති අධිකාරීත්ව රාමුව සහ වගකීම තුළ කටයුතු කරන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ගෙන් මෙම කමිටුව සමන්විත විය යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>මෙම කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් (03) දෙනෙකුගෙන්, ප්‍රධාන විධායක නිලධාරී සහ අවදානම් කළමනාකරණ සහකාර සාමාන්‍යාධිකාරීගෙන් සමන්විත වේ. අනුකූලතා නිලධාරී ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වේ. |
| | ආ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු මගින් මාසික පදනමින් බැංකුවේ සියලුම අවදානම්. එනම් ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් කමිටුවට ඇත. අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන්, අවදානම් කළමනාකරණය බැංකු පදනමින් සහ සමූහ පදනමින් සිදුකළ යුතුය | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>මෙම කමිටුව මගින් අවදානම් තක්සේරු කරන අතර සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් මගින් මාසික පදනමක් මත බැංකුවේ ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තාව පිළියෙළ කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි එසේම ඒකාබද්ධ අවදානම් කළමනාකරුණ කමිටුවේ නිර්දේශ ද අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කෙරේ. තවද, බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබිඹු වීම සඳහා ඇතැම් අවදානම් වැඩිදියුණු කර ඇත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | ඇ) කමිටුව විසින් ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කමිටු වැනි සියලුම කළමනාකරණ මට්ටමේ කමිටු සඳහා නිශ්චිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් සමාලෝචනය කර ඇති අතර පවතින කවර හෝ අවදානම් දර්ශක වරින් වර වාර්තා කිරීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත<br>කමිටු මෙහෙයුම්වල ප්‍රමාණවත් බව සහ සඵලතාවය සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් වත්කම් සහ වගකීම් කමිටුව ALCO කළමනාකරණ කමිටුව, මෙහෙයුම් අවදානම් කමිටුව සහ මෙහෙයුම් සහ පරිශ්‍ර කමිටුවේ රැස්වීම් සටහන් සහ නිශ්චිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සමාලෝචනය කරන ලදී;<br>තවද එම කමිටුවල කමිටු ප්‍රඥප්තිය හෝ යොමු කිරීම් අනුදේශ මත පදනම්ව, එම කමිටුවල කාර්යසාධනය සහ මිණුම් ලකුණ කමිටුව විසින් අධීක්ෂණය කරනු ලැබේ. |
| | ඈ) කමිටුව විසින් නියමිත ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමා ඉක්මවා ගොස් ඇති සියලුම අවදානම් දර්ශක සමාලෝචනය කර සලකා බලා ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තා කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. |
| | ඉ) කමිටුව අවම වශයෙන් කාර්තුවකට කී වතාවක් රැස්වී තිබේද? | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>2022 වර්ෂය තුළ කමිටුව 04 වතාවක් රැස්වී ඇත. |
| | ඊ) කමිටුව විසින් නිශ්චිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් විධිමත් ලේඛනගත විනය ක්‍රියාපටිපාටියක් සමාලෝචනය කර සම්මත කර ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>විධිමත් විනය කාර්ය සංග්‍රහය ක්‍රියාත්මකව පවතී. කමිටු පත්‍රිකා මගින් අවදානම් කරුණු සම්බන්ධයෙන් කමිටුව තීරණ ගෙන ඇත. කෙසේ වුවද, 2022 වර්ෂය සඳහා හඳුනාගත් සිදුවීම් කිසිවක් නොමැත. |
| | උ) අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය සහ / හෝ නිශ්චිත උපදෙස් අපේක්ෂා කරමින් කමිටුව විසින් සෑම රැස්වීමක්ම පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුවේ ප්‍රධාන අවදානම් දර්ශක පිළිබඳ වාර්තාව සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් විසින් මාසික පදනමින් පිළියෙළ කර මීළඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඉදිරිපත් කරනු ලැබේ. තවද, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර්තා ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. |
| | ඌ) ව්‍යාපාර මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍රවල නීති රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන සහ අනුමත ප්‍රතිපත්තිවලට බැංකුව අනුකූල වීම තක්සේරු කිරීම සඳහා කමිටුව මගින් අනුකූලතා කාර්යයක් ස්ථාපනය කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා සහ අනුකූලතා කාර්යය වරින් වර කමිටුව වෙත වාර්තා කිරීම සඳහා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් අතරින් තෝරාගත් ඒ සඳහා කැප වූ අනුකූලතා නිලධාරියෙකු සිටී. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුවේ අනුකූලතා කාර්යය ප්‍රධාන කළමනාකරණ නිලධාරියකු ද වන අනුකූලතා නිලධාරී විසින් මෙහෙයවනු ලබන අතර එම අනුකූලතා නිලධාරී විසින් අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව වෙත වරින් වර අනුකූලතා අවදානම් තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කරනු ලබයි. |
| 7) | සම්බන්ධිත පාර්ශව ගනුදෙනු | |
| 7)(i) | "සම්බන්ධිත පාර්ශව" ලෙස සලකනු ලබන ඕනෑම පුද්ගලයෙකු සමඟ සහ විශේෂයෙන් ම පහත සඳහන් පුද්ගල කාණ්ඩ සමඟ පවත්වනු ලබන ගනුදෙනුවක් මගින් ඇති විය හැකි බැඳියා පිළිගැටුම් වළක්වා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කරන ලද ලේඛනගත ක්‍රියාවලියක් ඇත | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත<br>2022 වර්ෂයේ දී යාවත්කාලීන කරන ලද, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිය ලබා ගත හැකිය. සම්බන්ධිත පාර්ශවයන්ට අයත් ගනුදෙනු ඔවුන්ගේ ප්‍රකාශය මත පදනම්ව ජාතික හැඳුනුම්පත භාවිතා කර පද්ධතියක් හරහා ලබා ගත හැකිය |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | අ බැංකුවේ යම් පරිපාලිත සමාගමක්;<br>ආ බැංකුවේ යම් ආශ්‍රිත සමාගමක්;<br>ඇ බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු:<br>ඈ බැංකුවේ යම් ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු;<br>ඉ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන කළමනාකරණ නිලධාරියකුගේ සමීප ඥාතියෙකු;<br>ඊ බැංකුවට සැලකිය යුතු බැඳියාවක් හිමි කොටස් හිමියෙකු;<br>උ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙකුට හෝ බැංකුවේ යම් අධ්‍යක්ෂවරයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ බැංකුවේ සැලකිය යුතු කොටස් හිමියෙකුගේ සැලකිය යුතු බැඳියාවක් ඇති කාරණයක්. | සම්බන්ධිත පාර්ශවයන්ට අයත් ගනුදෙනු ඔවුන්ගේ ප්‍රකාශය මත පදනම්ව ජාතික හැඳුනුම්පත භාවිතා කර පද්ධතියක් හරහා ලබා ගත හැකිය. |
| 3(7)(ii) | මෙම විධානය මගින් ආවරණය වන අදාළ පාර්ශව සමග ගනුදෙනු ලෙස හඳුනාගෙන ඇති පහත සඳහන් ආකාරයේ ගනුදෙනු හඳුනාගෙන වාර්තා කිරීමේ ක්‍රියාවලියක් ඇත.<br>අ) උපරිම පහසුකම් ප්‍රමාණය පිළිබඳ මුදල් මණ්ඩලයේ උපදෙස්වල අර්ථ දක්වා ඇති පරිදි ඕනෑම ආකාරයක පහසුකමක් ප්‍රදානය කිරීම.<br><br>ආ) තැන්පතු, ණය ගැනීම් සහ ආයෝජන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම.<br><br>ඇ) බැංකුවට සපයන ලද හෝ බැංකුවෙන් ලැබුණු මූල්‍ය හෝ මූල්‍ය නොවන ස්වභාවයේ ඕනෑම සේවාවක්.<br><br>ඈ) බැංකුව සහ ඒ ආශ්‍රිත ඕනෑම පාර්ශවයක් අතර වාර්තාකරණ රේඛා සහ තොරතුරු ප්‍රවාහයන් නිර්මාණය කිරීම හෝ නඩත්තු කිරීම, එවැනි සම්බන්ධ පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබා දිය හැකි හිමිකාර, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු විය හැක. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>2022 වර්ෂයේ දී යාවත්කාලීන කරන ලද සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සම්බන්ධිත පාර්ශව ගනුදෙනු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. සපයා ඇති ප්‍රකාශ මත පදනම්ව, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගත හැකිය. |
| 3(7)(iii) | ඉහත 3(7)(i) හි අර්ථ දක්වා ඇති පරිදි, බැංකුව සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු කිරීමේ දී අදාළ පාර්ශවයන් හට ඊට සමාන ගනුදෙනු සිදු කරනු ලබන අනෙකුත් ගනුදෙනුකරුවන්ට වඩා වැඩි වාසිදායක සැලකිල්ලක් සිදු නොවන ආකාරයෙන් කටයුතු කිරිමට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වගබලා ගත යුතුය. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන්ට. ඔවුන්ගේ සමීප ඥාතීන්ට සහ යම් සම්බන්ධයක් වෙනුවෙන් ණය පහසුකම් ලබාදීමේ දී, එම ණය පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය සැදුම්ලත් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂවරුන් සහභාගී වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී අනුමත කළ යුතුය.<br><br>අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කරනු ලබන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ ක්‍රියා-වලිය බැංකුව විසින් ක්‍රියාත්මක කර ඇති අතර අනුකූලතා වාර්තාවේ දක්වා ඇති අනුකූලතා තත්ත්වය 2022.01.01 දින සිට කාර්තුමය වශයෙන් / වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව BIRMC වෙත ඉදිරිපත් කෙරේ<br><br>2022 වර්ෂය තුළ දී, බැංකුව විසින් කිසිදු සම්බන්ධිත පාර්ශවයකට වඩාත් වාසිදායක සැලකිල්ලක් ලබා දී නොමැත |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ විචක්ෂණ ප්‍රතිශතය-ක් ඉක්මවන, සම්බන්ධිත පාර්ශවයන්ට "මුළු ශුද්ධ ණය" ප්‍රදානය කිරීම් මෙම උප නියමයන්හි අරමුණු සඳහාඃ<br><br>I "ණය පහසුකම්" යන්නෙන් 2007 අංක 7 දරන බැංකු පනත් විධානයන්ට අනුව උපරිම සීමා යටතේ දක්වා ඇති ණය පහසුකම් පිළිබඳ නිර්වචනය අදහස් වේ.<br><br>II "මුළු ශුද්ධ ණය පහසුකම්" ගණනය කරනු ලබන්නේ මුළු ණය පහසුකම් වටිනාකමෙන් එවැනි සම්බන්ධිත පාර්ශවයන් විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය සහ ණය උපකරණවල වසර 5ක් හෝ ඊට වැඩි කාලයක කල්පිරීමක් සහිතව සිදු කරන ලද මුදල් ඇප සහ ආයෝජන අඩු කිරිමෙනි. | |
| | ආ) බැංකුවේ ණය දීමේ අනුපාතයට වඩා අඩු පොලී අනුපාතයක් අය කිරීම හෝ නොබැඳි සැසඳිය හැකි ප්‍රතිපාර්ශවයක් සමඟ සැසඳිය හැකි ගනුදෙනුවක් සඳහා බැංකුවේ තැන්පතු අනුපාතයට වඩා වැඩි මුදලක් ගෙවීම. | |
| | ඇ) සම්බන්ධිත නොවන පාර්ශවයන් සමඟ සිදුකරන සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ලබා දී ඇති නියමයන් ඉක්මවා යමින් වඩාත් වාසිදායක කොන්දේසි, වෙළඳ පාඩු ආවරණය කිරීම සහ / හෝ ගාස්තු / කොමිස් අත්හැරීම වැනි වාසිදායක සැලකීමක් සිදු කිරීම. | |
| | ඈ) ඇගයීම් පටිපාටියකින් තොරව අදාළ පාර්ශ්වයකට සේවා සැපයීම හෝ ලබාගැනීම.<br><br>ඉ) නීත්‍යානුකූල රාජකාරී සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිදි, අදාළ පාර්ශව සමඟ විභව හිමිකාර, රහස්‍ය හෝ වෙනත් සංවේදී තොරතුරු හුවමාරු කර ගැනීමට හේතු විය හැකි වාර්තාකරණ රේඛා සහ තොරතුරු ප්‍රවාහයන් පවත්වාගෙන යාම. | |
| 3(7)(iv) | බැංකුවට එහි යම් අධ්‍යක්ෂවරයෙකුට සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකුට ණය පහසුකම් ලබාදීමේ ක්‍රියාවලියක් ඇති අතර, අදාළ අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් සහිත එහි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී එවැනි ණය පහසුකම් ලබා දීම සඳහා පක්ෂව ඡන්දය දීම මගින් එවැනි ණය පහසුකම් ලබා දිම සඳහා අවසර දෙනු ලැබේ<br>මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරනු ලබන ඇපයක් මගින් මෙම ණය මුදල සුරක්ෂිත කරනු ලැබේ. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය වන අතර අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් එවැනි අවස්ථා වර්ෂය තුළ වාර්තා වී නොමැත.<br>කාර්ය මණ්ඩල ණයවලට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ මාර්ගෝපදේශ මත පදනම්ව, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ලබා දෙන ණය පහසුකම් බැංකුවේ අදාළ අධිකාරී මට්ටම් විසින් අනුමත කරනු ලැබේ. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| 3(7)(v) | අ) බැංකුව විසින් යම් පුද්ගලයෙකුට හෝ යම් පුද්ගලයෙකුගේ සමීප ඥාතියෙකුට හෝ එම පුද්ගලයාට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම කාරණයක් සම්බන්ධයෙන් බැංකුවක් විසින් යම් ණය පහසුකමක් ලබාදීමෙන් පසුව එකී පුද්ගලයා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කරනු ලබන්නේ නම්, එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කළ දින සිට වසරක් ඇතුළත මුදල් මණ්ඩලය විසින් ඒ සඳහා අනුමත කළ හැකි වන පරිදි අවශ්‍ය ඇප ලබාගැනීමට බැංකුව විසින් පියවර ගෙන ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අදාළ පාර්ශව ගනුදෙනු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කෙරේ<br>2022 වර්ෂය තුළ එවැනි තත්ත්වයක් උද්ගත වී නැත |
| | ආ) ඉහත 3(7)(v)(අ) විධානයේ දක්වා ඇති කාලසීමාව තුළ එවැනි ඇපයක් ලබා දී නොමැති අවස්ථාවක, ණය පහසුකම් ලබාදුන් අවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ එම අධ්‍යක්ෂවරයා පත් කළ දින සිට මාස දහඅටක කාල සීමාවක් ඉකුත් වීම යන දෙකෙන් මුලින්ම එළැඹෙන දිනට ණය මුදල සඳහා ගෙවීමට තිබෙන ඕනෑම මුදලක් පොලිය ද (ඇත්නම්) සහිතව අයකර ගැනීමට බැංකුව පියවර ගෙන තිබිය යුතු බව. | එවැනි තත්ත්වයක් උද්ගත වී නැත. ඉහත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කෙරේ |
| | ඇ) ඉහත උප නියමයන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයකු අධ්‍යක්ෂධූරය අත්හැර ඇතැයි සලකනු ලැබ තිබේද යන්න සහ බැංකුව විසින් එම කරුණු මහජනතාවට අනාවරණය කර තිබේ ද යන්න හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් ඇත. | එවැනි තත්ත්වයක් උද්ගත වී නැත. ඉහත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කෙරේ. |
| | ඈ) අධ්‍යක්ෂකවරයෙකුට ණය පහසුකම් ප්‍රදානය කරන අවස්ථාවේ බැංකුවේ සේවකයෙකු ලෙස කටයුතු කරන්නේ නම් සහ එවැනි බැංකුවක සියලුම සේවකයින්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ණය පහසුකම් ලබාදුන්නේ නම්, එවැනි අධ්‍යක්ෂවරයකුට 3(7)(v)(ඇ) නියමය අදාළ නොවේ යන්න සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් තිබිය යුතුය. | එවැනි තත්ත්වයක් උද්ගත වී නැත. ඉහත ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කෙරේ. |
| 3(7)(vi) | බැංකුවක කිසියම් සේවකයෙකුට හෝ එම සේවකයාගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාට හෝ සමීප ඥාතියාට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම කරුණක් සඳහා එම බැංකුවේ සේවකයන්ට අදාළ වන යෝජනා ක්‍රමයක පදනම මත හෝ ඉහත 3(7)(v) නියමය අනුව මුදල් මණ්ඩලය විසින් අනුමත කළ සුරැකුමට අනුව ලබා දී ඇති ණය පහසුකමක් සම්බන්ධයෙන් හැර සේවකයෙකුට හෝ එම සේවකයාගේ සමීප ඥාතියෙකුට හෝ සේවකයාට හෝ සමීප ඥාතියාට සැලකිය යුතු උනන්දුවක් ඇති ඕනෑම කරුණකට අදාළව යම් ණය පහසුකමක් ලබාදීම හෝ ගාස්තු සහ/හෝ කොමිස් මුදල් අත්හැරීමට අදාළව "වඩා වාසිදායක අයුරින් සැලකීම" යන්න හඳුනාගැනීමේ ක්‍රියාවලියක් පැවතීම. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂවරුන්ට, ඔවුන්ගේ සමීප ඥාතීන්ට සහ යම් සම්බන්ධයක් වෙනුවෙන් ණය පහසුකම් ලබාදීමේ දී, එම ණය පහසුකම අධ්‍යක්ෂ මණ්ඩලය සැදුම්ලත් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අධ්‍යක්ෂවරුන් සහභාගී වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී අනුමත කළ යුතුය.<br><br>කාර්ය මණ්ඩල ණයවලට අදාළව නිකුත් කර ඇති චක්‍රලේඛ මාර්ගෝපදේශ මත පදනම්ව, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ලබා දෙන ණය පහසුකම් බැංකුවේ අදාළ අධිකාරී මට්ටම් විසින් අනුමත කරනු ලැබේ. |
| 3(7)(vii) | ඉහත 3(7)(v) සහ (3(7)(vi) නියමයන් යටතේ බැංකුවක් විසින් ලබාදෙන ඕනෑම ණය පහසුකමක් ලබාදීම සඳහා අධීක්ෂණ මණ්ඩලයෙන් පූර්ව අනුමැතිය ලබා ගැනීමේ සහ මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව ණය පහසුකම් හෝ ඒ සඳහා ගෙවිය යුතු කිසිදු පොලී මුදලක් ප්‍රේෂණය කර නොමැති බව තහවුරු කරන ක්‍රියාවලියක් ඇති එවැනි අනුමැතියකින් තොරව කරන ලද යම් සහනයක් වලංගු නොවන අතර එය ක්‍රියාත්මක නොවේ. | එවැනි තත්ත්වයක් උද්ගත වී නොමැති අතර 2022 වර්ෂය සඳහා යාවත්කාලීන කරන ලද ප්‍රතිපත්තිය මගින් මෙම අවශ්‍යතාවය ආවරණය කරයි |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
| --- | --- | --- |
| 3(8) | හෙළිදරව් කිරීම් | |
| 3(8)(i) | අධ්‍යකෂ මණ්ඩලය විසින් හෙළිදරව් කර ඇත.<br>අ) අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘති සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙළ කර ප්‍රකාශයට පත් කරන ලද සහ වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රිසි යන භාෂාවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල පළ කළ යුතුය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ප්‍රකාශයට පත් කරනු ලබන්නේ අධීක්ෂණ සහ නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතියට අනුව සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය. එම ප්‍රකාශන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල පළ කෙරේ. |
| | ආ) ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් සංක්ෂිප්ත ආකාරයෙන් පුවත්පත්වල පළ කරනු ලැබිය යුතුය. | |
| 3(8)(ii) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික වාර්තාවේ පහත සඳහන් අවම හෙළිදරව් කිරීම් සිදුකර ඇත්දැයි පරික්ෂා කරන්න. | |
| | අ) නිශ්චිත හෙළිදරව් කිරීම් ඇතුළුව අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවට ප්‍රකාශනය. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>1988 අංක 30 දරන බැංකු පනතේ අවශ්‍යතාවයට අනුකූලව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 2.2 මගින් හෙළිදරව් කෙරේ. |
| | ආ)මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බව සනාථ කරන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවඃ සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇති බව | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br><br>මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතියේ වාර්තාව "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය" යටතේ ලබා දී ඇත. |
| | ඇ) ඉහත 3(8)(ii)(ආ) නියමයේ සඳහන් අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සඵලතාවය පිළිබඳ බාහිර විගණකවරයාගේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාගෙන ඇත. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>බැංකුව විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනවල සඵලතාවය පිළිබඳ සහතිකයක් විගණකාධිපතිවරයාගෙන් ලබාගෙන ඇත. |
| | ඈ)පළපුරුද්ද සහ යෝග්‍යතාවය පිළිබඳ මාර්ගෝපදේශයේ අවශ්‍යතා සපුරාලමින්, අධ්‍යක්ෂවරුන්ගේ නම්, සුදුසුකම්, වයස, පළපුරුද්ද, බැංකුව සමඟ ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද මුළු ගාස්තු / පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර. | පහත කරුණ සහිතව අනුකූලතාව දක්වා ඇත.<br>අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තර "අධ්‍යක්ෂ මණ්ඩල පැතිකඩ" යටතේ හෙළිදරව් කර ඇත.<br><br>තවද, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ගෙවන ලද ගාස්තු / පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 14 මගින් හෙළිදරව් කර ඇත. |
| | ඉ) 3(7)(iii) හි අර්ථ දක්වා ඇති පරිදි එක් එක් සම්බන්ධිත පාර්ශවයන් සඳහා ලබා දී ඇති මුළු ශුද්ධ ණය පහසුකම් අදාළ පාර්ශවවල එක් එක් කාණ්ඩයට ලබා දී ඇති ශුද්ධ ණය පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස ද හෙළි කළ යුතුය | මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 38 යටතේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට සහ පවුලේ සමීපතම සාමාජිකයන් සඳහා ලබා දුන් මුළු ණය මුදල හෙළිදරව් කර ඇත. |

| කොටස | මූලධර්මය | 2022 වර්ෂය තුළ අනුකූලතා මට්ටම |
|---|---|---|
| | ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවනු ලබන පාරිශ්‍රමිකයේ සමස්ත අගයන් සහ ගෙවන ලද පාරිශ්‍රමික, ලබා දී ඇති ණය පහසුකම් සහ බැංකු තැන්පතු හෝ බැංකුවේ සිදු කරන ලද ආයෝජන වැනි පුළුල් කාණ්ඩ මගින් ආවරණය කෙරෙන ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් බැංකුව සමඟ සිදු කරන ලද ගනුදෙනුවල සමස්ත වටිනාකම් | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත. ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවන ලද පාරිශ්‍රමිකයේ මුළු වටිනාකම සහ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමඟ කරන ලද ගනුදෙනු වල මුළු වටිනා-කම මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන් අංක 38.1 යටතේ හෙළිදරව් කර ඇත. |
| | උ) ආයතනික පාලන උපදෙස්වලට අනුකූල වීම පිළිබඳ බාහිර විගණකවරයාගේ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබාගෙන ඇත. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත. ආයතනික පාලන නියමවලට අනුකූල වීම පිළිබඳ බාහිර විගණකවරයාගේ වාර්තාව වාර්ෂික වාර්තාවට ඇතුළත් වේ. |
| | ඌ) විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි, නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වීම සහ කිසියම් අනුකූල නොවීමක් නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර දැක්වෙන වාර්තාවක්. | පහත කරුණු සහිතව අනුකූලතාව දක්වා ඇත. විචක්ෂණ අවශ්‍යතා, රෙගුලාසි සහ නීති සහ අභ්‍යන්තර පාලනයන්ට අනුකූල වීම පිළිබඳ විස්තර අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවට ඇතුළත් කර ඇත. |
| | එ) මුදල් මණ්ඩලය විසින් මෙවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග මහජනතාවට හෙළිදරව් කරන ලෙස නියෝග කරනු ලැබුවහොත්, එවැනි ගැටළු විසඳීම සඳහා බැංකුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සහිතව බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති මෙම උපදෙස්වලට අනුකූල නොවීම පිළිබඳ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශයක් ලබා දිය යුතුය. | අදාළ නොවේ. එවැනි නියමයක් ලබා දී නැත. |

# අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා සහභාගීත්වය

| නම | මහින්ද සාලිය මහතා - සභාපති | ආචාර්ය එම්. තිරිමාල් ද සිල්වා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | මහාචාර්ය එච්.ඩබ්ලිව්.එම්.ඒ. හේරත් - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | කේ. රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩී.ඒ. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | හිරන්ති කරුණාරත්න මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එම්.එස්.එස්. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | තුෂානි තාරංගෙඩ මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිනය | | | | | | | | | | | |
| 06.01.2022 | P | P | P | P | P | P | P | P | P | N/A | N/A |
| 20.01.2022 | P | P | P | P | P | P | P | E | P | N/A | N/A |
| 10.02.2022 | P | E | E | P | P | E | E | P | P | P | N/A |
| 25.02.2022 | P | P | P | P | P | P | E | P | E | P | N/A |
| 10.03.2022 | P | P | P | P | E | E | P | E | P | P | N/A |
| 01.04.2022 | P | P | P | P | P | P | P | P | P | P | N/A |
| 05.05.2022 | P | R | R | P | P | P | P | P | P | P | N/A |
| 26.05.2022 | P | R | R | P | P Zoom හරහා සම්බන්ධ විය | P | P | P | P | P | N/A |
| 10.06.2022 | P | R | R | P | P | P | P | P | P | P | N/A |
| 27.06.2022 | P | R | R | P | P Zoom හරහා සම්බන්ධ විය | E | P | P | P | P | N/A |
| 14.07.2022 | P | R | R | P | E | E | E | P | P | P | N/A |
| 29.07.2022 | P | R | R | P | P Zoom හරහා සම්බන්ධ විය | P Zoom හරහා සම්බන්ධ විය | E | P | P Zoom හරහා සම්බන්ධ විය | P | N/A |
| 18.08.2022 | P | R | R | P | P | P | E | R | P | P | N/A |
| 01.09.2022 | P | R | R | P | P | P | P | R | P | P | N/A |
| 05.09.2022 | P | R | R | P | P | P | E | R | P | P | N/A |
| 06.10.2022 | P | R | R | P | P | E | E | R | P | P | N/A |
| 26.10.2022 | P | R | R | P | P | P | P | R | P | P | N/A |
| 10.11.2022 | P | R | R | P | P Zoom හරහා සම්බන්ධ විය | E | P | R | P | P | N/A |
| 24.11.2022 | P | R | R | P | P | P | P | R | P | P | N/A |
| 08.12.2022 | P | R | R | P | P | P | P | R | P | P | N/A |
| 22.12.2022 | P | R | R | P | E | P | P | R | P | P | P |

# අධ්‍යක්ෂ මණ්ඩල සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සඳහා සහභාගීත්වය

### මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුවේ සහභාගීත්වය

| දිනය | 10.02.2022 | 19.05.2022 | 07.07.2022 | 29.09.2022 | 21.11.2022 | 22.12.2022 |
|---|---|---|---|---|---|---|
| නම | | | | | | |
| මහින්ද සාලිය මහතා - සභාපති | P | P | P | P | P | P |
| ආචාර්ය නිමරෝල් ද සිල්වා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | E | R | R | R | R | R |
| ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P | P | P | P |
| මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P | P | P | P |

### අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවේ සහභාගීත්වය

| දිනය | 28.02.2022 | 20.06.2022 | 29.08.2022 | 31.10.2022 | 21.11.2022 |
|---|---|---|---|---|---|
| නම | | | | | |
| එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / BAC හි සභාපති | P | P Zoom හරහා සම්බන්ධ විය | R | R | R |
| ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / BAC හි සභාපති | P | p | P | P | P |
| ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P | P | P |
| ජී.ඒ. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P | P | P |
| ත්‍රිෂානි නාරංගොඩ මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | N/A | P | P | P | P |

### අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුවේ සහභාගීත්වය

| දිනය | 10.02.2022 | 26.05.2022 | 29.09.2022 | 21.11.2022 | 22.12.2022 |
|---|---|---|---|---|---|
| නම | | | | | |
| මහින්ද සාලිය මහතා - සභාපති | P | P | P | P | P |
| ආචාර්ය නිමරෝල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | E | R | R | R | R |
| ලලිත් අබේසිරිවර්ධන මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P | P | P |
| මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P | P | P |
| හිරන්ති කරුණාරත්න මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | E | P | P | P | P |

### අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ සහභාගීත්වය

| දිනය | 25.02.2022 | 18.05.2022 | 27.07.2022 | 14.10.2022 |
|---|---|---|---|---|
| නම | | | | |
| කේ. රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික / කමිටු සභාපති | P | P | P Zoom හරහා සම්බන්ධ විය | P |
| මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P Zoom හරහා සම්බන්ධ විය | P Zoom හරහා සම්බන්ධ විය | P |
| ආචාර්ය නිමරෝල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | R | R | R |
| ජී.ඒ. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | P | P | P Zoom හරහා සම්බන්ධ විය | P |

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

## පොදු කරුණු
ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (PSB) අධ්‍යක්ෂවරු, 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ දහතුන්වන වසරේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ, බැංකුවේ කටයුතු පිළිබඳ ඔවුන්ගේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව සතුටු වෙති. මෙම වාර්තාව 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ ආයතනික පාලනය පිළිබඳ නියමවල අවශ්‍යතාවලට ද අනුකූල වේ. ග්‍රාමීය සංවර්ධන බැංකු දාහතක් රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු ලෙස බැංකු හයකට ඒකාබද්ධ කිරීමෙන් පසු 1997 වර්ෂයේ දී බැංකුව මුලින් ස්ථාපනය කරන ලදී. මෙම පළාත් සංවර්ධන බැංකු හය 2010 මැයි මාසයේදී ජාතික මට්ටමේ සංවර්ධන බැංකුවක් ලෙස තවදුරටත් ඒකාබද්ධ කරන ලද අතර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (PSB) ලෙස නම් කරන ලදී. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ස්ථාපනය කරන ලදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව පූර්ණ වශයෙන් රාජ්‍ය හිමිකාරීත්වය සහිත ජාතික මට්ටමේ බැංකුවකි. ග්‍රාමීය ජනතාවට ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මූල්‍ය සේවා සැපයීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම අරමුණු කර ගෙන බැංකුව ස්ථාපනය කර ඇති අතර එමගින් ග්‍රාමීය ආර්ථිකය නංවාලීමට ද දායකත්වය ලබා දෙයි

## ප්‍රධාන ක්‍රියාකාරකම්
බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළඳාම, වාණිජ්‍යය, පශු සම්පත්, ධීවර කටයුතු සංවර්ධනය කිරීම සහ ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යවසායන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය ආධාර ලබා දීමෙන් ශ්‍රී ලාංකිකයන් සවිබල ගැන්වීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික සංවර්ධනයට පහසුකම් සැලසීමයි

## දැක්ම, මෙහෙවර
මෙම වාර්ෂික වාර්තාවේ 4 වන පිටුවේ බැංකුවේ දැක්ම සහ මෙහෙවර දක්වා ඇත. දැක්ම සහ මෙහෙවර යටතේ දක්වා ඇති අරමුණු ඉටු කර ගනිමින්, බැංකුව එහි ක්‍රියාකාරකම්වල ඉහළ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගනී

## අඛණ්ඩ පැවැත්ම
පුරෝකතනය කළ හැකි අනාගතයක් දක්වා බැංකුවට එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාමට බැංකුවට ප්‍රමාණවත් සම්පත් ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ එබැවින්, මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අපි අඛණ්ඩ පැවැත්ම පදනම අනුගමනය කරමු

## මූල්‍ය ප්‍රකාශන
බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRSs/ LKASs) අනුකූලව පිළියෙළ කර ඇති අතර 1988 අංක 30 දරන බැංකු පනතට අනුකූල වේ. 2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ බැංකුවේ දහතුන්වන වසරේ මූල්‍ය ප්‍රකාශන, ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන විධායක නිලධාරි සහ බැංකුවේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් නිසි ලෙස අත්සන් කර 119 පිටුවේ දක්වා ඇති අතර එම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය අංගයකි.

## මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම්
බැංකුවේ කටයුතුවල තත්ත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ මතයක් පිළිබිඹු කරන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ 1988 අංක 30 දරන බැංකු පනතේ සහ එහි සංශෝධනවල අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

මෙම වාර්ෂික වාර්තාවේ 111 පිටුවේ දක්වා ඇති අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශනය මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයක් වන මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සවිස්තරාත්මකව දක්වයි.

## විගණකවරයාගේ වාර්තාව
2022 වර්ෂය සඳහා බැංකුවේ විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද අතර, විගණනය වසර පුරා සිදු කරන ලදී. ඔවුන්ගේ වාර්තාවේ හඳුනාගත් ගැටළු කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළමනාකාරිත්වයට විධිමත්ව ඉදිරිපත් කරන ලදී. මූල්‍ය වාර්තාකරණයේ නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් පසුව, මූල්‍ය ප්‍රකාශන, අවශ්‍ය දත්ත සහ තොරතුරු සමඟ, විගණකාධිපතිවරයාට පරීක්ෂා කිරීම සඳහා ලබා දෙන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ 114 සිට 116 දක්වා පිටුවල දක්වා ඇත. නියාමන අධීක්ෂණ ආයතනයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නියෝගවලට බැංකුවේ අනුකූලතාව  තහවුරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකුවේ වාර්තා සහ කටයුතු පිළිබඳ කලින් කල පරීක්ෂණයක් සිදු කරන ලදී. කොටස්කරුවන්ගේ, විශේෂයෙන්ම තැන්පත්කරුවන්ගේ අයිතීන් ආරක්ෂා වන පරිදි, අවශ්‍ය මූල්‍ය දර්ශක අවශ්‍ය මට්ටමින් පවත්වා ගෙන යන බව ද ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරයි.

## වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 126 සිට 139 දක්වා පිටුවල දක්වා ඇත.

## අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික

වර්ෂය තුළ ගෙවන ලද අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල 14 වන සටහනේ දක්වා ඇත.

## අනාගත සංවර්ධන කටයුතු

බැංකුවේ අනාගත සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනයක් සභාපතිවරයාගේ ප්‍රකාශනයේ (පිටු 10 සිට 13 දක්වා) දක්වා ඇති අතර සාමාන්‍යාධිකාරීගේ / ප්‍රධාන විධායක නිලධාරීගේ සමාලෝචනය (පිටු 14 සිට 17 දක්වා) සහ කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය (පිටු 36 සිට 69) දක්වා) ද ඉදිරිපත් කර ඇත.

## ව්‍යාපාර කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය

2022 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ කාර්යසාධනය පිළිබඳ සමාලෝචනයක් සභාපතිවරයාගේ ප්‍රකාශයෙහි (පිටු 10 සිට 13 දක්වා) ද, සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනයේ ද (පිටු 14 සිට 17 දක්වා) සහ කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනයේ ද (පිටු 36 සිට 69 දක්වා) ඇතුළත් වේ. මෙම වාර්තා වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය අංග වේ.

## මූල්‍ය ප්‍රතිඵල

බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී සමාලෝචනයේ (14 සිට 17 දක්වා පිටුවල) සඳහන් කර ඇති අතර මූල්‍ය විශේෂ අවස්ථා 8 සිට 9 දක්වා පිටුවල දක්වා ඇත.

## ප්‍රකාශිත ප්‍රාග්ධනය

2022.12.31 දිනට මුළු කොටස් හිමි අරමුදල රුබිලියන 162 කි. වසර අවසානයේ කොටස් හිමියන් විසින් දායක වූ ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.බිලියන 8.22 ක් වන අතර ඔවුන්ගේ කොටස් හිමිකාරීත්ව ප්‍රතිශතය පහත පරිදි වේ.

| | | කොටස් සංඛ්‍යාව | % |
|---|---|---|---|
| 01. | මහා භාණ්ඩාගාරය | 501,941,973 | 91 |
| 02. | ලංකා බැංකුව | 16,448,448 | 3 |
| 03. | මහජන බැංකුව | 16,448,448 | 3 |
| 04. | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 16,452,126 | 3 |
| | එකතුව | 551,290,995 | 100 |

## ආදායම

2022 වර්ෂය සඳහා බැංකුවේ දළ ආදායම රු. බිලියන 36.20 කි ආදායම පිළිබඳ විස්තර 141 පිටුවේ දක්වා ඇත.

## බදුකරණය

2022 වර්ෂයේ දී බැංකුව බදු සහ අයකිරීම් ලෙස රජයට රු. මිලියන 2,940 කින් දායකත්වය ලබා දෙන ලදී. මෙයට රු. මිලියන 1,301 ක ආදායම් බද්දක්, රු. මිලියන 1,561 ක මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්දක් සහ රු. මිලියන 78 ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් ඇතුළත් විය.

බැංකුවේ මෙහෙයුම් සඳහා අදාළ වන ආදායම් බදු අනුපාතය 30% කි. වගකීම් ක්‍රමය යටතේ දන්නා සියලුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදුකරණය සඳහා විධිවිධාන සැලසීම බැංකුවේ ප්‍රතිපත්තියයි.

## දේපළල පිරියත සහ උපකරණ

වසර තුළ දේපළ, පිරියත සහ උපකරණ, කල්බදු දේපළ සහ අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා බැංකුව විසින් දරන ලද මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 210 ක් (2021 රු. මිලියන 326) වූ අතර, ඒ පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ 152 සිට 158 දක්වා පිටුවල මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 24 සහ 25 හි දක්වා ඇත.

## ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවී නොමැත.

## නිරාකරණය කරගත යුතුව ඇති නෛතික ක්‍රියාමාර්ග

අධ්‍යක්ෂවරුන්ගේ සහ බැංකුවේ නීතිඥයින්ගේ මතය අනුව, මූල්‍ය ප්‍රකාශනවල 41 වන සටහනේ හෙළිදරව් කර ඇති නිරාකරණය කරගතයුතුව ඇති නෛතික ක්‍රියාමාර්ග මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ එහි අනාගත මෙහෙයුම් කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොකරනු ඇත.

## ප්‍රාග්ධනය සහ සංචිත

රඳවා ගත් ඉපැයීම් ඇතුළුව බැංකුවේ ප්‍රාග්ධනය සහ සංචිත පහත සඳහන් දැ වලින් සමන්විත වේ:

| | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 8,221,864,565 | 8,047,229,930 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 845,247,866 | 777,778,133 |
| විශේෂ සංචිත අරමුදල | 699,638,194 | 632,168,461 |
| පොදු සංචිත අරමුදල | 3,569,591,213 | 3,299,712,282 |
| රඳවා ගත් ඉපැයීම් | 2,889,785,537 | 2,636,433,520 |
| **එකතුව** | 16,226,127,375 | 15,393,322,327 |

## ලාභාංශ

2022 වර්ෂයේ ආන්තික මෙහෙයුම් ප්‍රතිඵල සහ ප්‍රාග්ධන හිඟය සැලකිල්ලට ගනිමින්, 2022 වසර සඳහා ලාභයෙන් ලාභාංශ බෙදා හැරීමක් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයා ඇතුළු සාමාජිකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වේ. භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සභාපතිවරයා සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබන අතර, අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු මහා භාණ්ඩාගාරය, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව නියෝජනය කරන කොටස් හිමියන් විසින් නම් කරනු ලැබේ. මෙම වාර්ෂික වාර්තාවේ 20 සිට 25 දක්වා පිටුවල දැක්වෙන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් පහත දැක්වේ.

එම්. මහින්ද සාලිය මහතා - සභාපති
කේ. රවීන්ද්‍රන් මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්. ආරියරත්න හේරත් - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
ආචාර්ය නිර්මාල් ද සිල්වා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
ලලිත් අබේසිරිවර්ධන මහතා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
ජී.ඒ. ජයශාන්ත මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ
හිරන්ති කරුණාරත්න මහත්මිය - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ
එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ
ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ
ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ

## ඉවත් වූ අධ්‍යක්ෂවරුන්

ආචාර්ය නිර්මාල් ද සිල්වා - ස්වාධීන / විධායක නොවන අධ්‍යක්ෂ, 2022.04.04 දින සිට ඉල්ලා අස්විය.
එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ, 2022.07.29 දින සිට ඉල්ලා අස්විය.
ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය - ස්වාධීන නොවන / විධායක නොවන අධ්‍යක්ෂ, 2022.12.22 දින සිට ඉල්ලා අස්විය.

## අභිනව අධ්‍යක්ෂවරුන් පත් කිරීම

| අධ්‍යක්ෂ | පත්වීම් ලද දිනය |
|---|---|
| ඩබ්ලිව්.ඒ.සරත් කුමාර මහතා | 2022.08.26 |
| ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය | 2022.01.10 |

## අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

මහ බැංකුවේ ආයතනික පාලන ප්‍රමිතීන් සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අනුකූලතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සමස්ත වගකීම සහ වගකිවයුතුබව භාර ගනිමින් පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු ද ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා සියලුම අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල ලේකම්වරයා ලෙස කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල සංයුතිය පහත පරිදි වේ:

## අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව

1 එම්.එස්.එස්.එස්. ප්‍රනාන්දු මහතා (කමිටුවේ සභාපති 2022.02.28 දින පත් කරන ලදී)
2 ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා
3 ලලිත් අබේසිරිවර්ධන මහතා
4 ජී.ඒ. ජයශාන්ත මහතා
5 ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය (2022.06.20 දින පත් කරන ලදී)
6 ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරීවරයෙක්
7 සී.එල්.සී. මුතුබණ්ඩා මහතා - සහකාර සාමාන්‍යාධිකාරී - අභ්‍යන්තර විගණන
8 ජේ. ප්‍රියශාන්ත මහතා - ප්‍රධාන අභ්‍යන්තර විගණක (2022.08.29 සිට)
විගණන කමිටු වාර්තාව 102 පිටුවේ දක්වා ඇති අතර එය අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ කොටසක් වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

1. කේ රවීන්ද්‍රන් මහතා (කමිටුවේ සභාපති)
2. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් මහතා
3. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා (2022.04.04 දින සිට ඉල්ලා අස්විය)
4. ජී.ඒ. ජයශාන්ත මහතා
5. ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා - සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (2022.02.25 දින සිට)
6. සුමේධ එදිරිසූරිය මහතා - සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (රාජකාරී ආවරණය කිරීම (2022.10.14 දින සිට)
7. එච්.එම්.එන්.එම්. හේරත් මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණය
8. ටී.කේ. විජේරත්න මහත්මිය - සහකාර සාමාන්‍යාධිකාරී - අනුකූලතාව

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව 103 පිටුවේ දක්වා ඇති අතර එය අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවේ කොටසක් වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව

1. එම්. මහින්ද සාලිය මහතා (කමිටුවේ සභාපති)
2. ආචාර්ය නිර්මාල් ද සිල්වා මහතා (2022.04.04 දින සිට ඉල්ලා අස්විය)
3. ලලිත් අබේසිරිවර්ධන මහතා
4. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් මහතා
5. හිරන්ති කරුණාරත්න මහත්මිය (2022.11.21 දින පත් කරන ලදී)
6. ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ මහතා - සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (2022.02.10 සිට)
7. සුමේධ එදිරිසූරිය මහතා - සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (රාජකාරී ආවරණය කිරීම) (2022.09.05 සිට)
8. ඩී.කේ.එස්. සේරසිංහ මහතා - ප්‍රධාන මානව සම්පත් නිලධාරී

## අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුව

1. එම්. මහින්ද සාලිය මහතා (කමිටු සභාපති)
2. ආචාර්ය නිර්මාල් ද සිල්වා (2022.04.04 දින ඉල්ලා අස්විය)
3. ලලිත් අබේසිරිවර්ධන මහතා
4. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත්
5. හිරන්ති කරුණාරත්න මිය
6. ඒ.එච්.එම්.එම්.බී. ජයසිංහ - සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (2022.02.10 සිට)
7. සුමේධ එදිරිසූරිය මහතා - සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී (රාජකාරී ආවරණය කිරීම) (2022.09.05 සිට)
8. ඩී.කේ.එස්. සේරසිංහ මහතා - ප්‍රධාන මානව සම්පත් නිලධාරී

## අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු රැස්වීම්, අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු රැස්වීම් සහ මෙම රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සංඛ්‍යාව මෙම වාර්ෂික වාර්තාවේ ආයතනික පාලන වාර්තාවේ 93 සිට 94 දක්වා පිටුවල දක්වා ඇත.

## කොන්ත්‍රාත්තු සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පිළිබැඳියාව

සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ කොන්ත්‍රාත්තු හෝ යෝජිත කොන්ත්‍රාත්තු සඳහා අධ්‍යක්ෂවරුන්ට ඍජු හෝ වක්‍ර පිළිබැදියාවක් නොතිබුණි.

## සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අනුගමනය කරන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (LKAS 24) අදාළ පාර්ශව හෙළිදරව් කිරීම් අනුව, අදාළ පාර්ශව ගනුදෙනු ලෙස වර්ගීකරණය කළ හැකි ගනුදෙනු තිබේ නම්, ඒවා ද අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කර ඇත. අධ්‍යක්ෂවරුන් විසින් හෙළිදරව් කරන ලද එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 38 හි හෙළිදරව් කර ඇත.

## සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී

සාමාන්‍යාධිකාරීවරයා බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලැබේ. සාමාන්‍යාධිකාරීවරයාට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පෙනී සිටීමට සහ සහභාගී වීමට අයිතියක් ඇත.

## මානව සම්පත්

උසස් ගුණාත්මක සේවාවක් තුළින් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමට කැපවී සිටින සහ ඉහළ අභිප්‍රේරණයක් ලබා ඇති සේවකයින් සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම බැංකුව මගින් අඛණ්ඩව සිදු කරන ලදී.

## මෙහෙයුම් විශිෂ්ටත්වය

කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි ප්‍රමිතිකරණය ඉදිරියට ගෙන යාමට සහ පවතින තාක්‍ෂණික වේදිකා භාවිතය ප්‍රශස්ත කිරීමට බැංකුව අඛණ්ඩ මුලපිරීම් සිදු කර ඇත.

## පාරිසරික ආරක්ෂාව

බැංකුවේ තිරසාර සංවර්ධනය හා වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන පරිසරය ආරක්ෂා කිරීමට සහ වැඩිදියුණු කිරීමට බැංකුව මූලික පියවර ගෙන ඇති පරිසරයට හානිකර හෝ අනතුරුදායක කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නිරත වී නොමැත.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සේවකයින්ට අදාළව ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට සිදු කර ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුමට සහ විශ්වාසයට අනුව සෑහීමකට පත්වේ.

## අවදානම් කළමනාකරණය අභ්‍යන්තර පාලන සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

අවදානම් කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති එම අරමුණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව තුළ අභ්‍යන්තර පාලනය පිළිබඳ කාර්යක්ෂම හා විස්තීර්ණ පද්ධතියක් සහ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කර ක්‍රියාත්මක කර තිබේ. බැංකුව නිරාවරණය වන අවදානම් අවම කිරීම සහ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හෝ අලාභ සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා එකී අභ්‍යන්තර පාලන පද්ධති නැවත සැලසුම් කර ඇති බැංකුව මුහුණ පාන අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් පවතී. එකී අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කර ඇති සුවිශේෂී පියවර මෙම වාර්ෂික වාර්තාවේ 60 සිට 69 දක්වා පිටුවල විස්තර කර ඇත.

## අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂ වරුන්ගේ ප්‍රකාශනය

මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම අදාළ ගිණුම්කරණ මූලධර්ම සහ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්ෂික වාර්තාවේ අත්‍යවශ්‍ය අංගයක් වන ඉහත සඳහන් වාර්තාව 109 සිට 110 දක්වා පිටුවල දක්වා ඇත. මෙම වාර්ෂික වාර්තාවේ 107 සහ 108 පිටුවල දක්වා ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ මණ්ඩලය විසින් විගණකාධිපතිවරයාගෙන් සහතික වාර්තාවක් ලබාගෙන ඇත.

## ආයතනික පාලනය

බැංකුවට කළමනාකරණය කිරීමේදී, අධ්‍යක්ෂවරුන් හොඳම ආයතනික පාලන පිළිවෙත් සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම කෙරෙහි අවධාරණය කර ඇත. ඒ අනුව, අවදානම් කළමනාකරණ පියවරයන් වැඩිදියුණු කිරීම සහ වගවීම සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා වරින් වර පද්ධති සහ ව්‍යුහයන් හඳුන්වා දී / වැඩිදියුණු කර ඇත. ආයතනික පාලනය පිළිබඳ වෙනම වාර්තාවක් 73 සිට 92 දක්වා පිටුවල දක්වා ඇති අතර, ඒ සඳහා මණ්ඩලය විගණකාධිපතිවරයාගෙන් කරුණු සොයාගැනීම් වාර්තාවක් ලබාගෙන ඇත.

## නීති, රෙගුලාසි සහ විචක්ෂණභාවය පිළිබඳ අවශ්‍යතාවලට අනුකූලතාව දැක්වීම

බැංකුව සැම විටම ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතට සහ අනෙකුත් සියලුම අදාළ වන නීති, රෙගුලාසි සහ විචක්ෂණභාවය පිළිබඳ අවශ්‍යතාවලට අනුකූල වන බවට සහතික වී ඇත.

## විගණකවරු

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය අනුව



තිලානි රාජපක්ෂ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

# අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් සහ පාරිශ්‍රමික අනුකමිටු (BHRRC), අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු (BNC) වාර්තාව

## හැඳින්වීම

ආයතනික පාලන පිළිවෙත් සහ 3(6) (iii) සහ (iv) වගන්ති ප්‍රකාරව බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කරන ලද නියම 3(6) හි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියම අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (PSB) විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු ස්ථාපනය කිරීම අවශ්‍ය වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සහිතව අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුව (BNC) යන කමිටු දෙකක් ස්ථාපනය කරන ලදී ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නියමවලට අනුව අර්ථ දක්වා ඇති විෂය පථය තුළ කමිටු දෙකට වගකීම් පවරන ලදී. 2017 මාර්තු 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි, නිර්වචනය කරන ලද යොමු කිරීම් අනුදේශවලට (TOR) අනුව, අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුව (BNC) වෙනම කමිටු දෙකක් ලෙස ක්‍රියා කරයි.

## අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුවේ (BHRRC) විෂය පථයට ඇතුළත් වන්නේ,

- බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරී (CEO) සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) සම්බන්ධ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය තීරණය කිරීම

- අරමුණු සහ ඉලක්ක සැකසීම සහ අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස්වල (KMPs) කාර්යසාධනය නියමිත ඉලක්ක සහ අරමුණුවලට එදිරිව කාලානුරූපව ඇගයීම.

- බැංකුවේ ව්‍යාපාර සහ ක්‍රියාකාරී උපාය මාර්ග හා සම්බන්ධ මානව සම්පත් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සකස් කිරීමට මඟ පෙන්වීම සහ උපදෙස් දීම.

- මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද කරුණු හා යෝජනා සම්බන්ධයෙන් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීම.

## අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුවේ (BNC) විෂය පථයට ඇතුළත් වන්නේ,

- ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) තනතුරට පත් කිරීම හෝ උසස් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන ගුණාංග නිර්වචනය කිරීම.

- අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු, ප්‍රධාන විධායක නිලධාරීන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs) සඳහා නව සාමාජිකයින් තෝරා ගැනීම / පත් කිරීම හෝ ඔවුන් නැවත පත් කිරීම සහ බැංකුවේ සමස්ත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ගේ කාර්යසාධනය සහ දායකත්වය පිළිබඳව ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන කළමනාකරණ පිරිස්වල ධූර කාලය දීර්ඝ කිරීම නැවත සලකා බැලීම සඳහා ක්‍රියා පටිපාටියක් ක්‍රියාත්මක කිරීම.

- නියම 3 (3) හි දක්වා ඇති නිර්ණායකවල නිශ්චිතව දක්වා ඇති පරිදි සහ ප්‍රඥප්තිවල දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන් තනතුරු දැරීමට යෝග්‍ය සහ නිසි පුද්ගලයින් බව සහතික කිරීම.

- විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අමතර / නව විශේෂඥතා අවශ්‍යතා සහ අනුප්‍රාප්තික විධිවිධාන කලින් කලට සලකා බැලීම සහ නිර්දේශ කිරීම.

මෙම අනුකමිටු දෙක අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා නිර්දේශ ඉදිරිපත් කරයි.

## සංයුතිය සහ රැස්වීම්

සභාපති එම්. මහින්ද සාලිය මහතා විසින් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටු සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු රැස්වීම්වල මුලසුන හොබවන ලදී. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටු රැස්වීම් හයක් (06) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී.

කමිටු සාමාජිකයින්ට තීරණ ගැනීමට හැකි වන පරිදි ප්‍රධාන මානව සම්පත් නිලධාරී විසින් සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී මගින් අවශ්‍ය පසුබිම් මත තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සහ විශ්ලේෂණ සමඟ සියලුම පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් මෙම කමිටුවල ලේකම් වශයෙන් කටයුතු කරයි.

අවශ්‍ය අවස්ථාවල, ඔවුන්ගේ අදාළ කාර්යයන් පිළිබඳ අදහස් දැක්වීම සඳහා අංශ හෝ ඒකක ප්‍රධානීන්ට ආරාධනා කෙරේ. සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරියා අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුවේ (BHRRC) සියලුම රැස්වීම්වලට සහභාගී විය යුතු අතර සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීවරයා ආරාධනාවක් ලැබුණු අවස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු රැස්වීම්වලට සහභාගී විය යුතුය.

එක් එක් කමිටු රැස්වීමක ගණපූරණය වශයෙන් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සහභාගී විය යුතුය. මෙම කමිටු අවම වශයෙන් කාර්තුවකට වරක්වත් රැස්විය යුතුය. වසර තුළ කමිටු සාමාජිකයින් වෙනස් වන අතර පැමිණීම පිළිබඳ විස්තර පහත පරිදි වේ:

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටු සාමාජිකයින්;

| නම | සහභාගී වූ / සුදුසුකම් ලත් |
|---|---|
| එම්. මහින්ද සාලිය මහතා - සභාපති (2020 පෙබරවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 06/06 |
| ආචාර්ය නිමර්ාල් ද සිල්වා - අධ්‍යක්ෂ (2022 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක පරිදි ඉල්ලා අස් විය.) | 01/01 |
| ලලිත් අබේසිරිවධර්න මහතා - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 06/06 |
| මහාචාර්ය එච්.එම්.ඩබ්.ඒ. හේරත් - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 06/06 |
| හිරන්ති කරුණාරත්න මහත්මිය - අධ්‍යක්ෂ (2022 නොවැම්බර් 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 02/02 |
| පී.එස්. එදිරිසූරිය මහතා - සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී (වැඩ ආවරණ) | |
| ආර්.එම්.ටී. රාජපක්ෂ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | |

අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටු සාමාජිකයන්

| නම | සහභාගී වූ / සුදුසුකම් ලත් |
|---|---|
| එම්. මහින්ද සාලිය මහතා - සභාපති (2020 පෙබරවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 04/04 |
| ආචාර්ය නිමර්ාල් ද සිල්වා මහතා - අධ්‍යක්ෂ (2022 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉල්ලා අස් විය.) | 00/01 |
| ලලිත් අබේසිරිවධර්න මහතා - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 04/04 |
| මහාචාර්ය එච්.එම්.ඩබ්.ඒ. හේරත් - අධ්‍යක්ෂ (2020 පෙබරවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 04/04 |
| හිරන්ති කරුණාරත්න මහත්මිය - අධ්‍යක්ෂ (2022 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී) | 03/04 |
| පී.එස්. එදිරිසූරිය මහතා - සාමාන්‍යාධිකාරී / ප්‍රධාන විධායක නිලධාරී (වැඩ ආවරණ) | |
| ආර්.එම්.ටී. රාජපක්ෂ මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් | |

## ක්‍රියාකාරකම් සාරාංශය

2021 අගෝස්තු මාසයේදී, මණ්ඩල අධ්‍යක්ෂ කේ.ඊ.ඩී. සුමනසිරි මහතාගේ ඉල්ලා අස්වීම සැලකිල්ලට ගනිමින්. මණ්ඩල අධ්‍යක්ෂ හිරන්ති කරුණාරත්න මහත්මිය අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුවේ (BHRRC) සාමාජිකාවක් ලෙස පත් කිරීමට තීරණය කරන ලදී.

කමිටු ලේකම්වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුවේ (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුවේ (BNC) රැස්වීම් වාර්තා සමග නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරයි. සමාලෝචිත කාල සීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුව (BNC) විසින් කරන ලද නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරයි.



ඩී.එල්. ද ඉසෙඩ්. අබේසිරිවර්ධන
අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් පාරිශ්‍රමික අනුකමිටුව
අධ්‍යක්ෂ මණ්ඩල නාමික අනුකමිටුව

# අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු (BAC) වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 3 (6) (ii) වගන්තිය යටතේ නිකුත් කරන ලද "බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා ආයතනික පාලනය" පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනත් විධානයන් සහ එහි පසුකාලීන සංශෝධන, යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශවල විධිවිධාන අනුව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද "ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය" ට අනුව, පිහිටුවන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවේ ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරන ලද ප්‍රඥප්තිය සහ යොමු කිරීම් අනුදේශ මත පදනම් වේ.
වසර අවසානය වන විට පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂ-වරුන්ගෙන් අනුකමිටුව සමන්විත විය

1. ඩබ්ලිව්.එම්. කරුණාරත්න මහතා (සභාපති-2022.08.29 සිට)
2. ලලිත් අබේසිරිවර්ධන මහතා
3. ජී.ඒ. ජයශාන්ත මහතා
4. ක්‍රිෂානි නාරංගොඩ මහත්මිය (2022.06.20 දින පත් කරන ලදී)

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවේ ලේකම්වරයා ලෙස ද කටයුතු කරයි.
සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය) සහ සහකාර සාමාන්‍යාධිකාරී (අනුකූලතාවය) ආරාධනාවක් සිදු කළ අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු රැස්වීම්වලට සහභාගී වේ. ජාතික විගණන කාර්යාලයේ (බැංකුවේ බාහිර විගණක) නියෝජිතයෙකු ද මෙම රැස්වීම්වලට සහභාගී වේ.

පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවට එහි වගකීම් ඉටු කිරීම සහ එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මගින් බලය ලබා දී තිබේ.

- ව්‍යවස්ථාව යටතේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රියා වලිය සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය පරීක්ෂා කිරීම හා ව්‍යාපාර අවදානම කළමනාකරණය කිරීම.
- බාහිර සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම.

- නීති, රෙගුලාසි සහ විශේෂයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාත්මක වන ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ රැස්වීම් පහක් (05) පවත්වන ලදී. සමාලෝචිත වර්ෂය තුළ අනුකමිටුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කටයුතු කරන ලදී:

- 2022 වර්ෂය සඳහා බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණල සහ පසු විපරම් පරීක්ෂණවලදී මතු වූ ගැටළු සමාලෝචනය කර සාකච්ඡා කරන ලද අතර නිවැරදි කිරීමේ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදී.
- අභ්‍යන්තර විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කාලීනව සමාලෝචනය කරන ලදී.
- 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විගණකාධිපතිවරයාගේ වාර්තාව සමාලෝචනය කරන ලදී.
- ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කරන ලද අතර අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කරන ලදී.
- පද්ධතියට අදාළ ගැටළු සහ බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඇතැම් විශේෂ වාර්තා සමාලෝචනය කරන ලදී.

අභ්‍යන්තර විගණන වාර්තා, ඒවායේ නිරීක්ෂණය කරන ලද අඩුපාඩු, අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්/දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ලබා දුන් ප්‍රතිචාර සලකා බලන ලද අතර නිරීක්ෂණය කරන ලද අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව මගින් අධීක්ෂණය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු රැස්වීම්වල වාර්තා දැනුවත් වීම සඳහා /අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා මගින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් 2022 වර්ෂය තුළ කළමනාකාරිත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ පියවර පිළිබඳව ද අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව විසින් පසු විපරම් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයාට අවශ්‍ය වන සියලුම තොරතුරු සහ ලේඛන සැපයීම සම්බන්ධයෙන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව සහතික කරන ලදී. ප්‍රමාණවත් පාලනයන් සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක වන බවත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවේ ප්‍රඥප්තිය සියලු වැදගත් අංශවලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවේ අදහසයි.



ඩබ්ලිව්.එම්. කරුණාරත්න
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුව

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

## කමිටුවේ සංයුතිය

සමාලෝචිත වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන්ගේ පැතිකඩ 20 සිට 25 පිටුවල දක්වා ඇත. එක් එක් අධ්‍යක්ෂවරයාගේ නම යටතේ විධායක හෝ විධායක නොවන යන්න ඇතුළත් කර ඇත.

1. කේ. රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ (කමිටුවේ සභාපති / විධායක නොවන අධ්‍යක්ෂ)
2. මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් මහතා - විධායක නොවන අධ්‍යක්ෂ
3. ආචාර්ය නිර්මාල් ද සිල්වා - අධ්‍යක්ෂ (විධායක නොවන අධ්‍යක්ෂ)
4. ජී.ඒ. ජයශාන්ත මහතා - විධායක නොවන අධ්‍යක්ෂ

2022 වර්ෂය තුළ, නිත්‍ය වශයෙන් මෙම රැස්වීම් සඳහා සහභාගී වන ප්‍රධාන විධායක නිලධාරී (CEO) ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) / සහකාර සාමාන්‍යාධිකාරී අවදානම් කළමනාකරණ සහ අනුකූලතා නිලධාරී යන නිලධාරීන් නිත්‍ය වශයෙන් රැස්වීම් සඳහා සහභාගී විය.

### කමිටුවේ ලේකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) කාර්තුමය පදනමක් මත රැස්වන අතර අවශ්‍ය අවස්ථාවලදී නිරන්තරයෙන් රැස්වේ

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ (BIRMC) ප්‍රඥප්තියට අනුව, කමිටුවේ අවම ගණපූරණයට විධායක නොවන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරී ඇතුළත් වේ.

සමාලෝචිත වර්ෂය තුළ, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) මගින් රැස්වීම් හතරක් (04) පවත්වන ලදී. කමිටු රැස්වීම්වල කටයුතු විධිමත්ව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී

කමිටු සාමාජිකයින්ගේ පැමිණීම් පහත වගුවේ දක්වා ඇත.

## රැස්වීම්

| කමිටු සාමාජිකයාගේ නම | පැමිණීම |
|---|---|
| කේ. රවීන්ද්‍රන් මහතා - අධ්‍යක්ෂ | 04/04 |
| මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.ඒ. හේරත් - අධ්‍යක්ෂ | 04/04 |
| ආචාර්ය නිර්මාල් ද සිල්වා - අධ්‍යක්ෂ | 01/04 |
| ජී.ඒ. ජයශාන්ත මහතා - අධ්‍යක්ෂ | 04/04 |

## කමිටුවේ ප්‍රඥප්තිය

1988 අංක 30 දරන බැංකු පනත ප්‍රකාරව, මුදල් මණ්ඩලයට පැවරී ඇති බලතල යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද "ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය" පිළිබඳ 2007 අංක 12 දරන බැංකු පනත් විධානයන්හි 3(6) වගන්තියට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ස්ථාපනය කර ඇත.

ප්‍රධාන අවදානම් නිරාවරණ සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර සමාලෝචනය කිරීම ඇතුළුව, බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව සහ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා එහි වගකීම් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය ලබා දෙයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දක්වා ඇති යොමු කිරීමේ අනුදේශ, කමිටුවේ කාර්යභාර සහ වගකීම් පහත දැක්වේ:

1 ඒකාබද්ධ අවදානම් කළමනාකරණ (IRM) රාමුවට අනුව, බැංකුව පුරා නිරන්තරයෙන් අවදානම් කළමනාකරණ උපාය මාර්ගය, රාමුව සහ ක්‍රමවේදය ක්‍රියාත්මක කර / භාවිත කර ඇති බව සහතික කර ගන්න.

2 ණය, වෙළඳපොළ, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් හඳුනා ගැනීම, මැනීම, අධීක්ෂණය කිරීම සහ අවම කිරීම පිළිබඳ ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය.

3 ස්ථාපනය කරන ලද අභිනියෝජනය කළ බලධාරීන්ට අනුකූලව අවදානම් තීරණ ගැනීම සහතික කිරීම සහ බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් නියම කරන ලද අවදානම් දරා ගැනීම ඉක්මවා ගෙන ඇති අවදානම් අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම.

4 බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ අවදානම් කළමනාකරණ කාර්යයේ ශක්තිමත් බව අධීක්ෂණය කිරීම සහ ප්‍රවේශය.

5 බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් ගැනීමට අපේක්ෂා කරන අවදානම් මට්ටම සහ අවදානම දරා ගැනීමේ සීමාවන් නියම කිරීම.

6 බාසල් III මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීමේ සහ නියාමන මාර්ගෝපදේශවල ප්‍රගතිය සමාලෝචනය කිරීම.

7 බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ වැඩිදියුණු කිරීම.

8 අවදානම් කළමනාකරණ අංශයේ (RMD) කාර්ය පරාසය තීරණය කිරීම සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුව ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවදානම් කළමනාකරණ අංශයේ (RMD) ක්‍රියාකාරිත්වය සඳහා මඟපෙන්වීම.

## ප්‍රධාන වශයෙන් අවධානය යොමු කිරීම

බැංකුවේ අවදානම පිළිබඳ සියලු අංශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා කමිටුව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි. මේ සම්බන්ධයෙන්, කමිටුව බැංකුවේ ණය, ද්‍රවශීලතාවය, ක්‍රියාකාරිත්වය, වෙළඳපොළ සහ උපායමාර්ගික අවදානම් කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුවේ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් ගැනීමට අපේක්ෂා කරන අවදානම සමාලෝචනය කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

## 2022 වර්ෂයේ ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇති ඉහත රාජකාරි සහ වගකීම් ඉටු කිරීමේදී, උපායමාර්ගික, මෙහෙයුම්, ණය, වෙළඳපොළ, සයිබර් සහ අනෙකුත් නැගී එන අවදානම් කාණ්ඩ ඇතුළත් වන සැලකිය යුතු අවදානම් සමාලෝචනය කරන ලදී. කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ;

1 පවතින අවදානම් ආශ්‍රිත ප්‍රතිපත්ති සමාලෝචනය කර සංශෝධනය කරන ලද අතර බැංකුවේ වත්මන් අවදානම් පැතිකඩ මත පදනම්ව කමිටුවල ප්‍රතිපත්ති/අත්පොත්/ප්‍රඥප්ති නිර්දේශ කරන ලදී.

| 2022 වසර්ය තුළ සමාලෝචනය කර සංශෝධනය කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති | |
|---|---|
| ආතති පරීක්ෂණ ප්‍රතිපත්තිය | බැංකුවේ ආතති පරීක්ෂණ රාමුව විස්තර කරයි |
| පොලී අනුපාත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | පොලී අනුපාත අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා පවතින රාමුව |
| ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | ද්‍රවශීලතා අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා පවතින රාමුව |
| විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | විදේශ විනිමය අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ අවම කිරීම සඳහා පවතින රාමුව |
| මෙහෙයුම් අවදානම කළමනාකරණය | ග්‍රාමීය සංවර්ධන බැංකුවේ මෙහෙයුම් අවදානම් සිදුවීම් කළමනාකරණය සඳහා රාමුව මෙන්ම අවදානම් හඳුනා ගැනීම, අවම කිරීම සහ වාර්තා කිරීම සඳහා ඉහළ මට්ටමේ මූලධර්ම පවත්වා ගැනීම |
| ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය | අවදානම් සහ අවස්ථා අතර සමතුලිතතාවයක් පවත්වා ගැනීම සඳහා රාමුවක් සහ බැංකුව තුළ ණය සංස්කෘතියක් නිර්මාණය කිරීමේ මෙවලමක් ලෙස ක්‍රියා කිරීම. |
| **2022 වසර්ය තුළ සමාලෝචනය කර සංශෝධනය කරන ලද බැංකුවේ අනෙකුත් කාර්යයන්ට අදාළ ප්‍රතිපත්ති** | |
| සම්බන්ධිත පාශර්ව ගනුදෙනු ප්‍රතිපත්තිය | සම්බන්ධිත පාශර්ව ගනුදෙනු පිළිබඳ මාගෝපදේශ සහ ක්‍රියා පටිපාටි |
| අනුකූලතා ප්‍රතිපත්තිය | බැංකුවේ අනුකූලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහා රාමුව |
| තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය | බැංකුව සහ එහි ජාල තුළ තොරතුරුවල ආරක්ෂාවට අදාළ නීති සහ මාගෝපදේශ ගෙනහැර දක්වයි. |
| පිළිගත හැකි භාවිත ප්‍රතිපත්තිය | ග්‍රාමීය සංවධර්න බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාතර්මේන්තුව විසින් සපයනු ලබන පරිගණක උපකරණ සහ තොරතුරු සම්පත්වල පිළිගත හැකි භාවිතය ගෙනහැර දක්වයි. |
| මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (AML) ප්‍රතිපත්තිය | බැංකුවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහතික කිරීම සඳහා මාගෝපදේශ සහ ක්‍රියා පටිපාටි |
| ද්‍රවශීල අවිනිශ්චිතතා අරමුදල් ප්‍රතිපත්තිය | වැඩි වැඩියෙන් දරුණු තත්ත්වයකට පත් වන ද්‍රවශීලතා තත්ව ඇගයීමට බැංකුවට රාමුවක් සපයන අතර මෙම අනපේක්ෂිත තත්වයන් යටතේ අරමුදල් සපයා ගැනීමේ හැකියාව අධීක්ෂණය කිරීම සඳහා රාමුවක් සැපයීම. |
| 2022 වසර්ය තුළ සමාලෝචනය කර සංශෝධනය කරන ලද කමිටු ප්‍රඥප්ති | |
| අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය | අවදානම් පැතිකඩ නොසලකා හැරීම සහ බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව අනුමත කිරීම සඳහා BIRMC හි යොමු කිරීම් අනුදේශ සමාලෝචනය කරන ලදී. |
| *විධායක මෙහෙයුම් අවදානම් කළමනාකරණ උප කමිටුව* | ප්‍රමාණවත් නොවන හෝ අසාථර්ක අභ්‍යන්තර ක්‍රියාවලි, මිනිසුන්, පද්ධති සහ බැංකුවේ ණය හෝ වෙළඳපොළ අවදානම් මගින් ඇති වන බාහිර අවස්ථා හේතුවෙන් ඇතිවන අනපේක්ෂිත සෘජු හෝ වක්‍ර අලාභ පාලනය කරන ORMEC හි යොමු කිරීම් අනුදේශ සමාලෝචනය කරන ලදී. |

2 අපේක්ෂිත අවදානම් කළමනාකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ අවදානම් නිරාවරණයන් පාලනය කිරීම සඳහා පූර්ව ක්‍රියාකාරී පියවර ගැනීම සඳහා එවැනි දර්ශකවල ප්‍රමාණවත් බව තීරණය කිරීමේ අරමුණින්, නිශ්චිත අවදානම් මට්ටම අධීක්ෂණය කිරීම සඳහා යාවත්කාලීන කරන ලද ප්‍රධාන අවදානම් දර්ශක (KRI) විධිමත්ව සමාලෝචනය කරන ලදී. සත්‍ය මාසික ප්‍රතිඵල මිණුම් සලකුණුවලට එරෙහිව සමාලෝචනය කරන ලද අතර නිශ්චිත අවදානම්වල බලපෑම් අවම කිරීම සඳහා කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කරන ලදී.

3. 2022) වර්ෂය සඳහා ප්‍රධාන වශයෙන් අවධානය යොමු කළ ක්ෂේත්‍රය වූයේ රට තුළ මූල්‍ය ආතති තත්ත්වය හේතුවෙන් මූල්‍ය අංශයේ ණයවල ගුණාත්මකභාවය පිරිහීම හා සම්බන්ධ වූ රට තුළ පැවති ආර්ථික අර්බුදයේ පීඩනයයි. ආර්ථිකය උද්ධමනකාරී පීඩනයකට මුහුණ දී ඇති අතර විදේශ විනිමය අනුපාතය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ද පීඩනයක් එල්ල වී ඇත. වර්ෂය තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව වරින් වර මූල්‍ය ප්‍රතිපත්තිය සීමා කරන ලද අතර සමස්ත වර්ෂය පුරාම බැංකුව ආර්ථික අර්බුදය මගින් එල්ල වූ අභියෝගවලට මුහුණ දී ඇත. ණය ගුණාත්මකභාවය පිරිහීම වැළැක්වීම සඳහා බැංකුව එය අවම කිරීමේ සහ පාලනය කිරීමේ පියවර ස්ථාපනය කර ඇත.

4. ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් ගැනීමට අපේක්ෂා කරන අවදානම් ප්‍රමාණය පිළිබඳ රාමුව සහ අවදානම් ඉවසීමේ සීමාව පිළිබඳ සමාලෝචනය කරන ලද වාර්තා, බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ අංශය පිළිබඳ බැංකුවේ කාර්තුමය වාර්තාව.

5 බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණවත්තා තක්සේරු ක්‍රියාවලිය (ICAAP) පිළිබඳ ලේඛනය සමාලෝචනය කරන ලද අතර බැංකුවේ ප්‍රාග්ධන සැලසුම්කරණය ද සමාලෝචනය කරන ලදී.

6 කලින් තීරණය කරන ලද ප්‍රශ්නාවලියක් තුළින් කමිටු සාමාජිකයින්ගේ ප්‍රතිපෝෂණ විශ්ලේෂණය කිරීම මගින් සියලුම කළමනාකරණ කමිටුවල ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය පිළිබඳ වාර්තා කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

7 අනුමත සීමා ඉක්මවා ගොස් ඇති බැංකුවේ ණය කළඹේ ආංශික සීමාවන් අධීක්ෂණය කර සමාලෝචනය කරන ලද අතර ගැළපීම් සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

8 කල්පිරීමේ පරතරය, විදේශ විනිමය අවදානම, පොලී අනුපාත අවදානම යන අවදානම් පිළිබඳව කාර්තුමය වශයෙන් තක්සේරු කර ඉහත ක්ෂේත්‍ර පිළිබඳව ආතති පරීක්ෂණ තවදුරටත් සිදු කරන ලදී.

9 බැංකුවේ ණය සමාලෝචන යාන්ත්‍රණය අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

10 නියාමන අවශ්‍යතාවලට අනුකූල වීමේ ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා අනුකූලතා නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක අනුකූලතා වාර්තා සමාලෝචනය කරන ලදී

11 මුදල් විශුද්ධිකරණයට එරෙහි (AML) පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කරන ලදී.

12 ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාව අධීක්ෂණය කර සමාලෝචනය කරන ලද අතර ගැටළු නිවැරදි කිරීම සඳහා හැකි සියලු නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

13 සයිබර් අවදානම් වාර්තා, පොලී අනුපාත අවදානම, විදේශ විනිමය අවදානම, මෙහෙයුම් අවදානම, අනුකූලතා අවදානම යනාදී සියලු වර්ගවල අවදානම් දර්ශක අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.
14 බැංකුවේ ආපදා ප්‍රතිසාධන අභ්‍යාසය අධීක්ෂණය කරන ලද අතර ආපදා ප්‍රතිසාධන අභ්‍යාසයේ සාර්ථකත්වය සඳහා ලබා දිය හැකි සියලු නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
15 2021 අංක 16 දරන බැංකු පනත් විධානය මගින් යෝජනා කරන ලද තොරතුරු ආරක්ෂක කමිටුවක් ස්ථාපනය කරන ලදී
16 2022 සඳහා ක්‍රියාත්මක වන VAPT හි වත්මන් තත්ත්වය පිළිබඳ වාර්තාවක් සමාලෝචනය කර අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ පරීක්ෂාව සඳහා ඉදිරිපත් කරන ලදී.
17 දෙපාර්තමේන්තුවේ දැනුම වැඩි දියුණු කිරීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සමඟ සමීපව කටයුතු කරන ලදී.

18 බැංකුවේ මෙහෙයුම් අවදානම තක්සේරු කිරීම සහ අවම කිරීම සඳහා විධායක මට්ටමේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ උප කමිටුවේ (ORMC) ක්‍රියාකාරිත්වය මාසික පදනමින් සමීපව අධීක්ෂණය කරන ලදී.
19 අවදානම් කළමනාකරණ සහ අනුකූලතා දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරී සැලැස්ම අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

## වාර්තා කිරීම

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල කටයුතු රැස්වීම් වාර්තා ඉදිරිපත් කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. බැංකුවේ අවදානම් පැතිකඩ සහ අනෙකුත් විශේෂිත කරුණු පිළිබඳ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් කරන ලද නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

2022 වර්ෂය තුළ, ඵලදායී අවදානම් කළමනාකරණ රාමුවක් මගින් ශක්තිමත් කරන ලද අවදානම් පරාමිතීන් කට්ටලයක් තුළ බැංකුවේ සමස්ත ව්‍යාපාර උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහාය ලබා දුන් අතර ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධිමත්ව වාර්තා කරන ලදී

## සාරාංශය

2022 වර්ෂයේ දී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු සාමාජිකයින් සාමූහිකව කටයුතු කිරීම මගින් එහි ඵලදායීබව සහ කාර්යක්ෂමතාව ඇගයීමට ලක් කර ඇත. කමිටුව බැංකුව විසින් මුහුණ දෙන විවිධ අවදානම් ක්ෂේත්‍ර නිරන්තරයෙන් සමාලෝචනය කරන අතර පහත සඳහන් කටයුතුවල නිරතවීම මගින් ශක්තිමත් අවදානම් පාලන රාමුවක් ප්‍රවර්ධනය කිරීමට කමිටුවට හැකියාව ලැබුණි.

1 බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් ගැනීමට කැමැත්තක් දක්වන අවදානම් නිර්ණය කිරීම ආවරණය වන පරිදි මනාව සංවර්ධනය කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක්.
2 ආතති පරීක්ෂණ හෝ අවස්ථා විශ්ලේෂණ සම බැංකු විශ්ලේෂණය සහ දත්ත විශ්ලේෂණයේ ප්‍රතිඵල ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම. අවදානම් වාර්තා කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයට නිවැරදිව සන්නිවේදනය කරන බව සහතික කිරීම.
3 අවදානම් කළමනාකරණය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව කාර්ය මණ්ඩලය තුළ දැනුවත්භාවය වැඩි කිරීම, අනුකූලතාවය සහතික කිරීම සහ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම ආදිය අවදානම් සංස්කෘතියක් නිර්මාණය කිරීමේ වැදගත් සංරචක වේ.

බැංකුවේ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා පුරක්ෂිත කරමින් අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවයේ අභියෝගවලට මුහුණ දීම සඳහා බැංකුව නිවැරදි මාවතකට ගමන් කරන බව කමිටුවේ අදහසයි.
අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්

**එස්.එන්.බී.එම්.ඩබ්ලිව්. නාරායන**
**සභාපති**
**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව**

# ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ වගකීම් ප්‍රකාශය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් නියාමන අවශ්‍යතාවලට අනුකූලව පිළියෙළ කර ඉදිරිපත් කරනු ලැබේ:

1. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LK)
2. 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති සමීක්ෂණ පනත
3. 1988 අංක 30 දරන බැංකු පනත සහ එයට සිදු කරන ලද සංශෝධන
4. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනික පාලනය පිළිබඳව නිකුත් කරන ලද 2007 අංක 12 දරන බැංකු පනත් විධානය ද ඇතුළත්ව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කරන ලද උපදෙස්, චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ;
5. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත.

මූල්‍ය ප්‍රකාශන සහ හෙළිදරව් කිරීම් ඉදිරිපත් කිරීමේදී භාවිතා කරන ආකෘති ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා නිකුත් කරන ලද නිශ්චිත ආකෘතිවලට අනුකූල වේ.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් කලින් කලට නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ. බැංකුව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරන්තරයෙන් අදාළ කර ගනු ලබයි. ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රකාශ කර ඇත. සියලුම වැදගත් අයිතම මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මගින් හෙළිදරව් කිරීම සහ පැහැදිලි කිරීම සිදු කර ඇත. අපගේ දැනුමේ හා විශ්වාසයට අනුව, මේ සමඟ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මඟින් වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය තත්ත්වය, ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන බව අපි තහවුරු කරමු. දැකිය හැකි අනාගතයේදී එහි මෙහෙයුම් කටයුතු අඛණ්ඩව කරගෙන යාමට බැංකුවට ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සඳහා අඛණ්ඩ පැවැත්ම පදනම අනුගමනය කරන බවත් අපි විශ්වාස කරමු.

මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව සහ වාස්තවිකත්වය සඳහා වගකීම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය පිළි ගනියි. ගනුදෙනුවල ස්වරූපය සහ තත්ත්වය සහ බැංකුවේ කටයුතු සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන මගින් සත්‍ය සහ සාධාරණ මතයක් පිළිබිඹු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ඇස්තමේන්තු සහ විනිශ්චයන් සාධාරණ සහ විචක්ෂණශීලී පදනමක් මත සිදු කරන ලදී. ගනුදෙනුවල ස්වරූපය සහ තත්ත්වය සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්ත්වය සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත.

මෙම තත්ත්වය සහතික කිරීම සඳහා, වත්කම් ආරක්ෂා කිරීම සහ වංචා මෙන්ම අනෙකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ අනාවරණය කිරීම සඳහා මූලික බැංකු පද්ධතියක් භාවිතා කරමින් අභ්‍යන්තර පාලන පද්ධති ක්‍රියාත්මක කිරීමේ දී බැංකුව ප්‍රමාණවත් සහ නිසි සැලකිල්ලක් දක්වා ඇති අතර, මෙම කටයුතු අඛණ්ඩව සමාලෝචනය කිරීම, ඇගයීම සහ යාවත්කාලීන කිරීම සිදු කරනු ලැබේ.

ස්ථාපනය කරන ලද බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අඛණ්ඩව අනුගමනය කරන බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ අභ්‍යන්තර විගණකවරයා කලින් කල විගණන පවත්වා ඇත. කෙසේ වුවද, ඕනෑම අභ්‍යන්තර පාලන සහ ගිණුම්කරණ පද්ධතියක් මගින් සපයනු ලබන සහතික කිරීම මැන බැලීමේ දී, පිළිගත යුතු ආවේනික සීමා පවතී

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරන ලදී. විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද වාර්තාව වාර්ෂික වාර්තාවේ 114 සිට 116 දක්වා පිටුවල සඳහන් කර ඇත.

සියලුම ගනුදෙනු ගිණුම් පොත්වල නිවැරදිව හා පූර්ණ වශයෙන් සටහන් කර ඇති බවට සහ SLFRS/LKAS ඇතුළු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමේ ක්‍රියාවලි සහ මූල්‍ය වාර්තාකරණය සහ හෙළිදරව් කිරීම්වලට අදාළ අනෙකුත් නියාමන විධිවිධාන සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනවල කාර්යක්ෂමතාව ඇතුළුව අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටු වාර්තාව වාර්ෂික වාර්තාවේ 102 පිටුවේ දක්වා ඇත. පූර්ණ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා ඕනෑම වැදගත් කරුණක් සාකච්ඡා කිරීම පිණිස බාහිර විගණකවරුන්ට සහ අභ්‍යන්තර විගණකවරුන්ට විගණන අනුකමිටු රැස්වීම සඳහා සහභාගී විය හැකි වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල විගණන අනුකමිටුවේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා පූර්ණ සහ නිදහස් ප්‍රවේශයක් ඇත.

අදාළ වන සියලුම නීති, රීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බවත්;සැලකිය යුතු අන්දමේ අනුකූල නොවූ කිසිදු අවස්ථාවක් නොමැති බවත්; වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන කොටසේ 41 වන සටහන මගින් හෙළිදරව් කර ඇති කාරණා හැරුණු විට බැංකුවට එරෙහිව කිසිදු සැලකිය යුතු අන්දමේ නෛතික ක්‍රියාමාර්ග කිසිවක් නොමැති බවත්;
බැංකුව විසින් සියලුම බදු, අයබදු සහ සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ බැංකුවේ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන්ට අදාළව ගෙවිය යුතු සියලුම දායක මුදල්, අයබදු සහ බදු වාර්තා කරන දිනට හෝ අදාළ දින වන විට ගෙවා ඇති බව අපගේ දැනුම අනුව, අපි තහවුරු කරමු

පී.එස්. එදිරිසූරිය
සාමාන්‍යාධිකාරී / ප්‍රධාන
විධායක නිලධාරී
(වැඩ ආවරණ)
2023 අගෝස්තු 29

පී.එස්. එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරී

# අභ්‍යන්තර පාලන ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. BAN/E/RDB/IC/2022 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 09 July 2024 |

සභාපති,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයට අදාළව විගණකාධිපති-වරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලබා දෙන සහතික කිරීමේ වාර්තාව.**

## හැඳින්වීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් සහතිකයක් ලබා දීම සඳහා මෙම වාර්තාව ඉදිරිපත් කෙරේ.

## කළමනාකාරීත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද (2007) අංක (12) දරන බැංකු පනත් විධානයේ අංක 3(8) (ii) (b) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනයට අදාළව බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා ලබා දෙන මාර්ගෝපදේශය" අනුව ප්‍රකාශනය පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමනාකාරීත්වය වගකිව යුතුය.

## මාගේ වගකීම සහ SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතියට අනුකූලවීම

අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙළ කරන ලද ලේඛන මෙම ප්‍රකාශනය සඳහා උපකාරී වී ඇති ද යන්න සහ මෙමඟින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ සැකැස්ම සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂවරුන් විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලිය නිසි ලෙස පිළිබිඹු කරන්නේද යන්න තක්සේරු කිරීම මාගේ වගකීම වන්නේය.

ශ්‍රී ලංකා ප්‍රමිති සහතික එකඟතා (SLSAE) 3050 (සංශෝධිත) අනුකූලව, මාගේ සහතික වාර්තාව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳව බැංකු සඳහා වන සහතික වාර්තාවට අනුකූලව ඉදිරිපත් කරමි. සැලකිය යුතු මට්ටමින් වැදගත් සෑම ක්ෂේත්‍රයක්ම සලකා බලමින් කළමනාකාරීත්වය විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය පිළියෙළ කර තිබේ ද යන්න පිළිබඳව සීමිත සහතිකයක් ලබා ගැනීම සඳහා මා විසින් ක්‍රමවේද සැලසුම් කොට විගණනය කිරීම එකී ප්‍රමිතීන්ට අනුව අවශ්‍ය වේ.

මෙම විගණන කාර්යයෙහි අරමුණ වෙනුවෙන් කවර හෝ වාර්තාවක් යාවත්කාලීන කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් මා වගකීම නොදරන අතර, විගණන කාර්යය අතරතුරදී මූල්‍ය තොරතුරු සම්බන්ධ විගණනයක් හෝ සමාලෝචනයක් මා විසින් සිදු කර නොමැත.

## ඉටු කරන ලද කාර්යය පිළිබඳ සාරාංශයක්

අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් වෙනුවෙන් පිළියෙළ කරන ලද ලේඛන මෙම ප්‍රකාශනය සඳහා උපකාරී වී ඇති ද යන්න සහ මෙමගින් බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය සමාලෝචනය කිරීමේ දී, අධ්‍යක්ෂවරුන් විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය ප්‍රමාණවත් ලෙස පිළිබිඹු වන්නේ ද යන්න තක්සේරු කරනු පිණිස මා විසින් මෙම කර්තව්‍යය ඉටු කර ඇත.

මෙහිදී යොදා ගන්නා ලද ක්‍රමවේද මූලික වශයෙන්ම බැංකු කාර්ය මණ්ඩලයෙහි විමසීම් සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදා ගන්නා ලද ක්‍රියාවලිය වෙත සහාය වූ සහ නියැදි පදනමක් මත සිදු කරන ලද ලේඛනගත කිරීම්වල පැවැත්මට සීමා විය

SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතියට අනුව එම ප්‍රකාශනය මගින් අවදානම් සහ පාලන විධිවිධාන සියල්ලම ආවරණය

වන්නේද යන්න සලකා බැලීමේ හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය පිළිබඳව මතයක් ගෙන හැර දැක්වීම මා විසින් ඉටු කළ යුතු අවශ්‍යතාවක් නොවේ SLSAE 3050 (සංශෝධිත) ප්‍රමිතියට අනුව, වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති, සැලකිය යුතු මට්ටමේ ගැටළු කිසිවකට අදාළ අභ්‍යන්තර පාලන විධිවිධානවල වැදගත් පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම උදෙසා විස්තර කර ඇති ක්‍රියාවලීන් මගින් සත්‍ය වශයෙන්ම එම ගැටළුවලට පිළියම් යොදන්නේ ද යන්න මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

ප්‍රකාශනය සකස් කිරීමට අදාළව බැංකුවේ ස්වභාවය, සිදුවීම් හෝ ගනුදෙනු පිළිබඳ මගේ අවබෝධය සැලකිල්ලට ගනිමින්, තෝරාගත් ක්‍රියා පටිපාටි මගේ විනිශ්චය මත රඳා පවතී.

මාගේ නිගමනය සඳහා පදනමක් සැපයීමට මා ලබාගෙන ඇති සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මම විශ්වාස කරමි.

## සාරාංශය

මෙම කාර්යයේ දී යොදා ගන්නා ලද ක්‍රමවේද මත ආවරණය පදනම්ව බැලූ කල, වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරන ලද ප්‍රකාශනය බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම සහ කාර්යක්ෂමතාව සමාලෝචනය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කර ඇති ක්‍රියාවලිය පිළිබඳ මගේ අවබෝධයට අනුකූල නොවන බව විශ්වාස කිරීමට හේතු වන කිසිවක් මගේ අවධානයට ලක්ව නොමැත.



ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

### අවශ්‍යතාවය

මෙම වාර්තාව 2007 අංක 12 දරන බැංකු පනත් විධානයන්හි 3 (8) (ii) (b) වගන්තියට අනුකූලව නිකුත් කර ඇති අතර ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ICASL) විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව පිළියෙළ කර ඇත.

### වගකීම

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අභ්‍යන්තර පාලනය සහ එහි කාර්යක්ෂමතාව සහ ප්‍රමාණවත් බව සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. කෙසේ වුවද, එවැනි පද්ධතියක් නිර්මාණය කර ඇත්තේ බැංකුවේ ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපොහොසත් වීමේ අවදානම ඉවත් කිරීමට වඩා පිළිගත හැකි අවදානම් පැතිකඩ තුළ බැංකුවේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර කළමනාකරණය කිරීම වෙනුවෙනි. ඒ අනුව, අභ්‍යන්තර පාලන පද්ධතියට කළමනාකරණයේ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ට එරෙහිව සහ මූල්‍ය අලාභ හෝ වංචාවන්ට එරෙහිව මූල්‍ය තොරතුරු සහ වාර්තා පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දිය හැකි නමුත් නිරපේක්ෂ සහතිකයක් ලබා දිය නොහැක.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචන ක්‍රියාවලිය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය වරින් වර සමාලෝචනය කරනු ලබන අතර එය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශයට අනුකූල වේ් එම මාර්ගෝපදේශයේ දක්වා ඇති පරිදි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා වන මූලධර්ම සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කර ඇත. මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමට බැංකුව පියවර ගෙන ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහසයි.

කළමනාකාරිත්වය මගින් බැංකුවට මුහුණ දීමට සිදු වන අවදානම් හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම මගින් අවදානම් සහ පාලනය පිළිබඳ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීමේදී ද, මෙම අවදානම් අවම කිරීම සහ පාලනය කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීමේ දී ද අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය ලබා දෙයි.

### ක්‍රියාවලියේ ප්‍රධාන ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්භාවය සහ අඛණ්ඩතාව සමාලෝචනය කිරීමේදී ස්ථාපනය කර ඇති ප්‍රධාන ක්‍රියාවලීන් අතරට පහත සඳහන් ක්‍රියාවලි ද ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම්වල කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම සඳහා ද, බැංකුවේ මෙහෙයුම් කටයුතු ආයතනික අරමුණු, උපාය මාර්ග සහ වාර්ෂික අයවැය මෙන්ම අනුමත කර ඇති ප්‍රතිපත්ති සහ ව්‍යාපාරික උපදෙස්වලට අනුකූල බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ උප කමිටු ස්ථාපනය කර ඇත.

- බැංකුවේ මූල්‍ය සහ අනෙකුත් පාලනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙහෙයුම් අත්පොත ක්‍රියාත්මකව පවතින අතර ඒ පිළිබඳව කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට දැනුම් දී ඇත. තවද, යාවත්කාලීන කරන ලද මෙහෙයුම් අත්පොතක් පිළියෙළ කර ඇති අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව, බැංකුවේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කිරීමට නියමිතය.

- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය සාම්පල සහ වටමාරු ක්‍රියා පටිපාටි භාවිතයෙන් අඛණ්ඩ පදනමක් මත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවල අනුකූලතාව සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල කාර්යක්ෂමතාව පරීක්ෂා කරන අතර කිසියම් අනුකූල නොවීමක් සම්බන්ධයෙන් වැදගත් සොයාගැනීම් ඉස්මතු කර දක්වයි. සියලුම ඒකක සහ ශාඛාවල විගණන සිදු කරනු ලබන අතර, ස්වාධීන සහ විෂය මූලික වාර්තාවක් ලබා දීම සඳහා විගණන සිදු කළ යුතු වාර ගණන තීරණය වන්නේ තක්සේරු කරන ලද අවදානම් මට්ටම අනුවය.

- වාර්ෂික විගණන සැලැස්ම විගණන කමිටුව විසින් සමාලෝචනය කර අනුමත කරනු ලැබේ. අභ්‍යන්තර විගණනයේ සොයාගැනීම් නියමිත අවස්ථාවන්හි පවත්වනු ලබන රැස්වීම්වලදී සමාලෝචනය කිරීම සඳහා විගණන කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

- බැංකුවේ විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන අංශය, නියාමන බලධාරීන් සහ කළමනාකාරීත්වය මගින් හඳුනාගත් අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කරන අතර අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය ඇගයීමට ලක් කරයි. එම කමිටුව මගින් අභ්‍යන්තර විගණනවල විෂය පථය සහ ගුණාත්මකභාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, අභ්‍යන්තර විගණන කාර්යයන් ද සමාලෝචනය කරයි, විගණන කමිටු රැස්වීම්වල වාර්තා වරින් වර බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

# මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය

■ බැංකුව 2018 වර්ෂයේ දී, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වන SLFRS – 09 මූල්‍ය උපකරණ සහ 2019 වර්ෂයේ දී SLFRS – 16 කල්බදු සම්මත කර ගන්නා ලදී. බාහිර විගණකවරුන්ගේ, නියාමකයින්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ ප්‍රතිපෝෂණ මත පදනම්ව ඉහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම සඳහා මුලින්ම අදාළ කර ගන්නා ලද ක්‍රියාවලිය සහ ක්‍රියා පටිපාටි තවදුරටත් ශක්තිමත් කළ යුතු වේ. ණය සහ අත්තිකාරම් හානිකරණය, මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සහ අවදානම් කළමනාකරණය පිළිබඳ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට බැංකුව මගින් පියවර ගනු ඇත.

## තහවුරු කිරීම

ඉහත ක්‍රියාවලීන් මත පදනම්ව, මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය පිළිබඳව සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා බැංකුවේ මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බවත්, බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූලව සිදු කර ඇති බවත් මණ්ඩලය තහවුරු කරයි.

### බාහිර විගණකවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩයේ ප්‍රකාශනය සමාලෝචනය කිරීම

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අභ්‍යන්තර පාලනය පිළිබඳව ඉහත දක්වා ඇති අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය බාහිර විගණකවරුන් විසින් සමාලෝචනය කර ඇති අතර, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැලසුම සහ කාර්යක්ෂමතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය මගින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය පිළිබඳ ඔවුන්ගේ අවබෝධයට එම ප්‍රකාශනය පටහැනි වන බව විශ්වාස කිරීමට හේතු වන යමක් ඔවුන්ගේ අවධානයට ලක්ව තිබේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.



සභාපති
විගණන කමිටුව



අධ්‍යක්ෂ



සාමාන්‍යාධිකාරී/ ප්‍ර.වි.නි.
(වැඩ ආවරණ)
(2023.09.08)

# මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙම ප්‍රකාශනයෙහි බැංකුවේ මූල්‍ය වාර්තාකරණ රාමුවට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් දක්වා ඇත. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකවරුන්ගේ වගකීම් වාර්ෂික වාර්තාවේ 114 පිටුවේ විගණකවරුන්ගේ වාර්තාවේ දක්වා ඇත.

## මූල්‍ය ප්‍රකාශන

බැංකුව සියලුම ගනුදෙනු සඳහා නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන බවත්, අදාළ ව්‍යවස්ථාපිත/නියාමන අවශ්‍යතාවලට අනුකූල වන පරිදි, සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේම බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් ලබා දෙන පරිදි, මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFR/LKAS) අනුකූලව පිළියෙළ කිරීම සහතික කිරීම බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඒ සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති, වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරන ලද බවත්□ නිත්‍ය වශයෙන් එම ප්‍රතිපත්ති අදාළ කර ගන්නා ලද බවත, ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කර ඇති බවත් අධ්‍යක්ෂවරු පිළිගනිතී මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුවේ ස්වරූපය සහ හරය නිසි ලෙස පිළිබිඹු කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී සාධාරණ සහ විචක්ෂණශීලී විනිශ්චයන් ලබා දී ඇත

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ එහි සංශෝධනවල දැක්වෙන අවශ්‍යතාවලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් ව්‍යවස්ථාපිත / නියාමන අවශ්‍යතාවලට අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කටයුතු පිළිබඳව සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරයි

## අඛණ්ඩ පැවැත්ම

පුරෝකථනය කළ හැකි අනාගතය තුළ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව සිදු කිරීමට බැංකුවට ප්‍රමාණවත් සම්පත් පවතින බව අධ්‍යක්ෂවරු විශ්වාස කරන අතර ඒ අනුව□ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම අනුගමනය කළහ

## අභ්‍යන්තර පාලනය□ අවදානම, කළමනාකරණය සහ අනුකූලතාව

අභ්‍යන්තර මූල්‍ය පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් ද අධ්‍යක්ෂවරුන් වගකිව යුතු අතර බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීමට සහ සුරක්ෂිත කිරීමට සහ වංචා සහ අවපාලනය වැළැක්වීමට ශක්තිමත් පාලන පරිසරයක් පවත්වා ගැනීම කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කළ යුතුය

සම්පූර්ණයෙන්ම ඉවත් කළ නොහැකි ආවේනික අවදානම් අවධාරණය කරන අතරම, විවිධ පද්ධති සහ වෙනත් පාලනයන් තහවුරු කිරීම මගින් බැංකුව එවැනි අවදානම් අවම කිරීමට ගත හැකි පියවර ද ගෙන ඇතී මූල්‍ය වාර්තාකරණයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇති බව තහවුරු කරමින් බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂවරුන් විසින් ලබා දෙන ලද වාර්තාවක් වාර්ෂික වාර්තාවේ 109 සහ 110 පිටුවල දක්වා ඇත.

අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරිත්වය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කර ඇතී ප්‍රමාණාත්මක අවදානම් අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු ස්ථාපනය ඇති අතර ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කිරීම සඳහා වරින් වර අවදානම් පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

අදාළ නීති, රෙගුලාසි, රීති, නියෝග සහ මාර්ගෝපදේශවලට අනුකූල වීම අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වරින් වර වාර්තා කරනු ලැබේ.

අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩ පදනමක් මත සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. විගණන අනුකමිටුවේ සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා වාර්ෂික වාර්තාවේ 102 සහ 103 පිටුවල අනුපිළිවෙලින් ඇතුළත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන ඇතුළුව බැංකුවේ සියලුම වාර්තා විගණකාධිපතිවරයාට ලබා දී ඇති අතර ඔවුන් සුදුසු යැයි සලකන ලද පරීක්ෂණ සිදු කිරීමට සෑම අවස්ථාවක්ම ලබා දී ඇත.

## අනුකූලතාව

මූල්‍ය වර්ෂය අවසානය වන විට බැංකුව විසින් බදු මුදල් හා රජය වෙත සහ වෙනත් අදාළ නියාමන සහ ව්‍යවස්ථාපිත ආයතන වෙත ගෙවීමට නියමිත අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් සියල්ලම ගෙවා ඇති බවට හෝ අදාළ අවස්ථාවල ඒ සඳහා විධිවිධාන සලසා ඇති බවට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුම සහ විශ්වාසය අනුව උපරිමයෙන් සෑහීමකට පත්වේ.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි ඔවුන් තම වගකීම් ඉටු කර ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය අනුව'



තිලානි රාජපක්ෂ
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්



# මූල්‍යමය වාර්තා

විගණකාධිපති වාර්තාව ........................................ 114
ලාභ හෝ අලාභ පිළිබඳ ප්‍රකාශනය........................... 117
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය.................................. 118
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය........................................ 119
හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය....................... 120
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය.......................................... 121
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්................................ 123

# විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. BAN/E/RDB/1/2022/41 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 22 June 2023

සභාපති
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ("බැංකුව") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා ලාභ හෝ අලාභ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී, මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වා ගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 2022 වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙකුත් තොරතුරුවලට 2022 වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති තොරතුරු ඇතුළත් වන නමුදු එම තොරතුරු බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වන මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවේ. මෙම විගණන වාර්තාවේ දිනයෙන් පසුව අනෙකුත් තොරතුරු මට ලබා ගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කළමනාකාරීත්වය අනෙකුත් තොරතුරු සම්බන්ධයෙන් වගකීම දරයි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ මතය මගින් එකී අනෙකුත් තොරතුරු ආවරණය නොකෙරෙන අතර ඒ පිළිබඳව කිසිදු සහතික කිරීමේ නිගමනයක් මා විසින් ඉදිරිපත් නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළව මා වෙත පැවරෙන වගකීම වන්නේ ඉහත හඳුනා ගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි විට ඒවා කියවා විමසා බැලීම සහ එසේ කරන අතරතුර දී එකී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලට හෝ විගණනයේ දී මා විසින් ලබා ගන්නා දැනුමට අනුව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් වී ඇති ද යන්න සලකා බැලීමයි.

2022 වර්ෂය සඳහා බැංකුවේ වාර්ෂික වාර්තාව විමසා බැලීමේ දී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ එහි පවතින බව මාගේ නිගමනය වේ නම්, එකී කරුණු අදාළ නිරවද්‍යකරණ පියවර ගැනීම උදෙසා නියාමන බලතල පැවරී ඇති පාර්ශව වෙත මා විසින් සන්නිවේදනය කරනු ලැබීම අවශ්‍ය වේ. නිවැරදි නොකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ වැඩිදුරටත් පවතී නම්, එකී කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියේ විධිවිධානවලට අනුකූලව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙන මාගේ වාර්තාවෙහි ඇතුළත් කරනු ඇත.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව කළමනාකාරීත්වයේ සහ නියාමනය සම්බන්ධයෙන් බලතල පැවරී ඇති පාර්ශවයන්හි වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකාරීත්වයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී, මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා බැංකුවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකාරීත්වයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම නියාමන බලතල පැවරී ඇති පාර්ශව වෙත පැවරේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයක් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැක බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

■ වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

■ අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

■ භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

■ සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුයි කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

■ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව අදාළ නියාමන අධිකාරීන් දැනුවත් කරන ලදී.

### 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව මගින් පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුව විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, බැංකුවේ පාලක මණ්-ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.



ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති.

# ලාභ හෝ අලාභ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|---|
| දළ ආදායම | 7 | 36,202,749,629 | 24,492,768,957 |
| පොලී ආදායම | | 35,273,433,857 | 23,545,299,165 |
| පොලී වියදම් | | (19,639,529,550) | (9,893,373,234) |
| **ශුද්ධ පොලී ආදායම** | 8 | 15,633,904,307 | 13,651,925,931 |
| ගාස්තු හා පොලී ආදායම | | 806,547,782 | 935,136,855 |
| ගාස්තු හා කොමිස් වියදම් | | (355,184,923) | (312,112,052) |
| **ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම** | 9 | 451,362,859 | 623,024,803 |
| ශුද්ධ වෙළඳ ලාභ / (අලාභ) | 10 | 102,296,546 | (24,214,945) |
| වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ) | 11 | 20,471,444 | 36,547,883 |
| **මුළු මෙහෙයුම් ආදායම** | | 16,208,035,156 | 14,287,283,672 |
| හානිකරණ ගාස්තු | 12 | (2,852,677,176) | (3,256,775,862) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | | 13,355,357,980 | 11,030,507,810 |
| **අඩු කළා - මෙහෙයුම් වියදම්** | | | |
| පුද්ගල වියදම් | 13 | (8,739,537,602) | (7,292,269,883) |
| ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය වියදම් | | (532,733,987) | (520,988,009) |
| වෙනත් වියදම් | 14 | (2,084,970,281) | (1,290,468,186) |
| **බද්දට පෙර මෙහෙයුම් ලාභය** | | 1,998,116,109 | 1,926,781,733 |
| අඩු කළාඃ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | | (1,561,474,848) | (1,151,277,133) |
| සමාජ ආරක්ෂක දායක බද්ද | | (77,525,933) | - |
| **ආදායම් බදු වියදමට පෙර ලාභය** | | 359,115,328 | 775,504,600 |
| ආදායම් බදු (වියදම්) / ආපසු හැරවීම් | 15 | 990,279,323 | (469,201,889) |
| වසර සඳහා ලාභය | | 1,349,394,652 | 306,302,711 |
| **කොටසකට ඉපැයීම්** | | | |
| කොටසකට ඉපයීම් මූලික | 16.1 | 2.45 | 0.56 |
| කොටසකට තනුක ඉපැයීම් | 16.2 | 2.45 | 0.56 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 123 සිට 199 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමඟ කියවිය යුතු වේ.

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|---|
| **වසර සඳහා ලාභය** | | **1,349,394,652** | 306,302,711 |
| | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්)** | | | |
| **වෙනත් විස්තීර්ණ ආදායම් ලාභ හෝ අලාභ තුළට නැවත වර්ගීකරණය නොකළ යුතුය** | | | |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් මත ආයුගණන අලාභ | 34.3 | **156,249,438** | (35,917,534) |
| විලම්භිත බදු බලපෑම | | **(46,874,831)** | 8,620,208 |
| **වසර සඳහා මුළු වෙනත් විස්තීර්ණ ආදායම, බදු අඩු කළ පසු** | | **109,374,607** | (27,297,325) |
| **වර්ෂය සඳහා මුළු ආදායම** | | **1,458,769,259** | 279,005,386 |

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් දැක්වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 123 සිට 199 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමඟ කියවිය යුතු වේ.

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමානයන් | 18 | 2,889,883,677 | 1,486,878,989 |
| බැංකුවල රඳවා තැබීම් | 19 | 6,133,705,351 | 6,596,072,932 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලබන ස්කන්ධ උපකරණ | 20 | 120,280 | 188,140 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ | 21 | 198,008,145,155 | 175,229,666,656 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් - ණය හා අනෙකුත් උපකරණ | 22 | 65,079,635,908 | 54,856,210,318 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගැනෙන ස්කන්ධ උපකරණ | 23 | 2,289,919 | 2,289,919 |
| දේපළ, පිරියත හා උපකරණ | 24 | 926,615,241 | 928,568,438 |
| අස්පෘශ්‍ය වත්කම් | 25 | 68,867,744 | 113,688,780 |
| භාවිත හිමිකම් වත්කම් | 26.1 | 718,096,698 | 505,092,023 |
| විලම්භිත බදු වත්කම් | 27 | 3,525,174,919 | 1,263,795,071 |
| වෙනත් වත්කම් | 28 | 8,042,615,550 | 4,907,060,297 |
| **මුළු වත්කම්** | | 285,395,150,443 | 245,889,511,563 |
| **වගකීම්** | | | |
| බැංකුවලට ගෙවිය යුතු මුදල් | 29 | 47,470,707,056 | 29,500,936,543 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදල් | 30 | 210,301,323,468 | 187,752,465,256 |
| ලබා දුන් ණය හා වෙනත් ණයට ගත් අරමුදල් | 31 | – | 2,000,000,000 |
| වත්මන් බදු වගකීම් | 32 | 1,011,924,146 | 503,021,886 |
| වෙනත් වගකීම් | 33 | 7,293,487,262 | 7,693,300,812 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් | 34 | 3,091,581,136 | 3,046,464,739 |
| **මුළු වගකීම්** | | 269,169,023,068 | 230,496,189,235 |
| **ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 35 | 8,221,864,565 | 8,047,229,930 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | 36 | 845,247,866 | 777,778,133 |
| රඳවාගත් ඉපැයීම් | | 2,889,785,536 | 2,636,433,521 |
| වෙනත් සංචිත | 37 | 4,269,229,407 | 3,931,880,744 |
| **මුළු කොටස් හිමි ස්කන්ධය** | | 16,226,127,375 | 15,393,322,328 |
| **මුළු ස්කන්ධය හා වගකීම්** | | 285,395,150,443 | 245,889,511,563 |
| **අසම්භාව්‍ය වගකීම් හා බැඳීම්** | 40 | 380,380,046 | 225,888,152 |

මෙම මූල්‍ය ප්‍රකාශන, අදාළ සටහන් සමඟ සංයෝජිතව කියවිය යුතු අතර, එම මූල්‍ය ප්‍රකාශන පිටු අංක 123 සිට 199 දක්වා සඳහන් කර ඇති බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 1988 අංක 30 දරන බැංකු පනතේ සහ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙළ කර ඇති බව මම සහතික කරමි.

පී.එස්.එදිරිසූරිය
ප්‍රධාන මූල්‍ය නිලධාරි

පී.එස්.එදිරිසූරිය
සාමාන්‍යාධිකාරි / ප්‍රධාන විධායක නිලධාරී(වැඩ ආවරණ)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් තබන ලද මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

සභාපති / අධ්‍යක්ෂ
2023 ජූනි 16
කොළඹ

අධ්‍යක්ෂ

# හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | විශේෂ සංචිත අරමුදල | සාමාන්‍ය සංචිත අරමුදල | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|---|
| | සටහන 35 | සටහන 36 | සටහන 37 | සටහන 37 | | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **2021 ජනවාරි 01 දිනට ශේෂය** | 8,047,229,930 | 762,462,998 | 616,853,326 | 3,238,451,740 | 2,449,318,948 | 15,114,316,941 |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | | | | | | |
| වසර සඳහා ලාභය | – | – | – | – | 306,302,711 | 306,302,711 |
| වෙනත් විස්තීර්ණ ආදායම්, බදු පසු ශුද්ධ | – | – | – | – | (27,297,325) | (27,297,325) |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම** | – | – | – | – | 279,005,386 | 279,005,386 |
| **ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්** | | | | | | |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කිරීම් | – | 15,315,136 | – | – | (15,315,136) | – |
| විශේෂ සංචිත අරමුදල වෙත මාරු කිරීම් | – | – | 15,315,136 | – | (15,315,136) | – |
| සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරු කිරීම් | – | – | – | 61,260,542 | (61,260,542) | – |
| ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත් | – | 15,315,136 | 15,315,136 | 61,260,542 | (91,890,813) | – |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 8,047,229,930 | 777,778,134 | 632,168,492 | 3,299,712,282 | 2,636,433,521 | 15,393,322,327 |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | **8,047,229,930** | **777,778,134** | **632,168,462** | **3,299,712,282** | **2,636,433,521** | **15,393,322,328** |
| 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අය කරනු ලබන අධිභාර බද්ද සඳහා ගැළපීම (සටහන 15.5) | – | | – | – | **(800,598,848)** | **(800,598,848)** |
| **2022 ජනවාරි 01 දිනට ගළපන ලද ශේෂය** | **8,047,229,930** | **777,778,134** | **632,168,462** | **3,299,712,282** | **1,835,834,673** | **14,592,723,480** |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | | | | | | |
| වසර සඳහා ලාභය | – | – | – | – | **1,349,394,652** | **1,349,394,652** |
| වෙනත් විස්තීර්ණ ආදායම, බදු පසු ශුද්ධ | – | – | – | – | **109,374,607** | **109,374,607** |
| **වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | – | – | – | – | **1,458,769,259** | **1,458,769,259** |
| **ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්** | | | | | | |
| නිකුත් කළ ප්‍රකාශිත ප්‍රාග්ධනය | **174,634,635** | – | – | – | | **174,634,635** |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල වෙත මාරු කිරීම් | – | **67,469,733** | – | – | **(67,469,733)** | – |
| විශේෂ සංචිත අරමුදල වෙත මාරු කිරීම් | – | – | **67,469,733** | – | **(67,469,733)** | – |
| සාමාන්‍ය සංචිත අරමුදල වෙත මාරු කිරීම | – | – | – | **269,878,930** | **(269,878,930)** | – |
| **ස්කන්ධ හිමියන් සමග ගනුදෙනු, ස්කන්ධය තුළ සෘජුව හඳුනාගත්** | **174,634,635** | **67,469,733** | **67,469,733** | **269,878,930** | **(404,818,396)** | **174,634,635** |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **8,221,864,565** | **845,247,866** | **699,638,194** | **3,569,591,213** | **2,889,785,536** | **16,226,127,375** |

**මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 123 සිට 199 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමග කියවිය යුතු වේ.**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| බදු වලට පෙර ලාභය | | **359,115,328** | 775,504,601 |
| ගැළපුම්: | | | |
| **බදු වලට පෙර ලාභයට ඇතුළත් මුදල් නොවන අයිතම** | | | |
| දේපල, පිරියත හා උපකරණ ක්ෂය කිරීම / භාවිත හිමිකම් ඇති වත්කම් ක්‍රමක්ෂය කිරීම | 24 | **487,812,469** | 490,215,777 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 25 | **46,808,061** | 30,772,231 |
| කල්බදු මත පොළී වියදම් | 26.2 | **49,991,183** | 229,798,098 |
| ණයකර මත පොළී වියදම් | | **76,176,663** | 311,500,000 |
| ලාභාංශ ආදායම් | 10 | **(4,384,680)** | (10,209,840) |
| කාර්ය මණ්ඩල ණය ගැළපීම | | **–** | – |
| හානිකරණ ගාස්තු | 12 | **2,852,677,176** | 3,256,775,862 |
| ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් යුත් කොටස් උපකරණවල වෙනස්වීම | 10 | **67,860** | (42,980) |
| විනිමය ලාභය / අලාභය | 10 | **(97,979,726)** | 34,467,765 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත අය කිරීම | 34í | **567,113,577** | 379,779,626 |
| වෙනත් අරමුදල් සංචලනය | | **–** | – |
| දේපල, පිරියත හා උපකරණ විකුණුම් මත (ලාභය)/ අලාභය | 11 | **93,147** | (18,134,116) |
| අස්පෘශ්‍ය වත්කම් විකිණීම මත (ලාභය)/අලාභය | 11 | **–** | – |
| අක්‍රීය ණය අයකර ගැනීම් (ලියා හැර ඇත) | 11 | **(411,274)** | (441,823) |
| **මෙහෙයුම වත්කම් මත වෙනස** | | | |
| වෙනත් ගනුදෙනුකරුගෙන් ලැබිය යුතු දේ සහ ණය මත ශුද්ධ වෙනස | | **(25,603,792,299)** | (21,794,891,917) |
| වෙනත් වත්කම්වල ශුද්ධ වෙනස | | **(3,150,740,674)** | (2,167,393,709) |
| ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත මනිනු ලබන මූල්‍ය ආයෝජනවල ශුද්ධ වෙනස - ණය සහ අනිකුත් මූල්‍ය උපකරණ | | **(6,566,581,516)** | (1,033,112,853) |
| **මෙහෙයුම වගකීමවල වෙනස** | | | |
| බැංකුවලට ගෙවිය යුතු ශුද්ධ වෙනස | | **1,875,544,521** | 3,081,261,163 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශුද්ධ වෙනස | | **22,548,858,212** | 14,869,832,978 |
| වෙනත් වගකීම්වල ශුද්ධ වෙනස | | **(651,469,639)** | 1,456,574,150 |
| පාරිතෝෂිත ගෙවීම් | 34.1 | **(66,254,402)** | (134,929,431) |
| මූල්‍ය සේවා මත බදු | | | |
| ගෙවන ලද බදු | 32 | **(1,609,671,944)** | (695,837,450) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් උත්පාදිත / (තුළ භාවිතා වූ) ශුද්ධ මුදල** | | **(8,887,027,959)** | (938,511,867) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ** | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම | 24 | **(207,875,911)** | (202,693,190) |
| අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම | 25 | **(1,987,025)** | (123,380,926) |
| ණයකරවලින් මුදල් ආපසු ගැනීම් / (ආයෝජන) | 22.1 | **–** | 392,280,000 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන (මාස 3 ට වැඩි) | 22.2 | **(17,403,319,430)** | (3,220,344,943) |
| දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලත් මුදල් | | **(779,590)** | 17,453,993 |
| ලැබුණු ලාභාංශ ආදායම | 10 | **4,384,680** | 10,209,840 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලදී (භාවිතා කරන ලද) / වෙතින් ලද ශුද්ධ මුදල්** | | **(17,609,577,277)** | (3,126,475,226) |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා | සටහන | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ** | | | |
| මෙහෙයුම් කල්බදු මුල් මුදල ගෙවීම | 26.2 | **(327,195,209)** | (326,522,434) |
| කාලීන ණයවලින් ඉදිරියට ගෙන ආ ශුද්ධ මුදල | 29 | **15,494,249,151** | 4,807,413,840 |
| ණයකර නිදහස් කිරීම් | 31.1 | **(2,000,000,000)** | |
| ණයකර මත ගෙවූ පොලී | 31.1 | **(76,176,663)** | (311,500,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල්** | | **13,090,877,279** | 4,169,391,406 |
| **මුදල් හා මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / (අඩු වීම)** | | **(13,405,727,957)** | 104,404,312 |
| වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමානයන් | | **43,570,748,513** | 43,466,344,201 |
| **වසර අවසානයේදී මුදල් හා මුදල් සමානයන්** | | **30,165,020,556** | 43,570,748,513 |
| **මුදල් හා මුදල් සමානයන් සැසඳීම** | | | |
| මුදල් හා මුදල් සමානයන් | 18 | **2,889,883,677** | 1,486,878,989 |
| බැංකුවල ඇති වාසිදායක ශේෂයන් | | | |
| බැංකුවල රඳවා තැබීම් | 19 | **6,133,705,351** | 6,596,072,932 |
| මාස 3 ට අඩු ස්ථාවර තැන්පතු | 22.2 | **21,726,025,221** | 35,579,154,747 |
| බැංකුවල ඇති අවාසිදායක ශේෂයන් | | **(584,593,693)** | (91,358,155) |
| | | **30,165,020,556** | 43,570,748,513 |

මෙම මූල්‍ය ප්‍රකාශන, මෙහි 123 සිට 199 පිටුවල දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වන ඊට අදාළ සටහන් සමඟ කියවිය යුතු වේ.

# මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

## 1 පොදු කරුණු

### 1.1 ආයතනික තොරතුරු

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ආරම්භය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු කාණ්ඩය යටතේ දිස්ත්‍රික් මට්ටමේ බැංකු ස්ථාපිත කරන ලද 1985 වසර දක්වා අතීතයකට දිව යයි අනතුරුව, 1997 වර්ෂයේදී එවැනි ප්‍රාදේශීය සංවර්ධන බැංකු දාහතක් රජරට, රුහුණ, වයඹ, ඌව, කඳුරට සහ සබරගමුව සංවර්ධන බැංකු ලෙස පළාත් මට්ටමේ බැංකු හයකට ඒකාබද්ධ කර ක්‍රියාත්මක විය. 2010 මැයි මාසයේදී මෙම බැංකු හය එක් ජාතික මට්ටමේ බැංකුවක් වශයෙන් ඒකාබද්ධ කර ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ලෙස නම් කරන ලදී. 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ මෙම බැංකුව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. බැංකුවේ ලියාපදිංචි කාර්යාලය අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය යන ස්ථානයේ පිහිටා ඇත,

2022 දෙසැම්බර් 31 දින වන විට බැංකුවේ ස්ථිර, පුහුණු සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය 3,980 ක් විය 2021 දෙසැම්බර් 31 වන විට 3,226 විය

**1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය** බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා මූල්‍ය ආධාර ලබාදීම මගින් කෘෂිකර්මාන්තය, කර්මාන්ත, වෙළඳ, වාණිජ, පශු සම්පත්, ධීවර කටයුතු සංවර්ධනය කිරීම සහ කාන්තාවන් සවිබල ගැන්වීම ප්‍රවර්ධනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික සංවර්ධනය ක්‍රියාවලියට පහසුකම් සැලසීමයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත සහ ඊට පසුව සිදුකරන ලද සංශෝධන, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ අනතුරුව ඊට සිදුකරන ලද සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල ඇතුළත් විධිවිධාන ප්‍රකාරව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම පිණිස 2023 ජුනි 16 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර ලබා දෙන ලදී.

## 2. පිළියෙළ කිරීමේ පදනම

### 2.1 මිනුම් කිරීමේ පදනම

පහත සඳහන් සැලකිය යුතු මට්ටමේ අයිතමයන් හැර මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත:

- නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් සම්බන්ධයෙන් වන වගකීම ආයුගණන පදනම මත තක්සේරු කරනු ලබන අතර එය නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන වටිනාකම ලෙස හඳුනාගනු ලැබේ.
- සාධාරණ වටිනාකමින් මනිනු ලැබූ ලාභ හෝ අලාභ (FVTPL) වෙනත් විස්තීර්ණ ආදායම් (FVOCI) යටතේ පවතින ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සහ ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ

### 2.2 අනුකූලතා ප්‍රකාශනය

2022 දෙසැම්බර් (31) දිනට සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නියම කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර./ ශ්‍රී.ලං.ගි.ප්‍ර.), 1988 අංක 30 දරන බැංකු පනතේ සහ එහි සංශෝධනවල නියමයන් සහ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සහ එහි සංශෝධනවල නියමයන් ප්‍රකාරව පිළියෙළ කර ඇති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ද 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ සහ එහි සංශෝධනවලට නියමයන්ට අනුකූල වේ.

### 2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එම බැංකුව ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ භාවිත මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අන්‍යාකාරයක්න් දක්වා ඇත්තේනම් මිස, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත,

### 2.4 ප්‍රමාණාත්මක භාවය සහ සාමූහනය

ශ්‍රී ලංකා ගිණ්මකරණ ප්‍රමිත 01 - "මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම" යන ප්‍රමිතියට අනුකූලව, මූල්‍ය ප්‍රකාශනවල සමාන අයිතමවල සැලකිය යුතු එක් එක් කාණ්ඩ වෙන වෙනම ඉදිරිපත් කර තිබේ. අසමාන ස්වභාවයක් හෝ ක්‍රියාකාරීත්වයක් සහිත අයිතම ද සැලකිය යුතු භාවයකින් යුක්ත නම් වෙන වෙනම ඉදිරිපත් කෙරේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 2.5 හිලව් කිරීම

මූල්‍ය වත්කම් සහ වගකීම්, පිළිගත් මුදල් හිලව් කිරීමක් සිදුකිරීමට නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ ඒවා ශුද්ධ පදනමක් මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කර ගැනීමට සහ ඒ සමගම වගකීම් පියවීමට අදහස් කරන විට පමණක් එකිනෙකට හිලව් කර ශුද්ධ මුදලක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ නිරූපණයකින් නියම කර හෝ අවසර දී නොමැති නම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂයෙන් හෙළි කර ඇති පරිදි ආදායම් ප්‍රකාශයේ ආදායම සහ වියදම් පියවනු නොලැබේ.

## 2.6 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම සමග අනුකූල වීම සඳහා සහ වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සිදුකිරීම පිණිස බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් හෙළිදරව් කිරීම් ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන ලද 2019 චක්‍රලේඛ අංක 2 ට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය සෑම අවස්ථා-වකදීම යළි වර්ගීකරණය කරනු ලැබේ.

## 2.7 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඉදිරිපත් කර ඇති බැංකුවේ මූල්‍ය අයිතම ඒවායේ ස්වභාව අනුව සමූහගත කර ඇති අතර ඒවායෙහි සාපේක්ෂ ද්‍රවශීලතාව හා කල් පිරීමේ රටාව පිළිබිඹු වන පරිදි දක්වා තිබේ. මූල්‍ය ප්‍රකාශන වෙත බලපෑම් ඇති කරන උද්ධමනීය සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. වාර්තාකරණ දිනයට පසු මාස 12 ක කාලසීමාව තුළ (ජංගම) සහ වාර්තාකරණ දිනයට පසු මාස 12 කට වඩා වැඩි කාල සීමාවකදී (ජංගම නොවන) සිදුවූ අයකර ගැනීම හෝ පියවීම පිළිබඳ විශ්ලේෂණයක් 43 සටහනෙහි දක්වා තිබේ.

## 2.8 විකල්ප පිළියම් ප්‍රකාශය (SoAT)

එමෙන්ම, 2022 අංක 14 දරන අධිභාර බදු පනතින් පැන නගින බදු වගකීම, ආදායම් බදු පිළිබඳ සටහන 15 යටතේ හෙළිදරව් කර ඇති පරිදි, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී-වරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද විකල්ප පිළියම් ප්‍රකාශය මගින් නිර්දේශ කර ඇති පරිදි ගිණුම්ගත කර ඇත.

## 3 තක්සේරු සහ තීන්දු උපයෝජනය

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී කළමනාකාරීත්වය විසින් වාර්තා කර ඇති ආදායම් වටිනාකම්. වියදම්. වත්කම් හා වගකීම් හා ඊට අදාළ හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට බලපාන තීන්දු. තක්සේරු කිරීම් හා උප-කල්පන සිදු කිරීම අවශ්‍ය වේ. එකී උපකල්පන හා තක්සේරු කිරීම් සම්බන්ධ අවිනිශ්චිතතාවල ප්‍රතිඵලයක් ලෙස අනාගත කාල සීමාවලදී බලපෑමට ඉඩ ඇති වත්කම් හෝ වගකීම්වල ධාරණ අගය සම්බන්ධ සැලකිය යුතු ගැලපුම් සිදු කිරීමට අවශ්‍යවන තත්ත්වයක් ඇතිවිය හැකිය.

බැංකුවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියාවලියේදී ඉදිරි මූල්‍ය වර්ෂය තුළදී වත්කම් හා වගකීම්වල ධාරණ අගයෙහි සැලකිය යුතු වෙනස්වීම් සිදු වීමේ සැලකිය යුතු මට්ටමේ අවදානමක් සහිත, අනාගතය සලකා බලමින් සහ වාර්තාකරණ දිනය වන විට අවිනිශ්චිතතා මතු කෙරෙන අනෙකුත් මූලාශ්‍ර සම්බන්ධයෙන් පහත දැක්වෙන තීන්දු හා උපකල්පන වෙත කළමනාකාරීත්වය එළැඹ තිබේ. අනාගත සංවර්ධනයන් සම්බන්ධයෙන් දැනටමත් පවතින තත්ත්ව හා උපකල්පන බැංකුවේ පාලනයෙන් බැහැර සාධක හේතුවෙන් වෙනස් වීමට ඉඩ ඇති අතර ඒවා සිදුවන වන අවස්ථාවල උපකල්පන තුළ පිළිබිඹු කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට වඩාත්ම බලපෑම් ඇති කරන අයිතම ලැයිස්තුවක් සහ අදාළ කළමනාකරණ විනිශ්චයන් සහ/හෝ ඇස්තමේන්තු පහත දැක්වේ

(i) විනිශ්චයන්

(අ) මූල්‍ය වත්කම් වර්ගීකරණය

වත්කම් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීමේදී සහ මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත නියමයන්ට ඇතුළත් වන්නේ හිඟ ප්‍රාග්ධන මුදල සඳහා මූලික ගෙවීම් සහ පොලී ගෙවීම් (SPPI) පමණක්ද යන්න තීරණය කිරීමේදී බැංකුව විනිශ්චයන් භාවිතා කළේය.

(ආ) ණය අවදානම් තක්සේරුව

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 යටතේ සියලුම මූල්‍ය වත්කම් සඳහා හානිකරණ පාඩුව මිනුම් කිරීම සඳහා විනිශ්චය-න් අවශ්‍ය වන අතර විශේෂයෙන්, හානිකරණ පාඩු තීරණය කිරීමේදී සහ ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් තක්-සේරු කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය සහ කාල නිර්ණය සහ ඇපකර අගයන් තීරණය කිරීම සඳහා එවැනි විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම ඇස්තමේන්තු සාධක කිහිපයක් මත රඳා පවතින අතර, මෙම සාධකවල ඇතිවන වෙනස්කම් විවිධ දීමනා මට්ටම් ඇතිවීම සඳහා හේතු විය හැක.

බැංකුවේ අපේක්ෂිත ණය පාඩු ගණනය කිරීම් යනු, විචල්‍ය යෙදවුම් තෝරා ගැනීම සහ ඒවායේ අන්තර් සම්බන්ධතා පිළිබඳ උපකල්පන කිහිපයක් මත රඳා පවතින සංකීර්ණ ආකෘති වල ප්‍රතිඵල වේ. ගිණුම්කරණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු ලෙස සලකනු ලබන අපේක්ෂිත ණය පාඩු ආකෘතිවල ප්‍රධාන අංග අතරට පහත දෑ ඇතුළත් වේ:

- ණය අවදානමේ සැලකිය යුතු වැඩි වීමක් සිදුවී ඇත්දැයි තීරණය කිරීම සඳහා බැංකුවේ නිර්ණායක අනුව එමගි-න් මූල්‍ය වත්කම් සඳහා වන දීමනා ආයුකාලය පුරා අපේක්ෂිත ණය අලාභ පදනමක් මත සහ ගුණාත්මක තක්සේරුව මත මැනීම.
- සාමූහික පදනමක් මත ඔවුන්ගේ අපේක්ෂිත ණය පාඩු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් කාණ්ඩ ගත කිරීම.
- අපේක්ෂිත ණය අලාභ (ECL) ආකෘති සංවර්ධනය කිරීම සඳහා විවිධ සූත්‍ර නිර්මාණය කිරීම සහ නිවැරදි යෙදවුම් තෝරා ගැනීම. විරැකියා මට්ටම් සහ ඇපකර අගයන් වැනි සාර්ව ආර්ථික සාධක, PDs, EAs සහ LGDs කෙරෙහි බලපාන ආකාරය තීරණය කිරීම,

- අපේක්ෂිත ණය අලාභ ආකෘති වෙතට ආර්ථික ආදාන යොමු කිරීම සඳහා ඉදිරිගාමී සාර්ව-ආර්ථික තත්ත්ව හා ඒවායෙහි විභවතා බර තැබීම් තෝරා ගැනීම.

### (ඇ) පොදු පාලනය යටතේ ඇති ව්‍යාපාර ඒකාබද්ධතා

පොදු පාලනයක් යටතේ පවතින ආයතන අතර ඒකාබද්ධ ව්‍යාපාර පොලී සංචිත ක්‍රමය භාවිතා කර ගිණුම්ගත කෙරේ. ඒ අනුව, ඒකාබද්ධ ආයතනවල වත්කම් සහ වගකීම් ඒවායේ ධාරණ අගයෙන් පිළිබිඹු වේ. ඒකාබද්ධතාවයේ ප්‍රතිඵලයක් ලෙස නව කීර්ති නාමයක් හඳුනා නොගනී. ගෙවන ලද/මාරු කරන ලද මුදල් සහ අත්පත් කරගත් කොටස් අතර ඕනෑම වෙනසක් කොටස් තුළ පිළිබිඹු වේ.

ව්‍යාපාර ඒකාබද්ධතාවය, තාවකාලික/ඇස්තමේන්තුගත සංඛ්‍යා භාවිතා කරමින් සහ සාධාරණ කාලයක් තුළ සිදු කරන ලදී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව 2019 අප්‍රේල් 1 වන දිනට ඒකාබද්ධ කරන ලද වත්කම් සහ වගකීම් නැවත තක්සේරු කර ඒ අනුව ඒකාබද්ධ සංචිතය සකස් කළ යුතුය.

### (ii) උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතා අඛණ්ඩව පැවැත්ම

අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳව බැංකුවේ කළමනාකාරීත්වය විසින් තක්සේරුවක් සිදු කරන ලද අතර, අපේක්ෂිත අනාගතය තුළ ව්‍යාපාරික අඛණ්ඩතාව පවත්වා ගැනීමට ප්‍රමාණවත් සම්පත් බැංකුව සතුව පවතින බවට කළමනාකාරීත්වය සෑහීමකට පත් වේ, එමෙන්ම, අඛණ්ඩ පදනමක් මත මෙහෙයුම් පවත්වා ගැනීමට බැංකුවට ඇති හැකියාව සම්බන්ධයෙන් සැලකිය යුතු මට්ටමේ සැකයක් ඇතිවීමට තරම් කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් කළමනාකාරීත්වයේ අවධානයට ලක්ව නොමැත. එමනිසා, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩතා පදනම මත පිළියෙළ කරනු ලැබේ.

### මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කර ඇති මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්වල සාධාරණ අගය සක්‍රිය වෙළෙඳපොල වෙතින් ව්‍යුත්පන්න කළ නොහැකි විට ඒවා ගණිතමය ආකෘති භාවිතයද ඇතුළත් විවිධ තක්සේරුකරණ ශිල්ප ක්‍රම උපයෝගී කර ගෙන තීරණය කෙරේ. එකී ආකෘතිවල ආදානයන් හැකි අවස්ථාවලදී නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල වෙතින් ලබා ගනු ලැබේ කෙසේ වෙතත්, එකී දත්ත ලබා ගත නොහැකි අවස්ථාවලදී නිරීක්ෂණය නොවන ආදාන උපයෝගී කර ගැනීමේ බලපෑම අවම කරන සුළු සාධාරණ අගයන් පිහිටුවා ගැනීමෙන් තීන්දු ගැනීම සිදු කරනු ලැබේ.

### බදුකරණය

බැංකුව අදායම් බදුවලට යටත් වන අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන ලද අවස්ථාවේදී බදු නීතිවල අදාළතාව අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් පැවැති අවිනිශ්චිතතා හේතුවෙන් ප්‍රවර්තන, විලම්බිත හා අනෙකුත් බදු වෙනුවෙන් මුළු ප්‍රතිපාදන වශයෙන් කෙතරම් ප්‍රමාණයක් වෙන් කළ යුතුද යන්න තීරණය කිරීම සඳහා තීන්දු ගැනීම අවශ්‍ය වේ.

ව්‍යාපාරික සබඳතා පුළුල් පරාසයක විහිදීම හා පවතින ගිවිසුම්ගත එකගතාවල දිගු කාලීන ස්වභාවය හා සංකීර්ණතා හේතුවෙන් තථ්‍ය ප්‍රතිඵල හා සිදු කරන ලද උපකල්පන අතර වෙනස්කම් ඉස් මතු වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල 15,27 සහ 32 යන සටහන්වල මුලින් වාර්තා කරන ලද බදු ආදායම හා වියදම් සහ විලම්බිත බදු වටිනාකම් වෙනුවෙන් ගැලපුම් සිදු කිරීමට සිදු වේ.

### නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් මිනුම්කරණය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය හා ඒවායෙහි බැඳීම්වල වර්තමාන අගය ආයුගණන ඇස්තමේන්තු ඇසුරින් තීරණය කෙරේ වට්ටම් අනුපාත, වත්කම්වල ප්‍රතිලාභවලට අදාළ අපේක්ෂිත අනුපාත, අනාගත වැටුප් වැඩිවීම්, මර්ත්‍යතා අනුපාත හා අනාගත විශ්‍රාම වැටුප් ඉහළ දැමීම් සම්බන්ධයෙන් උපකල්පන වෙත එළැඹීම ආයුගණන තක්සේරුකරණයට ඇතුළත් වේ. එකී සැලසුම්වල පවත්නා දිගු කාලීන ස්වභාවය හේතුවෙන් එම තක්සේරු කිරීම් සැලකිය යුතු මට්ටමේ අවිනිශ්චිතතාවන්ට ලක්වේ. උපකල්පන සියල්ලම සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරේ.

සුදුසු වට්ටම් අනුපාතය තීරණය කිරීමේදී, කළමනාකාරීත්වය විසින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ අපේක්ෂිත කාල සීමාවට අදාළ තක්සේරුගත කල් පිරීම් සහ ශ්‍රී ලංකා රජයේ බැඳුම්කරවලට අදාළ පොලී අනුපාත සැලකිල්ලට ගනු ලබයි.

මර්ත්‍යතා අනුපාතය වර්තමානයේ ලබාගත හැකිව පවතින මර්ත්‍යතා වගු මත පදනම්වේ. අපේක්ෂිත අනාගත උද්ධමන අනුපාත සහ බැංකුවේ අපේක්ෂිත අනාගත වැටුප් ඉහළ දැමීම් මත පදනම්ව අනාගත වැටුප් ඉහළ දැමීම් හා විශ්‍රාම වැටුප් ඉහළ දැමීම් තීරණය කෙරේ.

### දේපළ, පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආයු කාලය

බැංකුව සෑම වාර්තාකරණ දිනයක් වන විට තම වත්කම්වල ශේෂ වටිනාකම්, ප්‍රයෝජනයට ගත හැකි ආයු කාල හා ක්ෂය ක්‍රමවේද සමාලෝචනය කරයි. එකී වටිනාකම්, අනුපාත හා ක්‍රමවේද තක්සේරු කිරීමේදී කළමනාකාරීත්වයේ තීන්දුව ක්‍රියාත්මක කරන අතර එබැවින් එය අවිනිශ්චිතතාවන්ට ලක්වේ.

### බැඳීම් හා අසම්භව්‍යතා

දන්නා බැරකම් සියල්ලෙහිම වටිනාකම නිර්ණය කර ගැනීමේදී හඳුනා ගත හැකි අවදානම් සියල්ලම සැලකිල්ලට ගනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු, ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීම සිදු කළ නොහැකි හෝ විශ්වසනීය ලෙස මිනුම්ගත කළ නොහැකි විට අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ වත්මන් බැඳීම් ඇසුරින් පමණක් පැවැත්ම තහවුරු කරගත හැකි බැඳීම් වේ. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගැනෙන නමුදු ඒවා දුරස්ථ වන්නේ නම් මිස හෙළිදරව් කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 4. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

ප්‍රධාන පොලී අනුපාත මිණුම් සලකුණු ගෝලීය වශයෙන් ප්‍රතිසංස්කරණය වෙමින් පවතින අතර, ඇතැම් අන්තර් බැංකු පිරිනමන අනුපාත IBORs අවදානම් රහිත ආසන්න විකල්ප අනුපාත (IBOR ප්‍රතිසංස්කරණය" ලෙස හැඳින්වෙන) සමඟ ප්‍රතිස්ථාපනය කරයි. මෙම වෙළඳපල-පුළුල් වෙනස්කම්වල කොටසක් ලෙස යාවත්කාලීන කරනු ලබන මෙම (IBORs) සමහරක් සමඟ සම්බන්ධිත මූල්‍ය උපකරණ බැංකුව සතුව ඇත.

පොලී අනුපාත මිණුම් සලකුණු ප්‍රතිසංස්කරණ අදියර 1 සහ අදියර 2 හේතුවෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන් ගේ ආයතනය විසින් ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 9 ශ්‍රී.ලං.ගි.ප්‍රමිත 39 සහ ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 7 සඳහා සංශෝධන නිකුත් කරන ලදී. IBOR ප්‍රතිසංස්කරණ අදියර 1 සහ අදියර 2 සංශෝධන දෙකෙහිම බලපැවැත්වෙන දිනය ශ්‍රී ලාංකික සන්දර්භය තුළ 2021 ජනවාරි 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේද වන අතර අදියර 2 සංශෝධන යටතේ ඇති අවශ්‍යතා අතීතයට බලපැවැත්වෙන පරිදි අදාළ කළ යුතුය

අවදානම් රහිත ආසන්න විකල්ප අනුපාත (IBOR) ප්‍රතිසංස්කරණ හේතුවෙන් බැංකුව මුහුණ දෙන ප්‍රධාන අවදානම් වනුයේ මෙහෙයුම් අවදානම්ය. උදාහරණයක් ලෙස, ගනුදෙනුකරුවන් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා හරහා ණය ගිවිසුම් නැවත සාකච්ඡා කිරීම. ගිවිසුම් නියමයන් යාවත්කාලීන කිරීම සහ ප්‍රතිසංස්කරණ හා නියාමන අවදානමට අදාළ මෙහෙයුම් පාලනයන් සංශෝධනය කිරීම මෙයට ඇතුළත් වේ.

අවදානම් රහිත ආසන්න විකල්ප අනුපාත ප්‍රතිසංස්කරණයෙන් ඇතිවන මූල්‍ය අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාත අවදානමට සීමා වේ. බැංකුව මෙම ප්‍රතිසංස්කරණ හෙතුවෙන් එහි මූල්‍ය උපකරණවලට ඇතිවන බලපෑම තක්සේරු කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. මෙයට IBOR මුදල් ප්‍රවාහයන්ට බැඳී ඇති ණය අත්තිකාරම්, ණය බැඳීම්, වගකීම් සහ ව්‍යුත්පන්නයන් සමාලෝචනය කිරීම, කොන්ත්‍රාත්තුවලට සංශෝධන අවශ්‍ය දැයි තීරණය කිරීම, ප්‍රතිසංස්කරණ පිළිබඳව ප්‍රතිපාර්ශවයන් සමඟ සන්නිවේදනය කළමනාකරණය කිරීම සහ අවශ්‍ය පරිදි පවතින ණය ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම ඇතුළත් වේ.

2022 දෙසැම්බර් 31 වන දින වන විට, බැංකුව නිරාවරණය වී ඇති ඇතැම් ප්‍රධාන මුදල් වර්ග සඳහා වන IBORs ප්‍රතිසංස්කරණයට භාජනය වෙමින් පවතී.

## 5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

අන්‍යාකාරයකින් දක්වා ඇත්නම් මිසc පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා සංගතව යොදාගෙන ඇත.

සටහන 4 හි විස්තර කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් හැර, බැංකුව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ කර ඇත.

### 5.1 මූල්‍ය වත්කම් සහ වගකීම්

#### 5.1.1 හඳුනාගැනීම සහ ආරම්භක මිනුම්කරණය

ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් සහ ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු ශේෂ හැරුණුකොට මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳ දිනය, එනම්, බැංකුව අදාළ උපකරණයේ ගිවිසුම්ගත විධිවිධානවල පාර්ශවකරුවෙකු බවට පත් වූ දිනය, සැලකිල්ලට ගෙන ආරම්භක හඳුනා ගැනීම සිදු කෙරේ, මිල දී ගැනීම් හෝ වෙළෙඳපොලෙහි ඇති නියාමන අවශ්‍යතා හෝ සම්මුතීන් මගින් සාමාන්‍යයෙන් ස්ථාපිත කෙරෙන කාල සීමාව ඇතුළත වත්කම් ලබා දීම අවශ්‍ය වන මූල්‍ය වත්කම් මීට ඇතුළත් වේ. ගනුදෙනුකරුවන්ගේ ගිණුම් වෙත මුදල් බැර කෙරෙන අවස්ථාවේදී ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය හා අත්තිකාරම් හඳුනා ගැනේ. බැංකුව වෙත මුදල් ලැබෙන අවස්ථාවේදී ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු ශේෂ හඳුනා ගැනේ.

#### 5.1.2 මූල්‍ය උපකරණ වර්ගීකරණය

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණ වර්ගීකරණය කිරීම ඒවායෙහි ගිවිසුම්ගත නියමයන් සහ උපකරණ කළමනාකරණය කිරීම සඳහා වන ව්‍යාපාරික ආකෘතිය මත තීරණය වේ. මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය මත පදනම්ව වාර්තා කර ඇති අවස්ථාවල හැර අන් අවස්ථාවලදී මූල්‍ය උපකරණ ඒවායෙහි සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන අතර, එම ප්‍රමාණයෙන් ගනුදෙනු පිරිවැය එකතු කිරීම හෝ අඩු කිරීම සිදුකරනු ලැබේ. ලැබිය යුතු වෙළෙඳ ගනුදෙනු මිල පදනම්ව මිනුම්ගත කර තිබේ. මූල්‍ය උපකරණවල සාධාරණ අගය ආරම්භක හඳුනා ගැනීමේදී ගනුදෙනු මිලෙන් වෙනස් වන්නේ නම් පහත දක්වා ඇති පරිදි බැංකුව ලාභ හෝ අලාභ 1 වන දිනය මත පදනම්ව ගිණුම්ගත කරයි.

**දින 1 ලාභ හෝ අලාභ**

ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය උපකරණයේ ගනුදෙනු මිල සාධාරණ අගයෙන් වෙනස් වන්නේ නම් හා සාධාරණ අගය වෙළෙඳපොල ගනුදෙනු ආශ්‍රිතව නිරීක්ෂණය කළ හැකි යෙදවුම් පමණක් යොදා ගැනෙන තක්සේරුකරණ ශිල්පක්‍රමයක් මත පදනම් වන්නේ නම්, බැංකුව එකී ගනුදෙනු මිල හා සාධාරණ අගය අතර වෙනස ශුද්ධ වෙළෙඳ ආදායම තුළ හඳුනා ගනියි, ඇතැම් යෙදවුම් නිරීක්ෂණය කළ නොහැකි යම් ආකෘති මත සාධාරණ අගය පදනම් වන එවැනි අවස්ථාවලදී, ගනුදෙනු මිල හා සාධාරණ අගය අතර වෙනස විලම්බනය කෙරෙන අතර යෙදවුම් වෙළෙඳපොල තුළ නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ උපකරණය හඳුනා ගැනීමෙන් ඉවත් කළ විට පමණක් ඒවා ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනේ

##### 5.1.2.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම්, පහත සාධක පදනම් කර ගෙන මිනුම්ගත කෙරෙන, වත්කම් හා වත්කම්වල ගිවිසුම්ගත නියමයන් සඳහා අදාළ වන ව්‍යාපාරික ආකෘතිය පාදක කර ගෙන බැංකුව සිය මූල්‍ය වත්කම් සියල්ලම වර්ගීකරණය කරයි:

- ක්‍රමක්ෂිත පිරිවැය (5.1.2.1.1) සටහනෙහි දැක්වෙ පරිදි
- වෙනත් විස්තීර්ණ ආදායම් මගින් සාධාරණ අගයට හඳුනාගනු ලබන මූල්‍ය වත්කම් (5.1.2.1.3) සටහනෙහි දැක්වෙන පරිදි
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබෙන මූල්‍ය වත්කම් (5.1.2.1.2 සටහනෙහි දැක්වෙන පරිදි)

එකී වර්ගීකරණය, මූල්‍ය වත්කම් සහ මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහ පිළිබඳ ගිවිසුම්ගත නියමයන් කළමනාකරණය කිරීම සඳහා බැංකුව සතුව පවතින ව්‍යාපාරික ආකෘතිය මත පදනම් වේ ලාභ ඔස්සේ නිශ්චය කර ඇති බැරකම් පවතින්නේ නම් හැර අනෙක් අවස්ථාවලදී බැංකුව සිය මූල්‍ය වත්කම් ක්‍රමක්ෂිත

පිරිවැය මත පදනම්ව වර්ගීකරණය කරයි.

### 5.1.2.1.1 ගනුදෙනුකරුවන් සඳහා ණය හා අත්තිකාරම්, ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම්

පහත දැක්වෙන කොන්දේසි දෙකම සම්පූර්ණ වන්නේ නම් බැංකුව විසින් වෙනත් බැංකුවලින් ලැබිය යුතු වත්කම්, ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම් සහ අනෙකුත් මූල්‍ය උපකරණ ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම්ගත කරනු ලැබේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස් කර ගැනීම පිණිස මූල්‍ය වත්කම් රඳවා තැබීමේ අරමුණ සහිත ව්‍යාපාරික ආකෘතියක් තුළ මූල්‍ය වත්කම රඳවා තිබේ නම්.
- මූල්‍ය වත්කමට අදාළ ගිවිසුම්ගත නියමයන් මගින්, හුදෙක්ම මුල් මුදල සහ මුල් මුදලේ හිඟය මත වන පොළිය ගෙවීම මගින් නිශ්චිත දිනවලදී මුදල් ප්‍රවාහ ඇති කිරීමට හේතුවේ නම්,

එකී කොන්දේසිවල විස්තර පහත පැහැදිලි කර ඇත.

#### ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම

බැංකුව සිය ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තම මූල්‍ය වත්කම් සමූහ කළමනාකරණය කරනු ලැබෙන ආකාරය වඩාත් හොඳින් පිළිබිඹු කෙරෙන අයුරින් සිය ව්‍යාපාරික ආකෘති තීරණය කරයි. බැංකුවේ ව්‍යාපාරික ආකෘතිය උපකරණයෙන් උපකරණයට යන පදනම මත තක්සේරු කරනු නොලබන අතර සමුච්චිත කළඹ ආශ්‍රිත ඉහළ මට්ටම් පාදකව එම තක්සේරුව කරනු ලබයි. එම කාර්යය පහත දැක්වෙන ආකාරයේ නිරීක්ෂණය කළ හැකි සාධක මත පදනම් වේ:

- ව්‍යාපාරික ආකෘතියේ කාර්යසාධනය සහ එක. ආකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් ඇගයීමට ලක් කොට ආයතනයේ ප්‍රධාන කළමනාකරණ නිලධාරී පිරිස වෙත වාර්තා කරනු ලබන්නේ කෙසේද යන්න

- ව්‍යාපාරික ආකෘතියේ කාර්යසාධනය (සහ එකී ආකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම්) වෙත බලපාන අවදානම් සහ විශේෂයෙන් එම අවදානම් කළමනාකරණය කරනු ලබන්නේ කෙසේද යන්න

- ව්‍යාපාරයේ කළමනාකරුවන් සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ කෙසේද යන්න (නිදසුනක් ලෙස, එකී ගෙවීම එලෙස කළමනාකරණය කරනු ලැබෙන වත්කම්වල සාධාරණ මතය මත පදනම් වන්නක්ද, නැතහොත් රැස් කරනු ලැබෙන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මත පදනම් වන්නක්ද යන්න)

- විකිණුම්වල අපේක්ෂිත වාර ගණන, ඒවායෙහි වටිනාකම හා කාලය ද බැංකුවේ තක්සේරුවෙහි වැදගත් අංග වේ.

ව්‍යාපාරික ආකෘතිය තක්සේරු කිරීම, 'වඩාත් අවාසිසහගතම අවස්ථා' හෝ 'ආතතිකර අවස්ථා' සැලකිල්ලට ගැනීමෙන් තොරව සාධාරණ ලෙස අපේක්ෂා කළ හැකි අවස්ථා හෝ සිදුවීම් මත පදනම් වේ ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව මුදල් ප්‍රවාහ සිදුවනුයේ බැංකුවේ මුල් අපේක්ෂාවලට වඩා වෙනස් ආකාරයකට නම්, බැංකුව එකී ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවා ඇති ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණයට වෙනස්කම් සිදු නොකරන අතරෘ අලුතින් උත්පාදනය වූ හෝ මිල දී ගත් මූල්‍ය වත්කම් අඛණ්ඩ පදනම මත තක්සේරු කිරීමේදී එකී තොරතුරු අන්තර්ගත කරයි

#### ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් සමන්විත වන්නේ මූලික සහ පොළී ගෙවීම් පමණක්ද යන්න තක්සේරු කිරීම

බැංකුව ස්වකීය වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පියවරක් වශයෙන් සිය මූල්‍ය වත්කම්වලට අදාළ ගිවිසුම්ගත නියමයන් හුදෙක්ම මුල් මුදල මත පොළී ගෙවීම් පරීක්ෂාව (SPPI test) සපුරාලන්නේදැයි යන්න හඳුනා ගනු පිණිස තක්සේරු කරයි.

මෙම පරීක්ෂාව සඳහා 'මුල් මුදල' යන්න නිර්වචනය කෙරෙනුයේ ආරම්භක හඳුනා ගැනීමේදී මූල්‍ය වත්කමෙහි සාධාරණ අගය වන අතර, එය එකී මූල්‍ය වත්කමේ ආයු කාලය තුළ වෙනස් වීමට ඉඩ ඇත (නිදසුනක් ලෙස, මුල් මුදල ආපසු ගෙවීම් හෝ මූලික මුදල/වට්ටම් ක්‍රමක්ෂය කිරීම් සිදු වේ නම්)

ණය ලබා දීමේ ගිවිසුමක් තුළ පොලීවල අදාළ වන ඉතාම වැදගත් මූලිකාංග වන්නේ සාමාන්‍යයෙන් මුදලෙහි කාලීන වටිනාකම සහ ණය අවදානම සලකා බැලීම යනාදියයි. SPPI තක්සේරුවක් සිදු කිරීම සඳහා බැංකුව ස්වකීය තීන්දු අදාළ කර ගන්නා අතර, මූල්‍ය වත්කම දක්වා ඇති මුදල් ඒකකය සහ පොළී අනුපාත අදාළ කෙරෙන කාල සීමාව වැනි අදාළ සාධක සැලකිල්ලට ගනියි.

එයට පටහැනිව. මූලික ණය ලබා දීමේ විධිවිධානයකට සම්බන්ධ නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවදානම් හෝ අස්ථාවරත්වය අවම කිරීමකට වඩා වැඩි යමක් හඳුන්වා දෙන ගිවිසුම් කොන්දේසි පවතින අවස්ථාවක දී, මූලික වශයෙන් ගෙවිය යුතු මුදල හා පොළිය පමණක් ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ට අදාළ ව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සිදු නොවේ. එවැනි අවස්ථාවන්හිදී, මූල්‍ය වත්කම ලාභ හෝ අලාභය (FVTPL) හරහා සාධාරණ වටිනාකමකින් මැනිය යුතුය.

### 5.1.2.1.2 ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනිනු ලැබෙන මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනිනු ලැබෙන මූල්‍ය වත්කම්

- විකිණීමට තබා ඇති මූල්‍ය ආයෝජනෘ සහ
- හුදෙක් මුල් මුදල හා ලාභය ගෙවීමක් නියෝජනය නොකරන ගිවිසුම්ගත නියමයන් සහිත උපකරණවලින් සමන්විත වේ.

ලාභ හෝ අලාභ හරහා රඳවා ඇති මූල්‍ය උපකරණ ආරම්භකව සාධාරණ අගයට අනුව හඳුනා ගනු ලබන අතර, ගනුදෙනු පිරිවැය සිදුවන විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ ඉන් අනතුරුව, ඒවා සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන අතර කවර හෝ ලාභයක් හෝ අලාභයක් වේ නම් ඒවා සිදුවන විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

යම් මූල්‍ය වත්කමක් සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන විට, ණය අවදානම ආශ්‍රිත වෙනස් වීම් හේතුවෙන් සාධාරණ අගයෙහි සිදු විය හැකි වෙනස් වීම් නියෝජනය වන පරිදි ප්‍රතිපාර්ශවයේ ණය යෝග්‍යතාව පිළිබිඹු කරනු පිණිස ණය තක්සේරුකරණ ගැළපීමක් ඇතුළත් කරනු ලැබේ.

### විකිණීමට තබා ඇති මූල්‍ය උපකරණ

කිසියම් මූල්‍ය ආයෝජනයක් මූලික වශයෙන්ම නුදුරු කාලයේදී විකිණීමේ හෝ නැවත මිල දී ගැනීමේ අරමුණින් අත්පත් කර ගෙන හෝ උද්ගත කර ගෙන තිබේ නම් හෝ සාමූහිකව කළමනාකරණය කෙරෙන සහ කෙටි කාලීන ලාභ ලැබීම පිළිබඳ සාක්ෂි පවතින මූල්‍ය උපකරණ කළඹක කොටසක් වේ නම් හෝ ඉදිරි රැකුම් සබඳතාවක් වෙතින් ව්‍යුත්පන්න වූවක් නොවේ නම් එය ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ.

කොටස් සුරැකුම්වල ආයෝජන ද ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගැනෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරෙන අතර සාධාරණ අගය මත හඳුනා ගැනේ, සටහන (20) බලන්න

### ලාභ හෝ අලාභ හරහා මිනුම්ගත කෙරෙන ලෙස නම් කෙරෙන මූල්‍ය උපකරණ

මූලික හඳුනා ගැනීමෙන් පසුව, මූල්‍ය උපකරණ ලාභ හෝ අලාභ ඔස්සේ මිනුම්ගත කෙරෙන ලෙස නම් කෙරේ. කිසියම් මූල්‍ය වත්කමක් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නියම කිරීම මගින්, වෙනත් ලෙසකින් මූල්‍ය වත්කම් හෝ වත්කම් වෙනස් පදනමක් මත මිනුම්ගත කිරීම නිසා උද්ගත විය හැකි, මිනුම්ගත කිරීමේ හෝ නම්කිරීමේ අසංගතතා මතු වීම වළක්වාලීමක් හෝ සැලකිය යුතු ලෙස අඩු කිරීමක් සිදු වේ නම් පමණක් එය ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරේ බැංකුව මෙම කාණ්ඩය යටතේ කිසිදු මූල්‍ය උපකරණයක් නම් නොකෙරේ.

### 5.1.2.1.3 වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම්.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 3 - "ව්‍යාපාර සංයුක්ත කිරීම" යන ප්‍රමිතිය අදාළ වන ව්‍යාපාර සංයුක්ත කිරීමක දී ලාභ හෝ අලාභ ඔස්සේ හඳුනා ගත් වෙළඳ මූල්‍ය වත්කම් හෝ අවිනිශ්චිත සලකා බැලීම් ලෙස වර්ගීකරණය කර නොමැති කොටස් ආයෝජන, අනෙකුත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලබන අතර එහිදී ආයෝජනයේ දිගු කාලීන ස්වභාවය හේතුවෙන් කළමනාකාරීත්වය විසින් අහෝසි කර නොහැකි වරණයක් සිදු කරනු ලැබේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කිරීම සම්බන්ධයෙන් කළමන-ාකාරීත්වය අහෝසි කළ නොහැකි වරණයක් යොදා ගැනීම සලකා නොබලන කළඹ සඳහා සම්මතයක් වශයෙන් එකී ආ-යෝජන ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරේ.

වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඉදිරිපත් කර ඇති වටිනාකම් පසුව ලාභ හෝ අලාභ වෙත මාරුකරනු නොලැබේ. එවැනි ආයෝජනවලින් ලැබෙන ලාභාංශ ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ.

එවැනි ස්කන්ධ ආයෝජන මත ලාභ හෝ අලාභ කිසිදු විටක ලාභ වෙත යොමු නොකෙරේ. බැංකුව විසින් කිසියම් උපක-රණයක පිරිවැයෙහි අයකර ගැනීමේ කොටස ලෙස ලාභාංශවල ප්‍රතිලාභ ලබන අවස්ථාවලදී හැර ගෙවීම් හිමිකමක් ස්ථාපිතව ඇති විට ලාභාංශ ආදායම් ප්‍රකාශනය තුළ ශුද්ධ වෙළෙඳ ලාභ/(අලාභ) ලෙස හඳුනා ගැනෙන අතර, එවැනි අවස්ථාවලදී එම ලාභ වෙනත් විස්තීර්ණ ආදායම් හි වාර්තා කෙරේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ස්කන්ධ ආයෝජන හානිකරණ තක්සේරුවකට ලක් නොකෙරේ

### 5.1.2.2 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් සම්බන්ධ ආරම්භක හා ඉන් පසුව සිදු කෙරෙන මිනුම්ගත කිරීම පහත දැක්වෙන පරිදි වන අනෙකුත් වර්ගීකරණයක් මත පදනම් වේ.

ආරම්භයේදී බැංකුව විසින් සිය මූල්‍ය වගකීම් වර්ගීකරණය කිරීම පිළිබඳව සලකා බලනු ලබයි ඒ අනුව, මූල්‍ය වගකීම් පහත පරිදි වර්ගීකරණය කෙරේ:

- ලාභ හෝ අහ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වගකීම් (සටහන 5.1.2.2.1)

1 විකිණීම සඳහා රඳවා ඇති මූල්‍ය වගකීම්

2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වගකීම්

- ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් (සටහන (5.1.2.2.2)

මූල්‍ය වගකීම් සම්බන්ධ පසුව සිදු කෙරෙන මිනුම්ගත කිරීම ඒවාට අදාළ වර්ගීකරණය මත පදනම් වේ.

### 5.1.2.2.1 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට තක්සේරු කෙරෙන මූල්‍ය වගකීම්

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට ආරම්භක හඳුනා ගැනී-මෙන් අනතුරුව තක්සේරු කරන ලද මූල්‍ය වගකීම් සහ විකිණීම සඳහා රඳවා ඇති මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට තක්සේරු කළ මූල්‍ය වගකීම්වලට අයත් වේ. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට තක්සේරු කෙරෙන අතර ඉන් පසුව සිදු වන වෙනස් වීම් ලාභ හෝ අලාභ තුළ හඳුනා ගැනේ

මූල්‍ය වගකීම් මූලික වශයෙන්ම නුදුරු කාලයේදී විකිණීමේ හෝ නැවත මිල දී ගැනීමේ අරමුණින් අත්පත් කර ගෙන ඇති නම් හෝ කෙටි කාලීන ලාභ වෙනුවෙන් කළමනාකරණය කරන කළඹක කොට-සක් ලෙස රඳවා ඇති නම් එකී මූල්‍ය වගකීම් විකිණීම සඳහා තබා ඇති ලෙස වර්ගීකරණය කෙරේ. "මූල්‍ය උපකරණ: හඳුනා ගැනීම හා මිනුම්ගත කිරීම" පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (- 39) මගින් නිශ්චය කර ඇති පරිදි ඉදිරි රැකුම් සම්බන්ධතාවකදී ඉදිරි රැකුම් උපකරණ ලෙස හඳුනා නොගැනෙන, බැංකුව සම්බන්ධ වූ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මෙම කාණ්ඩයට අයත් වේ.

වෙන් කරන ලද අන්තර්ගත ව්‍යුත්පන්නයන්ද සඵලදායී ඉදිරි රැකුම් උපකරණ ලෙස හඳුනා ගෙන නොමැති නම් ඒවාද විකිණීම සඳහා රඳවා ඇති ලෙස වර්ග කෙරේ. විකිණීම සඳහා රඳවා ඇති වගකීම් මත ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

මෙම කාණ්ඩය යටතේ බැංකුවට මූල්‍ය වගකීම් කිසිවක් නොමැත

### 5.1.2.2.2 ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම්

ගිවිසුම්ගත විධිවිධාන හේතුවෙන් රඳවුම් හිමියා වෙත මුදල් ගෙවීමට හෝ වෙනත් මූල්‍ය වත්කමක් ලබා දීමට හෝ ඵලදායී පොළී අනුපාත ක්‍රමවේදය භාවිතයෙන් සිය ස්කන්ධ කොටස් ස්ථාවර සංඛ්‍යාවක් ක්‍රමක්ෂිත පිරිවැය මත පදනම්ව ස්ථාවර වටිනාකමක් මුදලින් හෝ වෙනත් මූල්‍ය වත්කම් ඇසුරින් හුවමාරු කිරීම ස්වරූපයෙන් බැඳීමක් ඉටු කිරීමට බැංකුව බැඳියාවකට යටත් කෙරෙන විට ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කර නොමැති බැංකුව විසින් නිකුත් කර ඇති මූල්‍ය උපකරණ "ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු හා වෙනත් ණය ගැනීම්" යටතේ ක්‍රමක්ෂිත පිරිවැයට හඳුනා ගැනෙන වගකීම් ලෙස වර්ග කෙරේ.

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව, එවැනි මූල්‍ය වගකීම් සඵලදායී පොළී අනුපාත ක්‍රමවේදය යොදා ගනිමින් ක්‍රමක්ෂිත පිරිවැයට අනුව මිනුම්ගත කෙරේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කරනු ලබන්නේ නිකුතුවේ ඇති ඕනෑම වට්ටමක් හෝ වාරිකයක් සහ ඵලදායී පොළී අනුපාතයේ අවියෝජනීය අංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි. සඵලදායී පොළී ක්‍රමයට ක්‍රමක්ෂයකරණය ආදායම් ප්‍රකාශනයෙහි "පොලී වියදම්" යටතේ ඇතුළත් කර ඇත. වගකීම් හඳුනා ගැනීමෙන් ඉවත් කෙරෙන විට සහ සඵලදායී පොළී අනුපාත ක්‍රමයට ක්‍රමක්ෂය කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

බැංකුව වෙත ලැබිය යුතු වටිනාකම්, වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු බැඳීම්, නිකුත් කළ ණය සහ වෙනත් ණයට ගැනීම් මෙම කාණ්ඩයට අයත් වේ,

### 5.1.2.3 මූල්‍ය වත්කම් සහ බැරකම් නැවත වර්ගීකරණය

බැංකුව විසින් කිසියම් ව්‍යාපාරික මාර්ගයක් අත්පත් කර ගැනෙන, බැහැර කෙරෙන හෝ අවසන් කිරීම සිදු වන විශේෂිත අවස්ථාවලදී හැර, ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව බැංකුව සිය මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය නොකරයි මූල්‍ය වගකීම් කිසිදු විටෙක නැවත වර්ගීකරණය නොකෙරේ බැංකුව 2022 වසරේදී සිය මූල්‍ය වත්කම් හෝ වගකීම් කිසිවක් නැවත වර්ගීකරණය කර නැත.

### 5.1.2.4 මූල්‍ය වත්කම් සහ බැරකම් හඳුනා ගැනීම අවසන් කිරීම

නියම හා කොන්දේසි පසුව සංශෝධනය කිරීම හේතුවෙන් හඳුනා ගැනීම අවසන් කිරීම ගනුදෙනුකරුවෙකුට ලබා දුන් ණය මුදලක් වැනි කිසියම් මූල්‍ය වත්කමක් සැලකිය යුතු අයුරින් නව ණයක් බවට පත් වන තරමටම ඊට අදාළ නියම හා කොන්දේසි සංශෝධනය වී ඇති විට, හඳුනා ගන්නා ලද වෙනසින් හානිකරන අලාභයක් ඒ වන විටත් වාර්තා නොවනතාක්කල් ලාභ හෝ අලාභ හඳුනා ගැනීම අවසන් කිරීමක් ලෙස හඳුනා ගනිමින් එකී හඳුනා ගැනීම අවසන් කරනු ලැබේ. එකී ණය මුදල මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණයක් ලෙස පෙනී යන්නේ නම් හැර එලෙස අලුතින් හඳුනා ගත් ණය අපේක්ෂිත ණය අලාභ මිනුම්ගත කිරීමේ අරමුණ වෙනුවෙන් 1 අවධිය ලෙස වර්ග කෙරේ.

ගනුදෙනුකරුවෙකු වෙත ලබා දුන් ණය මුදලක් හඳුනා ගැනීම අවසන් කරන්නේද නැද්ද යන්න තක්සේරු කිරීමේදී අනෙකුත් කාරණා අතර බැංකුව පහත සාධකද සලකා බලයි:

- ණය මුදල් ඒකකයෙහි වෙනස් වීම්
- හිමිකම් ලක්ෂණයක් හඳුන්වා දීම
- ප්‍රතිපාර්ශවයෙහි සිදුවන වෙනස් වීම්
- අදාළ උපකරණය තවදුරටත් (SPPI) නිර්ණායකය සපුරාලීම සිදු නොකරන තරමට වෙනස් වීම සිදු වී ඇතිද යන්න

වෙනස් කිරීම නිසා මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ලෙස වෙනස් නොවන්නනේ නම්, එහිදී වෙනස් වීම නිසා හඳුනා ගැනීම අවසන් වීමක් සිදු නොවේ. මුල් සඵලදායී පොළී අනුපාතයට අනුව වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ආශ්‍රිත වෙනස් වීම් මත පදනම්ව බැංකුව, හානිකරණ අලාභයක් වාර්තා නොවන තාක් එකී වෙනස් වීම් ලාභයක් හෝ අලාභයක් ලෙස වාර්තා කරයි.

#### සැලකිය යුතු තරමේ වෙනස් වීමක් හැර වෙනත් හේතුවක් මත හඳුනා ගැනීම අවසන් කිරීම

#### මූල්‍ය වත්කම්

කිසියම් මූල්‍ය වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති හිමිකම අවසන් වී ඇති විට එකී මූල්‍ය වත්කම (හෝ අදාළ පරිදි, කිසියම් වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා ගැනීම අවසන් කෙරේ. බැංකුව විසින් කිසියම් මූල්‍ය වත්කමක් පවරා ඇත්නම් සහ එකී පැවරීම හඳුනා ගැනීම අවසන් කිරීමට අවශ්‍ය කාරණා සපුරන්නේ නම් එකී වත්කම හඳුනා ගැනීම අවසන් කෙරේ.

පහත අවස්ථාවන්හිදී පමණක් බැංකුව මූල්‍ය වත්කම් පවරා ඇත:

- මූල්‍ය වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති ගිවිසුම්ගත අයිතිය බැංකුව විසින් පැවරීම

හෝ

- මුදල් ප්‍රවාහ රඳවා ගැනීම සඳහා හිමිකම එමගින් තබා ගන්නා නමුදු, ලිහිල් ප්‍රතිපත්ති ක්‍රමවේදයක් යටතේ කිසිදු සැලකිය යුතු තරමේ ප්‍රමාදයකින් තොරව, ලැබුණු මුදල් ප්‍රවාහ මුලු මුදල වශයෙන්ම තෙවැනි පාර්ශවයක් වෙත ගෙවීමට බැඳීමක් ඇති බවට උපකල්පනය කිරීම.

ලිහිල් ප්‍රතිපත්ති ක්‍රමවේද යනු, පහත දැක්වෙන කොන්දේසි තුනම සපුරාලන අවස්ථාවන්හිදී කිසියම් මූල්‍ය වත්කමක (මුල් වත්කම) මුදල් ප්‍රවාහ ලැබීමට ගිවිසුම්ගත හිමිකම් බැංකුවට පවතින නමුදු, පාර්ශව එකක් හෝ වැඩි ගණනක් (අවසන් ලැබුම්කරු) වෙත එකී මුදල් ප්‍රවාහ ගෙවීමට ගිවිසුම්ගත බැඳීමක් පවතින බවට උපකල්පනය කිරීම.

- ණය පිණිස ලබා දුන් මුදල සහ වෙළෙඳපොල අනුපාත පාදක උපචිත පොලිය සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට හිමිකම සහිතව ලබා දුන් කෙටි කාලීන අත්තිකාරම් හැර මුල් වත්කමෙන් අදාළ වටිනාකම් රැස්කර ගෙන නොමැති නම්, ඉන් අනතුරුව එම මුදල් ලබන්නන් හට මුදල් ගෙවීම සඳහා බැඳීමක් බැංකුවට නොමැත
- වත්කමකින් මුදල් ලබා ගන්නා පාර්ශව වෙත සුරැකුමක් ලෙස ගෙවීම හැර වෙනත් ලෙසකින් මුල් වත්කම විකිණීමට හෝ ඇපයකට තැබීමට බැංකුවට නොහැක
- කිසිදු සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව, බැංකුව වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගන්නා පාර්ශව වෙනුවෙන් රැස් කර ගන්නා මුදල් ප්‍රවාහ ඔවුන් වෙත ප්‍රේෂණය කළ යුතු වේ

ඊට අමතරව, රැස් කර ගන්නා දිනය සහ ප්‍රතිලාභය ලැබෙන පාර්ශවය වෙත මුදල් ප්‍රේෂණය කෙරෙන දින අතර කාල සීමාව තුළ, උපයා ගන්නා පොලිය ද ඇතුළත්ව මුදල් හෝ මුදල් සමානයන් ස්වරූපයෙන් හැර වෙනත් ලෙසකින් එවැනි මුදල් ප්‍රවාහ නැවත ආයෝජනය කිරීමට බැංකුවට හිමිකමක් නොමැත

පහත සාධක පවතින්නේ නම් පමණක් යම් පැවරීමක් හඳුනා ගැනීම අවසන් කිරීමට සුදුසුකම් ලබයි:

- බැංකුව වත්කමට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස පවරා ඇති විට

හෝ

- බැංකුව වත්කමට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැත, එහෙත් වත්කමෙහි පාලනය පවරා ඇති විට

එකී වත්කම ඊට සම්බන්ධයක් නොමැති තෙවැනි පාර්ශවයක් වෙත විකිණීමට ප්‍රායෝගික හැකියාවක් පැවරීම ලබන පාර්ශවය සතුව පවතින්නේ නම්, සහ පැවරීම මත අතිරේක සීමාකම් යෙදවීමෙන් තොරව ඒකපාර්ශවීයව එම හැකියාව ක්‍රියාවේ යෙදවීමට හැකියාවක් තිබේනම් පමණක් බැංකුව එම වත්කමෙහි පාලනය පැවරිය හැකි එකක් ලෙස සලකයි

බැංකුව වත්කමට අදාළ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම සැලකිය යුතු ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති විට, බැංකුව සතුව තවදුරටත් ඊට ඇති සම්බන්ධය පවතින තාක් එම වත්කම හඳුනා ගැනීමට ලක් කළ යුතු අතර එවැනි අවස්ථාවලදී බැංකුවද ඊට සම්බන්ධිත වගකීමක් හඳුනා ගනී. පවරන ලද වත්කම හා ඒ හා සබැඳි වගකීම, බැංකුව විසින් රඳවා ගන්නා ලද හිමිකම් හා බැඳීම් පිළිබිඹු කෙරෙන පදනමක් මත මිනුම්ගත කෙරේ.

පවරන ලද වත්කම අරහයා වන ඇප සුරැකුමක ස්වරූපය ගන්නා අඛණ්ඩව පවත්නා සම්බන්ධතාවක් මිනුම්ගත කෙරෙනුයේ වත්කමෙහි ධාරණ අගයේ මුල් වටිනාකම සහ බැංකුව විසින් ගෙවිය යුතු සලකා බැලීමේ උපරිම වටිනාකම යන්නෙහි අඩු අගය අනුවය.

එම අඛණ්ඩව පවත්නා සම්බන්ධතාවය ලිඛිත හෝ මිල දී ගන්නා ලද විකල්පයක ස්වරූපය ගන්නේ නම් (හෝ ඒ දෙආකාරයේම), ප්‍රතිමිලදී ගැනීමකදී බැංකුව විසින් ගෙවිය යුතු වටිනාකම පදනම් කරගෙන මිනුම්ගත කරනු ලැබේ.

කිසියම් වත්කමක් සාධාරණ අගයට මනිනු ලැබෙන විට ලිඛිත විකල්පයක් යොදා ගන්නේ නම් ආයතනයේ අඛණ්ඩව පවත්නා සම්බන්ධතාවෙහි ප්‍රමාණය පවරන ලද වත්කමෙහි සාධාරණ අගය සහ විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල යන වටිනාකම් අතරින් පහළ අගය මත සීමාවේ.

### මූල්‍ය වගකීම්

යම් මූල්‍ය වගකීමක් යටතේ ඇති බැඳීම බැහැර කොට, අවලංගු කොට හෝ ඉකුත් වී ඇති විට එය හඳුනා ගැනීම අවසන් කෙරේ පවතින කිසියම් මූල්‍ය වගකීමක් අදාළ ණය හිමියා විසින් ලබා ගන්නා ලද සැලකිය යුතු තරමේ කොන්දේසි මත වූ වෙනත් වගකීමකින් ප්‍රතිස්ථාපනය කෙරේ නම් හෝ පවතින වගකීමේ නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් වී ඇති නම්, එවැනි හුවමාරුවක් හෝ සංශෝධනය කිරීමක් මුල් වගකීම හඳුනා ගැනීම අවසන් කිරීමක් ලෙස හා නව වගකීමක් හඳුනා ගැනීමට ලක් කිරීමක් ලෙස සැලකේ මුල් වගකීමෙහි ඉදිරියට ගෙන යන වටිනාකම සහ ගෙවන ලද වටිනාකම අතර වෙනස ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

## 5.1.2.5 හානිකරණය

### අපේක්ෂිත ණය අවදානම් හඳුනා ගැනීම

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට රඳවනු නොලබන සියලුම ණය සහ අනෙකුත් ණය මූල්‍ය වත්කම් මෙන්ම ණය බැඳීම් හා මූල්‍ය සුරැකුම් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් බැංකුව අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් ප්‍රතිපාදන වාර්තා කරමින් සිටී. මෙම කොටසේදී මේ සියල්ලම 'මූල්‍ය උපකරණ' ලෙස දක්වනු ලැබේ. ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර (9) යටතේ ස්කන්ධ උපකරණ හානිකරණයට ලක් නොවේ. මාස 12 අපේක්ෂිත ණය අලාභ යනු, මූල්‍ය උපකරණයක ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභයෙන් වාර්තාකරණ දිනයෙන් මාස 12 ක කාල සීමාවක් ඇතුළත මූල්‍ය උපකරණයකට අදාළව සිදු විය හැකි ගෙවීම් හිඟ වීම් හේතුවෙන් ඉස්මතු වන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන කොටස වේ.

මූල්‍ය උපකරණවල ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභය සහ අපේක්ෂිත ණය අලාභ යන දෙවර්ගයම ගණනය කරනු ලබන්නේ මූල්‍ය උපකරණවලට අදාළ කළඹෙහි ස්වභාවය මත පදනම්ව කේවල පදනම මත හෝ සාමූහික පදනම මත වන අතර, සාමූහික පදනමක් මත මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් සමූහනය කිරීම සඳහා බැංකුව විසින් භාවිත කරනු ලබන ප්‍රතිපත්තිය පහත විස්තර කර ඇත. යම් මූල්‍ය උපකරණයක ඉතිරි වී ඇති ආයු කාලය තුළ ගෙවීම් නොලැබීමේ අවදානම වෙනසකට ලක් විය හැකිද යන්න සලකා බලමින් එහි ආරම්භක හඳුනා ගැනීමේ සිට ඊට අදාළ ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිද යන්න පිළිබඳ තක්සේරුවක් ඒ ඒ වාර්තාකරණ කාල සීමාව අවසානයේදී සිදු කිරීම වෙනුවෙන් බැංකුව සතුව ස්ථාපිත ප්‍රතිපත්තියක් තිබේ.

ඉහත ක්‍රියාවලිය මත පදනම්ව, පහත දක්වා ඇති පරිදි බැංකුව සිය ණය 1 අදියර, 2 අදියර, 3 අදියර සහ මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ වෙත සමූහනය කරයි:

1 අදියර : ණය පළමු වරට හඳුනා ගැනීමෙන් අනතුරුව බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ පදනම් කර ගෙන ඒ සඳහා කිසියම් ප්‍රතිපාදනයක් හඳුනා ගනී. ණය අවදානම ඉහළ ගොස් ඇති සහ 2 අදියරේ සිට නැවත වර්ගීකරණය කර ඇති ණය පහසුකම්ද 1 අදියරේ ණයවලට ඇතුළත් වේ.

2 අදියර : කිසියම් ණය පහසුකමක් එහි උත්පාදනයේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති විට බැංකුව ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභය වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරයි. ණය අවදානම ඉහළ ගොස් ඇති සහ 3 අදියරේ සිට නැවත වර්ගීකරණය කර ඇති ණය පහසුකම්ද 2 අදියරේ ණයවලට ඇතුළත් වේ.

3 අදියර : ණය-හානිකරණ ලෙස සලකනු ලැබෙන ණයී බැංකුව ජීවිත කාලය පුරාම අපේක්ෂිත ණය අලාභය වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරයි.

මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ වත්කම් : මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ වත්කම් යනු ආරම්භක හඳුනා ගැනීම මත ණය හානිකරණයට ලක් වූ මූල්‍ය වත්කම් වේ මිල දී ගත් හෝ උත්පාදිත ණය හානිකරණ ආරම්භක හඳුනා ගැනීමේදී සාධාරණ අගයට වාර්තා කෙරෙන අතර ඉන් අනතුරුව ඒවායෙහි පොලී ආදායම, ණය ගැලපූ සඵලදායී වාර්ෂික පොලී අනුපාතයක් මත පදනම්ව හඳුනා ගැනේ. අපේක්ෂිත ණය අලාභවල පසුකාලීන වෙනසක් සිදුවන ප්‍රමාණයට පමණක් අපේක්ෂිත ණය අලාභ හඳුනා ගැනීම හෝ මුදා හැරීම සිදු කෙරේ, වාර්තාකරණ දිනය වන විට බැංකුව සතුව මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම් කිසිවක් නොතිබිණ.

සම්පූර්ණ හිඟ වටිනාකම හෝ ඉන් කොටසක් අයකර ගැනීමේ සාධාරණ අපේක්ෂාවක් බැංකුව සතු නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් එකී වත්කමෙහි දළ ධාරණ අගය අඩු කෙරේ.

මෙය, එකී මූල්‍ය වත්කම (හෝ ඉන් කොටසක්) හඳුනා ගැනීම අවසන් කිරීමක් ලෙස සලකණු ලැබේ.

## අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම

සඵලදායී වාර්ෂික පොලී අනුපාතයට සාපේක්ෂව වට්ටම් කරන ලද අපේක්ෂිත මුදල් හිඟ වීම් මිනුම්ගත කිරීම සඳහා බැංකුව සම්භාවිතාව අනුව බර තැබීම පදනම් වන සිද්ධි හතරක් පාදකව අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි. මුදල් හිඟ වීමක් යනු ගිවිසුමකට අදාළව කිසියම් පාර්ශවයක් වෙත ගෙවිය යුතු මුදල් සහ එකී පාර්ශවය ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනස වේ. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රමවේද සහ ඊට අදාළ ප්‍රධාන සංරචක පහත සඳහන් පරිදි වේ.

**සම්භාවිතා හිඟය :** දෙන ලද යම් කාල සීමාවක් තුළ හිඟයක් ඇති වීමට පවතින හැකියාව සම්භාවිතා හිඟයයි. අදාළ පහසුකම ඊට පෙර හඳුනා ගෙන නොමැති නම් සහ ඒ වන විටත් කළඹට ඇතුළත්ව තිබේ නම් යම් නිශ්චිත කාලයක් තුළ පමණක් මෙවැනි හිඟතාවයක් ඇති වීමට හැකියාව පවතී.

**හිඟ නිරාවරණය:** හිඟ නිරාවරණය යන්නෙන් මුල් මුදල හා පොලිය ආපසු ගෙවීම, නියම වී ඇත්තේ ගිවිසුමක් ප්‍රකාරවද නැතහොත් වෙනත් ආකාරයකින්ද යන්න, බැඳීමක් ඇති පහසුකම්වලින් අපේක්ෂිත පහත බැඳීම් සහ සිදු නොකොට ඇති ගෙවීම් වෙතින් ලැබෙන උපචිත පොලිය වැනි සාධක ආශ්‍රිතව වාර්තාකරණ දිනයෙන් පසුව සිදු වෙතැයි අපේක්ෂිත වෙනස් වීම් සැලකිල්ලට ගෙන කිසියම් අනාගත හිඟයක් ඇති විය හැකි දිනයක් වන විට සිදු විය හැකි නිරාවරණය පිළිබඳ තක්සේරුවක් අදහස් වේ.

**දෙන ලද කාලයකදී අලාභ:** දෙන ලද කාලයකදී අලාභ යනු කිසියම් දෙන ලද කාලයකදී වියහැකි පැහැරහැරීම් සිදුවීමකදී උද්ගත වන අලාභය තක්සේරු කිරීමකි. ඕනෑම ණය සුරැකුමක් උපලබ්ධිවීමද ඇතුළත්ව ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ සහ ණය හිමියා ලබා ගැනීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහ අතර වෙනස මත මෙය පදනම් වේ. සාමාන්‍යයෙන් එය හිඟ නිරාවරණයෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කෙරේ.

අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී බැංකුව විසින් පාදක සිද්ධිය, හොඳම සිද්ධිය හා අවාසිදායකම සිද්ධිය යන සිද්ධි තුනක් සැලකිල්ලට ගනු ලබයි. මේ සෑම සිද්ධියක්ම එකිනෙකට වෙනස් සම්භාවිතා හිඟ, හිඟ නිරාවරණ සහ දෙන ලද කාලයකදී අලාභ හා බැඳී තිබේ. අදාළ අවස්ථාවලදී, ණය ආශ්‍රිත හිඟයන් සමනය වීමට ඇති සම්භාවිතාව සහ සුරැකුම් වටිනාකම හෝ වත්කම විකිණීමෙන් ලැබීමට ඉඩ ඇති වටිනාකම ඇතුළත්ව ගෙවීම් හිඟ සහිත ණය ආපසු අයකර ගැනීමට අපේක්ෂා කරන්නේ කෙසේද යන්න විමසීමද ඉහත සිද්ධි තක්සේරුවට ඇතුළත් වේ.

හානිකරණ අලාභ හා නිකුතු, මූල්‍ය වත්කමේ දළ ධාරණ අගයෙහි ගැලපුමක් ලෙස ගිණුම්ගත කෙරෙන අලාභ හෝ ලාභවල වෙනස්වීම්වලින් වෙනස්ව ගිණුම්ගත කොට හෙළිදරව් කෙරේ. අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රමවේදය පහත සාරාංශගත කොට ඇත:

**අදියර 1 :** මාස 12 අපේක්ෂිත ණය අලාභ, වාර්තාකරණ දිනයෙන් මාස 12 ක කාල සීමාවකට පසුව මූල්‍ය උපකරණයකට අදාළව සිදු විය හැකි ගෙවීම් පැහැරහැරීම් හේතුවෙන් ඉස්මතු වන අපේක්ෂිත ණය අලාභ නියෝජනය කරන (LTECLs) කොටස ලෙස ගණනය කරනු ලැබේ. වාර්තාකරණ දිනයට මාස 12 කට පසුව ගෙවීම් පැහැරහැරීමක් පිළිබඳ අපේක්ෂාව පදනම් කර ගෙන බැංකුව මාස 12 අපේක්ෂිත ණය අලාභ ගණනය කරයි.
එකී මාස 12 හිඟ සම්භාවිතා පුරෝකථනිත හිඟ නිරාවරණ සඳහා අදාළ කෙරෙන අතර ඉන් පසුව අපේක්ෂිත දෙන ලද කාලයක අලාභවලින් එය ගුණ කොට මුල් සඵලදායී පොලී අනුපාතයට සාපේක්ෂ වටිනාකමක් වට්ටම් කෙරේ. ඉහත විස්තර කරන ලද සිද්ධි තුන සඳහාම මෙම ගණනය කිරීම සිදු කරයි.

**අදියර 2 :** කිසියම් ණය පහසුකමක් උත්පාදනයේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති විට බැංකුව ජීවිත කාලය පුරා අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් ප්‍රතිපාදනයක් වෙන් කරයි. එම ක්‍රමවේදය ඉහත විස්තර කර ඇති ක්‍රමවේදයට සමාන වන අතර බහුවිධ සිද්ධි භාවිත කිරීමද ඊට ඇතුළත් වේ. නමුත්, පැහැරහැරීමේ සම්භාවිතාව සහ දෙන ලද කාලයක අලාභ තක්සේරු කරනුයේ අදාළ උපකරණයේ ආයුකාලය පුරාවට වේ. අපේක්ෂිත මුදල් ප්‍රවාහ හිඟ වීම් මුල් සඵලදායී පොලී අනුපාතයට සාපේක්ෂ වටිනාකමකින් වට්ටම් කෙරේ.

**අදියර 3 :** ණය හානිකරණ ලෙස සලකනු ලැබෙන ණයවලට අදාළව බැංකුව ආයු කාලය තුළ අපේක්ෂිත ණය අලාභ හඳුනා ගනී. එම ක්‍රමවේදය ඉහත විස්තර කර ඇති ක්‍රමවේදයට සමාන වන අතර පැහැර හැරීම් සම්භාවිතාව 100% ක් ලෙස සැලකේ
**මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ :** මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම් යනු ආරම්භක හඳුනා ගැනීම මත ණය හානිකරණයට ලක් කරන ලද මූල්‍ය වත්කම් වේ. බැංකුව ආරම්භක හඳුනා ගැනීමේ සිට ආයු කාලයෙහි සමුච්චිත වෙනස්කම් පමණක් හඳුනා ගන්නා අතර, එම ක්‍රියාවලිය, ණයවලට ගැලපූ සඵලදායී වාර්ෂික පොලී අනුපාතයෙන් වට්ටම් කරන ලද ඉහත සිද්ධි හතර පිළිබඳ සම්භාවිතාව මත බර තැබීමක් මත පදනම්ව සිදු කරයි. වාර්තාකරණ දිනය වන විට බැංකුව සතුව මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ කිසිවක් නොතිබිණ.
**මූල්‍ය ඇපකර ගිවිසුම්:** ණය කාඩ්පත් සහ චක්‍රීය පහසුකමක් සහ ලබා නොගත් ණය ගිවිසුම් බැඳීමක් යන දෙකම ඇතුළත් පිළිවැටුම් ණය පහසුකම්වලට අදාළව අපේක්ෂිත ණය අලාභ අදාළ ණය පහසුකමද සමගින් ගණනය කොට ඉදිරිපත් කෙරේ. ණය බැඳීම්වලට අදාළව අපේක්ෂිත ණය අලාභ අදාළ ප්‍රතිපාදන ඇතුළත හඳුනා ගැනේ.

## කේවල වශයෙන් වැදගත් වන ණය පහසුකම් වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම

බැංකුව පළමුවෙන්ම බැංකුවට කේවල වශයෙන් වැදගත් වන මූල්‍ය වත්කම්වලට අදාළ අපේක්ෂිත ණය අලාභ කේවල වශයෙන් තක්සේරු කරයි. එවැනි වත්කම් හානිකරණය වී නොමැති බවට බැංකුව විසින් තීරණය කරනු ලැබෙන අවස්ථාවලදී (3 අදියරේදී නොවේ) සමාන ණය අවදානම් ලක්ෂණ දරන මූල්‍ය වත්කම් සමූහයක් තුළට එම වත්කම අයත් වන අතර එකී වත්කම් හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කෙරේ. කෙසේ වෙතත්, හානිකරණය වෙනුවෙන් කේවල වශයෙන් තක්සේරු කෙරෙන සහ හානිකරණ අලාභයක් හඳුනා ගෙන ඇති හෝ හඳුනා ගැනෙමින් පවතින වත්කම් සාමූහික හානිකරණ තක්සේරුවකට ඇතුළත් නොකෙරේ.
අදාළ වත්කම හානිකරණය වී ඇත්නම්, මුල් වරට පැවැති සඵලදායී පොලී අනුපාතයට අනුව එකී වත්කමින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහ වට්ටම් කිරීම සහ මූල්‍ය වත්කමේ වත්මන් ධාරණ අගය සමගින් එහි වත්මන් වටිනාකම සංසන්දනය කිරීම තුළින් එහි අලාභ වටිනාකම මිනුම්ගත කරනු ලැබේ. කේවල වශයෙන් වැදගත් ගිණුම් හානිකරණය කිරීම් සුදුසු අවස්ථාවලදී වඩාත් ක්‍රමවත් පදනමක් මත සමාලෝචනය කෙරේ සාමාන්‍යයෙන්, රඳවා ගන්නා ලද ඕනෑම ණය සුරැකුමක බලාත්මක කළ හැකි බව සහ එහි සත්‍ය හා අපේක්ෂිත ගෙවීම් ලැබීම්වලට අදාළ කාලය හා වටිනාකම නැවත තක්සේරු කිරීමද ඊට ඇතුළත් වේ. සිදු කරන ලද අලාභ ඇස්තමේන්තුවෙහි අඩු වීමක් සිදු විය හැකි බවට සාධාරණ හා වාස්තවික සාක්ෂියක් පවතින විට පමණක් කේවල වශයෙන් සිදු කරන ලද හානිකරණයන්

නිකුත් කරනු ලැබේ. හානිකරණය කරන ලද වත්කම් මත පොලිය වට්ටම නිදහස් කිරීම ඔස්සේ හඳුනා ගැනේ

කේවල වශයෙන් වැදගත් මූල්‍ය වත්කම්වලට අදාළ අපේක්ෂිත ණය අලාභ තීරණය කළ පසුව පහත සඳහන් සාධක සලකා බැලේ:

- ලබා නොගතත් නිරාවරණයන්ද ඇතුළුව ගනුදෙනුකරු වෙතට සිදු වන සමුච්චිත නිරාවරණය
- ගනුදෙනුකරුගේ ව්‍යාපාරික ආකෘතිය සතු ස්වශක්තතාව සහ මූල්‍යමය දුෂ්කරතා මධ්‍යයේ වුවද සාර්ථක ලෙස වෙළෙඳාමේ යෙදීමට හා ණය බැඳීම් ඉටු කිරීම උදෙසා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ ජනනය කිරීමට ඇති හැකියාව.
- ගෙවීම් හා අයකර ගැනීම් ලැබීමට අපේක්ෂිත කාලය හා වටිනාකම්
- අනෙකුත් ණයකරුවන්ගේ බැඳීම් බැංකුවේ බැඳීම් අභිබවමින් හෝ ඊට සමානව ශ්‍රේණිගත වන තරම සහ අඛණ්ඩව බැංකුවට සහාය දැක්වීම සඳහා ඔවුන්ට ඇති හැකියාව
- සමුච්චිත වටිනාකම තීරණය කිරීමේ සංකීර්ණතාව හා ණයකරුවන්ගේ සියලුම හිමිකම් පෑම් ශ්‍රේණිගත කිරීම සහ නෛතික හා රක්ෂණ අවිනිශ්චිතතා පවතින තරම
- සුරැකුමෙහි උපයා ගත හැකි වටිනාකම (හෝ වෙනත් ණය අවම කිරීමේ විධිවිධාන) සහ සාර්ථක ලෙස ණය පියවා ගැනීමට ඇති හැකියාව
- හිඟ මුදල් අයකර ගැනීමේදී දරන්නට සිදු වන කවර හෝ පිරිවැයක් වේ නම් එය අඩු කර ගැනීමට ඇති හැකියාව
- අදාළ ණය පහසුකම දේශීය මුදල් ඒකකයෙන් දක්වා නොමැති නම් එම ණය ලබා ගන්නා පාර්ශවයට ණය මුදල් ඒකකයෙන් ගෙවීම් ලබා ගැනීමට සහ සිදු කිරීමට ඇති හැකියාව
- ඇවර කිරීමකදී හෝ බංකොලොත් වීමකදී ලාභාංශ ලබා ගත හැකි වීම.

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ණය උපකරණ

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ණය උපකරණවලට අදාළ අපේක්ෂිත ණය අලාභ ඇස්තමේන්තු මගින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි එකී මූල්‍ය වත්කම්වල ඉදිරියට ගෙන යනු ලබන සාධාරණ අගයට පවතින ශේෂය  අඩු නොකෙරේ. ඒ වෙනුවට, වත්කම් ක්‍රමක්ෂිත පිරිවැය මත හඳුනා ගතහොත් ලැබිය හැකි ප්‍රතිපාදන වටිනාකමට සමාන වටිනාකමක්, සමුච්චිත හානිකරණ වටිනාකමක් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනෙන අතර ඊට අදාළ වියදම්ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගැනෙන සමුච්චිත අලාභය වත්කම් හඳුනා ගැනීම අවසන් කිරීමෙන් පසුව ලාභ හා අලාභ වෙත විතැන් කෙරේ.

මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම්

මිල දී ගත් හෝ උත්පාදිත ණය-හානිකරණ වත්කම්වලට අදාළව බැංකුව අලාභ ප්‍රතිපාදනවල ආරම්භක හඳුනා ගැනීමේ සිට ජීවිත කාලයටම අපේක්ෂිත ණය අලාභ අනුව සමුච්චිත වෙනස්කම් පමණක් හඳුනා ගනී

ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු

බැංකුව සිය අපේක්ෂිත ණය අලාභ ආකෘති සම්බන්ධයෙන් ආර්ථික යෙදවුම් ලෙස සලකමින් පුළුල් පරාසයක විහිදෙන ඉදිරි දැක්මක් පිළිබඳව වන තොරතුරු මාලාවක් මත රඳා පවත අතර ඒ තුළ පහත තොරතුරු ඇතුළත් වේ:

- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය
- උද්ධමන අනුපාතය
- පොලී අනුපාත
- ඇ.ඩො.: ශ්‍රී ලංකා රු. විනිමය අනුපාත
- විරැකියා අනුපාතය

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා භාවිත කෙරෙන යෙදවුම් හා ආකෘති මගින් මූල්‍ය ප්‍රකාශන දිනය වන විට පවතින වෙළෙඳපොල ලක්ෂණ සියල්ලම ග්‍රහණය නොවීමට ඉඩ ඇත. එබැවින්, එවැනි වෙනස් වීම් සැලකිය යුතු තරමින් වැදගත් වන අවස්ථාවලදී තාවකාලික ගැලපුම් වශයෙන් විටින් විට ගුණාත්මක ගැලපුම් හෝ අවදානම් ආවරණයන් සිදු කරනු ලැබේ. මේ නිසා, බැංකුව පහත දැක්වෙන ගුණාත්මක සාධක පිළිබඳවද අවධානය යොමු කරයි.

- වටිනාකමට ණය අනුපාතයේ සාමාන්‍යය
- රජයේ ප්‍රතිපත්ති
- කර්මාන්තයේ ව්‍යාපාරවල ස්වභාවය
- නියාමන බලපෑම්

### 5.1.3 ඇපකර තක්සේරුව

බැංකුව සිය මූල්‍ය වත්කම් මත ඇති විය හැකි ණය අලාභ අවම කර ගනු වස් හැකි අවස්ථාවලදී ඇපකර භාවිත කිරීමට අපේක්ෂා කරයි. මෙම ඇපකර මුදල, සුරැකුම්, ණයවර/ඇප ලිපි, දේපල, ලැබීම්, ඉන්වෙන්ටරි, තුලනය කිරීමේ විධිවිධාන වැනි අනෙකුත් මූල්‍ය නොවන වත්කම් හා ණය වැඩිදියුණු කිරීම් ආදී වශයෙන් විවිධ ස්වරූප ගනී.  ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 9 යටතේ බැංකුවේ ණය ලබා දීමේ ක්‍රියාවලීන් ඔස්සේ පැවරෙන ඇපකරවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය ශ්‍රී.ලං.ගි.ප්‍රමිත 39 යටතේ වන ප්‍රතිපත්තියම වේ.

### 5.1.3.1 නැවත ලබා ගත් ඇපකර

නැවත අත්කර ගත් වත්කමක් බැංකුවේ අභ්‍යන්තර මෙහෙයුම් සඳහා යොදා ගත යුතුද, නැතහොත් විකුණා දැමිය යුතුද යන්න තීරණය කිරීමද බැංකුවේ ප්‍රතිපත්තිය වේ, අභ්‍යන්තර මෙහෙයුම් සඳහා ප්‍රයෝජනවත් යැයි තීරණය කරන ලද වත්කම්, ඒවායේ නැවත අත්පත් කරගත් වටිනාකම හෝ මුල් ලබාගත් වත්කමේ ධාරණ අගය යන වටිනාකම් අතරින් අඩු අගයට  ඒවායේ අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ. විකුණා දැමීම වඩා හොඳ විකල්පය බවට තීරණය කෙරෙන වත්කම් බැංකුවේ ප්‍රතිපත්තිය අනුකූල වන පරිදි ඒවායෙහි සාධාරණ අගයට (මූල්‍ය වත්කම් නම්) සහ මූල්‍ය නොවන වත්කම් නම් ඒවා නැවත අත්කර ගත් දිනට පවතින විකිණුම් වටිනාකම සාධාරණ අගයෙන් අඩු කළ විට ලැබෙන වටිනාකමට විකිණීම පිණිස රඳවා ඇති වත්කම් කාණ්ඩයට මාරු කරනු  ලැබේ.

බැංකුව සිය සාමාන්‍ය ව්‍යාපාරික මෙහෙයුම් අතරතුර දී දේපල හෝ සිය සුළු කළඹෙහි ඇතුළත් වෙනත් වත්කම් භෞතික වශයෙන් නැවත අත්කර ගැනීමක් සිදු නොකරන අතර එහි හිඟ ණය පියවීම උදෙසා සාමාන්‍යයෙන් වෙන්දේසියකදී අදාළ අරමුදල් ආපසු අයකර ගැනීම සඳහා බාහිර නියෝජිතයන්ගේ සේවය ලබා ගනී. කවර හෝ අතිරික්ත අරමුදලක් තිබේ නම් එය ගනුදෙනුකරුවන්/බන්ධන්දායියන් වෙත ආපසු ගෙවනු ලැබේ. මෙම ක්‍රමවේද හේතුවෙන් නෛතික ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලීන් යටතේ පදිංචි දේපල කිසිවක් ශේෂ පත්‍රයෙහි වාර්තා නොකෙරේ.

### 5.1.4 ලියා හැරීම

මූල්‍ය වත්කම් අයකර ගැනීමේ ක්‍රියාවලිය බැංකුව විසින් නවතා දමා ඇත්නම් පමණක් එම මූල්‍ය වත්කම් කොටස් වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම ලියා හරිනු ලැබේ. ලියා හැරීමට නියමිත වටිනාකම සමුච්චිත අලාභ ප්‍රතිපාදනයට වඩා විශාල වන්නේ නම්, පළමුව ඒ අතර ඇති වෙනස ප්‍රතිපාදනයට අමතරව එක් කිරීමක් ලෙස සලකනු ලබන අතර ඉන් අනතුරුව දළ ධාරණ අගයට සාපේක්ෂව එය යොදනු ලැබේ, ඉන් පසුව සිදු කෙරෙන අයකර ගැනීම් කිසිවක් වේ නම් ණය අලාභ වියදම්වලට බැර කරනු ලැබේ.

### 5.1.5 ගළපන ලද හෝ සංශෝධිත ණය

ණය ගැනුම්කරුගේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඇපකරවල අයිතිය අත්පත් කර ගැනීම හෝ ඇපකර රැස්කර ගැනීම බලාත්මක කිරීම වෙනුවට බැංකුව ඇතැම් අවස්ථාවලදී ණය පහසුකමට අදාළ මුල් නියමයන් සම්බන්ධයෙන් සංශෝධනය කිරීම් හෝ සහන සැලසීම් සිදු කරයි. ගැනුම්කරුගේ වත්මන් හෝ අනාගතයේ අපේක්ෂිත මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් එවැනි ණය සහන හෝ සංශෝධන ලබා දෙන විට බැංකුව විසින් එවැනි ණයක් ගැළපුම් කිරීම සඳහා සලකා බලනු ලබන අතර, ගැනුම්කරු මූල්‍යමය වශයෙන් යහපත් තත්ත්වයක සිටී නම් බැංකුව එම කටයුතු සඳහා එකඟ නොවනු ඇති මෙම මූල්‍ය දුෂ්කරතා ප්‍රකට කරණ සාධක අතරට ගිවිසුම් පැහැර හැරීම හෝ ණය අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවධානයට ලක් කරන ලද වෙනත් සැලකිය යුතු තරමේ ගැටළු ආදිය ඇතුළත් වේ. සහන යටතේ ගෙවීමේ වැඩපිළිවෙළට දීර්ඝ කිරීම් හා නව ණය කොන්දේසි වෙත එකඟ වීමද ඇතුළත් විය හැක.

අදාළ කොන්දේසි පිලිබඳව යළි එකඟතාවයකට පැමිණීමෙන් අනතුරුව, කවර හෝ හානිකරණයක් වේ නම් එය කොන්දේසි සංශෝධනය කිරීමට පෙර පැවැති මුල් සඵලදායී වාර්ෂික පොලී අනුපාතය ඇසුරින් ගණනය කෙරේ, අනාගතයේදී ණය ආපසු ගෙවීම් අඛණ්ඩව සිදු වනු ඇති බව සහතික කරනු පිණිස ගැළපුම් කිරීම යටතේ ගෙවීමේ පහසුකම් සැලසූ ණය අධීක්ෂණයට ලක් කිරීම බැංකුවේ ප්‍රතිපත්තිය වේ. හඳුනාගැනීම අවසන් කිරීමේ තීරණ හා 2 හා 3 අදියර යටතේ වර්ගීකරණය කිරීම් සිද්ධියෙන් සිද්ධිය සලකා බැලීමේ පදනම මත සිදු කෙරේ. එම ක්‍රමවේද මගින් කිසියම් ණයකට අදාළ අලාභයක් ඇති බව හඳුනා ගැනෙන්නේ නම් එය හෙළිදරව් කොට එය අයකර ගන්නා හෝ ලියාහරින තෙක් 3 අදියරේ හානිකරණයට ලක් කරන ලද සහන යටතේ ගෙවීමේ පිළිවෙළ සැලසූ ණයක් ලෙස කළමනාකරණය කරනු ලැබේ. කිසියම් ණයකට අදාළ කොන්දේසි වෙනස් කර ඇති හෝ සංශෝධනය කර ඇති නමුත් හඳුනා ගැනීමෙන් ඉවත් කොට නොමැති විට, මෙහි (21.3) සටහනෙහි දක්වා ඇති පරිදි ණය අවදානම ආශ්‍රිත සැලකිය යුතු ඉහළ යාමක් වේද යන්න හඳුනා ගනු පිණිස එය නැවත තක්සේරු කිරීමටද බැංකුව පියවර ගනියි එමෙන්ම, එකී වත්කම් 3 අදියර යටතේ වර්ගීකරණය කළ යුතුද යන්නද බැංකුව සලකා බලයි.

### 5.1.6 පූර්වාවරණය කළ වත්කම්

පූර්වාවරණය කරන ලද වත්කම්, ණය සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් බේරුම් කිරීම වෙනුවෙන් අත්කරගත් දේපළ නියෝජනය කරන අතර, පූර්වාවරනය කරන ලද වත්කම් වල වර්තමාන වෙළඳපොල වටිනාකම සහ අදාළ ණය මුදලේ හිඟහිටි මුදල අතර පවතින අඩුව එකී දේපළ අත්කරගත් වර්ෂය තුළ ආදායම් ප්‍රකාශයේ ණය පියවීමේදී ඇති වන ණය අලාභ සඳහා වන ප්‍රතිපාදනයක් සේ හඳුනාගනු ලබයි.

### 5.1.7 මූල්‍ය උපකරණ හිලවු කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර හඳුනාගනු ලැබූ ප්‍රමාණ හිලව් කිරීම සඳහා කටයුතු කරන අවස්ථාවේ බලාත්මක යම් නෛතික අයිතියක් ඇත්නම් සහ ශුද්ධ පදනම මත පියවීමට හෝ වත්කම් උපලබ්ධි කොට බැරකම පියවීමට එකවර ක්‍රියාකිරීමට යම් අපේක්ෂාවක් ඇතිනම් පමණක් අදාළ ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ. ගෙවීම් පැහැර හැරීමකදී සියළුම බැරකම් එකවර පියවීම පිළිබඳ ගිවිසුම් සම්බන්ධයෙන් මෙය පොදුවේ අදාළ නොවන බැවින් අදාළ වත්කම් හා බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දළ වශයෙන් දක්වනු ලැබ ඇත.

## 5.2 පිරියත හා උපකරණ

වත්කම් හා බැඳුනු අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ වල පිරිවැයෙන් ඒවායේ දෛනික සේවා කිරීමේ පිරිවැය අත්හැර උපචිත ක්ෂය කිරීම් හා වටිනාකමේ උපචිත හානිකරණ අඩු කොට දක්වනු ලබයි. අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවකාලයේ වෙනස්වීම් යෝග්‍ය පරිදි ක්ෂය කිරීම් කාල පරිච්ඡේදය හෝ ක්‍රමවේදය වෙනස් කිරීම මගින් ගිණුම්ගත කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවලදී වෙනස්කම් සේ සලකනු ලබයි. වත්කම් භාවිතය සඳහා පවත්නා අවස්ථාවේ සිට ආරම්භ කර ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය පුරා ක්ෂයවීම සරල මාර්ග පදනමින් ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලබයි. කෙසේ වෙතත්, ඉඩම් ක්ෂය කිරීමට ලක් නොකෙරේ, තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි වේ:

| | |
|---|---|
| ගොඩනැගිලි වාර්ෂිකව | 20 අවුරුදු |
| පරිගණක උපකරණ වාර්ෂිකව | 05 අවුරුදු |
| කාර්යාල උපකරණ වාර්ෂිකව | 05 අවුරුදු |
| මෝටර් රථවාහන වාර්ෂිකව | 05 අවුරුදු |
| ගෘහ භාණ්ඩ වාර්ෂිකව | 06 අවුරුදු |
| යකඩ සේප්පු වාර්ෂිකව | 10 අවුරුදු |
| බෙදුම් හා සවි කිරීම් වාර්ෂිකව | 05 අවුරුදු |

පසුව සිදුකරනු ලබන වියදම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුව වෙත ගලා ඒමට සම්භාවතාවක් පවතින විට එම වියදම් ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.
දේපල, පිරියත හා උපකරණය යටතට ගැනෙන කිසියම් අයිතමයක ධාරණ අගය එය බැහැර කිරීමේදී හෝ එය භාවිත කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් අපේක්ෂා කළ නොහැකි විට හඳුනා ගැනීම අවසන් කෙරේ කිසියම් වත්කමක් හඳුනා ගැනීම අවසන් කිරීමකදී ඇති වන (බැහැර කිරීමේ ශුද්ධ ආදායම සහ වත්කමෙහි ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කරනු ලබන) ලාභය හෝ අලාභය අදාළ වත්කම හඳුනා ගැනීම අවසන් කරනු ලැබූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් මෙහෙයුම් (-) ආදායම්/වියදම් යටතේ දක්වනු ලබයි.
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ඒවායේ පිරිවැය මත දක්වනු ලැබේ ඒවා, ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව සෘජුව දරන ලදුව ප්‍රාග්ධනීකරණයට නියමිත ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

## 5.3 කල්බදු

මෙම ප්‍රතිපත්තිය 2019 ජනවාරි 1 වන දින හෝ ඊට පසු ඇති කරගත් (හෝ වෙනස් කළ) ගිවිසුම් සඳහා අදාළ වේ. කොන්ත්‍රාත්තුවක් ආරම්භයේදී, බැංකුව විසින් කොන්ත්‍රාත්තුවක් කල්බදුවක් ද නැතහොත් එහි කල්බදුවක් අන්තර්ගත ද යන්න තක්සේරු කරනු ලබයි. ගෙවීමක් වෙනුවෙන් නිශ්චිත කාල සීමාවක් සඳහා කිසියම් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය ලබා දෙන්නේ නම් එකී කොන්ත්‍රාත්තුවක් කල්බදුවක් හෝ කල්බදුවක් අන්තර්ගත කොන්ත්‍රාත්තුවක් ලෙස සැලකේ. හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමේ අයිතිය කොන්ත්‍රාත්තුවක් මගින් ලබා දෙන්නේද යන්න තක්සේරු කිරීම සඳහා, බැංකුව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිය 16 හි කල්බදු පිළිබඳ අර්ථ දැක්වීම අනුගමනය කරයි.

### 5.3.1.බැංකුව බදුකරු ලෙස

කල්බදු සංරචකයක් සහිත ගිවිසුමක් ආරම්භයේදී හෝ වෙනස් කිරීමේදී, බැංකුව විසින් එක් එක් කල්බදු සංරචකයේ ස්වාධීන මිල මත පදනම්ව කොන්ත්‍රාත්තුවේ ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ කෙසේ වෙතත්, ශාඛා සහ කාර්යාල පරිශ්‍ර කල්බදු සඳහා, කල්බදු සහ කල්බදු නොවන සංරචක සහ ගිණුම් තනි කල්බදු සංරචකයක් ලෙස වෙන් නොකිරීමට බැංකුව තීරණය කර ඇත.

කල්බදු ආරම්භක දිනයේදී බැංකුව වත්කමක භාවිතයේ අයිතිය සහ කල්බදු වගකීම හඳුනා ගනී. භාවිතයේ අයිතිය සම්බන්ධයෙන් වත්කම මුලින්ම පිරිවැයට අනුව මනිනු ලබන අතර, එයට ආරම්භක දිනයේදී හෝ ඊට පෙර සිදු කරන ලද ඕනෑම කල්බදු ගෙවීමක් සඳහා ගලපන ලද කල්බදු වගකීමේ ආරම්භක මුදල, දරන ලද ඕනෑම මූලික සෘජු පිරිවැයක් සහ ශාඛා හෝ කාර්යාල පරිශ්‍රයන් සඳහා කරන ලද ඕනෑම වැඩිදියුණු කිරීමක් ගලවා දැමීම සහ ඉවත් කිරීම සඳහා වන පිරිවැය ඇස්තමේන්තුවක් ඇතුළත් වේ.

කල්බදු කාලය අවසන් වන තෙක්, වත්කමේ භාවිතයේ අයිතිය සරල මාර්ග ක්‍රමය භාවිතයෙන් ක්ෂය කරනු ලැබේ. ඊට අමතරව, කිසියම් හානිකරණ අලාභයක් සිදුවුවහොත් වත්කමේ භාවිතයේ අයිතිය වරින් වර අඩු කරනු ලබන අතර, කල්බදු වගකීම නැවත මිනුම් කිරීම සඳහා ගලපනු ලැබේ.

කල්බදු වගකීම එහි ආරම්භක දිනයේදී නොගෙවන ලද කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව මූලිකව මනිනු ලබන අතර, කල්බදුවේ අදාළ පොලී අනුපාතය භාවිතා කර වට්ටම් කරනු ලැබේ. එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, බැංකුවේ වර්ධක ණය ගැනීමේ අනුපාතය භාවිතා කරයි සාමාන්‍යයෙන් බැංකුව එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරයි.

බැංකුව විවිධ බාහිර ප්‍රභවයන්ගෙන් ලබාගත් ණය ගැනීම් විශ්ලේෂණය කිරීමෙන් එහි වර්ධක ණය ගැනීමේ අනුපාතය තීරණය කරන අතර කල්බදු නියමයන් සහ කල්බදු වත්කම් වර්ගය පිළිබිඹු කිරීම සඳහා යම් යම් ගැලපීම් සිදු කරයි.

කල්බදු වගකීම් මිනුම් කිරීමේදී ඇතුළත් කර ඇති කල්බදු ගෙවීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- විචල්‍ය ගෙවීම්ද ඇතුළුව ස්ථාවර ගෙවීම්.
- ආරම්භක දිනයේ දර්ශකය හෝ අනුපාතය භාවිතා කර මුලින් මනිනු ලබන දර්ශකයක් හෝ අනුපාතයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම්.
- අවශේෂ වටිනාකම් සහතිකයක් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල් ප්‍රමාණයන්; සහ
- බැංකුව මිලදී ගැනීමේ විකල්පයක් යටතේ වත්කම මිලදී ගැනීමට ඉඩ තිබේ නම්, මිලදී ගැනීමේ මිල, බැංකුව කල්බදු කාලය දීර්ඝ කිරීමට ඉඩ තිබේ නම්, විකල්ප අලුත් කිරීමේ කාල පරිච්ඡේදයක් තුළ කල්බදු ගෙවීම් සහ බැංකුව කල්බදු නියමිත කාලයට පෙර අවසන් කිරීමට අදහස් නොකරන්නේ නම්, කල්බදු කාලයට පෙර අවසන් කිරීම වෙනුවෙන් අදාළ දඩ මුදල්.

කල්බදු වගකීම සඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ. මෙම කල්බදු වගකීම දර්ශකයක හෝ අනුපාතයක වෙනසක් හේතුවෙන් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් ඇති වූ විට, අවශේෂ වටිනාකම් ඇපකරයක් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල පිළිබඳ බැංකුවේ ඇස්තමේන්තුවේ වෙනසක් තිබේ නම්, බැංකුව මිලදී ගැනීමක්, කාල පරිච්ඡේදය දිගු කිරීමක් හෝ අවසන් කිරීමේ විකල්පයක් ක්‍රියාත්මක කරන්නේද යන්න පිළිබඳ තක්සේරුව වෙනස් කළහොත් හෝ සංශෝධිත විචල්‍ය ස්ථාවර කල්බදු ගෙවීමක් තිබේ නම් එය නැවත මනිනු ලැබේ.

මේ ආකාරයෙන් කල්බදු වගකීම නැවත ගණනය කිරීමේදී භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කමේ ධාරණ අගය අනුරූප ගැලපීමක් සිදු කිරීම හෝ භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කමේ ධාරණ අගය ශුන්‍යය දක්වා අඩු කර ඇත්නම් ලාභ හෝ අලාභයේ සටහන් කිරීම සිදුකරනු ලැබේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ බැංකුව විසින් වත්කම් භාවිතයේ අයිතිය වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන අතර අනෙකුත් වගකීම් යටතේ කල්බදු වගකීම් ඉදිරිපත් කරයි.

#### 5.3.1.1. කෙටි කාලීන කල්බදු සහ අඩු වටිනාකමක් ඇති කල්බදු වත්කම්

අඩු වටිනාකමක් ඇති වත්කම් සහ භාවිතයේ අයිතිය කෙටි කාලීනව පවතින කල්බදු වත්කම් සහ කල්බදු වගකීම් හඳුනා නොගැනීමට බැංකුව තීරණය කර ඇති මෙම කල්බදුවලට අදාළ කල්බදු ගෙවීම් නියමිත කල්බදු කාලය තුළ සරල මාර්ග පදනමක් මත වියදමක් ලෙස බැංකුව හඳුනා ගනී.

### 5.3.2. බැංකුව බදු හිමිකරුවෙකු ලෙස

කල්බදු සංරචකයක් සහිත ගිවිසුමක් ආරම්භයේදී හෝ වෙනස් කිරීමේදී, බැංකුව විසින් එක් එක් කල්බදු සංරචකයේ ස්වාධීන මිල මත පදනම්ව කොන්ත්‍රාත්තුවේ ගෙවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

බැංකුව කල්බදු හිමිකරුවෙකු වශයෙන් කටයුතු කරන විට, කල්බදුව ආරම්භයේදීම එය මූල්‍ය කල්බද්දක් ද නැතහොත් මෙහෙයුම් කල්බද්දක් ද යන්න තීරණය කරයි.

එක් එක් කල්බදුව වර්ගීකරණය කිරීම සඳහා, බැංකුව විසින් කල්බදුව මගින් අදාළ වත්කමේ හිමිකාරිත්වයට ආනුශාංගික වශයෙන් පවතින අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් ලෙස මාරු කරන්නේද යන්න පිළිබඳ සමස්ත තක්සේරුවක් සිදු කරනු ලබයි. එසේ අදාළ වත්කමේ හිමිකාරිත්වයට ආනුශාංගික වශයෙන් පවතින අවදානම් සහ ප්‍රතිලාභ සියල්ල ප්‍රමාණවත් ලෙස මාරු කරන්නේ එය මූල්‍ය කල්බදුවක් වන අතර එසේ නොවේ නම් එය මෙහෙයුම් කල්බදුවකි. මෙම තක්සේරුවේ කොටසක් ලෙස කල්බදුව අදාළ බදු වත්කමේ ආර්ථික ජීවකාලයේ ප්‍රධාන කොටසක් සඳහාද යන්න වැනි ඇතැම් දර්ශක බැංකුව සලකා බලයි.

ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 9 හි සඳහන් හඳුනාගැනීම් අවසන් කිරීමේ සහ හානිකරණ අවශ්‍යතා කල්බදු ගිවිසුමේ ශුද්ධ ආයෝජනය සඳහා බැංකුව අදාළ කරයි. ඊට අමතරව. කල්බදු ගිවිසුමේ දළ ආයෝජනය ගණනය කිරීමේදී භාවිතා කරනු ලබන ඇස්තමේන්තුගත සහතික නොකළ අවශේෂ වටිනාකම් බැංකුව නිරන්තරයෙන් සමාලෝචනය කරයි.

### 5.4. අස්පෘශ්‍ය වත්කම්

පරිගණක මෘදුකාංගවල වටිනාකම බැංකුවේ අනෙකුත් අස්පෘශ්‍ය වත්කම් අතරට ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කමක් එහි වියදම විශ්වසනීය ලෙස මැනිය හැකි වීමේදී හා එමගින් ඇතිවය හැකි අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ බැංකුවට ගලා ඒමේ හැකියාව ඇතිවීමේදී එම වත්කම හඳුනාගනී.

වෙන වෙනම අත්පත් කර ගනු ලැබෙන අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනා ගැනීමේදී පිරිවැය මත මිනුම්ගත කෙරේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව අස්පෘශ්‍ය වත්කම් පිරිවැය අඩුකරන ලද ඕනෑම සමුච්චිත ක්‍රමක්ෂයක් සහ ඕනෑම සමුච්චිත හානිකරණ අලාභයක් මත ගෙන යනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනයට ගත හැකි ආයු කාල නිශ්චිත හෝ අවිනිශ්චිත වශයෙන් තක්සේරු කෙරේ. නිශ්චිත ආයු කාල සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායෙහි ආර්ථිකමය වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි ආයු කාලයට සාපේක්ෂව ක්‍රමක්ෂය කරනු ලැබේ. නිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් සඳහා ක්‍රමක්ෂ කාලය සහ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමවේදය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේදී සමාලෝචනයට භාජනය කෙරේ. වත්කම්වල අන්තර්ගතව ඇති අපේක්ෂිත ප්‍රයෝජනවත් කාලසීමාවන්හි හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පරිභෝජන රටාවෙහි වෙනස්කම් උචිත පරිදි ක්‍රමක්ෂ කාලය හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් හෝ ගිණුම්ගත කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් ලෙස සලකනු ලබයි. නිශ්චිත කාල සීමාවක් සහිත අස්පෘශ්‍ය වත්කම් මත ක්‍රමක්ෂ වියදම ආදායම් ප්‍රකාශයෙහි වෙනම රේඛීය අයිතමයක් ලෙස දක්වනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් කාලසීමාව තුළ ඒවායේ වියදම ඒවායේ අවශේෂ වටිනාකමට ලියා හැරීම සඳහා සරල මාර්ග පදනම යොදාගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ:

- පරිගණක මෘදුකාංග වසර 3

### 5.5. මූල්‍ය නොවන වත්කම් හානිකරණය

කිසියම් වත්කමක් හානිකරණයට ලක් වීමේ සලකුණු පවතින්නේද යන්න බැංකුව සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරයි. එවැනි යම්කිසි සලකුණක් තිබෙන විට හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරණ පරීක්ෂණයක් අවශ්‍ය වූ විට බැංකුව අදාළ වත්කමෙහි අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරයි.

වත්කමක හෝ මුදල් උත්පාදන ඒකකයක (CGU) ආපසු අයකර ගත හැකි මුදල යනු එහි භාවිතයේ ඇති වටිනාකම හෝ විකුණුම් පිරිවැය අඩු කිරීමෙන් පසු එහි සාධාරණ වටිනාකම යන අගයන් අතරින් වැඩි වටිනාකමයි. භාවිතයේ ඇති වටිනාකම තීරණය කිරීම සඳහා, අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කර පසුව වර්තමාන වෙළඳපල තක්සේරු මුදල්වල කාල වටිනාකම සහ වත්කම්-නිශ්චිත අවදානම් පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලැබේ.

හානිකරණ පරීක්ෂාව සඳහා තනි තනිව පරීක්ෂා කළ නොහැකි වත්කම්, අනෙකුත් වත්කම්වල හෝ මුදල් උත්පාදන ඒකකයකයන්හි මුදල් ගලා ඒම් වලින් බොහෝ දුරට ස්වාධීන වන අඛණ්ඩ භාවිතයෙන් මුදල් ගලා ඒම් ජනනය කරන කුඩාම වත්කම් කාණ්ඩයට කාණ්ඩගත කරනු ලබන අතර මෙහෙයුම් අංශ සීමාව පරීක්ෂාවකට යටත් වේ.

වත්කමක ධාරණ අගය එහි අයකර ගත හැකි මුදල අභිබවා යන්නේ නම් හානිකරණ අලාභයක් හඳුනා ගනු ලැබේ. හානිකරණ අලාභ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනී.

### 5.6 මූල්‍ය ඇප

"මූල්‍ය ඇප" යනු ණය උපකරණයේ නියමයන්ට අනුකූලව නියමිත පරිදි යම්කිසි ගෙවීමක් සිදුකිරීමට විශේෂිත ණයකරුවකු අපොහොසත් වීම හේතුවෙන් ඇති වන අලාභය දරන්නාට ප්‍රතිපූරණය කිරීම සඳහා ගෙවීමට සිදුවන විශේෂිත ගෙවීම් සඳහා බැංකුවට අවශ්‍ය වන ගිවිසුම් වේ "ණය වගකීම්" යනු පූර්වයෙන් නිශ්චය කරන ලද නියමයන් හා කොන්දේසි යටතේ ණය ලබා දීමට ඇති ස්ථාවර බැඳීම වේ.

වෙළඳපොල පොලී අනුපාතයට වඩා පහළ අගයක ණයක් ලබා දීම සඳහා වන මූල්‍ය ඇප හෝ බැඳීම නිසා ඇති වන වගකීම් මූලික වශයෙන් සාධාරණ අගය මත ගණනය කෙරෙන අතර මූලික සාධාරණ අගය ඇපයේ කාල සීමාව හෝ බැඳීම මත ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමක් සිදු විය හැකි විට මෙම වගකීම නිරවුල් කිරීම සඳහා වන ඕනෑම අපේක්ෂිත ගෙවීමක වර්තමාන අගය සහ මෙම ක්‍රමක්ෂය කරන ලද ප්‍රමාණයේ ඉහළ මට්ටමට පසුව වගකීම රැගෙන යනු ලැබේ වෙළඳපොල පොලී අනුපාතයට වඩා පහළින් ණයක් සැපයීම සඳහා වන මූල්‍ය ඇප හා බැඳීම් වෙනත් වගකීම්වල ඇතුළත් කොට ඇත.

### 5.7 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම

#### 5.7.1 නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 - "සේවක ප්‍රතිලාභ" යන්නෙහි නිර්වචනය කොට ඇති පරිදි නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු නිශ්චිත දායකත්ව සැලසුමක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.

#### 5.7.2 පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික පනතට අනුව ගිණුම්වල ප්‍රතිපාදන සලසනු ලබයි.

මෙම අරමුදල යටතේ වන සම්පූර්ණ වගකීම තක්සේරු කරනු පිණිස සෑම වසරක්ම අවසානයේදී ආයුගණන තක්සේරුවක් සිදු කෙරේ. 2022 දෙසැම්බර් 31 දිනට මෙම තක්සේරුව සුදුසුකම්ලත් ආයුගණනයින් ඇක්චූරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්.) සමාගම විසින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කර සිදුකරන ලදී.

ආයුගණන අලාභ හා ලාභ හඳුනා ගැනීම: සැලසුමට අනුව බැංකුවේ වගකීම් ගණනය කිරීමේදී පැන නගින මුළු ආයුගණන ලාභ සහ අලාභ බැංකුව ඒවා සිදු වන කාලසීමාව තුළ අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනා ගනී.
අරමුදල්කරණ සැලසුම්: පාරිතෝෂික බැඳීම සඳහා බාහිරින් අරමුදල් සම්පාදනය නොකෙරේ.

### 5.7.3 නිශ්චිත විශ්‍රාම දායකත්ව සැලසුම

"නිශ්චිත දායකත්ව සැලසුමක් යනු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (19) "සේවා නියුක්ති ප්‍රතිලාභ" හි නිශ්චිතව සඳහන් ආකාරයට යම් කිසි ආයතනයක් වෙනත් ආයතනයකට (අරමුදලක්) නිශ්චිත දායක මුදලක් ගෙවනු ලබන සහ සේවකයින්ගේ වත්මන් සහ පූර්ව කාල පරිච්ඡේදවල සේවාවන්ට අදාළ සියලුම සේවක ප්‍රතිලාභ ගෙවීමට අරමුදල සතුව ප්‍රමාණවත් වත්කම් නොමැති නම් තවදුරටත් දායක මුදල් ගෙවීමට නීතිමය හෝ වාස්තවික බැඳීමක් නොමැති පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුමකි.
නිශ්චිත දායකත්ව සැලසුමකට ගෙවිය යුතු දායකත්වය සේවකයින් විසින් බැංකුවට ලබා දී ඇති සේවයට සමානුපාතික වන අතර ඒවා ගෙවීමට තිබෙන සෑම අවස්ථාවකදීම "පුද්ගලික වියදම්" යටතේ සටහන් කරනු ලැබෙයි නොගෙවූ දායකත්වයන් වගකීම් ලෙස සටහන් වෙයි

1 සේවක අර්ථසාධක අරමුදල

බැංකුව සහ සේවකයන් පිළිවෙළින් 15% ක් සහ 10%ක සේවක අර්ථසාධක අරමුදල වෙත දායක මුදල් ලෙස ගෙවයි

2 සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

බැංකුව සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 3% ක දායකත්වයක් ලබා දේ.

## 5.8 ප්‍රතිපාදන

යම් කිසි අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට යම් වර්තමාන වගකීමක් (නෛතික හෝ වාස්තවික) ඇති විට සහ වගකීම නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත කෙරෙන සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි විටෙක සහ වගකීමේ ප්‍රමාණයට විශ්වසනීය ඇස්තමේන්තුවක් සකස් කළ හැකි විටෙක ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. කවර හෝ ප්‍රතිපාදනයකට අදාළ වන වියදම් ලබා දෙන ලද ඕනෑම ප්‍රතිපූර්ණයක් වේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ.

## 5.9 ආදායම් හා වියදම් හඳුනා ගැනීම

### 5.9.1 පොලී ආදායම් සහ වියදම්

ඵලදායී පොලී අනුපාත ක්‍රමවේදය භාවිතා කරමින් ලාභය හෝ අලාභය තුළ පොලී ආදායම සහ වියදම හඳුනා ගැනේ. ඵලදායී පොලී අනුපාතය යනු මූල්‍ය වත්කමේ හෝ වගකීමේ අපේක්ෂිත ආයු කාලය (උචිත අවස්ථාවලදී කෙටි කාලයක්) හරහා ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් සහ ලැබීම් මූල්‍ය වත්කමේ හෝ වගකීමේ ධාරණ අගයට නිවැරදිව වට්ටම් කරන අනුපාතයයි. ඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී, බැංකුව මූල්‍ය උපකරණයේ සියලුම ගිවිසුම්ගත නියමයන් සැලකිල්ලට ගෙන අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරන අතර එහිදී අනාගත ණය පාඩු සැලකිල්ලට නොගනී.

ඵලදායී පොලී අනුපාතයේ අවියෝජනීය අංගයක් වන සියලුම ගනුදෙනු පිරිවැය සහ ගාස්තු සඵලදායී පොලී අනුපාතය ගණනය කිරීමේදී අදාළ කර ගනී. මූල්‍ය වත්කමක් හෝ වගකීමක් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම සඳහා සෘජුවම අදාළ වන වර්ධක පිරිවැය ගනුදෙනු පිරිවැයට ඇතුළත් වේ.
ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති පොලී ආදායම සහ වියදමට ඵලදායී පොලී පදනමක් මත ගණනය කරන ලද ක්‍රමක්ෂිත පිරිවැයට අනුව ගණනය කරනු ලබන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා වන පොලිය ඇතුළත් වේ.
අවදානම් කළමනාකරණ අරමුණු සඳහා තබා ඇති අනෙකුත් ව්‍යුත්පන්නයන්හි සාධාරණ වටිනාකම් වෙනස්වීම් සහ ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකමකින් ගෙන යන අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම්, ලාභය හෝ අලාභය ඔස්සේ සාධාරණ වටිනාකමකින් අනෙකුත් මූල්‍ය උපකරණවලින් ලැබෙන ශුද්ධ ආදායම ලෙස ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ.

සාධාරණ වටිනාකමක් ඔස්සේ වෙනත් විස්තීර්ණ ආදායමක් ලෙස වර්ගීකරණය කරන ලද ආයෝජන සුරැකුම්පත් මත උපයන පොලිය, ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ගණනය කරනු ලබන අතර එය ආයතනයක මුළු පොලී ආදායමට ඇතුළත් වේ.

### 5.9.2 ගාස්තු හා කොමිස් ආදායම

බැංකුව විසින් ගනුදෙනුකරුවෙන් වෙත ලබා දෙන පුළුල් පරාසයක වූ සේවාවන් මගින් ගාස්තු හා කොමිස් ආදායම උපයයි ගාස්තු ආදායම පහත කාණ්ඩවලට බෙදිය හැක:
කිසියම් නිශ්චිත කාල සීමාවක් තුළ සපයන සේවාවන් මගින් උපයන ගාස්තු ආදායම නිශ්චිත කාල සීමාවක් තුළ සපයනු ලබන සේවාවන් වෙතින් උපයා ගන්නා ගාස්තු ආදායම එම කාල සීමාවට අදාළව උපචිත කෙරේ. මෙම ගාස්තු ආදායමට කොමිස් ආදායම, ණය සේවා ගාස්තු, පරීක්ෂා කිරීමේ ගාස්තු හා ගනුදෙනුකරුවන් වෙතින් අයකර ගනු ලබන ලිපිලේඛන ගාස්තු ආදිය ඇතුළත් වේ.
ලබා ගැනීමට හැකියාව ඇති ණය සඳහා ණය බැඳීම් ගාස්තු සහ වෙනත් ණයට සම්බන්ධ ගාස්තු විලම්බනය කර (යම්කිසි වර්ධනීය පිරිවැයක් ඇත්නම් එය සමග) ණය මත පවතින ඵලදායී පොලී අනුපාතය සඳහා කරන ගැලපීමක් ලෙස හඳුනා ගැනේ යම්කිසි ණයක් ලබා ගැනීමට ඇති හැකියාව අඩු නම් ණය බැඳීම් ගාස්තු සරල මාර්ග පදනම යටතේ බැඳියාව පවතින කාල සීමාව තුළ හඳුනා ගනු ලැබේ.

### 5.9.3 වෙළඳාමෙන් ලැබෙන ශුද්ධ ලාභ/ (අලාභ)

මෙම ආදායම වෙළඳාම/ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව මිනුම්කරන ලද වත්කම් වලට අදාළ පාඩු අඩු කරන ලද ලාභවලින් සමන්විත වන අතර සියලු උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ සාධාරණ වටිනාකම් වෙනස්කම් ඊට ඇතුළත් වේ

### 5.9.4. දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ / අලාභ

දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන කිසියම් ලාභයක් හෝ අලාභයක් විකිණීම සිදුවන කාල සීමාව තුළ හඳුනාගනු ලබන අතර එය ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

### 5.10 බදුකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (12) "ආදායම් බදු" අනුව බදු වියදම යනු ප්‍රවර්තන හා විලම්බිත බදුකරණයට අදාළ කාල සීමාව සඳහා ලාභ හා අලාභ තීරණය කිරීමේදී ඇතුළත් වන මුළු ප්‍රමාණයයි. ආදායම් බදු වියදම සෘජුව "ස්කන්ධය" සහ "වෙනත් විස්තීර්ණ ආදායම්" යන අයිතමයන්ට අදාළ වන ප්‍රමාණයට හැර ස්කන්ධය හෝ වෙනත් විස්තීර්ණ ආදායම ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

### 5.10.1 ප්‍රවර්තන බදු

බදු අධිකාරය වෙත ගෙවීමට තිබෙන හෝ ආපසු අයකර ගැනීමට තිබෙන ප්‍රමාණය මත පවතින වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ. බදු ප්‍රමාණය ගණනය කිරීමට භාවිත කරන බදු අනුපාත සහ නීති වාර්තාකරණ දිනට ක්‍රියාත්මක හෝ ප්‍රමාණවත් පරිදි පනවා ඇතැයි අපේක්ෂිත ඒවා වේ.
ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ එයට සිදුකරන ලද සංශෝධන හා මූල්‍ය ප්‍රකාශනවලට යොදා ඇති 15 වැනි සටහනෙහි දක්වා ඇති අනුපාතිකවලට අනුව බදුකරණය සඳහා ගැලපුම් කරන ලද වසර සඳහා වන ලාභය මත බදුකරණය සඳහා වන ප්‍රතිපාදන පදනම් වේ.

### 5.10.2 විලම්බිත බදු

විලම්බිත බදු මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වන වත්කම් සහ වගකීම් වල බදු පදනම සහ ඒවායේ ධාරණ අගයන් අතර වාර්තා කරන දිනයේදී පවතින තාවකාලික වෙනස මත හඳුනාගැනේ. පහත සඳහන් කාරණා වලදී හැර සියළුම බදු අය කෙරෙන තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු හඳුනා ගැනේ:

- විලම්බිත බදු වගකීම ඉස්මතු වන්නේ මූලික අවස්ථාවේදීම කීර්තිනාමය හඳුනාගැනීමෙන් හෝ ව්‍යාපාරික සංකලනයක් නොවන වත්කමක් හෝ වගකීමක් තුළින් සිදුවන ගනුදෙනුවක් මගින් සහ එකී ගන්දෙනුව සිදුවන අවස්ථාවේ ගිණුම්කරණ ලාභයටවත් බදු ගෙවිය යුතු ලාභයටවත් බලපෑමක් නොවන විට,
- පරිපාලිත සමාගම්වල කරන ලද ආයෝජනවලට අදාළ බදු අයකල හැකි තාවකාලික වෙනස්කම්වලට අදාළව එම තාවකාලික වෙනස්කම්වල ප්‍රවර්තනයෙහි කාල නිර්ණය කිරීම පාලනය කළ හැකි අවස්ථාවල සහ තාවකාලික වෙනස පුරෝකථනය කළ හැකි අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවක් නොමැති අවස්ථාවලදී.

පහත සඳහන් අවස්ථාවලදී හැර, මෙම සියළුම අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතයට නොගත් බදු බැර සහ බදු අලාභ පියවා ගැනීම සඳහා බදු අය කළ හැකි ලාභය ලබා ගත හැකි නම් සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතයට නොගත් බදු බැර ඉදිරියට ගෙන යාම සහ භාවිතයට නොගත් බදු අලාභ සඳහා විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ:

- අඩු කළ හැකි තාවකාලික වෙනසට අදාළ විලම්බිත බදු වත්කම් යම්කිසි ගනුදෙනුවකදී ව්‍යාපාර සම්බන්ධයෙන් නොමැති වත්කමක් හෝ වගකීමක් ලෙස මූලිකව හඳුනාගෙන ඇති අවස්ථාවක දී සහ ගනුදෙනු සිදුකරන අවස්ථාවේ ගිණුම්කරණ ලාභයට හෝ බදු අයකල හැකි ලාභයට හෝ අලාභයට බලනොපාන අවස්ථාවකදී

- පරිපාලිත සමාගම්වල කරන ලද ආයෝජනවලට අදාළ බදු අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වලට අදාළව තාවකාලික වෙනස පුරෝකථනය කළ හැකි අනාගතය තුළ ප්‍රතිවර්තනය වීමට ඇති හැකියාවේ ප්‍රමාණය මත සහ තාවකාලික වෙනස උපයෝජනය කළ හැකි තත්ත්වයට බදු අය කළ හැකි ආදායම පවතින තත්ත්වයක් මත පමණක් විලම්බිත බදු වත්කම් හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම්වල ධාරණ අගය සෑම වාර්තාකරණ දිනකම සමාලෝචනය කරනු ලබන අතර එය විලම්බිත බදු වත්කම්වල සියල්ල හෝ කොටසක් උපයෝජනය කිරීම සඳහා ඉඩ සැලසෙන පරිදි ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් ඇති වීමට ඇති හැකියාව නොමැති වන ප්‍රමාණයට අඩු කරනු ලබයි හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනකම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කල හැකි ලාභය විසින් විලම්බිත බදු වත්කම් නැවත අය කර ගැනීමට හැකියාවැති ප්‍රමාණයට හඳුනාගනු ලබයි.
වාර්තාකරණ දිනට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත සහ නීති මත පදනම්ව, වත්කම් උපලබ්ධි වන හෝ වගකීම පියවන වර්ෂයේදී බලාත්මක වීමට අපේක්ෂිත බදු අනුපාත භාවිතා කරමින් විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලැබේ.

හිමිකම්වල සෘජුවම හඳුනාගත් අදාළ පවතින බදු සහ විලම්බිත බදු හිමිකම්වල යළි හඳුනාගන්නා අතර ආදායම් ප්‍රකාශය තුළ හඳුනා නොගනියි.
බදු අය කළ හැකි ආයතනයට සහ එම බදුකරණ අධිකාරියට අදාළ පවතින බදු වගකීම්වලට සහ විලම්බිත බදුවලට එදිරිව පවතින බදු වත්කම් හිලව් කිරීම සඳහා නෛතිකව බලාත්මක වන අයිතියක් තිබේ නම් විලම්බිත බදු වත්කම් සහ විලම්බිත බදු වගකීම් හිලව් කරනු ලැබේ.

### 5.10.3 මූල්‍ය සේවා මත වැට් බදු

බැංකුවේ අගය එකතු කළ බදු (VAT) වටිනාකම සඳහා පදනම වනුයේ බදු ගෙවීමට පෙර ගිණුම්කරණ ලාභය ගැලපීම, සේවක වැටුප් සහ හිමිකාරීත්වය දරන ස්ථාවර වත්කම් සඳහා ගණනය කරන ලද ආර්ථික ක්ෂයවීම් ය. අදාළ පිරිවැටුම මත පදනම්ව සමස්ත බැංකුව සඳහාම ලද එකතු කළ මුළු අගය වෙන් කළ යුතුයි සාමාන්‍ය වැට් බද්ද සහ මූල්‍ය සේවා සඳහා වන වැට් බද්දට අදාළ වන පිරිවැටුමට අනුකූලව පිරිවැටුම ප්‍රමාණනය කළ යුතුයි "මූල්‍ය සේවා මගින් දායක වන අගය එකතු කිරීම් " සිදු කළ යුත්තේ සාමාන්‍ය වැට් බද්ද සහ මූල්‍ය සේවා සඳහා වැට් බද්ද වෙන්කර හඳුනා ගනිමින් පිරිවැටුම් අනුපාතය යෙදීමෙනි නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා මුළු වැට් බදු වගකීම ලබා ගැනීම සඳහා මූල්‍ය සේවාවන්ට අදාළ කළ හැකි අගය එකතු කිරීම පිණිස 15/115 බදු අනුපාතය (මූල්‍ය සේවා සඳහා වැට් බදු අනුපාතය 15/115 සිට 18/118 දක්වා 2022 ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කිරීමට යෝජනා කර ඇත) යෙදිය යුතුය.

### 5.10.4 ලාභාංශ මත රඳවුම් බද්ද

බදු ගෙවීමෙන් පසු ලාභවලින් බෙදා හරින ලාභාංශ ලබන්නන් සඳහා 14% ක බදු අඩු කිරීමකට යටත් වේ (පුද්ගලයන් සඳහා 6% 12% සහ ඉතිරි 18% යන ප්‍රගතිශීලී අනුපාත යටතේ බදු අය කෙරේ) 2020 ජනවාරි මාසයට පෙර කාලපරිච්ඡේදයේ මෙන් නොව, ලාභාංශ සඳහා රඳවා ගැනීමේ බද්ද තවදුරටත් මූලාශ්‍රයේ බද්දක් නොවන අතර ලාභාංශ බෙදා හරින අවස්ථා-වේදී එය අඩු නොකෙරේ. ඒ වෙනුවට, කොටස් හිමියන්ට දළ වශයෙන් ලාභාංශ ලැබේ.
2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනතට අනුව, 2020 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලාභාංශ සඳහා වන රඳවා ගැනීමේ බද්ද අහෝසි කර ඇත. එබැවින්, 2020 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ලාභාංශ ආදායම තවදුරටත් රඳවා ගැනීමේ බද්දට යටත් නොවේ.

2021 අංක 10 දරන දේශීය ආදායම් සංශෝධන පනත හඳු-න්වාදීමත් සමඟ, ලැබුණු ලාභාංශවලින් ගෙවන ලාභාංශ අරමුදල්වල පිරිවැය අඩු කිරීමෙන් පසු ආදායම් බද්දෙන් නිදහ-ස් කෙරේ. ඊට අමතරව, නේවාසික සමාගමක් අනේවාසික පුද්ගලයෙකුට (සමාගමක් ඇතුළුව) ලාභාංශ ගෙවන්නේ නම්, එම ලාභාංශ ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන්ම නිදහස් වේ

### 5.10.5 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2022 ඔක්තෝබර් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව පනතට අනුකූලව මූල්‍ය සේවා සඳහා වැට් බද්ද සඳහා භාවිතා කරන මුළු අගය එකතු කිරීම මත පදනම්ව මූල්‍ය සේවා සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගණනය කරනු ලැබේ. මූල්‍ය සේවා සැපයීමෙන් ජනනය වන අගය එකතු කිරීම මත 2.5% ක අනුපාතයකින් මූල්‍ය සේවා සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවීමට බැංකුව බැඳී සිටී.

### 5.10.6 භෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනතෙහි 14 වැනි වගන්තියේ විධිවිධානවලට අනුව, 2013 අප්‍රේල් 1 වැනි දින සිට බලපැ-වැත්වෙන පරිදි භෝග රක්ෂණ බද්ද හඳුන්වා දෙන ලද අතර එය ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ගෙවිය යුතු වේ. වර්තමානයේදී, භෝග රක්ෂණ බද්ද, බදුවලට පසු ලාභයෙන් 1% ක් වශයෙන් ගෙවිය යුතු වේ
2013 අංක 12 දරන මුදල් පනතේ 14 වන වගන්තිය මගින් පහත සඳහන් පනත් මගින් පාලනය වන ආයතන මත බෝග රක්ෂණ බද්දක් පනවයි:

- 1988 අංක 30 දරන බැංකු පනත
- 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත
- 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ පනත

ඒ අනුව, 2013 අප්‍රේල් 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි බැංකුව විසින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙත තක්සේරු වර්ෂයක් සඳහා බදු ගෙවීමෙන් පසු ලාභයෙන් 1% ක ප්‍රමාණය-ක් ගෙවිය යුතුය,

### 5.10.7 අධිභාර බද්ද

2022 අංක 14 දරන අධිභාර බදු පනතට අනුව, 2020/21 තක්සේරු වර්ෂය සඳහා ප්‍රධාන සමාගමක සහ එහි අනුබද්ධිත සමාගම්වල මුළු බදු අය කළ හැකි ආදායම රුපියල් මිලියන 2,000 ඉක්මවන්නේ නම්▫ සමූහය තුළ සිටින සෑම සමාගමක්ම එහි බදු අය කළ හැකි ආදායමෙන් 25% ක අධිභාර බද්දක් ගෙවිය යුතුය.

### 5.10.8 ජා.මූ.වා.අ.ක.23 - ආදායම් බදු පිළියම් පිළිබඳ අවිනිශ්චිතතාව

ශ්‍රී.ලං.ගි.ප්‍රමිත 12 "ආදායම් බදු" යන ප්‍රමිතිය අදාළ කර ගැනීම කෙරෙහි බලපාන බදු පිළියම් ක්‍රම සම්බන්ධයෙන් අවිනිශ්චිතතා පවතින අවස්ථාවන්හිදී ආදායම් බදු ගිණුම්ගත කරන්නේ කෙසේද යන්න අර්ථ නිරූපණය පැහැදිළි කරයි. එය ශ්‍රී.ලං.ගි.ප්‍රමිත 12 හි විෂය පථයෙන් පරිබාහිර බදු හෝ අයකිරීම් සඳහා අදාළ නොවන අතර, ඒ තුළ ඇතැම් බදු පිළියම්වල ක්‍රමවලට අදාළ පොලී සහ දඩ මුදල් පිළිබඳ අවශ්‍යතා විශේෂයෙන් ඇතුළත් නොවේ. අර්ථ නිරූපණය විශේෂයෙන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පැහැදිළි කරයි:

- ආයතනයක් අවිනිශ්චිත බදු පිළියම් ක්‍රම පිළිබඳව වෙන වෙනම සලකා බලන්නේද යන්න.
- බදු බලධාරීන් විසින් බදු පිළියම් ක්‍රම පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් ආයතනයක් විසින් කරනු ලබන උපකල්පන
- ආයතනයක් බදු අය කළ හැකි ලාභය (බදු අලාභය), බදු පදනම්, භාවිතයට නොගත් බදු පාඩු, භාවිතයට නොගත් බදු බැර සහ බදු අනුපාත තීරණය කරන ආකාරය
- ආයතනයක් කරුණු සහ අවස්ථාවන්හි වෙනස්කම් පිළිබඳ සලකා බලන ආකාරය

එක් එක් අවිනිශ්චිත බදු පිළියම් තනි තනිව හෝ අනෙකුත් අවිනිශ්චිත බදු පිළියම් එකක් හෝ කිහිපයක් සමඟ ඒකාබද්ධව තක්සේරු කළ යුතුද යන්න බැංකුව තීරණය කරන අතර අවිනිශ්චිතතාවය විසඳන ආකාරය වඩාත් නිවැරදිව පුරෝකථනය කරන ප්‍රවේශය තෝරා ගනී.
ආදායම් බදු පිළියම්වලට අදාළ අවිනිශ්චිතතා හඳුනා ගැනීමේදී බැංකුව සැලකිය යුතු විනිශ්චයක් ඒ සඳහා යොදගෙනී.
එහි මෙහෙයුම්වල සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන, අර්ථ නිරූපණය එහි මූල්‍ය ප්‍රකාශනවලට බලපෑ ආකාරය බැංකුව විසින් ඇගයීමට ලක් කරන ලදී. අර්ථ නිරූපණය අනුග මනය කිරීමේදී, විශේෂයෙන් මාරු මිලකරණය සම්බන්ධයෙන් බැංකුවට කිසියම් අවිනිශ්චිත බදු තත්ත්වයන් තිබේද යන්න ඇගයීමට ලක් කරන ලදී. විවිධ බල ප්‍රදේශවල බැංකුවේ බදු ගොනු කිරීම්වලට මාරු මිලකරණයට අදාළ අඩු කිරීම් ඇතුළත් වන අතර, බදු බලධාරීන් විසින් එම බදු පිළියම් පිළිබඳව ප්‍රශ්න කරනු ලැබිය හැකිය.
බදු අනුකූලතාවය සහ මිල නියම කිරීමේ විශ්ලේෂණය මත පදනම්ව බැංකුව නිගමනය කළේ බදු බලධාරීන් විසින් එහි බදු ප්‍රතිකාර පිළිගනු ඇති බවයි. එම අර්ථ නිරූපණය බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලට බලපා නැත.

## 5.11 සාමාන්‍ය කොටස් මත ලාභාංශ

සාමාන්‍ය කොටස් මත ලාභාංශ වගකීමක් ලෙස හඳුනාගනු ලබන අතර බැංකුවේ කොටස් හිමියන් විසින් අනුමත කරනු ලබන අවස්ථාවේදී ඒවා කොටස් වලින් අඩු කරනු ලැබේ. අතුරු ලාභාංශ ප්‍රකාශයට පත් කරන විට කොටස් වලින් අඩු කරනු ලබන අතර එය තවදුරටත් බැංකුවේ අභිමතය පරිදි සිදු නොවේ.

## 5.12 කොටසක ඉපැයීම්

බැංකුව එහි සාමාන්‍ය කොටස් සඳහා කොටසක් මත මූලික ඉපයීම් පිළිබඳ දත්ත ඉදිරිපත් කරයි කාලසීමාව තුළ ගෙවීමට ඇති සාමාන්‍ය කොටස් වල හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණය මගින් බැංකුවේ සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට අදාළ වන ලාභය හෝ අලාභය බෙදීමෙන් මූලිකකොටස් මත ඉපයීම් ගණනය කෙරේ සාමාන්‍ය කොටස් හිමියන්ට අදාළ ලාභය හෝ අලාභය සහ සියලුම තනුක විභව සාමාන්‍ය කොටස්වල බලපෑම් සඳහා පවතින සාමාන්‍ය කොටස්වල බරිත සාමාන්‍ය සංඛ්‍යාව ගැලපීමෙන් කොටසකට තනුක කළ ඉපැයීම් තීරණය වේ.

## 5.13 ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 15 - ගනුදෙනුකරුවන් සමග එළැඹෙන ගිවිසුම් ඔස්සේ ලැබෙන ආදායම

2018 ජනවාරි 1 දින හෝ එයට පසු ආරම්භ වන මූල්‍ය කාලසීමා සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 15 බලාත්මක බවට පත් විය මෙහි ප්‍රධාන මූලධර්මය වනුයේ ආයතනයක් ගනුදෙනුකරුවන් වෙත පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා ලබාදීම පිළිබඳ විස්තර කිරීම සඳහා තම ආදායම හඳුනාගත යුතු බවයි මෙම ප්‍රධාන මූලධර්මය සාකච්ඡා කරන ලද පරිදි පහත පියවර මගින් ඉදිරිපත් කරනු ලැබේ.

- ගනුදෙනුකරුවන් සමග ගිවිසුම (ගිවිසුම්) හඳුනාගැනීම
- ගිවිසුම තුළ කාර්යසාධන බැඳීම් හඳුනාගැනීම
- ගනුදෙනු මිළ තීරණය කිරීම
- ගිවිසුම තුළ කාර්යසාධන බැඳීම් සඳහා ගනුදෙනු මිල වෙන් කිරීම
- ආයතනය කාර්යසාධන බැඳීමක් තෘප්තිමත් කරන අවස්ථාවේදී (හෝ තෘප්තිමත් කරන පරිදි) ආදායම හඳුනාගැනීම

මෙම මාර්ගෝපදේශය අනුගමනය කිරීම ගනුදෙනුකරුවෙකු සමඟ එළඹෙන ගිවිසුමක ඇති කරුණු සහ තත්වයන් මත රඳා පවතින අතර විනිශ්චය ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

## 5.14 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - 7 "මුදල් ප්‍රවාහ ප්‍රකාශය" ට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් සකස් කර ඇති මුදල් සහ මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් සහ කෙටි කාලීන. ඉහළ ද්‍රවශීලතාවයක් සහිත දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි වටිනාකමේ වෙනස්කම් වල සැලකිය යුතු අවදානමකට ලක් නොවන ආයෝජන ඇතුළත් වේ.

මුදල් සහ මුදල් සමාන දෑ යන්නට අතැති මුදල්, අනෙකුත් බැංකු ශේෂයන්, බැංකු සමඟ ස්ථානගත කිරීම්, ස්ථාවර තැන්පතුවල ආයෝජන (මාස 3කට අඩු කල්පිරීමක් සහිත) සහ අවාසිදායක බැංකු ශේෂවල ශුද්ධ ප්‍රමාණය ඇතුළත් වේ.

## 5.15 සංචිත

### 5.15.1 ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

1988 අංක 30 දරන බැංකු පනතේ 20 (1) සහ (2) වගන්ති ප්‍රකාරව නියම කර ඇති පරිදි ව්‍යවස්ථාපිත සංචිත අරමුදල පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව, ලාභාංශ ප්‍රකාශ කිරීමට පෙර බැංකුව විසින් බදු ගෙවීමෙන් පසු එහි ශුද්ධ ලාභයෙන් අවම වශයෙන් 5% ක් වත් අරමුදල ගෙවන ලද ප්‍රාග්ධනයෙන් 50% ක් කරා ළඟා වන තුරු ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කළ යුතුය.

### 5.15.2 පොදු සංචිත අරමුදල

බැංකුව විසින් රඳවා ගත් ඉපැයීම් ගිණුම්වලින් කිසියම් ලාභ ප්‍රමාණයක් පොදු සංචිත ගිණුමට මාරු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොදු සංචිතය ඇතිවේ පොදු සංචිතය පිහිටුවීමේ අරමුණ වනුයේ අනාගයේ ඇතිවිය හැකි නොදන්නා වගකීම් පියවීමට යොදා ගැනීමයි.

### 5.15.3 විශේෂ සංචිත අරමුදල

විශේෂ සංචිත අරමුදල යනු බැංකුව විසින් රඳවා ගත් ඉපැයීම් ගිණුම්වලින් යම් ලාභ ප්‍රමාණයක් විශේෂ සංචිත ගිණුමට මාරු කිරීම හේතුවෙන් ඇතිවන සංචිතයකි. අනාගත නොදන්නා වගකීම් පියවීම සඳහා යොදා ගැනීම සංචිත අරමුදල පිහිටුවීමේ අරමුණයි.

## 6. නිකුත් කරන ලද නමුත් බලාත්මකව නොතිබූ ප්‍රමිති

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් පහත සඳහන් නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර./ශ්‍රී.ලං.ගි.ප්‍ර.) නිකුත් කර ඇති අතර ඒවා 2023 ජනවාරි 1 වන දිනෙන් පසු ආරම්භ වන මූල්‍ය කාල පරිච්ඡේද සඳහා අදාළ වේ ඒ අනුව, පහත සඳහන් නව සහ සංශෝධිත ප්‍රමිතීන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකෙරේ.

### 6.1 වගකීම්, ජංගම හෝ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 සඳහා සංශෝධන)

සංශෝධනය මගින් වගකීම් ජංගම හෝ ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කිරීමේ නිර්ණායක පැහැදිලි කරයි. වගකීම පියවීම කල් දැමීමේ අයිතියක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද, වාර්තාකරණ කාල සීමාව අවසානයේ කල් දැමීමේ අයිතියක් පැවතිය යුතු බව, වර්ගීකරණය එහි කල් දැමීමේ අයිතිය ආයතනයක් විසින් ක්‍රියාත්මක කිරීමේ සම්භාවිතාවෙන් බලපාන්නේ නැති බව, පරිවර්තනය කළ හැකි වගකීමක ඇතුළත් කර ඇති ව්‍යුත්පන්නයක් කොටස් උපකරණයක් නම් පමණක් වගකීම් නියමයන් එහි වර්ගීකරණයට සහ හෙළිදරව් කිරීම් වලට බලපාන්නේ නැති බව සංශෝධන මගින් පැහැදිලි කෙරේ.

## 6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම (ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 සහ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර ප්‍රායෝගික ප්‍රකාශය 2 සඳහා සංශෝධන)

ශ්‍රී.ලං.ගි.ප්‍ර. 1 සහ ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර ප්‍රායෝගික ප්‍රකාශය 2 සඳහා කරන ලද සංශෝධන, ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් සඳහා ප්‍රමාණවත් විනිශ්චයන් යොදාගැනීමට ආයතනවලට සහාය වීම සඳහා මාර්ගෝපදේශ සහ උදාහරණ සපයයි. මෙම සංශෝධනවල අරමුණ වනුයේ ආයතනවලට තම " වැදගත්" ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය ඔවුන්ගේ "ප්‍රමාණවත්" ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය සමඟ ප්‍රතිස්ථාපනය කිරීමෙන් වඩාත් ප්‍රයෝජනවත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් සැපයීමට සහාය වීමයි ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් පිළිබඳ තීරණ ගැනීමේදී ආයතන ප්‍රමාණවත්බව යන සංකල්පය යොදන ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ ද එක්කර ඇත.

## 6.3 "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ දෝෂ" සඳහා සංශෝධන (ශ්‍රී.ලං.ගි.ප්‍ර.8) ගිණුම්කරණ ඇස්තමේන්තු අර්ථ දැක්වීම.

ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්කම් අතර වෙනස සහ දෝෂ නිවැරදි කිරීම මෙම සංශෝධන මගින් පැහැදිලි කරයි.

තවද, ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ආයතන විසින් මිනුම් ශිල්පීය ක්‍රම සහ යෙදවුම් භාවිතා කරනු ලබන ආකාරය ද එමගින් පැහැදිලි කෙරේ පෙර කාලපරිච්ඡේද දෝෂ නිවැරදි කිරීමේ ප්‍රතිඵලයක් නොවන්නේ නම්, යෙදවුම්වල වෙනසකින් හෝ මිනුම් ශිල්පීය ක්‍රමයක වෙනසකින් ගිණුම්කරණ ඇස්තමේන්තුවකට ඇති කරන බලපෑම් ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්කම් බව සංශෝධිත ප්‍රමිතිය පැහැදිලි කරයි.

## 6.4 රක්ෂණ ගිවිසුම් (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර 17)

ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 17 යනු හඳුනාගැනීම සහ මිනුම් කිරීම, ඉදිරිපත් කිරීම සහ අනාවරණය කිරීම යන අංශ ආවරණය වන රක්ෂණ ගිවිසුම් සඳහා වන පුළුල් නව ගිණුම්කරණ ප්‍රමිතියකි. 2025 ජනවාරි 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන වාර්ෂික වාර්තා කාල පරිච්ඡේද සඳහා ශ්‍රී.ලං.මූ.වා.ප්‍රමිත 17 අදාළ වේ. මෙම ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම බැංකුවේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොවනු ඇති බව බැංකුව අපේක්ෂා කරයි.

## 7. දළ ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| පොලී ආදායම (8.1 සටහන) | 35,273,433,857 | 23,545,299,165 |
| ගාස්තු හා කොමිස් ආදායම (9 සටහන) | 806,547,782 | 935,136,855 |
| ශුද්ධ වෙළෙඳ ලාභ / (අලාභ) (10 සටහන) | 102,296,546 | (24,214,945) |
| වෙනත් මෙහෙයුම් ආදායම් (11 සටහන) | 20,471,444 | 36,547,883 |
| දළ ආදායමේ එකතුව | 36,202,749,629 | 24,492,768,958 |

## 8. ශුද්ධ පොලී ආදායම

### 8.1 පොලී ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| බැංකුවල රඳවා තැබීම් | 760,952,114 | 364,966,827 |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් | | |
| වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ණය හා ලැබිය යුතු දෑ | 25,287,684,763 | 19,937,925,746 |
| ණය හා වෙනත් උපකරණ | 9,224,796,980 | 3,242,406,591 |
| මුළු පොලී ආදායම | 35,273,433,857 | 23,545,299,165 |

### 8.2 පොලී වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| බැංකු වෙත ගෙවිය යුතු | (2,149,689,728) | (1,180,999,383) |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | (17,607,209,517) | (8,483,808,364) |
| කල්බදු වගකීම මත පොළී වියදම් | 117,369,695 | (228,565,487) |
| මුළු පොලී වියදම් | (19,639,529,550) | (9,893,373,234) |
| ශුද්ධ පොලී ආදායම | 15,633,904.307 | 13,651,925,931 |

## 9. ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ගාස්තු හා කොමිස් ආදායම | 806,547,782 | 935,136,855 |
| ගාස්තු හා කොමිස් වියදම් | (355,184,923) | (312,112,052) |
| ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 451,362,859 | 623,024,803 |
| සැඳුම් ලබන්නේ, | | |
| ණය | 709,899,122 | 834,390,141 |
| වෙළෙඳ හා ප්‍රේෂණ | 9,638,064 | 7,927,757 |
| තැන්පතු | (320,973,518) | (274,099,141) |
| වෙනත් | 52,799,191 | 54,806,046 |
| ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම | 451,362,859 | 623,024,803 |

## 10. ශුද්ධ වෙළඳ ලාභ /(අලාභ)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ලාභ හෝ අලාභ හරහා හඳුනාගත් මූල්‍ය වත්කම් - සාධාරණ අගය වෙනස්වීම | (67,860) | 42,980 |
| විනිමය (අලාභය)/ ලාභය | 97,979,726 | (34,467,765) |
| ලාභාංශ ආදායම | 4,384,680 | 10,209,840 |
| **එකතුව** | 102,296,546 | (24,214,945) |

## 11. වෙනත් මෙහෙයුම් ආදායම් (ශුද්ධ)

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලාභ / (අලාභ) | 93,147 | 18,134,116 |
| අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීම මත ලාභය / (අලාභය) | - | - |
| අක්‍රිය ණය ආපසු අයකර ගැනීම් (ලියාහරින ලද) | 411,274 | 441,823 |
| වෙනත් ආදායම් | 19,967,023 | 17,971,945 |
| **එකතුව** | 20,471,444 | 36,547,884 |

## 12. හානිකරණ ගාස්තු

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| බැංකුවල රඳවා තැබීම් (19.1 සටහන) | - | - |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අය විය යුතු ණය හා ලැබිය යුතු දෑ (21.2 සටහන) | (2,848,036,496) | (3,259,719,557) |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ (22.3 සටහන) | (1,065,829) | 432,420 |
| ලබානොගත් ණය කැපවීම් සහ මූල්‍ය ඇපකර (සටහන 40.1.1) | (3,574,850) | (1,265,710) |
| වෙනත් වත්කම් (28.1 සටහන) | - | 3,776,985 |
| **ණය හා වෙනත් අලාභ වෙනුවෙන් ශුද්ධ හානිකරණ (ගාස්තුව) / ප්‍රතිවර්තන** | (2,852,677,176) | (3,256,775,862) |

## 13. කාර්ය මණ්ඩල වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| වැටුප් හා ප්‍රසාද දීමනා | 5,596,751,248 | 4,740,121,879 |
| EPF / ETF සඳහා දායකත්වයන් | 872,212,354 | 732,569,872 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම වෙත දායකත්වයන් | 620,181,014 | 417,763,843 |
| වෙනත් | 1,650,392,987 | 1,401,814,289 |
| **එකතුව** | 8,739,537,602 | 7,292,269,883 |

## 14. වෙනත් වියදම්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික | 4,248,060 | 3,510,000 |
| විගණක ගාස්තු | 2,285,841 | 2,400,000 |
| වෘත්තීය හා නෛතික ගාස්තු | 21,347,210 | 13,199,075 |
| කාර්යාල පරිපාලන හා ආයතන වියදම් | 1,396,364,812 | 900,940,590 |
| පරිගණක ගත කිරීමේ වියදම් | 436,221,334 | 186,225,340 |
| ව්‍යාපාරික බදු වියදම් | 1,636,420 | 3,521,405 |
| ගෙවන ලද වෙනත් කොමිස් මුදල් | 335,352 | 930,266 |
| තැන්පතු රක්ෂණ වාරිකය | 203,169,932 | 167,038,634 |
| බෝග රක්ෂණ බද්ද | 13,551,052 | 9,716,275 |
| කාර්ය මණ්ඩල ඇප තැන්පතු පොලිය | 5,814,102 | 2,978,933 |
| උකස් අත්තිකාරම් මත ප්‍රාග්ධන අලාභය | (3,834) | 7,668 |
| **එකතුව** | 2,084,970,281 | 1,290,468,186 |

## 15. ආදායම් බදු වියදම්

## 15.1 ලාභ හෝ අලාභ ලෙස හඳුනාගත් ප්‍රමාණයන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **ප්‍රවර්තන බදු වියදම්** | | |
| ප්‍රවර්තන වසරේ ලාභ මත බදු (සටහන 15.3) | 1,301,405,280 | 752,050,328 |
| පසුගිය වර්ෂවලට අදාළව ඌන බදු වෙන් කිරීම් | 16,570,076 | 68,605,453 |
| | 1,317,975,356 | 820,655,781 |
| **විලම්භිත බදු වියදම්** | | |
| තාවකාලික වෙනස්කම් මත ආපසු හැරවීම (සටහන 27.2) | (2,308,254,679) | (351,453,892) |
| | (2,308,254,679) | (351,453,892) |
| **ලාභ හෝ අලාභ ලෙස හඳුනාගත් මුළු ආදායම බදු වියදම්** | (990,279,323) | 469,201,889 |

## 15.2 වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් හඳුනාගත් ප්‍රමාණයන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **විලම්භිත බදු වියදම්** | | |
| තාවකාලික වෙනස්කම් මත ආපසු හැරවීම (සටහන 27.2) | 46,874,831 | (8,620,208) |
| **වෙනත් විස්තීර්ණ ආදායම්වලින් හඳුනාගත් මුළු ආදායම් බදු වියදම** | 46,874,831 | (8,620,208) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 15.3 ගිණුම්කරණ ලාභය ආදායම් බදු වියදම් සමග සැසඳුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ආදායම් බදු වියදමට පෙර ලාභය | 359,115,328 | 775,504,600 |
| නිදහස් ආදායම | | |
| පොලී ආදායම | (1,705,392,315) | (514,904,089) |
| එකතු කළා: අනුමත කළ නොහැකි වියදම් | 6,902,036,608 | 5,772,134,980 |
| අඩු කළා: අනුමත වියදම් | (733,790,790) | (2,905,148,199) |
| **ව්‍යාපාරයෙන් බදු අය කළ හැකි ආදායම** | 4,821,968,831 | 3,127,587,292 |
| 2022 ජුනි මාසයෙන් අවසන් වූ පළමු මාස 6 සඳහා බදු වගකීම | 24% / 14% | 24% |
| බදු 24% | 57,811,098 | 750,620,950 |
| බදු 14% | 1,999 | 1,429,378 |
| 2022 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ දෙවන මාස 6 සඳහා බදු වගකීම | 30%15% | - |
| බදු 30% | 722,637,623 | - |
| බදු 15% | 655,560 | - |
| **කාල පරිච්ඡේදය සඳහා ලාභය මත බදු** | 1,301,405,280 | 752,050,328 |
| විලම්භිත බදු ආපසු හැරවීම (සටහන 27.2) | (2,308,254,679) | (351,453,892) |
| පසුගිය වර්ෂවලට අදාළව ඌන බදු වෙන් කිරීම් | 16,570,076 | 68,605,453 |
| **ආදායම් බදු වියදම්** | (990,279,323) | 469,201,889 |
| | | |
| **සඵලදායි වත්මන් බදු අනුපාතිකය** | -275.76% | 60.50% |

## 15.4 සඵලදායී බදු අනුපාතය සැසඳීම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | % | රු. | % | රු. |
| ආදායම් බදු වියදමට පෙර ලාභය | | 359,115,328 | | 775,504,600 |
| කාල පරිච්ඡේදය සඳහා ආදායම් බදු | 27.00% | 96,961,139 | 24.00% | 186,121,104 |
| බදු අරමුණු සඳහා අඩු කළ නොහැකි වියදම්වල බදු බලපෑම | 518.93% | 1,863,549,884 | 178.63% | 1,385,312,395 |
| බදු අරමුණු සඳහා අඩු කළ හැකි වියදම් වල බදු බලපෑම | -55.50% | (199,307,377) | -89.91% | (697,235,568) |
| බදු නිදහස් ආදායම | -128.22% | (460,455,925) | -15.94% | (123,576,981) |
| ලාභාංශ ආදායම මත බද්ද | 0.18% | 657,559 | 0.18% | 1,429,378 |
| විලම්භිත බදු ප්‍රත්‍යාවර්තනය (සටහන 27.2) | -642.80% | (2,308,254,679) | -45.30% | (351,453,892) |
| පෙර වර්ෂවලට අදාළ (අධි) / ඌන වෙන් කිරීම | 4.61% | 16,570,076 | 8.85% | 68,605,453 |
| **මුළු ආදායම් බදු වියදම්** | -275.76% | (990,279,323) | 60.50% | 469,201,889 |

ලාභාංශ ආදායම් ලැබීම් හැරුණු විට, බැංකු සහ කල්බදු ව්‍යාපාරවලින් ලැබෙන ලාභ සඳහා ප්‍රවර්තන බද්ද තක්සේරු වර්ෂයේ පළමු අර්ධ වර්ෂය සඳහා 24%ක අනුපාතයකින් සහ දෙවන අර්ධ වර්ෂය සඳහා 30%ක අනුපාතයකින් ගණනය කර ඇති අතර, ලාභාංශ ආදායමෙන් 14%ක සහ 15%ක අනුපාතයකින් බදු අය කෙරේ. ඊට අමතරව, විදේශ මුදල් ගිණුම් සඳහා ලැබෙන පොලිය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

2022 දෙසැම්බර් 31 දිනට ආදායම් බද්ද සහ විලම්භිත බදු වත්කම්/වගකීම් ගණනය කිරීම සඳහා බැංකුව 2022 අංක 45 දරන දේශීය ආදායම් සංශෝධන පනතට අනුකූලව 24% ක සංශෝධිත අනුපාතය සහ අනෙකුත් සංශෝධන උපයෝගී කර ගන්නා ලදී. තක්සේරු වර්ෂයේ මාස හයක් සඳහා වැඩි කළ බදු අනුපාතය අදාළ වියි 2022 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා අනුපාතය 24% ක් වූ අතර එම තක්සේරු වර්ෂයේම දෙවන මාස හය සඳහා අනුපාතය 30% ක් වියි 2022 දෙසැම්බර් 31 දිනට විලම්භිත බදු ගණනය කිරීම සඳහා බැංකුව 30% ක් වූ සංශෝධිත අනුපාතය උපයෝගී කර ගන්නා ලදී.

## 15.5 2022 අංක 14 දරන අධිභාර බදු පනත යටතේ අය කරනු ලබන අධිභාර

ශ්‍රී ලංකා රජය විසින් 2022 අයවැයෙන් (2021/2022) තක්සේරු වර්ෂය සඳහා රුපියල් මිලියන 2,000 ඉක්මවන බදු අය කළ හැකි ආදායමක් උපයා ඇති ඕනෑම සමාගමක් මත 25% ක අනුපාතයකින් අධිභාර බද්දක් ලෙස හඳුන්වනු ලබන එක් වරක් පමණක් ගෙවිය යුතු බද්දක් යෝජනා කරන ලදී. 2022 අප්‍රේල් 07 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 2022 අංක 14 දරන අධිභාර බදු පනත මගින් මෙම බද්ද පනවනු ලැබේ. අධිභාර බද්ද පැනවීමේ නීතිය වාර්තා කිරීමේ කාල සීමාව අවසන් වීමෙන් පසුව පනවන ලද බැවින්, එහි ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින බදු වගකීම 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹු නොවන අතර, එහි ප්‍රමාණය රු. 800,598,848ක් විය හැකි බවට ඇස්තමේන්තු කර ඇත

## 16. කොටසකට ඉපැයීම්

## 16.1 කොටසකට මූලික ඉපැයීම්

2021 සහ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ බැංකුවේ කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි බදු ගෙවීමෙන් පසු ලාභය, සාමාන්‍ය කොටස් නිකුතුවේ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවෙන් (ඡන්ද බලය සහ ඡන්ද බලය නොමැති) බෙදීමෙන් කොටසකට මූලික ඉපැයීම් ගණනය කර ඇත,

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා | 2022 | 2021 |
|---|---|---|
| බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන්ට හිමි වන වර්ෂය සඳහා ලාභය (රු.) | 1,349,394,652 | 306,302,711 |
| සාමාන්‍ය කොටස් නිකුතුවේ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | 551,290,995 | 545,107,049 |
| සාමාන්‍ය කොටසකට මූලික ඉපැයීම් | 2.45 | 0.56 |

## 16.2 කොටසකට තනුක ඉපැයීම්

තනුක කළ හැකි සාමාන්‍ය කොටස් නොමැති වීම හේතුවෙන් කොටසකට තනුක කළ ඉපැයීම් සහ කොටසකට මූලික ඉපැයීම් සමාන වේ.

## 17. මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය

පහත වගුව මඟින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රේඛීය අයිතම සහ මූල්‍ය උපකරණ කාණ්ඩ අතර සැසඳීමක් සපයයි.

| 2022 දෙසැම්බර් 31 දිනට | සටහන | ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 18 | - | 2,889,883,677 | - | 2,889,883,677 |
| බැංකුවල රඳවා තැබීම් | 19 | - | 6,133,705,351 | - | 6,133,705,351 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කළ ස්කන්ධ උපකරණ | 20 | 120,280 | - | - | 120,280 |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ණය හා ලැබිය යුතු දෑ | 21 | | 198,008,145,155 | - | 198,008,145,155 |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 22 | | 65,079,635,908 | | 65,079,635,908 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනා ගැනෙන ස්කන්ධ | 23 | | - | 2.289.919 | 2.289.919 |
| වෙනත් මූල්‍ය වත්කම් | 28 | | 6,018,325,952 | | 6,018,325,952 |
| **මුළු මූල්‍ය වත්කම්** | | 120,280 | 278,129,696,043 | 2,289,919 | 278,132,106,242 |

| 2022 දෙසැම්බර් 31 දිනට | සටහන | ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මූල්‍ය වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 29 | - | 47,470,707,056 | - | 47,470,707,056 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 30 | - | 210,301,323,468 | - | 210,301,323,468 |
| ලබාදුන් ණය හා වෙනත් ණයට ගත් අරමුදල් | 31 | - | - | - | - |
| වෙනත් වගකීම් | 33 | - | 6,426,430,198 | - | 6,426,430,198 |
| මුළු මූල්‍ය වගකීම් | | - | 264,198,460,722 | - | 264,198,460,722 |

| 2021 දෙසැම්බර් 31 දිනට | සටහන | ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් | එකතුව |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මූල්‍ය වත්කම** | | | | | |
| මුදල් හා මුදල් සමානයන් | 18 | - | 1,486,878,989 | - | 1,486,878,989 |
| බැංකුවල රඳවා තැබීම් | 19 | - | 6,596,072,932 | - | 6,596,072,932 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කළ ස්කන්ධ උපකරණ | 20 | 188,140 | - | - | 188,140 |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ණය හා ලැබිය යුතු දෑ | 21 | - | 175,229,666,656 | - | 175,229,666,656 |
| ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 22 | - | 54,856,210,318 | - | 54,856,210,318 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනාගැනෙන ස්කන්ධ උපකරණ | 23 | - | - | 2,289,919 | 2,289,919 |
| වෙනත් මූල්‍ය වත්කම් | 28 | - | 3,721,641,936 | - | 3,721,641,936 |
| **මුළු මූල්‍ය වත්කම** | | 188,140 | 241,890,470,831 | 2,289,919 | 241,892,948,890 |

| 2021 දෙසැම්බර් 31 දිනට | සටහන | ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් රු. | ක්‍රමක්ෂිත පිරිවැයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් රු. | වෙනත් විස්තීර්ණ ආදායම ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන මූල්‍ය වත්කම් රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **මූල්‍ය වගකීම** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු | 29 | - | 29,500,936,543 | - | 29,500,936,543 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 30 | - | 187,752,465,256 | - | 187,752,465,256 |
| ලබාදුන් ණය හා වෙනත් ණයට ගත් අරමුදල් | 31 | - | 2,000,000,000 | - | 2,000,000,000 |
| වෙනත් වෙගකිම | 33 | - | 5,514,857,775 | - | 5,514,857,775 |
| **මුළු මූල්‍ය වගකිම** | | - | 224,768,259,574 | - | 224,768,259,574 |

## 18. මුදල් හා මුදල් සමානයන්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| අතැති මුදල් | 919,970,763 | 839,013,334 |
| වෙනත් බැංකුවල ශේෂයන් | 1,969,912,914 | 647,865,655 |
| **එකතුව** | 2,889,883,677 | 1,486,878,989 |

## 19. බැංකුවල රඳවා ඇති මුදල්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| මූල්‍ය වෙළෙඳපොල ස්ථාපන | 6,133,705,351 | 6,596,072,932 |
| අඩු කළා : අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් හානිකරණ (19.1 සටහන) | - | - |
| **බැංකුවල රඳවා ඇති මුදල් එකතුව** | 6,133,705,351 | 6,596,072,932 |

## 19.1 අපේක්ෂිත ණය අලාභ වෙනුවෙන් හානිකරණයන්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **අදියර 1** | | |
| ජනවාරි 01 වන විට ශේෂය | - | - |
| වසර තුළ ගාස්තුව / (ආපසු හැරවීම) | - | - |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | _ | _ |

## 20. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත කෙරෙන ස්කන්ධ උපකරණ

| දෙසැම්බර් 31 දිනට | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | ආයෝජන පිරිවැය | වෙළෙඳපොළ වටිනාකම | කොටස් සංඛ්‍යාව | ආයෝජන පිරිවැය | වෙළෙඳපොල වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ප්‍රකාශිත කොටස්** | | | | | | |
| පිපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී | 600 | 5,160 | 2,280 | 600 | 5,160 | 4,140 |
| සෙලාන් ඩිවලොප්මන්ට් පීඑල්සී | 10,000 | 140,000 | 118,000 | 10,000 | 140,000 | 184,000 |
| | 10,600 | 145,160 | 120,280 | 10,600 | 145,160 | 188,140 |

## 21. ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් අයවිය යුතු ණය හා ලැබිය යුතු දෑ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| දළ ණය හා ලැබිය යුතු දෑ (සටහන 21.1) | 215,372,501,881 | 189,039,666,420 |
| (අඩු කළා) - කාර්ය මණ්ඩල ණයවල සාධාරණ අගය ගැළපුම | (1,576,948,950) | (870,864,778) |
| | 213,795,552,931 | 188,168,801,642 |
| (අඩු කළා) - අපේක්ෂිත ණය අලාභ දීමනාව - කේවල හානිකරණ ගාස්තු (21.2.1 සටහන) | (1,362,761,334) | (1,581,171,535) |
| (අඩු කළා) - අපේක්ෂිත ණය අලාභ දීමනාව - සාමූහික හානිකරණ ගාස්තු (21.2.2 සටහන) | (14,424,646,441) | (11,357,963,453) |
| **වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අය විය යුතු ශුද්ධ ණය හා ලැබිය යුතු දෑ** | 198,008,145,156 | **175,229,666,654** |

## 21.1 ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් විශ්ලේෂණය - වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් අයවිය යුතු ණය හා ලැබිය යුතු දෑ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **21.1.1 නිපැයුම අනුව** | | |
| උකස් | 42,234,452,674 | 20,173,958,657 |
| කාර්ය මණ්ඩල ණය | 5,501,098,905 | 4,614,968,345 |
| කල්බදු | 1,397,522,296 | 969,406,200 |
| කෙටි කාලීන | 13,716,623,362 | 9,989,450,293 |
| දිගු කාලීන | 152,522,804,644 | 153,291,882,926 |
| **දළ එකතුව** | 215,372,501,881 | 189,039,666,420 |
| **21.1.2 ව්‍යවහාර මුදල් ඒකකය අනුව** | | |
| ශ්‍රී ලංකා රුපියල් | 215,372,501,881 | 189,039,666,420 |
| **දළ එකතුව** | 215,372,501,881 | 189,039,666,420 |
| **21.1.3 කර්මාන්තය අනුව** | | |
| කෘෂිකර්මය හා ධීවර කර්මාන්තය | 77,425,986,329 | 51,314,868,161 |
| නිෂ්පාදන | 30,674,769,876 | 28,605,048,280 |
| කල්බදු | 1,382,157,636 | 969,406,200 |
| ප්‍රවාහන | 76,097,009 | 77,854,618 |
| ඉදිකිරීම් / නිවාස | 19,645,882,183 | 24,484,171,958 |
| වෙළෙඳ | 30,799,835,516 | 31,526,204,748 |
| වෙනත් (පරිභෝජන / තැන්පතු එදිරිව / කාර්ය මණ්ඩල / සංචාරක) | 55,367,773,330 | 52,062,112,455 |
| **දළ එකතුව** | 215,372,501,881 | 189,039,666,420 |

## 21.2 අපේක්ෂිත ණය අලාභ දීමනාව

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **21.2.1 කේවල හානිකරණ** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 1,581,171,535 | 2,562,109,132 |
| ලාභය හෝ අලාභය වෙත ශුද්ධ අයකිරීම | (218,410,201) | (980,937,597) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 1,362,761,334 | 1,581,171,535 |
| | | |
| **21.2.2 සාමූහික හානිකරණයන්** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 11,357,963,453 | 7,116,566,892 |
| ලාභ හෝ අලාභ සඳහා ශුද්ධ ගාස්තුව | 3,066,446,697 | 4,240,657,154 |
| වෙනත් චලනයන් / ලියා හරින ලද | 236,292 | 739,407 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 14,424,646,442 | 11,357,963,453 |

## 21.3 ණය අවදානමට ඇති නිරාවරණය පාදකව වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අය විය යුතු ණය හා ලැබිය යුතු දෑ විශ්ලේෂණය

| 2022 දෙසැම්බර් 31 දිනට | 01 අදියර රු. | 02 අදියර රු. | 03 අදියර රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| කේවල වශයෙන් හානිකරණය කරන ලද ණය | - | - | 3,914,938,412 | 3,914,938,412 |
| **සාමූහික හානිකරණයට ලක් වූ ණය** | | | | - |
| කාලීන ණය - වෙනත් | 6,235,310,221 | 470,348,720 | 329,766,321 | 7,035,425,261 |
| කාලීන ණය - කාර්මික | 7,197,631,331 | 5,043,062,302 | 2,842,564,144 | 15,083,257,777 |
| කාලීන ණය - වාණිජ | 12,777,291,982 | 8,277,103,276 | 3,588,432,875 | 24,642,828,133 |
| කාලීන ණය - කෘෂිකාර්මික | 11,735,212,472 | 5,357,081,276 | 2,493,687,055 | 19,585,980,803 |
| කාලීන ණය නිවාස | 39,340,010,010 | 6,685,513,025 | 3,772,200,402 | 49,797,723,437 |
| ප්‍රතිමූල්‍යයන | 19,581,638,683 | 13,281,543,155 | 3,031,476,105 | 35,894,657,943 |
| ලිය ඉසුර | 37,142 | - | 33,929,845 | 33,966,988 |
| උකස් | 39,780,415,414 | 2,361,740,747 | 92,296,513 | 42,234,452,674 |
| කල්බදු | 836,543,168 | 250,204,784 | 106,561,580 | 1,193,309,532 |
| කාර්ය මණ්ඩල ණය | 5,474,357,955 | 5,121,216 | 21,631,734 | 5,501,110,905 |
| තැන්පතු එරෙහි ණය | 9,650,382,255 | 375,941,462 | 307,212,888 | 10,333,536,605 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය | | | 121,313,411 | 121,313,411 |
| වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු දළ ණය හා ලැබිය යුතු දෑ | 152,608,830,634 | 42,107,659,962 | 20,656,011,285 | 215,372,501,881 |
| අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය | (4,125,594,789) | (5,063,057,294) | (6,598,755,693) | (15,787,407,777) |
| ශුද්ධ ණය හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ* | 148,483,235,844 | 37,044,602,668 | 14,057,255,591 | 199,585,094,104 |

| 2021 දෙසැම්බර් 31 දිනට | අදියර 1<br>රු. | අදියර 2<br>රු. | අදියර 3<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| කේවල වශයෙන් හානිකරණය කරන ලද ණය | - | - | 4,068,587,727 | 4,068,587,727 |
| **සාමූහික හානිකරණයට ලක් වූ ණය** | | | | - |
| කාලීන ණය - වෙනත් | 5,152,133,697 | 498,664,202 | 1,365,934,028 | 7,016,731,927 |
| කාලීන ණය - කාර්මික | 8,313,820,445 | 5,375,832,322 | 3,541,687,459 | 17,231,340,226 |
| කාලීන ණය - වාණිජ | 15,706,847,346 | 6,527,785,774 | 4,423,695,584 | 26,658,328,704 |
| කාලීන ණය - කෘෂිකාර්මික | 14,471,577,935 | 5,656,147,322 | 3,051,767,224 | 23,179,492,481 |
| කාලීන ණය නිවාස | 35,546,451,023 | 6,906,851,613 | 4,580,982,935 | 47,034,285,571 |
| ප්‍රතිමූල්‍යයන | 19,968,852,819 | 7,495,970,359 | 4,046,508,276 | 31,511,331,454 |
| ලිය ඉසුර | 235,526 | 176,532 | 37,368,607 | 37,780,665 |
| උකස් | 19,462,956,439 | 523,219,611 | 187,782,607 | 20,173,958,657 |
| කල්බදු | 771,438,998 | 65,576,219 | 16,262,297 | 853,277,513 |
| කාර්ය මණ්ඩල ණය | 4,594,875,972 | | 20,092,373 | 4,614,968,345 |
| තැන්පතු එරෙහි ණය | 6,534,465,899 | | 1,254,395 | 6,535,720,294 |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය | | | 123,862,856 | 123,862,856 |
| **වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු දළ ණය හා ලැබිය යුතු දෑ** | 130,523,656,099 | 33,050,223,952 | 25,465,786,369 | 189,039,666,420 |
| අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණය | (2,530,819,723) | (3,038,214,893) | (7,370,100,371) | (12,939,134,987) |
| **ශුද්ධ ණය හා වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ*** | **127,992,836,376** | **30,012,009,059** | **18,095,685,999** | **176,100,531,433** |

*(ශූන්‍ය අනුපාත හා කාර්ය මණ්ඩල ණය සඳහා ගැළපුම්වලට පෙර)

## 22. ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය උපකරණ - ණය හා වෙනත් උපකරණ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ණයකර - ප්‍රකාශිත (22.1 සටහන) | **623,946,610** | 623,946,610 |
| රජයේ ණය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර | **11,487,849,406** | 4,813,547,891 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජන (22.2 සටහන) | **52,970,666,614** | 49,420,476,709 |
| **ක්‍රමක්ෂිත පිරිවැය මත මුළු මූල්‍ය වත්කම්** | **65,082,462,630** | 54,857,971,210 |
| අඩු: අපේක්ෂිත ණය අලාභ දීමනාව (සටහන 22.3) | **(2,826,721)** | (1,760,892) |
| **ක්‍රමක්ෂිත පිරිවැය මත ශුද්ධ මූල්‍ය වත්කම්** | **65,079,635,909** | 54,856,210,318 |

## 22.1 ණයකර - ප්‍රකාශිත

| දෙසැම්බර් 31 දිනට | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | ණයකර සංඛ්‍යාව | අයෝජන පිරිවැය<br>රු. | ක්‍රමක්ෂිත පිරිවැය.<br>රු. | ණය කර සංඛ්‍යාව | ආයෝජන පිරිවැය<br>රු. | ක්‍රමක්ෂිත පිරිවැය<br>රු |
| කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී | - | - | - | - | - | - |
| ඩී.එෆ්.සී.සී. | **5,000,000** | **500,000,000** | **508630137** | 5,000,000 | 50,000,000 | 508,630,137 |
| සෙලාන් බැංකුව | **1,077,200** | **107,720,000** | **115,316,473** | 1,077,200 | 107,720,000 | 115,316,473 |
| එකතුව | **6,077,200** | **607,720,000** | **623,946,610** | 6,077,200 | 157,720,000 | 623,946,610 |

## 22.2 ස්ථාවර තැන්පතුවල ආයෝජන

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| මාස 3ට අඩු ස්ථාවර තැන්පතු | 21,726,025,221 | 35,579,154,747 |
| මාස 3ට වැඩි ස්ථාවර තැන්පතු | 31,244,641,393 | 13,841,321,963 |
| **එකතුව** | 52,970,666,614 | 49,420,476,709 |

### 22.2.1 ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වත්කම් විශ්ලේෂණය - ණය සහ වෙනත් උපකරණ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **22.2.1.1 ව්‍යවහාර මුදලින්** | | |
| ශ්‍රී ලංකා රුපියල් | 28,069,212,094 | 38,621,426,282 |
| එක්සත් ජනපද ඩොලර් | 24,901,454,519 | 10,799,050,427 |
| **ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මුළු මූල්‍ය වත්කම්** | 52,970,666,614 | 49,420,476,709 |
| **22.2.1.2 ඇපකර තැබීම මගින්** | | |
| ඇපකරයක් ලෙස පොරොන්දු වී ඇත | 10,051,950,266 | 2,799,724,148 |
| බාධාවන් රහිත | 42,918,716,348 | 46,620,752,561 |
| **ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මුළු මූල්‍ය වත්කම්** | 52,970,666,614 | 49,420,476,709 |
| **22.2.1.3 ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් සැසඳීම - ණය සහ වෙනත් උපකරණ** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 5,435,733,610 | 4,794,468,336 |
| වසර තුළ ශුද්ධ අත්පත් කරගැනීම් සහ කල්පිරීම් | 6,693,646,250 | 643,026,165 |
| අඩුකළා: අපේක්ෂිත ණය අලාභ දීමනාව (සටහන 22.3) | (2,826,721) | (1,760,892) |
| **දෙසැම්බර් 31 වන විට ශේෂය** | 12,126,553,139 | 5,435,733,609 |

## 22.3 අපේක්ෂිත ණය අලාභ දීමනාව

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 1,760,892 | 2,193,312 |
| වසර සඳහා ශුද්ධ ගාස්තු (ආපසු හැරවීම) | 1,065,829 | (432,420) |
| **දෙසැම්බර් 31 වන විට ශේෂය** | 2,826,721 | 1,760,892 |

## 23. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට ස්කන්ධ උපකරණ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| අප්‍රකාශිත ස්කන්ධ සුරකුම් (23.1 සටහන) | 2,289,919 | 2,289,919 |
| | 2,289,919 | 2,289,919 |

## 23.1 අප්‍රකාශිත ස්කන්ධ සුරැකුම්

| දෙසැම්බර් 31 දිනට | 2022 | | | 2021 | | |
|---|---|---|---|---|---|---|
| | කොටස් සංඛ්‍යාව | ආයෝජන පිරිවැය | වෙළෙඳපොළ වටිනාකම | කොටස් සංඛ්‍යාව | ආයෝජන පිරිවැය | වෙළෙඳපොළ වටිනාකම |
| | | රු. | රු. | | රු. | රු. |
| ණය තොරතුරු කාර්යංශය | 1821 | 2,289,919 | 2,289,919 | 1,821 | 2,289,919 | 2,289,919 |
| එකතුව | 1,821 | 2,289,919 | 2,289,919 | 1,821 | 2,289,919 | 2,289,919 |

## 24. දේපළ, පිරියත හා උපකරණ

| 2022 දෙසැම්බර් 31 දිනට | ඉඩම් සහ ගොඩනැගිලි | කල්බදු දේපල | පරිගණක දෘඩාංග |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | |
| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | 702,910,953 | - | 765,947,389 |
| එකතු කිරීම් | 8,810,285 | - | 59,069,158 |
| ඉවත් කිරීම් | (3,802,742) | - | (17,433,335) |
| කපා හරින ලද | - | - | - |
| වසර තුළ මාරු කිරීම් | - | - | - |
| ප්‍රතිවර්ගීකරණ ගැළපුම් | | | 2,000 |
| 2022.12.31 දිනට අවසාන ශේෂය | 707,918,496 | - | 807,585,212 |
| **(අඩු කළා)- සමුච්චිත ක්ෂය කිරීම්** | | | |
| 2022.01.01 දිනට ආරම්භක ශේෂය | 209,726,962 | - | 622,424,460 |
| වසර සඳහා අය කිරීම් | 22,625,057 | - | 56,087,298 |
| ඉවත් කිරීම් | (2,083,558) | - | (17,433,173) |
| කපා හරින ලද | - | - | - |
| වසර තුළ මාරු කිරීම් | - | - | - |
| ප්‍රතිවර්ගීකරණ ගැළපුම් | (8,821) | | (664,531) |
| 2022.12.31 දිනට අවසාන ශේෂය | 230,259,640 | - | 660,414,054 |
| 2022.12.31 දිනට ශුද්ධ පොත් අගය | 477,658,856 | | 147,171,159 |

| 2022 | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලීය උපකරණ ලී බඩු සහ සවිකිරීම් | මෝටර් රථ වාහන | බෙදුම් හා උපාංග | නොනිමි වැඩ | වෙනත් | එකතුව |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,356,459,136 | 387,762,031 | 423,704,723 | 6,299,469 | 747,424 | 3,643,831,125 |
| 64,544,426 | | 74,827,163 | 624,879 | | 207,875,911 |
| (6,698,473) | (635,196) | (1,143,261) | | | (29,713,007) |
| - | | | | | - |
| 89,524 | | | | (89,524) | - |
| (90,204) | 128,080 | (346,000) | | | (306,124) |
| 1,414,304,409 | 387,254,915 | 497,042,625 | 6,924,347 | 657,900 | 3,821,687,905 |
| 1,160,933,630 | 386,599,729 | 335,581,260 | - | - | 2,715,266,041 |
| 84,791,446 | 3,445,868 | 43,806,062 | - | - | 210,755,730 |
| (6,697,976) | (629,591) | (1,453,990) | - | - | (28,298,288) |
| - | - | - | - | - | - |
| - | - | - | - | - | - |
| (1,771,677) | (252,800) | 44,999 | - | - | (2,652,830) |
| 1,237,255,423 | 389,163,206 | 377,978,331 | - | - | 2,895,070,653 |
| 177,048,987 | (1,908,291) | 119,064,294 | 6,924,347 | 657,900 | 926,617,253 |

| | ඉඩම් හා ගොඩනැගිලි | කල්බදු දේපල | පරිගණක දෘඩාංග |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | |
| 2021.01.01 දිනට ආරම්භක ශේෂය | 635,090,898 | - | 710,527,368 |
| එකතු කිරීම් | 65,792,724 | - | 68,789,187 |
| ඉවත් කිරීම් | - | - | (13,464,028) |
| කපා හරින ලද | - | - | - |
| වසර තුළ මාරු කිරීම් | - | - | - |
| ප්‍රතිවර්ගීකරණ ගැළපුම් | 2,027,332 | | 94,862 |
| **2021.12.31 දිනට අවසාන ශේෂය** | 702,910,954 | - | 765,947,389 |
| **(අඩු කළා)- සමුච්චිත ක්ෂය කිරීම්** | | | |
| 2021.01.01 දිනට ආරම්භක ශේෂය | 184,965,594 | - | 574,829,342 |
| වසර සඳහා අය කිරීම් | 24,258,278 | - | 60,926,671 |
| ඉවත් කිරීම් | - | - | (13,424,381) |
| කපා හරින ලද | - | - | - |
| වසර තුළ මාරු කිරීම් | - | - | - |
| ප්‍රතිවර්ගීකරණ ගැළපුම් | 503,091 | | 93,287 |
| **2021.12.31 දිනට අවසාන ශේෂය** | 209,726,963 | - | 622,424,919 |
| **2021.12.31 දිනට ශුද්ධ පොත් අගය** | 493,183,991 | | 143,522,470 |

## 24.1 පූර්ණ වශයෙන් ක්ෂය වූ දේපළ, පිරියත හා උපකරණ

වාර්තා කරන දිනට තවමත් භාවිතයේ පවතින බැංකුවේ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද දේපළ, පිරියත සහ උපකරණවල මූලික පිරිවැය සම්බන්ධයෙන් කාණ්ඩ වශයෙන් සිදු කරන ලද විශ්ලේෂණයක් පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **වත්කම් කාණ්ඩය** | | |
| ගොඩනැගිලි | **3,562,414** | 20,396,463 |
| පරිගණක, දෘඩාංග | **394,666,351** | 470,021,543 |
| කාර්යාල උපකරණ, ලී බඩු හා සවි කිරීම් | **619,998,427** | 774,199,583 |
| මෝටර් රථ වාහන | **366,272,260** | 357,416,907 |
| බෙදුම් හා උපාංග | **174,463,538** | 191,097,754 |
| පරිගණක මෘදුකාංග | **112,232,689** | 96,208,779 |
| | **1,671,195,678** | 1,909,341,030 |

## 24.2 දේපළ, පිරියත හා උපකරණ මත හිමිකම් සීමා

වාර්තාකරණ දිනට බැංකුවේ දේපළ, පිරියත සහ උපකරණ මත හිමිකම් සීමා කිසිවක් නොවීය.

## 24.3 වගකීම් සඳහා ඇප වශයෙන් තබන ලද දේපල, පිරියත සහ උපකරණ

කවර හෝ වගකීමක් සඳහා ඇප වශයෙන් කිසිදු සින්නක්කර දේපළ, පිරියත සහ උපකරණයක් නොතබන ලදී.

| 2021 | | | | | |
|---|---|---|---|---|---|
| කාර්යාලීය උපකරණ ලී බඩු සහ සවිකිරීම | මෝටර් රථ වාහන | නොනිමි වැඩ | බෙදුම් හා උපාංග | වෙනත් | එකතුව |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1,340,256,705 | 409,400,481 | 5,156,066 | 393,628,535 | 819,424 | 3,494,879,478 |
| 33,912,730 | - | 711,727 | 33,486,823 | - | 202,693,190 |
| (16,876,877) | (21,646,441) | - | (715,537) | - | (52,702,882) |
| - | - | - | - | - | - |
| (766,424) | - | - | - | (72,000) | (838,424) |
| (66,999) | 7,990 | 431,675 | (2,695,098) | - | (200,238) |
| 1,356,459,136 | 387,762,031 | 6,299,468 | 423,704,723 | 747,424 | 3,643,831,124 |
| | | | | | |
| 1,066,545,951 | 404,587,270 | - | 293,412,666 | - | 2,524,340,823 |
| 111,692,802 | 3,611,667 | - | 43,130,616 | - | 243,620,034 |
| (16,026,373) | (23,545,018) | - | (579,847) | - | (53,575,618) |
| - | - | - | - | - | - |
| (1,134,048) | 1,937,820 | - | 73,676 | - | 877,448 |
| (148,516) | 7,990 | - | (455,852) | - | - |
| 1,160,929,816 | 386,599,729 | - | 335,581,260 | - | 2,715,262,686 |
| | | | | | |
| 195,529,320 | 1,162,302 | 6,299,468 | 88,123,463 | 747,424 | 928,568,438 |

## 24.4 දේපල, පිරියත සහ උපකරණ අයිතම වෙනුවෙන් තෙවන පාර්ශවයන්ගෙන් වන්දි

හානිකරණය වූ හෝ අත්හැර දමන ලද කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් වෙනුවෙන් තෙවන පාර්ශවයන්ගෙන් වන්දි ලැබීමක් / ලැබිය යුතු වීමක් හෝ නොවීය.

## 24.5 තාවකාලිකව අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ

වාර්තාකරණ දිනට තාවකාලිකව නිෂ්කාර්යව පැවති දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් නොවීය.

## 24.6 රඳවාගෙන පවතින සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි

2022 දෙසැම්බර් 31 දිනට බැංකුව මගින් රඳවාගෙන පවතින සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි පිළිබඳ විස්තර පහත දක්වා ඇත

| පරිශ්‍රයේ නම සහ ලිපිනය | ප්‍රමාණය (පර්චස්) | ගොඩනැගිල්ල (වගර් අඩි) | තක්සේරු කළ දිනය | ඉඩමේ පිරිවැය (රු.) | ගොඩනැගිල්ලේ පිරිවැය (රු.) | මුළු වටිනාකම (රු.) | සමුච්චිත ක්ෂය කිරීම (රු.) | ලියා තැබූ පිරිවැය වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රධාන කාර්යාලය - අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය** | 50.4 | 5,375 | 2012 මාර්තු 5 | 142,244,280 | 139,378,152 | 281,622,432 | 63,995,577 | 217,626,855 |
| **මධ්‍යම පළාත** | | | | | | | | |
| මාතලේ - අංක 62, ප්‍රධාන වීදිය, මාතලේ | 4.8 | 2,280 | 2014 දෙසැම්බර් 26 | - | 11,915,631 | 11,915,631 | 4,774,414 | 7,141,217 |
| දඹුල්ල - අංක 734, අනුරාධපුර පාර, දඹුල්ල | 8.2 | 2,210 | 2003 දෙසැම්බර් 18 | 565,000 | 2,286,908 | 2,851,908 | 2,286,907 | 565,001 |
| වැලිගමුව - හෙට්ටිපොළ, වැලිගමුව | 38.0 | 1,740 | 2009 අගෝස්තු 24 | - | 7,581,277 | 7,581,277 | 5,660,205 | 1,921,073 |
| ආගරපතන - අංක 158, හුල්බaak, ආගරපතන | 10.8 | 1,598 | 2012 අගෝස්තු 17 | | 1,260,000 | 1,260,000 | 719,999 | 540,001 |
| නාවුල- 26, දඹුල්ල පාර, නාවුල | 20.0 | 1,640 | 1998 පෙබරවාරි 25 | 2,471,252 | 8,600,539 | 11,071,791 | 3,871,162 | 7,200,629 |
| ලග්ගල - නව නගරය, ලග්ගල | 40.0 | 3,261 | | - | 23,565,250 | 23,565,250 | 4,228,832 | 19,336,417 |
| **උතුරු මැද පළාත** | | | | | | | | |
| මිහින්තලේ - ත්‍රිකුණාමලය පාර, මිහින්තලය | 20.0 | 6,359 | 2005 දෙසැම්බර් 30 | 0 | 8,859,427 | 8,859,427 | 7,522,342.67 | 1,137,084 |
| මැදවච්චිය - මන්නාරම පාර, මැදවච්චිය | 34.0 | 4,371 | 2013 මාර්තු 19 | - | 16,192,223 | 16,192,223 | 8,096,111.50 | 8,096,111 |
| ගලෙන්බිඳුණුවැව - පොළ පාර, ගලෙන්බිඳුණුවැව | 70.0 | 1,687 | 2013 මාර්තු 14 | - | 5,820,073 | 5,820,073 | 2,788,710.91 | 3,031,362 |
| මැදිරිගිරිය - ප්‍රධාන වීදිය, මැදිරිගිරිය | 40.0 | - | 2007 දෙසැම්බර් 31 | - | 9,643,650 | 9,643,650 | 7,241,381,08 | 2,402,269 |
| සිරිපුර - නව නගරය, සිරිපුර | 30.0 | 4,973 | 2016 පෙරවාරි 24 | - | 22,291,625 | 22,291,625 | 7,637,622.47 | 14,654,003 |
| තිරප්පනේ - නුවර පාර, තිරප්පනේ | 65.4 | 8,030 | 2016 දෙසැම්බර් 8 | 379,869.25 | 46,150,602 | 46,150,602 | 9,965,269.98 | 36,565,202 |
| අංත 343, මුස්ලිම් පල්ලිය පාර, අදියර 01, අනුරාධපුර | | | | | 125,000 | 125,000 | 25,000.00 | 100,000 |
| **වයඹ පළාත** | | | | | | | | |
| මාවතගම - නුවර පාර, මාවතගම | 21.5 | - | 2016 මාර්තු 3 | 10,801,311 | | 10,801,311 | - | 10,801,311 |
| කුරුණෑගල පළාත් කායර්ාලය - අංක 155, මීගමුව පාර, කුරුණෑගල | 14.0 | 8,484 | 2004 දෙසැම්බර් 29 | - | 18,227,912 | 18,227,912 | 11,777,882 | 6,450,030 |
| පොල්පිතිගම - කුරුණෑගල පාර, පොල්පිතිගම | 20.0 | 2,784 | 2014 දෙසැම්බර් 30 | - | 16,782,785 | 16,782,785 | 6,525,330 | 10,257,455 |
| මාම්පුරි - කල්පිටිය පාර, මාම්පුරි | 80.0 | 15,181 | 2014 දෙසැම්බර් 30 | - | 25,188,128 | 25,188,128 | 9,927,598 | 15,260,530 |
| පාලකුඩා- කල්පිටි පාර, තලවිල | 20.3 | 2,244 | 2003 මාර්තු 25 | - | 5,792,157 | 5,792,157 | 3,786,171 | 2,005,987 |
| නාත්තන්ඩිය - මාරවිල පාර, නාත්තන්ඩිය | 15.7 | 1,200 | 2003 පෙබරවාරි 11 | - | 36,799,082 | 36,799,082 | 7,666,964 | 29,132,118 |
| වාරියපොල - අංක 29/4, අධිකාරී මාවත, වාරියපොල | 10.0 | 6,208 | 2013 නොවැම්බර් 12 | - | 35,609,963 | 35,609,963 | 10,956,316 | 24,653,647 |

| පරිශ්‍රයේ නම සහ ලිපිනය | ප්‍රමාණය (පර්චස්) | ගොඩනැගිල්ල (වර්ග අඩි) | තක්සේරු කළ දිනය | ඉඩමේ පිරිවැය (රු.) | ගොඩනැගිල්ලේ පිරිවැය (රු.) | මුළු වටිනාකම (රු.) | සමුච්චිත ක්ෂය කිරීම (රු.) | ලියා තැබූ පිරිවැය වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| **දකුණු පළාත** | | | | | | | | |
| කැකනදුර- වෙහෙරහේන පාර, කැකනදුර | 12.0 | 1,704 | 2004 මැයි 10 | 1,418,000 | 1,194,535 | 2,612,535 | 1,015,082 | 1,597,453 |
| අක්මීමන - ගනේගොඩ, අක්මීමන | 6.5 | 1,614 | 1993 ඔක්තෝබර් 02 | - | 600,000 | 600,000 | 599,999 | 1 |
| ගාල්ල ශාඛාව - අංක 301, මාතර පාර, මාගාල්ල, ගාල්ල | 30.0 | 1,224 | 1999 ඔක්තෝබර් 09 | - | 8,894,553 | 8,894,553 | 3,790,392 | 5,104,161 |
| කටුවාන, උඩ ගොමදිය පාර, කටුවාන | 39.1 | 3,150 | 2001 මාර්තු 22 | 1,320,000 | 7,406,958 | 8,726,958 | 6,294,223 | 2,432,735 |
| තංගල්ල - 81, බෙලිඅත්ත පාර, තංගල්ල | 16.0 | 1,200 | 2005 මැයි 05 | 1,620,667 | 1,675,534 | 3,296,201 | 1,675,152 | 1,621,049 |
| ඌරගස්මන්හන්දිය- කොස්ගොඩ පාර, ඌරගස්මන්හන්දිය | 20.0 | 1,940 | 2012 අප්‍රේල් 10 | - | 13,354,618 | 13,354,618 | 6,494,369 | 6,860,249 |
| අම්බලන්තොට - 139, හම්බන්තොට පාර, අම්බලන්තොට | 25.0 | 2,568 | 2004 අගෝස්තු 30 | 2,000,000 | 3,070,100 | 5,070,100 | 2,608,884 | 2,461,216 |
| අගුණකොළපැලැස්ස, රන්න පාර, අගුණකොළපැලැස්ස | 12.0 | 2,371 | 2001 අගෝස්තු 27 | - | 3,470,348 | 3,470,348 | 2,526,266 | 944,082 |
| ගාල්ල දිස්ත්‍රික් කායර්ාලය - අංක 301, මාතර පාර, මාගාල්ල, ගාල්ල | 30.0 | 2,000 | 1999 ඔක්තෝබර් 08 | 1,750,000 | 4,884,716 | 6,634,716 | 3,873,608 | 2,761,108 |
| අංක 01, ගල්වල පාර, හම්බන්තොට | 237.0 | 16,315 | | | 33,082,199 | 33,080,199 | 16,993,513 | 16,088,687 |
| තල්ගස්වල | | | 2022 මැයි 26 | 3,004,320 | | 3,004,320 | | 3,004,320 |
| **ඌව පළාත** | | | | | | | | |
| ගිරාඳුරුකෝට්ටේ - සංවර්ධන මධ්‍යස්ථානය, ගිරාඳුරුකෝට්ටේ | 10.1 | 1,1661 | 2011 නොවැම්බර් 30 | | 3,227,674.2 | 3,227,674 | 1,846,918 | 1,380,756 |
| මොණරාගල දිස්ත්‍රික් කායර්ාලය, - මොණරාගල පාර, බුත්තල | 34.0 | 1,706 | 1999 ඔක්තෝබර් 22 | 3,162,263 | | 3,162,263 | 2,819,890 | 342,373 |
| බණ්ඩාරවෙල සින්නක්කර පරිශ්‍රය | 7.7 | | 2013 පෙබරවාරි 18 | 1,150,000 | - | 1,150,000 | - | 1,150,000 |
| **සබරගමුව පළාත** | | | | | | | | |
| බලංගොඩ - අංක 17, තානායම පිවිසුම, බලංගොඩ | 20.0 | - | 2013 පෙබරවාරි 18 | 6,679,574 | | - | 1,584 | 6,667,990 |
| **නැගෙනහිර පළාත** | | | | | | | | |
| ස්විස් ගම්මානය, මඩකලපුව | | | | 173,370 | | 173,370 | | 173,370 |
| ඔරලෝසු කණුව හන්දිය, බස් නැවතුම ඉදිරිපිට, අම්පාර | | | | 468,550 | | 468,550 | | 468,550 |
| නැගෙනහිර පළාත -දෙහිඅත්තකණ්ඩිය | | | | | 5,778,419 | 5,778,419 | 267,549 | 5,510,870 |
| **එකතුව** | | | | 179,208,456 | 528,710,039 | 707,918,496 | 230,261,223 | 477,657,272 |

## 25. අස්පෘශ්‍ය වත්කම්

| | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **පරිගණක මෘදුකාංග පිරිවැය** | | |
| ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 366,809,102 | 277,845,780 |
| එකතු කිරීම් | 1,987,025 | 123,380,926 |
| බැහැර කිරීම | - | (34,417,603) |
| **දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය** | 368,796,127 | 366,809,103 |
| | | |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 253,120,322 | 256,573,080 |
| වසර සඳහා අය කිරීම | 46,808,068 | 30,772,232 |
| බැහැර කිරීම | - | (34,224,989) |
| දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය | 299,928,383 | 253,120,322 |
| **ශුද්ධ පොත් අගය** | 68,867,744 | 113,688,780 |

25.1 වාර්තා කරන දිනට බැංකුවේ අස්පෘශ්‍ය වත්කම්වල හිමිකම් පිළිබඳ කිසිදු තහනමක් නොතිබුණි තවද. වගකීම් සඳහා සුරැකුම්පත් ලෙස ඇපයට තබා ඇති අයිතම කිසිවක් නොතිබුණි.

## 26. කල්බදු

### බදුකරු ලෙස කල්බදු

බැංකුව කල්බදු යටතේ ඇතැම් ශාඛා සහ කාර්යාල පරිශ්‍ර ලබාගෙන ඇති මෙම කල්බදු සාමාන්‍යයෙන් වසර 05ක කාලයක් සඳහා ක්‍රියාත්මක වන අතර, එම දිනයෙන් පසු කල්බදු අළුත් කිරීමේ හැකියාව ඇත.

## 26.1 භාවිත හිමිකම් වත්කම්

| | 2022 | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි<br>රු. | මෝටර් වාහන<br>රු. | එකතුව<br>රු. |
| **පිරිවැය** | | | |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 1,426,641,309 | 51,945,919 | 1,478,587,228 |
| එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් | 322,279,642 | 18,593,541 | 340,873,183 |
| **2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය** | 1,748,920,951 | 70,539,460 | 1,819,460,411 |
| | | | |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | |
| 2022 ජනවාරි 01 දිනට ශේෂය | 773,511,982 | 50,794,992 | 824,306,973 |
| කාල සීමාව සඳහා අයකිරීම | 270,663,435 | 6,393,304 | 277,056,739 |
| **2022 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය** | 1,044,175,417 | 57,188,296 | 1,101,363,713 |
| **2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 704,745,534 | 13,351,164 | 718,096,698 |

| | 2021 | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි | මෝටර් වාහන. | එකතුව |
| | රු. | රු. | රු. |
| **පිරිවැය** | | | |
| 2021ජනවාරි 01 දිනට ශේෂය | 1,086,118,299 | 51,945,918 | 1,138,064,217 |
| එකතු කිරීම් හා වැඩිදියුණු කිරීම් | 152,709,208 | - | 152,709,208 |
| **2021 දෙසැම්බර් 31 දිනට පිරිවැය** | 1,238,827,507 | 51,945,918 | 1,290,773,425 |
| | | | |
| **සමුච්චිත ක්‍රමක්ෂය** | | | |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 504,412,649 | 34,673,010 | 539,085,659 |
| කාල සීමාව සඳහා අයකිරීම | 230,473,761 | 16,121,982 | 246,595,743 |
| **2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය** | 734,886,410 | 50,794,992 | 785,681,402 |
| **2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය** | 503,941,097 | 1,150,926 | 505,092,023 |

## 26.2 කල්බදු වගකීම්

| | 2022 | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි | මෝටර් වාහන | එකතුව |
| | .රු. | රු. | රු. |
| **2022 ජනවාරි 1 දිනට ශේෂය** | **762,815,214** | **1,356,855** | **764,172,070** |
| ආරම්භක ශේෂ සංශෝධනය - ගොඩනැගිලි | - | - | - |
| එකතු කිරීම් | **307,094,220** | **18,593,541** | **325,687,761** |
| පොලී එකතු කිරීම | **49,793,001** | **198,181** | **49,991,183** |
| ගෙවීම් | **(320,454,959)** | **(6,740,250)** | **(327,195,209)** |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **799,247,477** | **13,408,328** | **812,655,804** |

| | 2021 | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි | මෝටර් වාහන | එකතුව |
| | .රු. | රු. | රු. |
| **2021 ජනවාරි 1 දිනට ශේෂය** | 692,975,425 | 19,465,192 | 712,440,617 |
| ආරම්භක ශේෂ සංශෝධනය - ගොඩනැගිලි | - | - | - |
| එකතු කිරීම් | 317,494,655 | - | 317,494,655 |
| පොලී එකතු කිරීම | 61,733,479 | 753,433 | 62,486,912 |
| ගෙවීම් | (309,388,344) | (18,861,770) | (328,250,114) |
| **2021 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 762,815,214 | 1,356,855 | 764,172,070 |

### 26.2.1 කල්බදු වගකීම්වල කල්පිරීම් විශ්ලේෂණය - ගිවිසුම්ගත කළ ගිණුම්ගත නොකළ මුදල් ප්‍රවාහ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| වසර 1ට අඩු | **48,815,297** | 270,606,187 |
| වසර 1 - 5 | **763,840,507** | 564,054,752 |
| | **812,655,804** | 834,660,939 |

## 26.3 ලාභ හෝ අලාභ ලෙස පිළිගත් ප්‍රමාණයන්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| කල්බදු වගකීම් සඳහා පොලිය | **49,991,183** | 62,486,912 |
| වසර සඳහා ක්‍රමක්ෂිත ගාස්තුව | **277,056,739** | 246,595,743 |
| | **327,047,922** | 309,082,655 |

## 26.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි හඳුන්ගත් වටිනාකම්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| කල්බදු වාරික ගෙවීම් | **327,195,209** | 328,250,114 |
| | **327,195,209** | 328,250,114 |

## 27. විලම්බිත බදු වත්කම් / වගකීම්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| විලම්බිත බදු වත්කම් | **(3,664,188,331)** | (1,464,843,346) |
| විලම්බිත බදු වත්කම් | **139,013,413** | 201,048,274 |
| ශුද්ධ විලම්බිත බදු (වත්කම්) / වගකීම් | **(3,525,174,918)** | (1,263,795,071) |

## 27.1 ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇති වටිනාකම

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ලාභ හෝ අලාභ තුළ හඳුනාගත් | **(2,308,254,679)** | (351,453,892) |
| වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත් | **46,874,831** | (8,620,208) |

## 27.2 විලම්බිත බදු ශේෂයන්හි සංචලනය

| 2022 | 2022 ජනවාරි 1 දිනට ශුද්ධ ශේෂය | ලාභ හෝ අලාභ තුළ හඳුනා ගත් | වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත් | 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ශේෂය | විලම්බිත බදු වත්කම් | විලම්බිත බදු වගකීම් |
|---|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | **91,465,510** | **8,196,278** | **-** | **99,661,788** | **-** | **99,661,788** |
| කල්බදු | **109,582,764** | **(70,231,139)** | **-** | **39,351,625** | **-** | **39,351,625** |
| වෙන් කිරීම් | **(697,722,669)** | **(2,067,359,053)** | **-** | **(2,765,081,722)** | **(2,765,081,722)** | **-** |
| සේවක ප්‍රතිලාභ | **(731,151,537)** | **(243,197,635)** | **46,874,831** | **(927,474,341)** | **(927,474,341)** | **-** |
| මෙහෙයුම් කල්බදු | **(35,969,138)** | **64,336,869** | **-** | **28,367,732** | **28,367,732** | **-** |
| | **(1,263,795,070)** | **(2,308,254,679)** | **46,874,831** | **(3,525,174,918)** | **(3,664,188,331)** | **139,013,413** |

| 2021 | 2021 ජනවාරි 1 දිනට ශුද්ධ ශේෂය | ලාභ හෝ අලාභ තුළ හඳුනා ගත් | වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගත් | 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ශේෂය | විලම්බිත බදු වත්කම් | විලම්බිත බදු වගකීම් |
|---|---|---|---|---|---|---|
| දේපල, පිරියත හා උපකරණ | 121,487,447 | (30,021,937) | - | 91,465,510 | - | 91,465,510 |
| කල්බදු | 104,950,300 | 4,632,464 | - | 109,582,764 | - | 109,582,764 |
| ණය අලාභ සඳහා | (440,421,507) | (257,301,162) | - | (697,722,669) | (697,722,669) | - |
| සේවක ප්‍රතිලාභ | (667,889,910) | (54,641,419) | (8,620,208) | (731,151,537) | (731,151,537) | - |
| මෙහෙයුම් කල්බදු | (21,847,299) | (14,121,838) | - | (35,969,138) | (35,969,138) | - |
| | (903,720,969) | (351,453,892) | (8,620,208) | (1,263,795,069) | (1,464,843,344) | 201,048,274 |

## 28. වෙනත් වත්කම්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **පිරිවැය** | | |
| **මූල්‍ය වත්කම්** | | |
| ලැබිය යුතු දෑ | **5,277,754,780** | 3,559,214,197 |
| තැන්පතු හා අත්තිකාරම් | **18,116,724** | 34,738,696 |
| විවිධ ණයගැතියන් | **138,577,994** | 61,277 |
| වෙනත් | **583,876,453** | 127,627,766 |
| | **6,018,325,951** | 3,721,641,936 |
| **මූල්‍ය නොවන වත්කම්** | | |
| පූර්ව ගෙවීම් | **125,158,025** | 76,407,532 |
| වෙනත් | **1,896,047,149** | 1,105,926,405 |
| ලැබිය යුතු බදු | **3,084,424** | 3,084,424 |
| | **2,024,289,598** | 1,185,418,361 |
| **වෙනත් වත්කම් එකතුව** | **8,042,615,549** | 4,907,060,297 |

## 29. බැංකු වෙත ගෙවිය යුතු

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ණය ගැනීම් | **31,220,478,612** | 15,726,229,460 |
| කල්බදු (සටහන 29.1) | **96,000** | 96,000 |
| ප්‍රතිමූල්‍යන | **16,250,132,445** | 13,774,611,083 |
| **බැංකු වෙත ගෙවිය යුතු එකතුව** | **47,470,707,057** | 29,500,936,543 |

## 29.1 කල්බදු කල්පිරීම

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| වසර 1ට නොවැඩි | **96,000** | 96,000 |
| කල්බදු (සටහන 29.1) | **96,000** | 96,000 |
| අඩු කළා - අවිනිශ්චිත ගිණුමෙහි පොලිය | **-** | - |
| **එකතුව** | **96,000** | 96,000 |

## 30. ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් - වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 210,301,323,468 | 187,752,465,256 |
| **ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් එකතුව - වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු** | 210,301,323,468 | 187,752,465,256 |

### 30.1 ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් - වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **30.1.1 නිපැයුම අනුව** | | |
| ඉතුරුම් තැන්පතු | 40,472,860,914 | 46,993,998,454 |
| දිගුකාලීන ඉතුරුම් | 25,379,586,421 | 25,165,494,768 |
| ස්ථාවර තැන්පතු | 144,448,876,133 | 115,592,972,034 |
| **ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම්** | 210,301,323,468 | 187,752,465,256 |
| **30.1.2 ව්‍යවහාර මුදල් ඒකකය අනුව** | | |
| ශ්‍රී ලංකා රුපියල් | 210,301,323,468 | 187,752,465,256 |
| **ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් එකතුව** | 210,301,323,468 | 187,752,465,256 |
| **30.1.3 කල්පිරීම අනුව** | | |
| වසරක් ඇතුළත ගෙවිය යුතු | 153,700,366,310 | 127,934,846,256 |
| වසරකට පසු ගෙවිය යුතු | 56,600,957,158 | 59,817,618,999 |
| **ක්‍රමක්ෂිත පිරිවැය මත මූල්‍ය වගකීම් එකතුව** | 210,301,323,468 | 187,752,465,256 |

## 31. නිකුත් කරන ලද ණය සුරැකුම්පත්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| නිදහස් කළ හැකි ණයකර (සටහන 31.1) | - | 2,000,000,000 |
| **නිකුත් කරන ලද මුළු ණය සුරැකුම්පත්** | - | 2,000,000,000 |

### 31.1 නිදහස් කරගත හැකි ණයකර

| | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය | 2,000,000,000 | 2,000,000,000 |
| නිදහස් කරගත් ණයකර | (2,000,000,000) | - |
| ගෙවිය යුතු පොලී | 76,176,663 | 311,500,000 |
| ගෙවන ලද පොලී | (76,176,663) | (311,500,000) |
| **දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | - | 2,000,000,000 |

## නිකුත් කළ ණයකර වල විස්තර

| | සටහන | ණයකර සංඛ්‍යාව | මුහුණත් වටිනාකම රු. | ක්‍රමක්ෂිත පිරිවැය 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|---|---|---|
| 2017 දී නිකුත් කළ ණයකර | 31.1.1 | 20,000,000 | 2,000,000,000 | **2,000,000,000** | 2,000,000,000 |
| **බැංකුව විසින් නිකුත් කර ඇති මුළු ණයකර** | | 20,000,000 | 2,000,000,000 | **2,000,000,000** | 2,000,000,000 |

## 31.1.1 2017 දී නිකුත් කළ ණයකර

2017 දී නිකුත් කරන ලද රු.100/- බැගින් වූ අනාරක්ෂිත, යටත් නිදහස් කළ හැකි වසර 5ක ණයකර. මෙම ණයකර කොළඹ කොටස් වෙළඳපොලේ මිල ගණන් යටතේ දක්වා නොමැත.

| කාණ්ඩය | ණයකර සංඛාව | මුහුණත් වටිනාකම(රු) | 2022 ක්‍රමක්ෂිත පිරිවැය(රු) | 2021 ක්‍රමක්ෂිත පිරිවැය | වෙන් කළ දිනය | කල් පිරීම් දිනය | පොලී අනුපාතය |
|---|---|---|---|---|---|---|---|
| අ | 3,000,000 | 300,000,000 | 300,000,000 | 300,000,000 | 3/31/2017 | 3/31/2022 | ස්ථාවර - වසරකට 16.00%ක් වාර්ෂිකව ගෙවිය යුතුය |
| ආ | 17,000,000 | 1,700,000,000 | 1,700,000,000 | 1,700,000,000 | 3/31/2017 | 3/31/2022 | ස්ථාවර - 15.5% ක් අර්ධ - වාර්ෂිකව ගෙවිය යුතුය |
| | 20,000,000 | 2,000,000,000 | 2,000,000,000 | 2,000,000,000 | | | |

## 31.2 ගෙවිය යුතු ණයකර

| | 2022 මුහුණත් වටිනාකම රු. | 2022 ක්‍රමක්ෂිත පිරිවැය රු. | 2021 මුහුණත් වටිනාකම රු. | 2021 ක්‍රමක්ෂිත පිරිවැය රු. |
|---|---|---|---|---|
| වසරක් ඇතුලත ගෙවිය යුතු මුදල | **2,000,000,000** | **2,000,000,000** | 2,000,000,000 | 2000000000 |
| වසරකට පසු ගෙවිය යුතු | - | - | - | - |
| | **2,000,000,000** | **2,000,000,000** | 2,000,000,000 | 2,000,000,000 |

## 32. පුවර්තන බදු වගකීම්

| | 2022 (රු.) | 2021(රු.) |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | **503,021,886** | 378,203,555 |
| වසර සඳහා ලාභය මත පදනම් වූ ප්‍රවර්තන බදු (15 සටහන) | **1,301,405,280** | 752,050,328 |
| පෙර වසරවලට අදාළ ඌන වෙන්කිරීම (15 සටහන) | **16,570,076** | 68,605,453 |
| බදු අයභාරය | **800,598,848** | - |
| බදු ගෙවීම් | **(1,609,671,944)** | (695,837,450) |
| **දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | **1,011,924,146** | 503,021,886 |

## 33. වෙනත් වගකීම්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **මූල්‍ය වගකීම** | | |
| විවිධ ණයහිමියන් | **1,948,511,439** | 593,559,411 |
| වෙනත් ගෙවිය යුතු දෑ | **3,663,600,338** | 4,177,558,407 |
| සංක්‍රමණය තුළ අන්තර්බැංකු ගනුදෙනු | **1,662,616** | 11,434 |
| මෙහෙයුම් කල්බදු වගකීම (සටහන 26.2) | **812,655,805** | 764,172,070 |
| | **6,426,430,198** | 5,535,301,322 |
| **මූල්‍ය නොවන වගකීම** | | |
| වෙනත් ගෙවිය යුතු දෑ | **860,174,209** | 2,175,135,031 |
| අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ ප්‍රතිපාදන - ණය ආශ්‍රිත බැඳීම් හා අසම්භාව්‍යතා | **6,882,856** | 3,308,006 |
| | **867,057,065** | 2,178,443,036 |
| **එකතුව** | **7,293,487,262** | 7,713,744,358 |

## 34. විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම (34.1 සටහන) | **3,091,581,136** | 3,046,464,739 |
| | **3,091,581,136** | 3,046,464,739 |

## 34.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගත් ශුද්ධ වත්කම් / (වගකීම්)

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය | **3,046,464,739** | 2,782,874,624 |
| වසරට අදාළ පිරිවැය (සටහන 34.2) | **567,113,577** | 379,779,626 |
| විශ්‍රාමලත් සේවකයන්ට ගෙවිය යුතු | **(299,493,340)** | (17,177,614) |
| බැඳීම මත ශුද්ධ ආයු ගණන (ලාභ) / අලාභ (34.3 සටහන) | **(156,249,438)** | 35,917,534 |
| | **3,157,835,538** | 3,181,394,170 |
| බැංකුව විසින් ගෙවන ලද ප්‍රතිලාභ | **(66,254,402 )** | (134,929,431) |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **3,091,581,136** | 3,046,464,739 |

## 34.2 ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගත් වටිනාකම්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ප්‍රවර්තන සේවා පිරිවැය | **216,770,132** | 162,715,405 |
| පොලී පිරිවැය | **350,343,445** | 217,064,221 |
| **ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගත් මුළු වටිනාකම** | **567,113,577** | 379,779,626 |

## 34.3 වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගත් වටිනාකම්

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| බැඳීම මත ශුද්ධ ආයු ගණන (ලාභ)/ අලාභ | **(156,249,438)** | 35,917,534 |
| වෙනත් විස්තීර්ණ ආදායම තුළ හඳුනාගත් මුළු වටිනාකම | **(156,249,438)** | 35,917,534 |

34.4 ආයු ගණනය පිළිබඳ වෘත්තීයමය ආයතනයක් වන, ඇක්චුරියල් ඇන්ඩ් මැනේජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම විසින් 2022 දෙසැම්බර් 31 වැනි දින පාරිතෝෂික අරමුදල සම්බන්ධ ආයු ගණන තක්සේරුවක් සිදුකරන ලදී. ආයුගණක විසින් අරමුදලෙහි වටිනාකම තක්සේරු කිරීම සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 19 (සේවක ප්‍රතිලාභ) මගින් නිර්දේශිත "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමවේදය" යොදා ගන්නා ලදී.

| ආයුගණන උපකල්පන | 2022 | 2021 |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට වට්ටම් අනුපාතය | **18.00%** | 11.50% |
| අනාගත වැටුප් වර්ධක අනුපාතය | **2023, 2024, 2026, 2027 & 2029 - 8%, 2025 සහ 2028 - 20%** | 2022-21%, 2023, 2024, 2026, 2027 සහ 2029 - 8%, 2025 සහ 2028 - 20% |
| මරණ අනුපාතය | **A1967/70 මරණ අනුපාත වගුව** | A 1967/70 මරණ අනුපාත වගුව |
| විශ්‍රාම ලැබීමේ වයස | **අවුරුදු 60** | අවුරුදු 60 |

## 34.5 ආයුගණන තක්සේරුව සඳහා යොදා ගන්නා ලද උපකල්පනවල සංවේදිතාව

සේවක ප්‍රතිලාභ වගකීම මැනීමේ දී සෙසු සියළු විචල්‍යයන් ස්ථාවර යැයි උපකල්පනය කරමින් යොදා ගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් හි සාධාරණව සිදුවිය හැකි වෙනස්වීම් කෙරෙහි සංවේදිතාවය පහත වගුවෙන් නිරූපනය කෙරේ.

මුළු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි සංවේදිතාව යනු වට්ටම් අනුපාතිකයෙහි සහ වැටුප් වර්ධක අනුපාතිකයෙහි උපකල්පිත වෙනස්කම් වර්ෂය වෙනුවෙන් මුළු විස්තීර්ණ ආදායම සහ සේවක ප්‍රතිලාභ බැඳීම මත ඇති කරන බලපෑම වේ.

| | | 2022 | | 2021 | |
|---|---|---|---|---|---|
| වට්ටම අනුපාතයෙහි ඉහළ / (පහළ) යාම | වැටුප් වර්ධක අනුපාතයෙහි ඉහළ / (පහළ) යාම | වසර සඳහා ප්‍රතිඵල තුළ ආදායම් ප්‍රකාශන ඉහළ යාම / (අඩුවීම) මත සංවේදිතා බලපෑම | වගකීමෙහි නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ඉහළ/ (පහළ) යාමේ ප්‍රවර්තන වටිනාකම | වසර සඳහා ප්‍රතිඵල තුළ ආදායම් ප්‍රකාශන ඉහළ යාම / (අඩුවීම) මත සංවේදිතා බලපෑම | වගකීමෙහි නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ ඉහළ/ (පහළ) යාමේ ප්‍රවර්තන වටිනාකම |
| | | රු. | රු. | රු. | රු. |
| +1% | - | **187,672,691** | **(187,672,691)** | 224,678,599 | (224,678,599) |
| -1% | - | **(212,584,985)** | **212,584,985** | (259,968,345) | 259,968,345 |
| - | 1% | **(218,242,691)** | **218,242,691** | (259,217,411) | 259,217,411 |
| - | -1% | **195,388,622** | **(195,388,622)** | 227,994,528 | (227,994,528) |

## 35. ප්‍රකාශිත ප්‍රාග්ධනය

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| **සාමාන්‍ය කොටස්** | | |
| ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය | 8,047,229,930 | 8,047,229,930 |
| කොටස් නිකුතුව | 174,634,635 | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 8,221,864,566 | 8,047,229,930 |

සාමාන්‍ය කොටස් හිමිකරුවන්ට වරින් වර ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශ ලබා ගැනීමට හිමිකම් ඇති අතර බැංකුවේ රැස්වීම් සඳහා එක් කොටසකට එක් ඡන්දයක් බැගින් හිමිකම් කියයි.

## 36. ව්‍යවස්ථාපිත සංචිත අරමුදල

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය | 777,778,133 | 762,462,998 |
| කාල සීමාව තුළ මාරු කිරීම් | 67,469,733 | 15,315,136 |
| **දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය** | 845,247,866 | 777,778,133 |

## 37. වෙනත් සංචිත

| 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2022 ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය<br>රු. | සංචලන / මාරු කිරීම<br>රු. | 2022 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය<br>රු. |
|---|---|---|---|
| පොදු සංචිත අරමුදල | 3,299,712,282 | 269,878,930 | 3,569,591,212 |
| විශේෂ සංචිත අරමුදල | 632,168,462 | 67,469,733 | 699,638,194 |
| **එකතුව** | 3,931,880,744 | 337,348,663 | 4,269,229,406 |

| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2021 ජනවාරි 1 දිනට ආරම්භක ශේෂය<br>රු. | සංචලන / මාරු කිරීම<br>රු. | 2021 දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය<br>රු. |
|---|---|---|---|
| පොදු සංචිත අරමුදල | 3,238,451,740 | 61,260,542 | 3,299,712,282 |
| විශේෂ සංචිත අරමුදල | 616,853,326 | 15,315,135 | 632,168,461 |
| **එකතුව** | 3,855,305,066 | 76,575,677 | 3,931,880,743 |

## 38. අදාළ පාර්ශව හෙළිදරව් කිරීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 24 - "සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්" අනුව, සම්බන්ධිත පාර්ශව ලෙස අර්ථ දක්වා ඇති පාර්ශවයන්, එනම් වැදගත් ආයෝජකයින්, ප්‍රධාන කළමනාකරණ පිරිස් (KMPs), ප්‍රධාන කළමනාකරණ පිරිස්වල සමීප පවුලේ සාමාජිකයන් (CFMs) සහ අනෙකුත් අදාළ අස්තිත්ව සමග බැංකුව ගනුදෙනුවලට එළඹ ඇත. එම ගනුදෙනුවලට ණය දීමේ ක්‍රියාකාරකම්, පිළිගැනීම සහ ස්ථානගත කිරීම්, ශේෂ පත්‍රයෙන් පිටත ගනුදෙනු සහ සහනදායී අනුපාත යටතේ සියලුම කාර්ය මණ්ඩලයට ඒකාකාරව අදාළ වන යෝජනා ක්‍රම යටතේ ප්‍රධාන කළමනාකරණ පිරිස් KMPs ලබාගෙන ඇති ගනුදෙනු හැර, වාණිජ අනුපාත යටතේ අතේ දුරින් සිදු කරනු ලබන සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී අනෙකුත් බැංකු සහ මූල්‍ය සේවා සැපයීම ඇතුළත් වේ

## 38.1 බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය - LKAS 24 - "සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්" අනුව, ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට (KMPs) බැංකුවේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම සඳහා අධිකාරිය සහ වගකීම ඇති නිලධාරීන් ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ පිරිස්වලට (KMPs) බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන විධායක නිලධාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර සාමාන්‍යාධිකාරීවරුන්, ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරීවරු, අනුකූලතා නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ඇතුළත් වේ.

### 38.1.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ලබා දුන් ප්‍රතිලාභ

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා ලබා දුන් ප්‍රතිලාභ පහත පරිදි වේ;

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| කෙටි කාලීන සේවක ප්‍රතිලාභ | 160,829,395 | 138,863,934 |
| පශ්චාත්-සේවා කාල ප්‍රතිලාභ | - | - |
| | 160,829,395 | 138,863,934 |

### 38.1.2 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සහ ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයන් නිරත වන ගනුදෙනු, ක්‍රියාදාම හා ගිවිසුම්

ප්‍රධාන කළමනාකාරීත්වයට අදාළ ගනුදෙනුවල සමස්ත අගයන් සහ හිඟ ශේෂයන් පහත පරිදි විය;

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අයිතම | | |
| වත්කම් | | |
| ණය සහ ලැබිය යුතු දෑ | 65,671,853 | 69,063,712 |
| | 65,671,853 | 69,063,712 |
| වගකීම් | | |
| තැන්පතු | 139,035,622 | 113,343,587 |
| | 139,035,622 | 113,343,587 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි අයිතම | | |
| පොලී ආදායම | 506,851 | 3,849,843 |
| පොලී වියදම | 8,423,376 | 4,494,112 |
| | 8,930,227 | 8,343,955 |

## 38.1.2.1 ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සමීප සාමාජිකයන් සඳහා ලබා දෙන ප්‍රතිලාභවලට අදාළ නියම සහ කොන්දේසි

| ණය වර්ගය | අනෙකුත් නියම සහ කොන්දේසි | 2022.12.31 දිනට ශේෂය | 2022.12.31 දිනට ඇප විස්තර | |
|---|---|---|---|---|
| | | | වර්ගය | වටිනාකම |
| සේවක නිවාස ණය | සේවකයන් සියලුම දෙනාට හෝ නිශ්චිත කාණ්ඩවලට හෝ අදාළ අනුමත යෝජනා ක්‍රම යටතේ වන කාර්ය මණ්ඩල ණය හැරුණු විට නියම හා කොන්දේසි සම්බන්ධතාවක් නොමැති පාර්ශව සමඟ සංසන්දනීය ගනුදෙනුවල නියමයන්ට සමාන වේ. | 15,149,524 | ඉඩම් | 182,500,000 |
| සේවක රථ වාහන ණය | | 16,082,731 | වාහන | 60,437,000 |
| තැන්පතු එරෙහි ණය | | 22,474,505 | ස්ථාවර තැන්පතු / ඉතුරුම් තැන්පතු | 28,093,131 |
| පරිභෝජන සහ සෙසු ණය | | 11,965,093 | | |
| | | 65,671,853 | | 271,030,131 |

| ණය වර්ගය | අනෙකුත් නියම සහ කොන්දේසි | 2021.12.31 දිනට ශේෂය | 2021.12.31 දිනට ඇප විස්තර | |
|---|---|---|---|---|
| | | | වර්ගය | වටිනාකම |
| සේවක නිවාස ණය | සේවකයන් සියලුම දෙනාට හෝ නිශ්චිත කාණ්ඩවලට හෝ අදාළ අනුමත යෝජනා ක්‍රම යටතේ වන කාර්ය මණ්ඩල ණය හැරුණු විට නියම හා කොන්දේසි සම්බන්ධතාවක් නොමැති පාර්ශව සමඟ සංසන්දනීය ගනුදෙනුවල නියමයන්ට සමාන වේ. | 22,525,008 | ඉඩම් | 206,650,000 |
| සේවක රථ වාහන ණය | | 32,476,614 | වාහන | 98,208,912 |
| තැන්පතු එරෙහි ණය | | 3,703,273 | ඉතුරුම් තැන්පතු | 14,255,943 |
| පරිභෝජන සහ සෙසු ණය | | 10,358,817 | | |
| | | 69,063,712 | | 319,114,855 |

ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වල සමීප සමාජිකයන් වෙත ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභ නිරාවරණය බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 03% කි.

## 38.2 ශ්‍රී ලංකා රජය සමග ගනුදෙනු/ එහි ආයතනවල පාලනය, ඒකාබද්ධව පාලනය, ශ්‍රී ලංකා රජයේ සැලකිය යුතු බලපෑමකට ලක්වීම

ප්‍රමිති - LKAS 24 - "සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්" ට අනුව, ශ්‍රී ලංකා රජය, සැලකිය යුතු ආයෝජකයන් සහ අදාළ සම්බන්ධිත ආයතන සමග ගනුදෙනු සම්බන්ධයෙන් 18 වැනි පරිච්ඡේදය යටතේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවන්ගෙන් බැංකුව නිදහස් කොට ඇත.

ශ්‍රී ලංකා රජයේ බැඳියාවක් සහිත ආයතන ගණනාවකට බැංකුවේ සැලකිය යුතු බැඳියාවක් ඇත.

බැංකුව මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 යටතේ තනිව වැදගත් වන ගනුදෙනු සහ සෙසු ගනුදෙනු සාමූහිකව හෙළිදරව් කරනු ලැබ ඇති නමුත්, සැලකිය යුතු ආයෝජන හා එහි ආශ්‍රිත ආයතන සමග ගනුදෙනු තනි තනිව හෙළිදරව් කර නොමැත. බැංකුව ශ්‍රී ලංකා රජය හා එහි ආශ්‍රිත ආයතන සමග ගනුදෙනු, විධිවිධාන සහ ගිවිසුම්වලට එළැඹ ඇත. වර්ෂය තුළ හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනය වන විට සිදු කරන ලද සැලකිය යුතු මූල්‍ය ගනුදෙනු පහත දැක්වේ:

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අයිතම | | |
| වත්කම් | | |
| ණය සහ ලැබිය යුතු දෑ | 205,953,019 | 184,086,623 |
| | 205,953,019 | 184,086,623 |
| වගකීම් | | |
| තැන්පතු | 13,335,228,331 | 13,318,465,018 |
| | 13,335,228,331 | 13,318,465,018 |
| ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි අයිතම | 422,182 | 10,505,819 |
| පොලී ආදායම | 1,588,821,341 | 662,977,749 |
| | 1,589,243,523 | 673,483,567 |

### 38.2.1 සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ පහත දක්වා ඇති වැඩිදුර ගනුදෙනු වෙත ශ්‍රී ලංකා රජය සහ ඊට සම්බන්ධිත ආයතන සමග එළැඹ ඇත:

- භාණ්ඩාගාර බිල්පත් හා මුදල් වෙළඳපොලෙහි ආයෝජන
- ව්‍යවස්ථාපිත ගාස්තු හා වරිපනම් බදු ගෙවීම
- ප්‍රධාන වශයෙන් දුරකථන, විදුලිය හා ජල යන උපයෝගිතා ගෙවීම්
- සේවක විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ගෙවීම් - (සේ.අ.අ, සේ.නි.භා.අ.)

## 38.3 සම්බන්ධිත පාර්ශව සමඟ මිල නියම කිරීමේ ප්‍රතිපත්තිය

සමස්ත සේවකයන් හෝ විශේෂිත සේවක කාණ්ඩ සඳහා ඒකමතිකව අදාළ වන අනුමත යෝජනා ක්‍රම යටතේ ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් වෙත පිරිනමන ලද අනුග්‍රහය හැරුනු විට, සම්බන්ධතාවයක් නොමැති සන්සන්දනීය පාර්ශව සමඟ ගනුදෙනුවල නියමයන්ට සමාන වන නියමයන් හා කොන්දේසි සහිතව බැංකුව සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී සම්බන්ධිත පාර්ශවයන් සමඟ ගනුදෙනුවලට එළැඹෙයි.

## 39 ඇප වශයෙන් ඔඩපනය කරන ලද වත්කම්

2022 සහ 2021 දෙසැම්බර් 31 දිනට බැරකම් වෙනුවෙන් ඇප වශයෙන් ඔඩපනය කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගත් සමස්ත මූල්‍ය වත්කම් පහත වගුවේ දැක්වේ:

| 2022 | පහසුකම් වර්ගය | පහසුකමේ වටිනාකම රු. මිලියන | ඇපයෙහි ස්වභාවය | ඇපයෙහි වටිනාකම රු. මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන |
|---|---|---|---|---|---|
| 1 | බැංකු අයිරාව - ලංකා බැංකුව | 606 | FD 80912939 | 723 | - |
| | | | FD 74619066 | 335 | |
| 2 | බැංකු අයිරාව - මහජන බැංකුව | 200 | FD-055-60-01-00027365-2 | 290 | - |

| 2021 | පහසුකම් වර්ගය | පහසුකමේ වටිනාකම රු. මිලියන | ඇපයෙහි ස්වභාවය | ඇපයෙහි වටිනාකම රු. මිලියන | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන |
|---|---|---|---|---|---|
| 1 | බැංකු අයිරාව - ලංකා බැංකුව | 1,326 | FD 80912939 | 685 | - |
| | | | FD 74353124 | 281 | |
| | | | FD 82300125 | 242 | |
| | | | FD 74817306 | 343 | |
| | | | FD 74588793 | 320 | |
| | | | FD 74619066 | 317 | |
| 2 | බැංකු අයිරාව - මහජන බැංකුව | | FD 014-60-01-00015762-6 | 502 | - |

## 40. අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

සාමාන්‍ය ව්‍යාපාර ක්‍රියාවලියේ දී, ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය හා ආයෝජන අවශ්‍යතා සපුරාලීමට, වෙළඳ කටයුතු සිදු කිරීමට සහ අවදානමට නිරාවරණය වීම කළමනාකරණය කිරීම සඳහා බැංකුව සිය ගනුදෙනුකරුවන්ට නෛතික උපයෝජන සහිතව බැඳීම් භාර ගනිමින් අසම්භාව්‍ය වගකීම් දරනු ලැබේ. මෙම මූල්‍ය උපකරණ පොලී හෝ ගාස්තු උත්පාදනය කරන අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම් ලෙස හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට අතිරේකව ණය අවදානමේ සංරචක දරනු ලැබේ. කෙසේ වුවද, මෙම ගනුදෙනුවල ප්‍රතිඵලයක් වශයෙන් කිසිදු ප්‍රමාණාත්මක අලාභයක් අපේක්ෂා නොකෙරේ.

මෙම හදිසි අවස්ථා සහ බැඳීම් පහත දැක්වේ

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ඇපකර සහ කාර්යසාධන බැඳුම්කර | 180,046,018 | 177,766,966 |
| අනෙකුත් හදිසි අවස්ථා අයිතම | 207,216,884 | 51,429,192 |
| අඩු කළා: අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරණ - ඇපකර | (6,882,856) | (3,308,006) |
| එකතුව | 380,380,046 | 225,888,152 |

## 40.1 බැඳීම් සහ අසම්භාව්‍යතාවයන් ණය අවදානමට නිරාවරණය වීම පිළිබඳ විශ්ලේෂණය

| 2022 දෙසැම්බර් 31 දිනට | අදියර 1 (රු.) | එකතුව (රු.) |
|---|---|---|
| ඇපකර සහ කාර්යසාධන බැඳුම්කර | 180,046,018 | 180,046,018 |
| අනෙකුත් හදිසි අවස්ථා අයිතම | 207,216,884 | 207,216,884 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව (සටහන 40.1.1) | (6,882,856) | (6,882,856) |
| | 380,380,046 | 380,380,046 |

| 2021 දෙසැම්බර් 31 දිනට | අදියර 1 (රු.) | එකතුව (රු.) |
|---|---|---|
| ඇපකර සහ කාර්යසාධන බැඳුම්කර | 177,766,966 | 177,766,966 |
| අනෙකුත් හදිසි අවස්ථා අයිතම | 51,429,192 | 51,429,192 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව (සටහන 40.1.1) | 6,882,856 | 6,882,856 |
| | 236,079,014 | 236,079,014 |

### 40.1.1 අපේක්ෂිත ණය අලාභ දීමනාව

| දෙසැම්බර් 31 දිනට | 2022 (රු.) | 2021 (රු.) |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 3,308,006 | 2,042,296 |
| වර්ෂය සඳහා ශුද්ධ ගාස්තුව | 3,574,850 | 1,265,710 |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 6,882,856 | 3,308,006 |

## 40.2 බැංකුවට ලැබුණු තක්සේරුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පහත සඳහන් තක්සේරු කිරීම් බැංකුවට ලැබී තිබුණි.

### ආදායම් බදු

2014/15 තක්සේරු වර්ෂය සඳහා නිකුත් කරන ලද තක්සේරු දැන්වීම රු. මිලියන 653 (ITA18280500065), 2015/16 රු. මිලියන 573 (0201516002), 2016/17 රු. මිලියන 138 (0201617002), 2017/18 රු. මිලියන 1,023 (0201718001) සහ 2018/19 රු. මිලියන 246 (0201819002) සම්පූර්ණ නිරවුල් කිරීම සඳහා බලධාරීන් සමග සාකච්ඡා පැවැත්වේ. අදාළ බදු උපදේශක විසින් උපදෙස් දී ඇති පරිදි සිදුවිය හැකි ප්‍රතිඵලය මත පදනම්ව ප්‍රතිපාදන ගොඩනගා ඇත.

### එකතු කළ අගය මත බද්ද

2016 (VATFS/BFSU/2019/1002), 2017 (07501718002), 2018 (075018190002) සහ 2019 (07501920002) යන වර්ෂ සඳහා මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද අනුපිළිවෙලින් රු. මිලියන 197.7 ක් විය.

## 41. බැංකුවට එරෙහිව ගන්නා ලද නෛතික ක්‍රියාමාර්ග

බැකුවට එරෙහිව නඩු පැවරීම බැංකුව විසින් සිදු කරන ව්‍යාපාරයේ ස්වභාවය හේතුවෙන් බැංකු කර්මාන්තයේ දක්නට ලැබෙන සුලභ සිදුවීමකි. නෛතික හිමිකම් කළමනාකරණය කිරීම සඳහා බැංකුවට විධිමත් පාලනයන් සහ ප්‍රතිපත්ති ඇති වෘත්තීය උප-දෙස් ලබා ගත් පසු සහ සිදුවිය හැකි පාඩු ප්‍රමාණය සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ පසු, බැංකුවේ මූල්‍ය ස්ථාවරය සඳහා අහිතකර බලපෑම් සිදු කළ හැකි හිමිකම් පෑම් සඳහා බැංකුව විසින් ගිණුම්වලට ගැළපීම් සිදු කරනු ලබයි. 2022/12/31 දිනට, බැං-කුවට එරෙහිව නෛතික හිමිකම් පෑම් 39 ක් ඇති අතර සියලුම ප්‍රමාණාත්මක හිමිකම් සඳහා ප්‍රමාණවත් ලෙස ප්‍රතිපාදන සපයා ඇත. බැංකුවට එරෙහිව දැනට විභාග වෙමින් පවතින නඩු කටයුතු වාර්තා කරන ලද මූල්‍ය ප්‍රතිඵලවලට හෝ බැංකුවේ ඉදිරි මෙහෙයුම් කටයුතු කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බව බැංකුවේ නීති දෙපාර්තමේන්තුවේ අදහසයි.

## 42. වාර්තා කරන දිනෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් වාර්තා කිරීමේ දිනයේ සිට පැන නැගී නොමැත.

## 43. ජංගම හා ජංගම නොවන වත්කම් විශ්ලේෂණය

| 2022 දෙසැම්බර් 31 දිනට | මාස 12 ඇතුළත රු. | මාස 12 කට පසු රු. | එකතුව රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| මුදල් හා මුදල් සමානයන් | 2,889,883,677 | - | 2,889,883,677 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,133,705,351 | - | 6,133,705,351 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 120,280 | - | 120,280 |
| ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතු දෑ | 51,925,223,135 | 146,082,922,020 | 198,008,145,155 |
| ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 65,079,635,908 | - | 65,079,635,908 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | - | 2,289,919 | 2,289,919 |
| දේපළ, පිරියත හා උපකරණ | - | 926,615,241 | 926,615,241 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 68,867,744 | 68,867,744 |
| භාවිත හිමිකම් | - | 718,096,698 | 718,096,698 |
| විලම්භිත බදු වත්කම් | - | 3,525,174,919 | 3,525,174,919 |
| වෙනත් වත්කම් | 3,426,030,585 | 4,616,584,965 | 8,042,615,550 |
| මුළු වත්කම් | **129,454,598,937** | **155,940,551,506** | **285,395,150,443** |
| වගකීම් | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 3,459,855,516 | 44,010,851,540 | 47,470,707,056 |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 151,286,336,343 | 59,014,987,125 | 210,301,323,468 |
| නිකුත් කළ ණය හා ණයට ගත් වෙනත් අරමුදල් | 2,000,000,000 | - | 2,000,000,000 |
| ප්‍රවර්තන බදු වගකීම් | 1,011,924,146 | - | 1,011,924,146 |
| වෙනත් වගකීම් | 3,732,121,974 | 3,561,365,287 | 7,293,487,262 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් | 299,493,340 | 2,792,087,796 | 3,091,581,136 |
| මුළු වගකීම් | 161,789,731,319 | 109,379,291,749 | 271,169,023,068 |
| කල්පිරීමේ පරතරය | (32,335,132,382) | 46,564,259,757 | 14,226,127,375 |
| සමුච්චිත පරතරය | (32,335,132,382) | 14,226,127,376 | - |

| 2021 දෙසැම්බර් 31 දිනට | මාස 12 ඇතුළත<br>රු. | මාස 12 කට පසු<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| මුදල් හා මුදල් සමානයන් | 1,486,878,989 | - | 1,486,878,989 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,596,072,932 | - | 6,596,072,932 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 188,140 | - | 188,140 |
| ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය හා ලැබිය යුතු දෑ | 62,634,410,988 | 112,595,255,668 | 175,229,666,656 |
| ක්‍රමක්ෂිත පිරිවැය අනුව මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 54,856,210,318 | - | 54,856,210,318 |
| වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | - | 2,289,919 | 2,289,919 |
| දේපළ, පිරියත හා උපකරණ | - | 928,568,438 | 928,568,438 |
| අස්පෘශ්‍ය වත්කම් | - | 113,688,780 | 113,688,780 |
| භාවිත හිමිකම් | - | 505,092,023 | 505,092,023 |
| විලම්භිත බදු වත්කම් | - | 1,263,795,071 | 1,263,795,071 |
| වෙනත් වත්කම් | 3,827,515,561 | 1,079,544,736 | 4,907,060,296 |
| මුළු වත්කම් | **129,401,276,928** | **116,488,234,635** | **245,889,511,562** |
| වගකීම් | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 4,143,128,486 | 25,357,808,057 | 29,500,936,543 |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 127,934,846.256 | 59,817,618,999 | 187,752,465,256 |
| නිකුත් කළ ණය හා ණයට ගත් වෙනත් අරමුදල් | 2,000,000,000 | - | 2,000,000,000 |
| ප්‍රවර්තන බදු වගකීම් | 503,031,886 | - | 503,021,886 |
| වෙනත් වගකීම් | 3,562,698,921 | 4,130,601,890 | 7,693,300,811 |
| විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් | 193,769,265 | 2,852,695,474 | 3,046,464,739 |
| මුළු වගකීම් | 138,337,464,814 | 92,158,724,420 | 230,496,189,234 |
| කල්පිරීමේ පරතරය | (8,936,187,887) | 24,329,510,214 | 15,393,322,327 |
| සමුච්චිත පරතරය | (8,936,187,887) | 15,393,322,328 | - |

# 44. මූල්‍ය අවදානම් කළමනාකරණය

## 44.1 හැඳින්වීම සහ විග්‍රහය

මූල්‍ය උපකරණ හරහා බැංකුව ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන අවදානම්වලට නිරාවරණය වෙයි.

- ණය අවදානම
- ද්‍රවශීලතා අවදානම
- වෙළඳපොල අවදානම
- මෙහෙයුම් අවදානම

### 44.1.1 අවදානම් කළමනාකරණ රාමුව

අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම දරයි. අධ්‍යක්ෂ මණ්ඩලය එහි පාලන වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් ඉටු කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට විධිමත්ව වාර්තා කරන විධායක නොවන සාමාජිකයින්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සමන්විත වේ. මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සහාය වන විශේෂිත අවදානම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන විධායක කළමනාකරණ කමිටුවෘ වත්කම් සහ වගකීම් කමිටුව (ALCO), විධායක ණය කළමනාකරණ කමිටුව සහ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් කමිටුව වැනි විධායක කළමනාකරණ උප කමිටු කිහිපයක් ඇත

බැංකුව මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම, සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් සැකසීම සහ අවදානම් අධීක්ෂණය කිරීම සහ සීමාවන්ට අනුකූල වීම සඳහා බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපනය කර ඇත. වෙළඳපල තත්ත්වයන්, පිරිනමන නිෂ්පාදන සහ සේවාවන්හි වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති විධිමත්ව සමාලෝචනය කෙරේ. බැංකුව, එහි පුහුණු සහ කළමනාකරණ ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි මගින් සියලුම සේවකයින් තම කාර්යභාර සහ බැඳීම් අවබෝධ කර ගන්නා විනයගරුක සහ සඵලදායී පාලන පරිසරයක් සංවර්ධනය කිරීම අරමුණු කරයි

බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වගකිව යුතුය. මෙම කාර්යයන් සඳහා අභ්‍යන්තර විගණනය මගින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සහාය ලබා දෙයි අභ්‍යන්තර විගණනය මගින් අවදානම් කළමනාකරණ පාලනයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ නිත්‍ය සහ තත්කාලීන සමාලෝචන සිදු කරන අතර, එහි ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කරනු ලබයි

## 44.1.2 වත්කම් සහ වගකීම් කමිටුව (ALCO)

ALCO වත්කම් සහ වගකීම් කමිටුවේ සභාපති ධූරය සාමාන්‍යාධිකාරීවරයා විසින් දරනු ලබන අතර මෙම කමිටුව මූල්‍ය ණය මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගෙන් සමන්විත වේ. කමිටුව නිරන්තරයෙන් රැස් වෙමින්, නියාමන අවශ්‍යතා සපුරාලමින්, බැංකුවේ වත්කම් සහ වගකීම් අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම සිදු කරනු ලබන අතර බැංකුවේ ද්‍රවශීලතාව යහපත් ආකාරයෙන් පවත්වා ගැනීම උදෙසා සමස්ත ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳව ද කමිටුවේ අවධානය යොමු කෙරේ.

## 44.1.3 අවදානම් මිනුම්ගත කිරීම සහ වාර්තා කිරීම

අවදානම් වර්ගය, සහ ක්ෂේත්‍රයේ යහ ක්‍රියාකාරකම් මත පදනම්ව නිසි තාක්ෂණික ශිල්ප ක්‍රම යොදා ගනිමින් බැංකුවේ අවදානම් මනිනු ලබයි. ප්‍රමුඛ වර්ගවල අවදානම් ආශ්‍රිත ආන්තික සිදුවීම්/දරුණු ගතයේ තත්ත්වයන්හි බලපෑම හඳුනා ගැනීම සඳහා බැංකුව ආතති පරීක්ෂණ ද සිදු කරන අතර ඒවායේ ප්‍රතිඵල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට වරින් වර වාර්තා කරනු ලැබේ. අවදානම් අධීක්ෂණය සහ පාලනය කිරීම ප්‍රධාන වශයෙන් බැංකුව මගින් ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති, සීමාවන් සහ කඩඉම් පාදක කර ගනිමින් සිදු කෙරේ. මෙම සීමාවන් මගින් බැංකුවේ ව්‍යාපාරික උපායමාර්ගය සහ වෙළඳපොල වටපිටාව පිළිඹිබු වන අතර බැංකුවෙහි අවදානම් දරා ගැනීමේ සූදානම ද මෙමගින් පිළිබිඹු කෙරේ.

## 44.1.4 අවදානම් අවම කිරීම

සමස්ත අවදානම් කළමනාකරණයේ කොටසක් වශයෙන්, බැංකුව මගින් අවදානම අවම කිරීම සඳහා විවිධ වර්ගයේ ඇප ලබා ගනියි. පිළිගත හැකි ඇපවල ස්වභාවය, අවශ්‍ය සුරක්ෂිතතා තීරුව වැනි විස්තර බැංකුවේ ණය ප්‍රතිපත්තියේ පැහැදිලිව අර්ථ දක්වා ඇති අතර ඉන් කවර හෝ අපගමනයක් සඳහා විශේෂිත අනුමැතියක් අවශ්‍ය වේ. කෙසේ වුවද, අදාළ අනුමත අධිකාරී බලය තුළ ආපසු ගෙවීමේ ද්විතියික මූලාශ්‍රය ලෙස පමණක් ආරක්ෂාව ලබා ගැනීමේ හැකියාව සැලකිල්ලට ගනියි.

## 44.2 ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකු හෝ මූල්‍ය උපකරණයක ප්‍රතිපාර්ශවයක් මගින් තම ගිවිසුම්ගත බැඳීම්වලට අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වීම මත බැංකුවට මූල්‍යමය පාඩුවක් සිදුවීමේ අවදානම වන අතර එය ප්‍රධාන වශයෙන් ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් බැංකුවලට බැංකුව විසින් ලබා දෙන ණය සහ අත්තිකාරම් සහ ආයෝජන ණය සුරැකුම්පත්වලින් පැන නගී. අවදානම් කළමනාකරණ වාර්තාකරණ අරමුණු සඳහා, බැංකුව ණය අවදානම් නිරාවරණයේ සියලුම සංරචකයන් (තනි බන්ධනදායිය ණය පැහැර හැරීමේ අවදානම, දේශීය සහ ආංශික සංකේන්ද්‍රණ අවදානම් වැනි) සලකා බලා ඒවා ඒකාබද්ධ කරයි.

අවදානම් කළමනාකරණ අරමුණු සඳහා, වෙළඳ වත්කම් (FVTPL) මත පැන නගින ණය අවදානම ස්වාධීනව කළමනාකරණය කරනු ලබන අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ. වෙළඳ වත්කම්වල ඇතුළත් කර ඇති ණය සුරැකුම්පත් සහ ව්‍යුත්පන්නයන්ට අදාළ වන වෙළඳපල ණය පැතිරීම්වල වෙනස්වීම්වලින් පැන නගින වෙළඳ වත්කම්වල සාධාරණ වටිනාකමේ වෙනස්කම් (FVTPL) සම්බන්ධයෙන් වෙළඳපල අවදානම වෙළඳපල අවදානමේ අංගයක් ලෙස කළමනාකරණය කරනු ලැබේ, වැඩිදුර විස්තර වෙළඳපල අවදානම් අංශයේ දක්වා ඇත.

## ණය අවදානම කළමනාකරණය කිරීම

ණය අවදානම අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව වෙත පවරා ඇත (2021 ජූනි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලදී.) ප්‍රධාන අවදානම් නිලධාරියා මගින් විධායක ණය කළමනාකරණ කමිටුවට වාර්තා කරන බැංකු ණය පරිපාලන ඒකකය බැංකුවේ ණය අවදානම කළමනාකරණය සඳහා වගකිව යුතු අතර, ඒවාට ඇතුළත් වන්නේ:

- ව්‍යාපාර ඒකක සමඟ සාකච්ඡා කර ණය ප්‍රතිපත්ති සකස් කිරීම, ඇප අවශ්‍යතා ආවරණය කිරීම, ණය ඇගයීම, අවදානම් ශ්‍රේණිගත කිරීම සහ වාර්තා කිරීම, වාර්තාමය සහ නෛතික ක්‍රියා පටිපාටි සහ නියාමන සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල වීම.
- ණය පහසුකම් අනුමත කිරීම සහ අලුත් කිරීම සඳහා බලය දීමේ ව්‍යුහය ස්ථාපනය කිරීම් බලය දීමේ සීමාවන් ව්‍යාපාර ඒකක ණය නිලධාරීන් සඳහා වෙන් කරනු ලැබේ. විශාල පහසුකම් සඳහා ණය ප්‍රධානීන්, අධ්‍යක්ෂ මණ්ඩල ණය කමිටුව (2021 ජූනි සිට ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවා ඇත) හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝග්‍ය වන පරිදි අනුමැතිය ලබා දීම අවශ්‍ය වේ.

- ණය අවදානම සමාලෝචනය කිරීම සහ තක්සේරු කිරීම. අදාළ ව්‍යාපාර ඒකකය විසින් ගනුදෙනුකරුවන්ට පහසුකම් ලබා දීමට පෙර ණය ප්‍රධානීන් විසින් නම් කරන ලද සීමාවන් ඉක්මවා ඇති සියලුම ණය නිරාවරණයන් අගයනු ලැබේ. පහසුකම් අලුත් කිරීම සහ සමාලෝචනය කිරීම එකම සමාලෝචන ක්‍රියාවලියට යටත් වේ.
- ප්‍රතිපාර්ශවයන්, භූගෝලීය ප්‍රදේශ සහ කර්මාන්ත (ණය සහ අත්තිකාරම් සඳහා) සහ නිකුත් කරන්නා විසින් නිරාවරණය වීමේ සංකේන්ද්‍රණය සීමා කිරීම.
- තෝරාගත් කර්මාන්ත, රටේ අවදානම් සහ නිෂ්පාදන වර්ග ඇතුළුව එකඟ වූ නිරාවරණ සීමාවන් සහිත ව්‍යාපාර ඒකකවල අනුකූලතාවය සමාලෝචනය කිරීම් සුදුසු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය විය හැකි ණය ප්‍රධානීන්ට දේශීය ණය කළඹවල ගුණාත්මකභාවය පිළිබඳ විධිමත් වාර්තා සපයනු ලැබේ.
- ණය අවදානම් කළමනාකරණය කිරීමේදී▫ බැංකුව පුරා මනා පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර ඒකකවලට උපදෙස් ලබා දීම, මග පෙන්වීම සහ විශේෂඥ නිපුණතා ලබා දීම.
- අභ්‍යන්තර විගණනය මගින් ව්‍යාපාර ඒකක සහ බැංකු ණය ක්‍රියාවලීන් සඳහා විධිමත් විගණන සිදු කරනු ලැබේ.

## ණය අවදානමට නිරාවරණය වීම

මූල්‍ය වත්කම්වල ණය ගුණාත්මකභාවය සහ එම වත්කම්වලට සාපේක්ෂව බැංකුව විසින් දරනු ලබන හානිකරණ / අපේක්ෂිත ණය අලාභ සඳහා දීමනාව පිළිබඳ තොරතුරු පහත වගුවේ දක්වා ඇත.

## ණය තත්ත්ව විශ්ලේෂණය

## බැංකුවේ ගෙවීම් පැහැර හැරීමේ තත්ත්වය

| ගෙවීම් පැහැර හැරීමේ තත්ත්වය | විස්තරය |
|---|---|
| 1 අදියර | |
| සාමාන්‍ය | සක්‍රීය |
| දින 1 - 30 | සක්‍රීය |
| 2 අදියර | |
| දින 31 - 60 | අවක්‍රීය |
| දින 61 - 90 | අවක්‍රීය |
| 3 අදියර | |
| දින 90ට වැඩි | අක්‍රීය |

| දෙසැම්බර් 31 දිනට | 2022 අදියර 1 රු. | අදියර 2 රු. | අදියර 3 රු. | එකතුව රු. |
|---|---|---|---|---|
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ | | | | |
| ප්‍රකාශිත ණයකර | 623,946,610 | - | - | 623,946,610 |
| රජයේ ණය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 11,487,849,406 | - | - | 11,487,849,406 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම | 52,970,666,614 | - | - | 52,970,666,614 |
| මුළු ණය සහ වෙනත් උපකරණ | 65,082,462,630 | - | - | 65,082,462,630 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව | (1,760,892) | | | (1,760,892) |
| ශුද්ධ ණය සහ වෙනත් උපකරණ | 65,080,701,739 | - | - | 65,080,701,739 |
| බැංකුවල ස්ථානගත කිරීම් | | | | |
| මුදල් වෙළඳපොල ස්ථානගත කිරීම් | 6,133,705,351 | - | - | 6,133,705,351 |
| බැංකුවල මුළු ස්ථානගත කිරීම් | 6,133,705,351 | - | - | 6,133,705,351 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව | - | | | |
| බැංකුවල ශුද්ධ ස්ථානගත කිරීම් | 6,133,705,351 | - | - | 6,133,705,351 |
| බැඳීම් සහ අසම්භාව්‍යතා | | | | |
| බැංකු ඇපකරය | 180,046,018 | | | 180,046,018 |
| එක්රැස් කිරීම සඳහා යවන ලද බිල්පත් | 207,216,884 | | | 207,216,884 |
| මුළු බැඳීම් සහ අසම්භාව්‍යතා | 387,262,902 | - | - | 387,262,902 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව | (6,882,856) | | | (6,882,856) |
| ශුද්ධ බැඳීම් සහ අසම්භාව්‍යතා | **380,380,046** | - | - | **380,380,046** |

* ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකුව විවිධ බැඳීම් සහ අවිනිශ්චිත වගකීම්වලට එළැඹේ. මෙම බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගත නොහැකි වුවද, ඒවායේ ණය අවදානමක් අඩංගු වන අතර එම නිසා, ඒවා බැංකුවේ සමස්ත අවදානමේ කොටසක් වේ.

| දෙසැම්බර් 31 දිනට | 2021<br>අදියර 1<br>රු. | අදියර 2<br>රු. | අදියර 3<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|
| ක්‍රමක්ෂය පිරිවැය යටතේ මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ | | | | |
| ප්‍රකාශිත ණයකර | 623,946,610 | - | - | 623,946,610 |
| රජයේ ණය සුරැකුම්පත් - භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර | 4,813,547,891 | - | - | 4,813,547,891 |
| ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම | 49,420,476,709 | - | - | 49,420,476,709 |
| මුළු ණය සහ වෙනත් උපකරණ | 54,857,971,211 | - | - | 54,857,971,270 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව | (1,760,892) | | | (1,760,892) |
| ශුද්ධ ණය සහ වෙනත් උපකරණ | 54,856,210,319 | - | - | 54,856,210,308 |
| බැංකුවල ස්ථානගත කිරීම් | | | | |
| මුදල් වෙළඳපොල ස්ථානගත කිරීම් | 6,596,072,932 | - | - | 6,596,072,932 |
| බැංකුවල මුළු ස්ථානගත කිරීම් | 6,596,072,932 | - | - | 6,596,072,932 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව | | | | - |
| බැංකුවල ශුද්ධ ස්ථානගත කිරීම් | 6,596,072,932 | - | - | 6,596,072,932 |
| බැඳීම් සහ අසම්භාව්‍යතා | | | | |
| බැංකු ඇපකරය | 177,766,966 | | | 177,766,966 |
| එක්රැස් කිරීම සඳහා යවන ලද බිල්පත් | 51,429,192 | | | 51,429,192 |
| මුළු බැඳීම් සහ අසම්භාව්‍යතා | 229,196,158 | - | - | 229,196,158 |
| අපේක්ෂිත ණය අලාභ දීමනාව | (3,308,006) | | | (3,308,006) |
| ශුද්ධ බැඳීම් සහ අසම්භාව්‍යතා | **225,888,152** | - | - | 225,888,152 |

## 44.2.1 අපේක්ෂිත ණය අලාභ මැනීම (ECL)

SLFRS 9 යටතේ හානිකරණ තක්සේරු කිරීම සඳහා භාවිතා කරන යෙදවුම්, උපකල්පන සහ ශිල්පීය ක්‍රම ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන 5.1.2.5 යටතේ හෙළිදරව් කර ඇත

### ණය අවදානමෙහි සැලකිය යුතු ඉහළ යෑම

අපේක්ෂිත ණය අලාභවලට යටත් වන සියලුම වත්කම් බැංකුව මගින් අඛණ්ඩව නිරීක්ෂණය කරයි. කිසියම් උපකරණයක් හෝ උපකරණ කළඹක් මාස 12 අපේක්ෂිත ණය අලාභවලට හෝ ජීව කාල අපේක්ෂිත ණය අලාභවලට යටත් වේද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව මගින් මූලික පිළිගැනීමේ සිට ණය අවදානමේ සැලකිය යුතු ඉහළ යෑමක් පවතී ද යන්න තක්සේරු කරයි. ගනුදෙනුකරුවන් විසින් ගෙවීමට නියමිත දිනය දින 30ක් කල්පසු කළ විට බැංකුව විසින් සැලකිය යුතු අන්දමින් ඉහළ ගිය ණය අවදානම හඳුනා ගනියි.

බැංකුව මගින් වත්කමක් සඳහා ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇති කිරීම සඳහා පාරිභෝගිකයෙකු/පහසුකම නිරීක්ෂණ ලැයිස්තුවට ගෙන යාම හෝ ගිණුමෙන් ණය ගෙවීම තාවකාලිකව නැවැත්වීම වැනි ද්විතියික ගුණාත්මක ක්‍රමයක් ද යොදයි.

### ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු සංස්ථාගත කිරීම

ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව උපකරණයක ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේද යන්න තක්සේරු කිරීම සහ අපේක්ෂිත ණය අලාභ මැනීම යන දෙකටම බැංකුව ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු සංස්ථාගත කරයි. බැංකුව විසින් මූල්‍ය උපකරණවල එක් එක් කළඹ සඳහා ණය අවදානම සහ ණය අලාභය සඳහා හේතු වන ප්‍රධාන සාධක හඳුනාගෙන ලේඛනගත කර ඇති අතර, ඓතිහාසික දත්ත විශ්ලේෂණයක් භාවිතා කරමින්, සාර්ව ආර්ථික විචල්‍ය සහ ණය අවදානම සහ ණය අලාභ අතර සම්බන්ධතා ඇස්තමේන්තු කර ඇත.

ණය අවදානම සඳහා හේතු වන ප්‍රධාන සාධක වන්නේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාත, උද්ධමනය, විනිමය අනුපාත සහ පොලී අනුපාත ය, මූලික අවස්ථාව, හොඳම අවස්ථාව සහ අයහපත්ම අවස්ථාව පිළිබිඹු කිරීම සඳහා බැංකුව බහු ආර්ථික අවස්ථා සකස් කරයි.

### භූගෝලීය කලාපයකට අනුව බහු ආර්ථික අවස්ථා යටතේ ණය අලාභ ආකෘතිය සඳහා යෙදවුම් විශ්ලේෂණය

අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේ දී අනුගමනය කරනු ලබන ප්‍රවේශය පිළිබඳ කෙටි සමාලෝචනයක් සටහන 2 - සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයෙහි ද, සටහන 2.1 - සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවල ද දක්වා ඇති. පරිපූර්ණත්වය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා, බැංකුව මගින් තෙවන පාර්ශ්වීය මූලාශ්‍ර (CBSL) මගින් භාවිතා කරන ලද දත්ත ලබා ගන්නා අතර එහි අවදානම් දෙපාර්තමේන්තුවේ ආර්ථික විද්‍යාඥයින් කණ්ඩායමක් බහුවිධ තත්ත්වයන්ට ආරෝපණය කළ හැකි බර තීරණය කිරීම ඇතුළුව බැංකුවේ අපේක්ෂිත ණය අලාභ ආකෘති සඳහා යෙදවුම්වල නිරවද්‍යතාවය සත්‍යාපනය කරයි. 2022 දෙසැම්බර් 31 දිනට, අපේක්ෂිත ණය අලාභය සඳහා ප්‍රධාන හේතු සහ බැංකුවේ මූලික අවස්ථා ඇස්තමේන්තුව සඳහා භාවිතා කරන උපකල්පන, මූලික අවස්ථා මත පදනම් වූ අපේක්ෂිත ණය අලාභ සහ බහුවිධ ආර්ථික අවස්ථා භාවිතයේ බලපෑම පහත වගු මගින් දක්වා ඇත.

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ දී සලකා බැලෙන ඒ ඒ ආර්ථික තත්ත්වයට අදාළව භාවිතා කරන ප්‍රධාන ඉදිරිගාමී දැක්මක් සහිත ආර්ථික විචල්‍යයන්/උපකල්පනවල අගයන් මෙම වගුවේ දැක්වේ. "එළැඹෙන වසර" සඳහා වන අගයන් මගින් දිගු කාලීන සාමාන්‍යයක් පිළිබිඹු වන අතර ඒවා සෑම තත්ත්වයක් සඳහාම එක සමාන වේ.

දෙසැම්බර් 31 දිනට

| ප්‍රධාන ගාමකයන් | අ.ණ.අ. තත්ත්වය | 2023 % | 2024 % | 2025 % | 2026 % | එළැඹෙන වසර |
|---|---|---|---|---|---|---|
| ද.දේ.නි. වර්ධනය % | පදනම් තත්ත්වය | -11.8% | -11.8% | -11.8% | -11.8% | -11.8% |
| | යහපත් තත්ත්වය | 3.5% | 4.1% | 4.6% | 5.2% | 5.6% |
| | අයහපත් තත්ත්වය | -9.1% | -8.0% | -6.8% | -5.4% | -8.0% |
| උද්ධමන % | පදනම් තත්ත්වය | 54.2% | 54.2% | 54.2% | 54.2% | 54.2% |
| | යහපත් තත්ත්වය | 35.4% | 30.7% | 26.5% | 22.9% | 18.4% |
| | අයහපත් තත්ත්වය | 60.9% | 60.9% | 60.9% | 60.9% | 60.9% |
| පොලී අනුපාත % | පදනම් තත්ත්වය | 14.5% | 14.5% | 14.5% | 14.5% | 14.5% |
| | යහපත් තත්ත්වය | 13.3% | 13.0% | 12.6% | 12.3% | 11.8% |
| | අයහපත් තත්ත්වය | 15.3% | 16.0% | 16.7% | 17.4% | 17.9% |
| විනිමය අනුපාත (ඇ.එ.ඩො. - රු.) | පදනම් තත්ත්වය | 421.73 | 491.43 | 550.00 | 550.00 | 550.00 |
| | යහපත් තත්ත්වය | 362.87 | 362.82 | 364.78 | 365.74 | 366.70 |
| | අයහපත් තත්ත්වය | 550.00 | 550.00 | 550.00 | 550.00 | 550.00 |
| විරැකියා අනුපාත % | පදනම් තත්ත්වය | 5.0% | 5.0% | 5.0% | 5.0% | 5.0% |
| | යහපත් තත්ත්වය | 4.9% | 4.9% | 4.9% | 4.9% | 4.8% |
| | අයහපත් තත්ත්වය | 5.0% | 5.1% | 5.1% | 5.1% | 5.2% |

## අපේක්ෂිත ණය අලාභය මැනීම

අපේක්ෂිත ණය අලාභය මැනීම සඳහා වන ප්‍රධාන යෙදවුම් පහත සඳහන් විචල්‍යයන්ගේ කාලීන ව්‍යුහය වේ.

- පැහැර හැරීමට ලක් වන සම්භාවිතාව (PD);
- අලාභය පැහැර හැරීම (LGD) සහ
- පැහැර හැරීමට නිරාවරණය වීම (EAD)

පැහැර හැරීමට නිරාවරණය වීම (EAD) මගින් හානිකරණය ගණනය කිරීමට යටත්ව මූල්‍ය උපකරණවල දළ ධාරණ වටිනාකම නියෝජනය කරන අතර, එය පැහැර හැරීමට ළඟා වන අතරතුර නිරාවරණය වැඩි කිරීමට ගනුදෙනුකරුට ඇති හැකියාව සහ කලින් මුදල් ආපසු ගෙවීම් සඳහා පවතින විභවය යන දෙකම ආමන්ත්‍රණය කෙරේ.

අදියර 1 ණය මුදලක් සඳහා පැහැර හැරීමට ලක් වන නිරාවරණය (EAD) ගණනය කිරීම සඳහා, බැංකුව මගින් මාස 12 ක් සඳහා අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීම සඳහා මාස 12 ක කාලයක් තුළ සිදුවිය හැකි පැහැර හැරීමේ සිදුවීම් තක්සේරු කරයි. කෙසේ වුවද, ශේෂ පත්‍ර දිනයේ සිට මාස 12 ක් තුළ අදියර 1 ණයක් පැහැර හැරීමට අපේක්ෂා කරන්නේ නම් සහ ණය ගෙවීම යථා තත්ත්වයකට පත් කිරීමෙන් පසුව නැවත ණය ගෙවීම පැහැර හරින්නේ නම්, එවිට සියලු සම්බන්ධිත පැහැර හැරීමේ සිදුවීම් සැලකිල්ලට ගනියි. අදියර 2 සහ අදියර 3 සඳහා, උපකරණවල ජීවිත කාලය පුරා සිදුවීම් සඳහා පැහැර හැරීමට නිරාවරණය වීම සලකා බලනු ලැබේ.

බහුවිධ අවස්ථාවලට අනුරූපව, විවිධ කාලවලදී සිදු විය හැකි නිරාවරණ ප්‍රතිඵල පරාසය ආදර්ශනය කිරීම මගින් බැංකුව පැහැර හැරීමට නිරාවරණය වීම තීරණය කරයි ඉන්පසු බැංකුවේ ආකෘතිවල ප්‍රතිඵල මත පදනම්ව SLFRS 9 PDs එක් එක් ආර්ථික අවස්ථාවට පවරනු ලැබේ.

බැංකුව එහි සිල්ලර ණය නිෂ්පාදන කුඩා සමජාතීය කළඹ, අනාගත මුදල් ප්‍රවාහ ඇස්තමේන්තු කිරීමට අදාළ වන ප්‍රධාන ලක්ෂණ මත පදනම්ව කොටස් කරයි. යොදන ලද දත්ත ඓතිහාසිකව එකතු කරන ලද අලාභ දත්ත මත පදනම් වන අතර පුළුල් ගනු-දෙනු ලක්ෂණ සමූහයක් (උදාඃ නිෂ්පාදන වර්ගය, පුළුල් පරාසයක ඇපකර වර්ග) මෙන්ම ණය ගැණුම්කරු ලක්ෂණ ඇතුළත් වේ

## භාණ්ඩාගාර, වෙළඳ සහ අන්තර් බැංකු සබඳතා

බැංකුවේ භාණ්ඩාගාර, වෙළඳ සහ අන්තර් බැංකු සබඳතා සහ ප්‍රතිපාර්ශවයීය මූල්‍ය සේවා ආයතන, බැංකු, ප්‍රාථමික-වෙළෙඳුන්, හුවමාරු සහ නිෂ්කාශන නිවාසවලින් සමන්විත වේ. මෙම සබඳතා සඳහා, බැංකුවේ භාණ්ඩාගාර ඒකකය මූල්‍ය තොරතුරු වැනි ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු විශ්ලේෂණය කරයි.

## ණය පිළිබඳ ආංශික වර්ගීකරණය

වාර්තා කිරීමේ අරමුණ සඳහා බැංකුවේ ණය වර්ගීකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ආංශික වර්ගීකරණයට අනුව ස්ථාපනය කර ඇත.

සමස්ත ආංශික වර්ගීකරණයෙන්, කළඹවල විභාලත්වය අනුව, මෙම වාර්තාව මගින් ඒවා ප්‍රමුඛ ප්‍රධාන ක්ෂේත්‍ර තුනකට වර්ගීක-රණය කර ඇත.

බැංකුවේ අවසාන ගිණුම් පොත් අනුව, 2022 වර්ෂයේ මෙම වර්ගීකරණය යටතේ ඉහළම අංශය වන්නේ නිවාස ණය වන අතර එයට පසුව, ප්‍රතිමූල්‍යකරණය, වාණිජ, කෘෂිකර්මය, උකස් කිරීම, කාර්මික සහ වෙනත් ණය, තැන්පතු වලට එරෙහිව ණය, කාර්ය මණ්ඩල ණය, ලීසිං, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ලිය ඉසුර ණය වේ.

| ආංශික වශයෙන් ණය කළඹ | රු. |
|---|---|
| කාලීන ණය - නිවාස | 49,820,375,132 |
| ප්‍රතිමූල්‍ය | 37,587,477,683 |
| කාලීන ණය - වාණිජ | 24,913,536,960 |
| කාලීන ණය - කෘෂිකර්ම | 19,942,668,431 |
| උකස් කිරීම් | 42,234,452,674 |
| කාලීන ණය - කර්මාන්ත | 16,451,115,535 |
| කාලීන ණය - වෙනත් | 7,035,425,261 |
| තැන්පතු මත ණය | 10,333,536,605 |
| කාර්ය මණ්ඩල ණය | 5,501,110,905 |
| කල්බදු | 1,397,522,296 |
| කුඩා සහ මධ්‍යම ව්‍යවසායකයින්ගේ ණය | 121,313,411 |
| ලිය ඉසුර | 33,966,988 |

## ආයතනික ණය (සේවා, නිෂ්පාදන සහ කර්මාන්ත ණය)

ආයතනික ණය සඳහා, බැංකුවේ විශේෂඥ ණය වෘත්තිකයින් විසින් ණය අයදුම්කරුවන් ඇගයුමට ලක් කෙරේ. ණය අවදානම් ඇගයුම ගනුදෙනුකරුගේ චර්යාව සහ අතීත හිඟ ණය තත්ත්වයන් මත පදනම් වූ ණය ගුණාත්මකභාවය මත රඳා පවතී. තවද, බැංකුව මගින් ගනුදෙනුකරුවෙකුගේ අවදානම ඇගයුමට ලක් කිරීමේදී පහත සඳහන් අංශ පිළිබඳව සලකා බලයි:

- සේවාදායකයා විසින් සකසන ලද පුරෝකථන සහ අයවැය සමග ඓතිහාසික මූල්‍ය තොරතුරු. මෙම මූල්‍ය තොරතුරුවලට සාක්ෂාත් කරගත් සහ අපේක්ෂිත ප්‍රතිඵල, නුබුන්වත් අනුපාත, ද්‍රවශීලතා අනුපාත සහ සේවාදායකයාගේ මූල්‍ය කාර්යසාධනය මැනීම සඳහා වෙනත් අදාළ අනුපාත ඇතුළත් වේ. මෙම දර්ශක වලින් සමහරක් සේවාදායකයින් සමග ඇති කර ගත් ගිවිසුම් තුළ ඇතුළත් කර ඇති අතර එබැවින්ල ඒවා වැඩි අවධානයකින් මනිනු ලැබේ.

- ණය තොරතුරු කාර්යාංශය විසින් සපයනු ලබන තොරතුරු ඇතුළත්ව බාහිර පාර්ශවයන්ගෙන් සේවාදායකයින් පිළිබඳ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි ඕනෑම තොරතුරක් ලබා ගනු ලැබේ. මෙයට ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් නිකුත් කරන ලද බාහිර ශ්‍රේණිගත කිරීමේ ශ්‍රේණි, ස්වාධීන විශ්ලේෂක වාර්තා, මාධ්‍ය නිවේදන සහ ලිපි ඇතුළත් වන අතර, ඒවා සේවාදායකයින්ගේ/කර්මාන්තයේ අදාළ තොරතුරු ඇතුළත් වන අතර ණය විශ්ලේෂණය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට ද අදාළ වේ.

- සමාගමේ කාර්යසාධනයට අදාළ සේවාදායකයන්ගේ කළමනාකරණයේ ගුණාත්මකභාවය සහ හැකියාවන් පිළිබඳ වෙනත් වාස්තවිකව සහාය දැක්විය හැකි තොරතුරු

## පාරිභෝගික ණය දීම සහ සාමාන්‍ය ණය

පාරිභෝගික ණය ලබා දීම නිවාස ණය, පාරිභෝගික ණය සහ පුද්ගලික ණයවලින් සමන්විත වේ. සාමාන්‍ය, උකස් හා අඩු සංකීර්ණබවකින් යුත් කුඩා ව්‍යාපාර සඳහා ණය ලබා දීම සහිත මෙම නිෂ්පාදන (ආයතනික සහ සිල්ලර ණය ලකුණු කිරීමේ ආකෘති) මගින් ශ්‍රේණිගත කර ඇත. ප්‍රධාන වශයෙන් නියමිත දින ඉක්මවා පවතින ණය මත රඳා පවතී (ණය තොරතුරු කාර්යාංශයේ වාර්තා) ආකෘති සඳහා අනෙකුත් ප්‍රධාන යෙදවුම් වන්නේ:

■ පාරිභෝගික ණය ලබා දීමේ සැලසුම්: සීමා භාවිත කිරීම සහ ඒවායේ අස්ථාවරත්වය, ආර්ථික තත්ත්වය, ආපසු ගෙවීමේ ධාරිතාව පිළිබඳ වාර්තා මත පදනම්ව පුද්ගලික ආදායම්/ වැටුප් මට්ටම්වල වෙනස්කම්, ආපසු ගෙවීමේ මූලයන්, පුද්ගලික ණයගැතිභාවය සහ අපේක්ෂිත පොලී ප්‍රතිමිලකරණය සම්බන්ධ සීමා සහ ඒවායේ උච්චාවචනයන් භාවිත කෙරේ.
■ සාමාන්‍ය උකස්: දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, විරැකියා අනුපාත, ජංගම ගිණුම්වල වාර්තා මත පදනම්ව පුද්ගලික ආදායම්/වැටුප් මට්ටම්වල වෙනස්කම්, පුද්ගලික ණයගැතිභාවය සහ අපේක්ෂිත පොලී ප්‍රතිමිලකරණය

## සාමූහික පදනමක් මත මිනුම්ගත කරන ලද මූල්‍ය වත්කම් කාණ්ඩගත කිරීම

බැංකුව මගින් ඒකල පදනමක් මත අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලබන වත්කම් කාණ්ඩයන් අතරට, සමස්තයෙන් රු. මිලියන 5 ක ඒකල වශයෙන් සැලකිය යුතු මට්ටමට වඩා ඉහළින් සිටින සියලුම ගනුදෙනුකරුවන් ඇතුළත් වේ.

බැංකුව මගින් සාමූහික පදනමක් මත අපේක්ෂිත ණය අලාභ ගණනය කරනු ලබන වත්කම් කාණ්ඩ පහත දැක්වේ:
■ රු. මිලියන 5 ක සැලකිය යුතු කේවල සීමාවකට වඩා පහළ ගනුදෙනුකරුවන්

බැංකුව මගින් පහත දැක්වෙන පරිදි මෙම කුඩා සමජාතීය කළඹ කාණ්ඩ ගත කරයි:
■ නිෂ්පාදන වර්ගය
■ පොලී අනුපාතය

## 44.2.2 රඳවා තබා ගත් ඇපකර සහ අනෙකුත් ණය වැඩිදියුණු කිරීම්

දේපල සඳහා උකස් පොලී, වත්කම්, ඉන්වෙන්ටරි සහ ඇපකර සඳහා වෙනත් ලියාපදිංචි සුරැකුම්පත් යනාදී ගනුදෙනුකරුවන්ට ලබා දෙන ණය සහ අත්තිකාරම් සඳහා බැංකුව මගින් ඇපකරයක් තබා ගනියි. සාධාරණ වටිනාකම පිළිබඳ ඇස්තමේන්තු ණයට ගැනීමේදී තක්සේරු කරන ලද ඇපකරයේ වටිනාකම මත පදනම් වන අතර ඒවා විධිමත්ව යාවත්කාලීන කරනු ලැබේ. අවශ්‍ය ඇපකරයේ ප්‍රමාණය සහ වර්ගය ප්‍රතිපාර්ශවයේ ණය අවදානම තක්සේරු කිරීම මත රඳා පවතී. කළමනාකාරීත්වය විසින් ඇපක-රයේ වෙළඳපල වටිනාකම අධීක්ෂණය කරන අතර අදාළ ගිවිසුමට අනුකූලව අමතර ඇපකරයක් ඉල්ලා සිටිනු ඇත.

## නියමිත දින ඉක්ම වූ ගෙවිය යුතු දෑ අර්ථ දැක්වීම

ගිවිසුම්ගත පරිදි ගෙවිය යුතු නියමිත දිනට වඩා දින තිස් එකක් හෝ ඊට වැඩි කාලයක් තුළ අයකර නොගත් බැංකුවේ ඕනෑම මුදලක් 'නියමිත දින ඉක්ම වූ ගෙවිය යුතු දෑ' වශයෙන් බැංකු සලකති.

ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම්වලට එදිරිව රඳවා ඇති ඇපකරයේ සාධාරණ වටිනාකම සහ අනෙකුත් සුරැකුම් වැඩිදියුණු කිරීම් ණයට ගැනීමේදී සිදු කරන ලද ඇස්තමේන්තුවක් පහත දක්වා ඇති අතර ඇපකරයේ වටිනාකම ණය හිඟ ශේෂවල වටිනාකමට සීමා කර ඇත.

| දෙසැම්බර් 31 දිනට | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| සුරැකුම් වර්ගය | | |
| ඉඩම් සහ | 27,770,254,509 | 28,440,620,295 |
| යන්ත්‍රෝපකරණ | 1,281,765,425 | 1,002,307,447 |
| මෝටර් රථ | 2,518,646,804 | 2,003,005,196 |
| රත්තරන් | 42,217,210,774 | 20,172,426,918 |
| ස්ථාවර තැන්පතු | 10,333,536,604 | 6,669,463,537 |
| පුද්ගලික ඇප | 117,387,564,475 | 117,077,766,283 |
| බැංකු ඇප | 756,422 | 993,213 |
| වෙනත් | 13,862,766,869 | 13,673,083,531 |
| | **215,372,501,881** | **189,039,666,420** |

| දෙසැම්බර් 31 දිනට | 2022<br>ණය අවදානමට උපරිම වශයෙන් නිරාවරණය වීම<br>රු. . | 2022<br>ඇපකරණයට ශුද්ධ නිරාවරණය වීම<br>රු. | 2021<br>ණය අවදානමට උපරිම වශයෙන් නිරාවරණය වීම<br>රු. | 2021<br>ඇපකරණයට ශුද්ධ නිරාවරණය වීම<br>රු. |
|---|---|---|---|---|
| මුදල් හා මුදල් සමාන දෑ | 2,889,883,677 | 2,889,883,677 | 1,486,878,989 | 1,486,878,989 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,133,705,351 | 6,133,705,351 | 6,596,072,932 | 6,596,072,932 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 12,028 | 120,280 | 188,140 | 188,140 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය හා ලැබිය යුතු දෑ | 215,372,501,881 | 131,251,087,765 | 189,039,666,420 | 130,751,843,027 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් - ණය හා වෙනත් උපකරණ | 65,079,635,908 | 65,079,635,908 | 54,856,210,318 | 54,856,186,484 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද ස්තන්ධ උපකරණ | 2,289,919 | 2,289,919 | 2,289,919 | 2,289,919 |
| වෙනත් වත්කම් | 6,018,325,952 | 6,018,325,952 | 3,721,641,936 | 3,617,507,110 |

| | පූර්වාපේක්ෂිත ඇපකරය කෙටි කාලයකින් විකිණිය යුතු අවස්ථාවක දී විකිණුම් වටිනාකම<br>2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| ජනවාරි 01 දිනට ශේෂය | 165,450,000 | 165,450,000 |
| වර්ෂය තුළ එකතු කිරීම් | - | - |
| වර්ෂය තුළ බැහැර කිරීම් | - | - |
| ඇගයීම්වල වෙනස්කම් | - | - |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 165,450,000 | 165,450,000 |

ඇපකරය නිසිකලට ලබා ගැනීම බැංකුවේ ප්‍රතිපත්තියක් වේ.

## ණය වටිනාකම් අනුපාතය (LTV) නේවාසික උකස් ණය දීම්

පහත වගුව තුළ සාමාන්‍ය ගනුදෙනුකරුවන් සඳහා ලබා දුන් ණය සහ අත්තිකාරම්වල ණය වටිනාකම් අනුපාතයේ පරාසයන් අනුව ණය නිරාවරණය ස්ථරවලට වෙන් කර තිබේ. ණය වටිනාකම් අනුපාතය ගණනය කරනු ලබන්නේ ඇපයේ අනුපාතයට ණයෙහි දළ ප්‍රමාණයේ හෝ ණය ගෙවීමට ඇති බැඳීම සඳහා බැඳී ඇති අනුපාතයේ ප්‍රමාණය අනුවයි දළ මුදල් ප්‍රමා- ණය යම්කිසි හානිකරණ දීමනාවක් ඇත්නම් එය බැහැර කරයි. ඇපය තක්සේරු කිරීමේ දී, ඇපය ලබා ගැනීමේ දී සහ විකිණීමේ දී වන ගැළපුම් බැහැර කරනු ලැබේ. නේවාසික උකස් ණය සඳහා වන ඇපයේ වටිනාකම නිවාස මිල දර්ශකවල වෙනස්කම් මත පදනම්ව යාවත්කාලීන කරන ලද මුල් අවස්ථාවේ ඇප වටිනාකම මත පදනම් වේ.
‘

| දෙසැම්බර් 31 දිනට | 2022<br>රු. | 2021<br>රු. |
|---|---|---|
| **ණය වටිනාකම් අනුපාතය** | | |
| 50% ට අඩු | - | |
| 51-70 % | 27,770,254,509 | 28,440,620,295 |
| 71-90 % | | |
| 91-100 % | | |
| 100 % වැඩි | | |
| **එකතුව** | **27,770,254,509** | **28,440,620,295** |

### 44.2.3 ණය අවදානම සංකේන්ද්‍රණය වීම

බැංකුව මගින් කර්මාන්තය අනුව සහ භූගෝලීය පිහිටීම අනුව ණය අවදානම් සංකේන්ද්‍රණය වීම අධීක්ෂණය කරයි.

#### ණය අවදානම සංකේන්ද්‍රණය වීම

ණය සහ අත්තිකාරම්, ණය ලබා දීමේ බැඳීම්, මූල්‍යමය ඇපකර සහ ආයෝජන සුරැකුම් සඳහා ණය අවදානමේ සංකේන්ද්‍රණය සම්බන්ධ විශ්ලේෂණයක් පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දිනට | ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම් | | ආයෝජන ණය සුරැකුම්පත් | | ණය දීමේ බැඳීම් සහ මූල්‍ය ඇපකර | |
|---|---|---|---|---|---|---|
| | 2022 රු. | 2021 රු. | 2022 රු. | 2021 රු. | 2022 රු. | 2021 රු. |
| ධාරණ අගය | 215,372,501,881 | 189,039,666,420 | 65,082,462,630 | 54,857,971,210 | 387,262,902 | 229,196,158 |
| **පොරොන්දු වූ / සහතික කළ මුදල** | | | | | | |
| **ආයතනික** | | | | | | |
| වෙනත් | - | - | - | - | 387,262,902 | 229,196,158 |
| රාජ්‍ය | - | - | 11,487,849,406 | 4,813,547,891 | - | |
| බැංකු | - | - | 53,594,613,224 | 50,044,423,320 | - | |
| **සාමාන්‍ය** | | | | - | - | |
| පුද්ගල ඇප | 117,387,564,475 | 117,077,766,283 | - | - | - | |
| උකස් | 84,122,170,538 | 58,287,823,393 | - | - | * | |
| සුරක්ෂිත නොකළ ණය දීම් | 13,862,766,869 | 13,674,076,744 | - | - | - | |
| | **215,372,501,882** | **189,039,666,420** | **65,082,462,630** | **54,857,971,211** | **387,262,902** | **229,196,158** |

### 44.3 ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු, බැංකුව විසින් මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලබා දීමෙන් පියවනු ලබන එහි මූල්‍යමය වගකීම් ආශ්‍රිත බැඳීම් සපුරාලීමේදී බැංකුවට මුහුණ දීමට සිදුවන අවදානම වේ. එබැවින්, සාමාන්‍ය සහ ආතති සහගත තත්වයන් ද්විත්-වයම යටතේ බැංකුවට ගෙවීමේ වගකීම නියමිත වූ අවස්ථාවල එම ගෙවීම් බැඳීම් සපුරාලීමට නොහැකි විය හැකිය.

#### ද්‍රවශීලතා අවදානම කළමනාකරණය

බැංකුව මගින් ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේ උපාය මාර්ගය සකසන අතර, අදාළ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීමේ වගකීම වත්කම් සහ වගකීම් කමිටුව වෙත පවරනු ලබයි. එම කමිටුව මගින් බැංකුවේ ද්‍රවශීලතා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි අනුමත කරයි. මධ්‍යම භාණ්ඩාගාරය මගින් බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය දෛනික පදනමක් මත කළමනාකරණය කරන අතර දෛනික වාර්තා සමාලෝචනය කිරීම ද සිදු කරයි. කවර හෝ ව්‍යතිරේකයක් සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් සාරාංශ ගත වාර්තාවක් නිතිපතා වත්කම් සහ වගකීම් කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා බැංකුවේ ප්‍රවේශය වන්නේ, සාමාන්‍ය සහ ආතති සහගත තත්වයන් යන ද්විත්වයම යටතේ, පිළිගත නොහැකි අලාභ සිදු නොකර හෝ බැංකුවේ කීර්ති නාමයට හානි වීමේ අවදානමකින් තොරව, එහි වගකීම් නියමිත වේලාවට සහ හැකිතාක් දුරට සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි. බැංකුවේ ද්‍රවශීලතා ක්‍රමෝපායේ ප්‍රධාන සංරචකයන් පහත දැක්වේ.

- ගනුදෙනුකරුවන්ගේ තැන්පතු (සාමාන්‍ය සහ ආයතනික යන දෙපාර්ශවයම) සහ තොග වෙළඳපොළ තැන්පතුවලින් සමන්විත විවිධාංගීකරණය වූ අරමුදල් සම්පාදන පදනමක් පවත්වා ගැනීම සහ අවිනිශ්චිතතා පහසුකම් පවත්වාගෙන යෑම
- ව්‍යවහාර මුදල් හා කල්පිරීම මගින් විවිධාංගීකරණය වූ ඉහළ ද්‍රවශීල වත්කම් කළඹක් බැංකුව සතුව පවත්වා ගැනීම
- බැංකුවේ මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල ද්‍රවශීලතා අනුපාත, කල්පිරීමේ නොගැළපීම්, චර්යාමය ගති ලක්ෂණ සහ නෛතික හා නියාමන සීමාවලට යටත්ව පවතින බැංකුවේ වත්කම් ප්‍රමාණය සහ එබැවින්, අරමුදල් ලබා ගැනීම සඳහා විභව ඇපකරයක් ලෙස භාවිත කළ නොහැකි ප්‍රමාණය අධීක්ෂණය කිරීම
- බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ ආතති පරීක්ෂණයක් සිදු කිරීම

නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා අවම වශයෙන් 20% ක ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වා ගැනීම වඩාත්ම වැදගත් කරුණ වේ. ද්‍රවශීල වත්කම් මුදල්, කෙටිකාලීන බැංකු තැන්පතු සහ ක්ෂණිකව විකිණීම සඳහා යෙදවිය හැකි ද්‍රවශීල ණය සුරැකුම්වලින් සමන්විත වේ.

## 44.3.1 ද්‍රවශීලතා අවදානමට නිරාවරණය වීම

ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීම සඳහා බැංකුව විසින් භාවිතා කරනු ලබන ප්‍රධාන මිනුම දණ්ඩ වන්නේ ද්‍රවශීල වත්කම්වලට ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන තැන්පතු සහ අනෙකුත් වගකීම්වල අනුපාතයයි. මෙම අරමුණ වෙනුවෙන්, ක්‍රියාකාරී සහ ද්‍රවශීල වෙළඳපොළක් පවතින මුදල් සහ මුදල් සමානතා සහ ආයෝජන ද්‍රවශීල වත්කම්වලට ඇතුළත් බව සලකනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ස්ථාපනය කර ඇති ද්‍රවශීලතා සීමාවට බැංකුවේ අනුකූලතාවය මැනීම සඳහා සමාන ගණනය කිරීමක් භාවිතා කරයි. ශුද්ධ ද්‍රවශීල වත්කම්වලට වාර්තා කරන දිනයේදී සහ වර්ෂය තුළ ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණු වගකීම්වල වාර්තා වූ බැංකු අනුපාතය පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| | 2022<br>DBU % | 2021<br>DBU % |
|---|---|---|
| දෙසැම්බර් 31 දිනට | 27.83% | 26.18% |
| වසර සඳහා සාමාන්‍ය | 27.16% | 27.64% |
| වසර සඳහා උපරිම | 29.78% | 28.46% |
| වසර සඳහා අවම | 25.10% | 26.18% |

2020 මැයි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ගවලට අනුව, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්, 2022 දෙසැම්බර් 31 දක්වා ව්‍යවස්ථාපිත ද්‍රවශිල වත්කම් අනුපාතය ගණනය කිරීමේදී පහත සඳහන් වත්කම් ද්‍රවශිල වත්කම් ලෙස සැලකීමට බලපත්‍රලාභී බැංකුවලට අවසර ලබා දී ඇත.

- ජ්‍යෙෂ්ඨ පුරවැසි විශේෂ තැන්පතු යෝජනා ක්‍රමය සඳහා ලැබිය යුතු පොලී සහනාධාරය.
- ශ්‍රී ලංකා රජය විසින් සහතික කරන ලද රජය සතු ආයතන සඳහා වන නිරාවරණයන් සහ 10% ක කපා හැරීමක් සහිතව වසරක කාලයක් නොඉක්මවන කල්පිරීමක් සහිත මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා SLFRS 9 මූල්‍ය උපකරණ යටතේ අදියර 1 හි වර්ගීක-රණය කර ඇති නිරාවරණයන්.
- බලපත්‍රලාභී බැංකු විසින් අනෙකුත් බලපත්‍රලාභී බැංකුවල පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු;

(අ) කල් පිරීමේ ඉතිරි කාලය වසර 1 ඉක්මවන නමුත් වසර 2 ට අඩු හෝ ඊට සමාන වේ නම්, 20% ක කපා හැරීමක් සහිතව,
(ආ) කල් පිරීමේ ඉතිරි කාලය වසර 2 ඉක්මවන නමුත් වසර 3 ට අඩු හෝ ඊට සමාන වේ නම්, 30% ක කපා හැරීමක් සහිතව,

- තැන්පතුවලින් 20% කට සමාන හිමිකම් යටතේ තැන්පතු මගින් සුරක්ෂිත කරන ලද ණය.
- ණය පියවීමේදී සේවක අර්ථසාධක අරමුදලෙන් (EPF) ලැබිය යුතු මුදල්.

කෙසේ වුවද, බැංකුවේ ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වය හේතුවෙන්, බැංකුවට එතරම් බලපෑමක් සිදු නොවීය.

## 44.3.2 ඉතිරි කොන්ත්‍රාත් කල්පිරීම් මගින් මූල්‍ය වගකීම් විශ්ලේෂණය කිරීම

2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වගකීම්වල වට්ටම් නොකළ මුදල් ප්‍රවාහයන්ගේ කල්පිරීමේ ස්වභාවය පහත වගුවේ සාරාංශ ගත කර ඇත දැනුම් දීමට යටත් වන ආපසු ගෙවීම් වහාම දැනුම් දිය යුතු ඒවා  ලෙස සලකනු ලැබේ. කෙසේ වුවද, බොහෝ ගනුදෙනුකරුවන් ගෙවීම අවශ්‍ය විය හැකි මුල්ම දිනයේදී ආපසු ගෙවීම් ඉල්ලා නොසිටිනු ඇතැයි බැංකුව අපේක්ෂා කරන අතර වගුව මගින් එහි තැන්පතු රඳවා ගැනීමේ ඉතිහාසය මගින් දක්වා ඇති අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් පිළිබිඹු නොකරයි.

| 2022 දෙසැම්බර් 31 දිනට | ධාරණ අගය<br>රු. | මූළු වටිනාකම<br>රු. | මාස 3කට වඩා අඩු<br>රු. | මාස 3 සිට 12 දක්වා<br>රු. | අවුරුදු 1 සිට 3 දක්වා<br>රු. | අවුරුදු 3 සිට 5 දක්වා<br>රු. | අවුරුදු 5කට වැඩි<br>රු. |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යුත්පන්න නොවන වගකීම්** | | | | | | | |
| බැංකුවට ගෙවිය යුතු | 47,470,707,056 | 47,470,707,056 | 341,729,856 | 3,118,125,660 | 4,440,243,697 | 14,000,065,209 | 25570542634 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 210,301,323,468 | 210,301,323,468 | 39,028,814,697 | 112,257,521,646 | 11,660,479,038 | 15,939,669,814 | 31414838273 |
| නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් අරමුදල් | - | 2,076,176,663 | 2,076,176,663 | - | - | - | - |
| වෙනත් වගකීම් | 7,293,487,262 | 8,804,727,995 | 1,713,880,930 | 2,363,638,596 | 2,110,610,176 | 1,135,661,764 | 1480936529 |
| මුළු ව්‍යුත්පන්න නොවන වගකීම් | 265,065,517,787 | 268,652,935,183 | 43,160,602,145 | 117,739,285,903 | 18,211,332,912 | 31,075,396,787 | 58,466,317,437 |

| 2021 දෙසැම්බර් 31 දිනට | ධාරණ අගය<br>රු. | මුළු වටිනාකම<br>රු. | මාස 3කට වඩා අඩු<br>රු. | මාස 3 සිට 12 දක්වා<br>රු. | අවුරුදු 1 සිට 3 දක්වා<br>රු. | අවුරුදු 3 සිට 5 දක්වා<br>රු. | අවුරුදු 5කට වැඩි<br>රු. |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යුත්පන්න නොවන වගකීම්** | | | | | | | |
| බැංකුවට ගෙවිය යුතු | 29,500,936,543 | 33,271,523,388 | 1,458,704,149 | 3,466,762,024 | 15,825,578,727 | 50,147,714 | 12,470,330,773 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 187,752,465,256 | 192,354,798,672 | 48,125,528,994 | 84,078,496,904 | 12,483,089,634 | 15,917,855,300 | 31,749,827,841 |
| නිකුත් කරන ලද ණය සහ වෙනත් ණයට ගත් අරමුදල් | 2,000,000,000 | 2,076,176,663 | 2,076,176,663 | - | - | - | - |
| වෙනත් වගකීම් | 7,693,300,812 | 7,693,300,812 | 1,497,536,500 | 2,065,274,787 | 1,844,186,327 | 992,306,358 | 1,293,996,840 |
| මුළු ව්‍යුත්පන්න නොවන වගකීම් | 226,946,702,610 | 235,395,799,534 | 53,157,946,306 | 89,610,533,715 | 30,152,854,688 | 16,960,309,372 | 45,514,155,454 |

## 44.3.3 බැඳීම් සහ අසම්භාව්‍යතා පිළිබඳ ගිවිසුම්ගත කල්පිරීම්

බැංකුවේ අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්වල කල්පිරීම මගින් ගිවිසුම්ගත කල් ඉකුත්වීම පහත වගුවේ දැක්වේ. එක් එක් ලබා නොගත් ණය බැඳීම එය ලබා ගත හැකි මුල්ම දිනය අඩංගු කාල පරාසයට ඇතුළත් වේ. නිකුත් කරන ලද මූල්‍ය ඇපකර කොන්ත්‍රාත්තු සඳහා, ඇපකරයේ උපරිම මුදල ඇපකරය කැඳවිය හැකි මුල්ම කාල සීමාව සඳහා වෙන් කරනු ලැබේ.

### 2022 දෙසැම්බර් 31 දිනට

| අසම්භාව්‍ය වගකීම් | ඉල්ලුම මත<br>රු. | මාස 3ට අඩු<br>රු. | මාස 3 සිට 12 දක්වා<br>රු. | අවුරුදු 1 සිට 5 දක්වා<br>රු. | අවුරුදු 5ට වැඩි<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|
| බැංකු ඇපකරය (හානිකරණයෙන් තොරව) | - | 696,547 | 166,242,048 | 13,107,424 | - | 180,046,018 |
| අනෙකුත් අසම්භාව්‍ය අයිතම - එකතු කිරීම සඳහා යවන ලද බිල්පත් | 207,216,884 | - | - | - | - | 207,216,884 |
| **මුළු අසම්භාව්‍ය වගකීම්** | **207,216,884** | **696,547** | **166,242,048** | **13,107,424** | - | **387,262,902** |

### 2021 දෙසැම්බර් 31 දිනට

| අසම්භාව්‍ය වගකීම් | ඉල්ලුම මත<br>රු. | මාස 3ට අඩු<br>රු. | මාස 3 සිට 12 දක්වා<br>රු. | අවුරුදු 1 සිට 5 දක්වා<br>රු. | අවුරුදු 5ට වැඩි<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|
| බැංකු ඇපකරය (හානිකරණයෙන් තොරව) | - | 687,730 | 164,137,728 | 12,941,508 | - | 177,766,966 |
| අනෙකුත් අසම්භාව්‍ය අයිතම - එකතු කිරීම සඳහා යවන ලද බිල්පත් | 51,428,192 | - | - | | - | 51,429,192 |
| **මුළු අසම්භාව්‍ය වගකීම්** | **51,428,192** | **687,730** | **164,137,728** | **12,941,508** | - | **229,196,158** |

## 44.3.4 ද්‍රවශීලතා සංචිතය

ද්‍රවශීලතා අරමුණු සඳහා රඳවාගෙන ඇති බැංකුවේ ද්‍රවශීල වත්කම්වල සංරචක පහත වගුවේ දක්වා ඇත.

| දෙසැම්බර් 31 දිනට | 2022 | |
|---|---|---|
| | ධාරණ වටිනාකම | සාධාරණ වටිනාකම |
| මුදල් සහ මුදල් සමාන දෑ | 2,889,883,677 | 2,889,883,677 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 1,908,705,351 | 1,908,705,351 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම | 4,225,000,000 | 4,225,000,000 |
| ස්ථාවර තැන්පතු | 52,970,666,614 | 52,970,666,614 |
| | **61,994,255,642** | **61,994,255,642** |

* ධාරණ අගයන් කෙටි කාලීන ස්වභාවයක් ගන්නා (මාස දොළහකට අඩු) බැවින්, ඒවායේ සාධාරණ අගයන්ට ආසන්න වේ

## 44.3.5 ද්‍රවශීලතා ආවරණ අනුපාතය

නියාමකයා විසින් අර්ථ දක්වා ඇති ආකාරයට ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) දින (30) ක කාලයක් තුළ බැංකුවක ද්‍රවශීලතා අවදානම් පැතිකඩෙහි කෙටිකාලීන ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන පවතී. ද්‍රවශීලතාවය ඉහළ නැංවීම සඳහා භාවිතා කළ හැකි උසස් තත්ත්වයේ ද්‍රවශීල වත්කම් (HQLA) ප්‍රමාණය ලෙස මෙම අනුපාතය අර්ථ දක්වා ඇති අතර ආතති සහගත අවස්ථාවකදී සත්‍ය සහ අසම්භාව්‍ය නිරාවරණයන් යන ද්විත්වයෙන්ම පැන නගින ශුද්ධ මුදල් පිටතට ගලා යාමේ මුළු පරිමාවට සාපේක්ෂව මනිනු ලැබේ.

ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) බැංකුවේ ආතති පරීක්ෂණ රාමුවට අනුපූරක වේ. අවම නියාමන අවශ්‍යතා ඉක්මවා යන අනුපාතයක් පවත්වා ගැනීමෙන් කෙටිකාලීන ද්‍රවශීලතා ආතතිය අවම කිරීම සඳහා බැංකුව සතුව ප්‍රමාණවත් ද්‍රවශීලතා සම්පත් ඇති බව සහතික කිරීමට ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) මගින් අපේක්ෂා කෙරේ.

සියලුම බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් 2015 අප්‍රේල් 01 දින සිට ආරම්භ කරමින්, දේශීය මුදල් මෙහෙයුම් සඳහා රුපියල් ද්‍රවශීලතා අවම අවශ්‍යතාවය සහ 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන සමස්ත මෙහෙයුම් සඳහා සියලුම මුදල් ද්‍රවශීලතා අවම අවශ්‍යතාවය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද ද්‍රවශීලතා ආවරණ අනුපාත (LCR) 100% ක මට්ටමින් පවත්වා ගෙන යන ලදී.

COVID-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මැයි මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ගවලට අනුව, වැඩිදියුණු කළ අධීක්ෂණය සහ නිරන්තර වාර්තාකරණය මගින් 2022 දෙසැම්බර් 31 දින දක්වා අවම ද්‍රවශීලතා ආවරණ අනුපාතය 90% ක් දක්වා අඩු කරන ලදී.

| අවම අවශ්‍යතාව (%)- දින සිට ක්‍රියාත්මක වේ | |
|---|---|
| **2021 ජූලි 1** | **2020 මැයි සිට 2021 ජූනි 30 දක්වා** |
| 100 | 90 |

දෙසැම්බර් 31 දිනට බැංකුවේ ද්‍රවශීලතා ආවරණ අනුපාත (%) පහත දැක්වේ:

| දෙසැම්බර් 31 දිනට | 2022 | 2021 |
|---|---|---|
| දේශීය මුදල් මෙහෙයුම් සඳහා රුපියල් ද්‍රවශීලතා අවශ්‍යතාවය | 167.25 | 174 |

### 44.3.6 ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය

**2022 දෙසැම්බර් මාසය සඳහා** **27.83%**

2021 දෙසැම්බර් මාසය සඳහා 26.18%

## 44.3.7 බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු මුදල්වලට (තැන්පතුවලට) බැංකුවලින් සහ වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය සහ මුදල් (අත්තිකාරම්) අනුපාතය

බැංකුවේ ණය ලබා දීමේ මෙහෙයුම් සඳහා අරමුදල් ප්‍රභවයක් ලෙස බැංකු සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු මුදල්වල වැදගත්කම පිළිබඳව බැංකුව දැනුවත්ව සිටියි.

බැංකු සහ අනෙකුත් ගනුදෙනුකරුවන් වෙත ලැබිය යුතු දෑවල (තැන්පතුවල) ප්‍රතිශතයක් ලෙස ණය සහ ගනුදෙනුකරුවන්ට ලැබිය යුතු දෑ සංසන්දනය කරනු ලබන පහත අනුපාතය භාවිත කරමින් මෙය අධීක්ෂණය කෙරේ.

බැංකු සහ වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු මුදල්වලට, බැංකුවලින් සහ වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ණය සහ ලැබිය යුතු දෑ අනුපාතයః

| **2022 දෙසැම්බර් 31 දිනට** | **95.81%** |
|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට | 90.64% |

බැංකුව සතුව පවතින මූල්‍ය සහ මූල්‍ය නොවන වත්කම් සඳහා 2022.12.31 සහ 2021.12.31 දිනට නෛතික හෝ නියාමන සීමා පැවතීම හෝ නොපැවතීම පිළිබඳව පහත වගුවේ දක්වා ඇත

| | 2022 | | | |
|---|---|---|---|---|
| | නෛතික හෝ නියාමන සීමා පැවතීම | | නෛතික හෝ නියාමන සීමා නොමැති වීම | |
| | ඇපයක් ලෙස ඔඩපනය කර ඇත | වෙනත් | වෙනත් | එකතුව |
| මුදල් සහ මුදල් සමාන දෑ | - | - | 2,889,883,677 | 2,889,883,677 |
| බැංකුවල ස්ථානගත කිරීම් | - | - | 6,133,705,351 | 6,133,705,351 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද හිමිකම් උපකරණ | - | - | 120,280 | 120,280 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් - ණය | - | - | 198,008,145,155 | 198,008,145,155 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ | 1,347,726,270 | - | 63,731,909,638 | 65,079,635,908 |
| වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමින් යුත් හිමිකම් උපකරණ | - | - | 2,289,919 | 2,289,919 |
| **වෙනත් වත්කම්** | - | - | 8,042,615,550 | 8,042,615,550 |
| **එකතුව** | **1,347,726,270** | - | **278,808,669,570** | **280,156,395,840** |

| | 2021 | | | |
|---|---|---|---|---|
| | නෛතික හෝ නියාමන සීමා පැවතීම | | නෛතික හෝ නියාමන සීමා නොමැති වීම | |
| | ඇපයක් ලෙස ඔඩපනය කර ඇත | වෙනත් | වෙනත් | එකතුව |
| මුදල් සහ මුදල් සමාන දෑ | - | - | 1,486,878,989 | 1,486,878,989 |
| බැංකුවල ස්ථානගත කිරීම් | - | - | 6,596,072,932 | 6,596,072,932 |
| ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මනින ලද හිමිකම් උපකරණ | - | - | 188,140 | 188,140 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් - ණය | - | - | 175,229,666,656 | 175,229,666,656 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් - ණය සහ අනෙකුත් උපකරණ | 2,690,695,651 | - | 52,165,490,833 | 54,856,186,484 |
| වෙනත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමින් යුත් හිමිකම් උපකරණ | - | - | 2,289,919 | 2,289,919 |
| **වෙනත් වත්කම්** | - | - | 4,907,060,297 | 4,907,060,297 |
| **එකතුව** | **2,690,695,651** | - | **240,387,647,766** | **243,078,343,416** |

## 44.4 වෙළඳපල අවදානම

වෙළඳපොළ අවදානම යනු බැංකුවේ ආදායමට හෝ එහි හිමිකාරීත්වය සහිත මූල්‍ය උපකරණවල වටිනාකම සඳහා බලපෑමක් සිදු කළ හැකි වන පරිදි පොලී අනුපාත, කොටස් මිල ගණන්, විදේශ විනිමය අනුපාත සහ ණය ව්‍යාප්තීන් (බැඳුම්කරුගේ/නිකුත් කරන්නාගේ ණය තත්ත්වයෙහි වෙනස්කම්වලට අදාළ නොවේ) වැනි වෙළඳපල මිල වෙනස් කරනු ලබන අවදානමකි. බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණ වන්නේ පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළඳපල අවදානමට නිරාවරණය වීම කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම මගින් අවදානම මත ප්‍රතිලාභය ප්‍රශස්තකරණය කරමින් බැංකුවේ ද්‍රවශීලතාවය සහතික කිරීමයි.

වෙළඳපල අවදානම සම්බන්ධ සමස්ත අධිකාරිය වත්කම් හා වගකීම් කමිටුව වෙත පවරනු ලැබ ඇත. එමගින් එක් එක් වර්ගයේ සමුච්චිත අවදානම් සහ කළඹ වෙත සීමාවන් සකසනු ලබන අතර, එහිදී වෙළඳ කළඹ සඳහා සීමා නිර්ණය කිරිමේ දී මූලික සාධකය වශයෙන් වෙළඳපොළ ද්‍රවශීලතාවය සැලකිල්ලට ගැනේ.

වෙළඳ කළඹ සහ වෙළඳ නොවන කළඹ අතර වෙළඳපල අවදානමට යටත්ව වත්කම් සහ වගකීම් වෙන් කිරීම පහත වගුවේ දක්වා ඇත:

| 2022 දෙසැම්බර් 31 දිනට | ධාරණ අගය | වෙළඳපොල අවදානම මැනීම | |
|---|---|---|---|
| | | වෙළඳ කළඹ | වෙළඳ නොවන කළඹ |
| **වෙළඳපල අවදානමට යටත් වන වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානතා | 2,889,883,677 | - | 2,889,883,677 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,133,705,351 | | 6,133,705,351 |
| ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 120,280 | 120,280 | - |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ | 65,079,635,908 | - | 65,079,635,908 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ | 198,008,145,155 | - | 198,008,145,155 |
| වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 2,289,919 | - | 2,289,919 |
| වෙනත් වත්කම් | 6,018,325,952 | - | 6,018,325,952 |
| **වෙළඳපොළ අවදානමට යටත් වන වගකීම්** | | - | |
| බැංකු වෙත ගෙවිය යුතු | 47,470,707,056 | - | 47,470,707,056 |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 210,301,323,468 | - | 210,301,323,468 |
| නිකුත් කළ ණය සහ ණයට ගත් වෙනත් අරමුදල් | - | - | - |
| ප්‍රවර්තන බදු වගකීම් | 1,011,924,146 | - | 1,011,924,146 |
| වෙනත් වගකීම් | 6,426,430,198 | - | 6,426,430,198 |

| 2021 දෙසැම්බර් 31 දිනට | ධාරණ අගය | වෙළඳපොල අවදානම මැනීම | |
|---|---|---|---|
| | | වෙළඳ කළඹ | වෙළඳ නොවන කළඹ |
| **වෙළඳපල අවදානමට යටත් වන වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානතා | 1,486,878,989 | - | 1,486,878,989 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,596,072,932 | - | 6,596,072,932 |
| ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 188,140 | 188,140 | - |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය ආයෝජන - ණය සහ වෙනත් උපකරණ | 54,856,210,318 | - | 54,856,210,318 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ | 175,229,666,656 | - | 175,229,666,656 |
| වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ අගයට මනින ලද ස්කන්ධ උපකරණ | 2,289,919 | - | 2,289,919 |
| වෙනත් වත්කම් | 3,721,641,936 | - | 3,721,641,936 |
| **වෙළඳපොළ අවදානමට යටත් වන වගකීම්** | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 29,500,936,543 | - | 29,500,936,543 |
| වෙනත් ගනුදෙනුකරුවන් වෙත ගෙවිය යුතු | 187,752,465,256 | - | 187,752,465,256 |
| නිකුත් කළ ණය සහ ණයට ගත් වෙනත් අරමුදල් | 2,000,000,000 | - | 2,000,000,000 |
| ප්‍රවර්තන බදු වගකීම් | 503,021,886 | - | 503,021,886 |
| වෙනත් වගකීම් | 5,514,857,775 | - | 5,514,857,775 |

## වෙළඳපොළ අවදානම් කළමනාකරණය

වෙළඳපොළ අවදානම් කළමනාකරණය වාර්තා කිරීම මගින් අවදානම් පැතිකඩෙහි විනිවිදභාවයක් ඇති කරන අතර බැංකුවේ සියලුම මට්ටම් සඳහා මූලික වෙළඳපල අවදානම් තත්ත්ව ක්‍රියාවලි පිළිබඳව අවබෝධ කර ගැනීමට පහසුකම් සලසයි. කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු, වෙළඳපල අවදානම, ප්‍රාග්ධනය සහ ඉපැයීම් කෙරෙහි ඇති බලපෑම පිළිබඳව නිතිපතා වාර්තාකරණය මෙන්ම අවශ්‍ය අවස්ථාවල තාවකාලික වාර්තාකරණය ද ආතති පරීක්ෂණ මගින් ලබා ගනී. මෙහෙයුම් අවදානම් කළමනාකරණ කමිටුව (ORMC) සහ වත්කම් සහ වගකීම් කමිටුව (ALCO) මාසික සහ කාර්තුමය ඇතුළු වාර ගණනා-වක් මගින් අවදානම් තොරතුරු ලබා ගනී.

බැංකුව වෙළඳපල අවදානමට නිරාවරණය වීම වෙළඳාම සහ වෙළඳ නොවන කළඹ අතර වෙන් කරයි. වෙළඳ කළඹ ප්‍රධාන වශයෙන් බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන අතර වෙළඳපල සෑදීමෙන් ඇති වන තනතුරු සහ සාධාරණ වටිනාකම් පදනමක් මත කළමනාකරණය කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් ලාභයක් උපයා ගැනීමේ අරමුණින් පවත්වාගෙන යනු ලබයි.

වෙළඳපොළ අවදානම් නිරාවරණයන් අධීක්ෂණය කිරීම සහ සීමා කිරීම සඳහා බැංකුව මගින් මෙවලම් පරාසයක් භාවිත කරයි

## වෙළඳ නොවන වෙළඳපොළ අවදානම

- වෙළඳ නොවන වෙළඳපොළ අවදානම ප්‍රධාන වශයෙන් ඇති වන්නේ අපගේ වෙළඳ ඒකකවල ක්‍රියාකාරකම්වලින් පිටත, අපගේ බැංකු පොතේ සහ ශේෂ පත්‍රයෙන් බැහැර ඇතැම් අයිතමවලින් ය. බැංකුව නිරාවරණය වන සහ අවදානම් කළමනාකරණ කමිටු විසින් අධීක්ෂණය කරනු ලබන සැලකිය යුතු වෙළඳපල අවදානම් සාධක වන්නේ:
- පොලී අනුපාත අවදානම (ඇතැම් නිෂ්පාදන වර්ග සඳහා කාවැද්දූ විකල්පභාවයෙන් සහ හැසිරීම් රටා වල වෙනස්කම් ඇතුළුව)
- SWAP වැනි හෙජින් උපකරණවල විදේශ විනිමය අවදානම වැනි ශේෂ පත්‍රයෙන් බැහැර අයිතමවලින් ඇති වන වෙළඳපල අවදානම්.

## 44.4.1 පොලී අනුපාත අවදානම

පොලී අනුපාත අවදානම යනු වෙළඳපොළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් බැංකුවේ ඉපැයීම් සහ ශුද්ධ වත්කම් වටිනාකම් කෙරෙහි ඇති විය හැකි බලපෑමයි. ශේෂ පත්‍රයේ සහ ඉන් පිටත බැංකුවේ ප්‍රධාන මුදල් ප්‍රවාහ සහ පොලී මුදල් ප්‍රවාහ (අවසාන කල්පිරීම් ඇතුළුව) නොගැළපෙන මිල වෙනස් කිරීමේ දින ඇති අවස්ථාවල පොලී අනුපාත අවදානම ඇතිවේ. අවදානම් ප්‍රමාණය පොලී අනුපාත වෙනස්වීම්වල විශාලත්වය සහ දිශාව සහ නොගැළපෙන තත්ත්වයේ ප්‍රමාණය සහ කල් පිරීමේ ව්‍යුහයේ ශ්‍රිතයකි. බැංකුවේ ණය දීම, අරමුදල් සැපයීම සහ ආයෝජන ක්‍රියාකාරකම් පොලී අනුපාත අවදානම ඇති කරයි.

පොලී අනුපාත අවදානම් කළමනාකරණය පුළුල් ව්‍යාපාරික උපාය මාර්ගයක සන්දර්භය තුළ සිදු කෙරේ. පොලී අනුපාත අවදානම කළමනාකරණය කිරීමේ උපාය මාර්ගවලට අනුකූලව, පොලී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම සඳහා බැංකුව ඵලදායී හා පුළුල් ක්‍රියා පටිපාටි සකස් කර ක්‍රියාත්මක කර ඇති මෙම ක්‍රියා පටිපාටි බැංකුවේ පොලී අනුපාත අවදානම් ගැනීමේ ක්‍රියාකාරකම්වල ප්‍රමාණය හා සංකීර්ණතාවයට අනුකූල වේ.

ප්‍රශස්ත ලාභවලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අරමුදල් මාරු කිරීමේ මිලකරණ (FTP) ශිල්පීය ක්‍රම භාවිතා කරමින් මිල වෙනස් කිරීම් කල්පිරීමේ නොගැළපෙන පරතර තුළින් බැංකුව පොලී අනුපාත අවදානම කළමනාකරණය කරයි. අරමුදල් මාරු කිරීමේ මිලකරණ (FTP) තුළින් කළඹ හෙජ් කර ඇත. මෙම ප්‍රවේශය තුළින් බැංකුව මගින් එක් එක් කාල කළඹේ ණය දීම සහ අරමුදල් සැපයීම අතර පොලී අනුපාත අවදානම අඩු මට්ටමක පවතින බව සහතික කරයි. එබැවින්, බැංකුවේ පොලී අනුපාත අවදානමෙන් බහුතරයක් වත්කම් සහ වගකීම්වල හෙජ් නොකළ කොටසෙන් ඇති වේ.

සාමාන්‍යයෙන් පොලී අනුපාත අවදානම සංරචක දෙකකට බෙදා ඇතඃ වෙළඳාම් කරන ලද පොලී අනුපාත අවදානම සහ වෙළඳාම් නොකළ පොලී අනුපාත අවදානම වෙළඳාම් කරන ලද පොලී අනුපාත අවදානම වෙළඳ ක්‍රියාකාරකම්වලට සහ එහි බලපෑම්වලට අදාළ වන අතර□ දෙවැන්න බොහෝ විට ශේෂ පත්‍රයේ හෝ බැංකු පොතේ පොලී අනුපාත අවදානම ලෙස හඳුන්වනු ලබන අතර එය බැංකුවේ මූලික බැංකු ක්‍රියාකාරකම්වලින් ඇති වේ.

## බැංකු පොතේ පොලී අනුපාත අවදානම (IRRBB)

බැංකු පොතේ පොලී අනුපාත අවදානම යනු බැංකු පොතේ නිරාවරණයන්ට බලපාන පොලී අනුපාතවල චලනයන් හේතුවෙන් පැන නගින බැංකුවේ ප්‍රාග්ධනය සහ ඉපැයීම් යන දෙකටම ඇති අවදානමයි. විවිධ පොලී අනුපාත වක්‍ර භාවිතා කරමින් මිල නියම කරන ලද මූල්‍ය උපකරණ සඳහා පොලී අනුපාතවල සාපේක්ෂ වෙනස්කම්වල බලපෑම විස්තර කරන පොලී දරන වත්කම් සහ වගකීම්වල කල්පිරීමේ නොගැළපීම් මෙයට ඇතුළත් වේ.

පොලී අනුපාත අවදානම යනු කාලයත් සමඟ පොලී අනුපාත චලනය වන විට බැංකුවේ මූල්‍ය තත්ත්ව පිරිහීමට ලක්වීම මගින් බැංකුවට අත්විඳීමට සිදු වන අවදානමයි.

බැංකුවේ පොලී අනුපාත තත්ත්වය වන්නේ මිල වෙනස් කිරීමේ පැතිකඩෙහි වගකීම්වල කාලසීමාව කෙටි කාලසීමාවල වත්කම්වල කාලසීමාවට වඩා යම් දුරකට අඩු වීමයි. මෙම නොගැළපීම මගින් සාමාන්‍ය තත්ත්ව යටතේ වැඩිවන පොලී අනුපාත බැංකුවේ පොලී ආදායමට ඍණාත්මක බලපෑමක් ඇති කරයි. අනෙක් අතට, වගකීම්වල මිල වෙනස් වීම වත්කම්වලට වඩා ඉක්මනින් සිදු වන බැවින්, වගකීම් සඳහා ගෙවන සාමාන්‍ය පොලී අනුපාත අඩු වෙළඳපල පොලී අනුපාතවලට වඩා ඉක්මනින් අනුගත වනු ඇත, එවිට එය බැංකුවේ ශුද්ධ පොලී ආදායමට සහාය වනු ඇත.

ප්‍රවර්තන වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂයේදීද රාජ්‍ය මූල්‍ය හා මුල්‍ය උත්තේජකවල ප්‍රතිඵලයක් ලෙස, බැංකු කර්මාන්තයට පෙර නොවූ විරූ අභියෝගවලට මුහුණ  දීමට සිදු වියී වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන්, 2022 වර්ෂය තුළ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් අවිනිශ්චිතතාවය සහ ආර්ථික තත්ත්වයන්හි අහිතකර බව අවම කිරීම සඳහා වරින් වර ක්‍රියාත්මක කරන ලද විවිධ ප්‍රතිපත්ති සහ රෙගුලාසි හේතුවෙන් බලපෑමට ලක් වූ බව වැඩි වැඩියෙන් පැහැදිලි වෙමින් පැවතුනි.

අවදානම් සහිත ඉපැයීම් (EAR) සහ හිමිකම්වල ආර්ථික වටිනාකම (EVE) මිනුම් යන  ද්විත්වයම භාවිත කරමින් බැංකු පොතේ (IRRBB) පොලී අනුපාත අවදානම බැංකුව මගින් කළමනාකරණය කරයි අඛණ්ඩ පදනමක් මත පොලී අනුපාත අවදානම මධ්‍යගතව කළමනාකරණය කිරීමට භාණ්ඩාගාර අංශයට පවරා ඇති අතර අවදානම් කළමනාකරණ ඒකකය ස්වාධීන අධීක්ෂණ කාර්යයක් මත දෙවන ආරක්ෂක මාර්ගය ලෙස ක්‍රියා කරයි.

ආර්ථික අගය පදනම් කරගත් පියවර මගින් ගිණුම්කරණ පිළියමෙන් ස්වාධීනව, පොලී අනුපාත චලනයන් හේතුවෙන් ඇතිවන වත්කම්, වගකීම් සහ ශේෂ පත්‍රයෙන් පරිබාහිර නිරාවරණවල බැංකු පොතේ ආර්ථික වටිනාකමෙහි වෙනස නිරීක්ෂණය කරයි එමඟින්, බැංකු අධීක්ෂණය පිළිබඳ බාසල් කමිටුව විසින් අර්ථ දක්වා ඇති පරිදි (ICAPP) ක්‍රියාවලිය සඳහා සම්මත අවස්ථා යටතේ බැංකු පොතේ හිමිකම්වල ආර්ථික වටිනාකමෙහි (EVE) වෙනස බැංකුව මගින් මනිනු ලබයි.

පොලී අනුපාත චලනයන් හේතුවෙන් ඇති වන නිශ්චිත කාලසීමාවක් පුරා ඇතැම් නිර්වචනය කරන ලද මිණුම් සලකුණු අවස්ථා හා සසඳන විට, ශුද්ධ පොලී ආදායමේ (NII) අපේක්ෂිත වෙනස ඉපැයීම් මත පදනම් වූ මිනුම් මගින් නිරීක්ෂණය කරයි. එමඟින් බැංකුව විවිධ පොලී අනුපාත අවස්ථාවලට සමාන්තර මාරුවීමක්  සඳහා බැංකුවේ පොලී සංවේදී වත්කම් සහ වගකීම්වල සංවේදීතාව මනිනු ලබයි.

## 44.4.2 කල්පිරීමේ පරතර

කළමනාකාරීත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් කමිටුව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව බැංකුව සඳහා ද්‍රවශීලතාව සහ අරමුදල් අවදානම් උපාය මාර්ගය මෙන්ම බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් ගැනීමට අපේක්ෂා කරන අවදානම නිර්වචනය කරයි. අවම වශයෙන් වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව විසින් ද්‍රවශීලතා අවදානම මැනීම සහ පාලනය කිරීම සඳහා බැංකුවට අදාළ වන සීමාවන් මෙන් ම අපගේ දිගුකාලීන මූල්‍යකරණ සැලැස්ම සමාලෝචනය කර අනුමත කරනු ලැබේ.

අවදානම් අධීක්ෂණය ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුව විසින් ගැනීමට අපේක්ෂා කරන අවදානම අනුව අනුමත කරන ලද අනුපාත සහ අවදානම් මට්ටම් හරහා තොග ප්‍රවේශය මත වුවද, ද්‍රවශීලතා අවදානම කළමනාකරණය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ තවත් ක්‍රමයක් වන්නේ ජනප්‍රිය කල්පිරීම් නොගැළපීම හෝ කල් පිරීමේ පරතර විශ්ලේෂණයක් වන ප්‍රවාහ ප්‍රවේශ මෙවලම් භාවිතා කිරීමයි.

අදාළ මුදල් ප්‍රවාහය / කල්පිරීමේ පරතර සමඟ කල්පිරීමේ දින වාර්තා කරන දිනට ඉතිරි කාල සීමාව මත පදනම්ව 2022 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු වත්කම් හා බැරකම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| 2022 දෙසැම්බර් 31 දිනට | ධාරණ මුදල<br>රු. | මාස 3 ක් දක්වා<br>රු. | මාස 3 සිට 12 දක්වා<br>රු. | වසර 1 සිට 5 දක්වා<br>රු. | වසර 5 ට වැඩි<br>රු. |
|---|---|---|---|---|---|
| **පොලී උපයන වත්කම** | | | | | |
| මහ බැංකුවේ මුදල් සහ ශේෂ | 2,889,883,677 | 2,889,883,677 | - | - | - |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,133,705,351 | 6,133,705,351 | - | - | - |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනින ලද හිමිකම් උපකරණ | 120,280 | 120,280 | - | - | - |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් ණය සහ අනෙකුත් ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ | 215,372,501,881 | 20,765,534,350 | 68,158,625,869 | 88,021,524,268 | 38,426,817,393 |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය ආයෝජන ණය සහ අනෙකුත් උපකරණ | 65,082,462,630 | 36,189,771,645 | 22,925,323,999 | 4,858,812,738 | 1,108,554,248 |
| වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම් | 2,289,919 | - | - | - | 2,289,919 |
| **මුළු වත්කම** | **289,480,963,738** | **65,979,015,303** | **91,083,949,869** | **92,880,337,006** | **39,537,661,560** |
| **පොලී දරන වගකීම** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු දෑ | 47,470,707,056 | 341,729,856 | 3,118,125,660 | 18,440,308,907 | 25,570,542,634 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ | 210,301,323,468 | 39,028,814,697 | 112,257,521,646 | 27,600,148,852 | 31,414,838,273 |
| නිකුත් කළ ණය සහ අනෙකුත් ණයට ගත් අරමුදල් | 2,000,000,000 | 2,000,000,000 | - | - | - |
| **මුළු වගකීම** | **259,772,030,524** | **41,370,544,552** | **115,375,647,306** | **46,040,457,758** | **56,985,380,907** |
| **පරතර** | **29,708,933,214** | **24,608,470,751** | **(24,291,697,438)** | **46,839,879,248** | **(17,447,719,347)** |

| 2021 දෙසැම්බර් 31 දිනට | ධාරණ මුදල<br>රු. | මාස 3 ක් දක්වා<br>රු. | මාස 3 සිට 12 දක්වා<br>රු. | වසර 1 සිට 5 දක්වා<br>රු. | වසර 5 ට වැඩි<br>රු. |
|---|---|---|---|---|---|
| **පොලී උපයන වත්කම්** | | | | | |
| මහ බැංකුවේ මුදල් සහ ශේෂ | 1,486,878,989 | 1,486,878,989 | - | - | - |
| බැංකුවල ස්ථානගත කිරීම් | 6,596,072,932 | 6,596,072,932 | - | - | - |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනින ලද හිමිකම් උපකරණ | 188,140 | 188,140 | - | - | - |
| ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය වත්කම් ණය සහ අනෙකුත් | 189,039,666,420 | 18,110,092,805 | 49,460,589,634 | 87,271,577,867 | 34,197,406,113 |
| ගනුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය කළ පිරිවැයට මූල්‍ය ආයෝජන | 54,857,971,211 | 39,183,286,650 | 10,237,166,224 | 623,946,610 | 4,813,571,726 |
| ණය සහ අනෙකුත් උපකරණ වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ වටිනාකමට මනින ලද මූල්‍ය වත්කම් | 2,289,919 | - | - | - | 2,289,919 |
| **මුළු වත්කම්** | **251,983,067,611** | **65,376,519,517** | **59,697,755,858** | **87,895,524,478** | **39,013,267,758** |
| **පොලී දරන වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු දෑ | 29,500,936,543 | 1,364,318,523 | 2,778,809,963 | 15,000,220,002 | 10,357,588,055 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ | 187,752,465,256 | 47,613,449,121 | 80,321,397,135 | 28,159,887,937 | 31,657,731,062 |
| නිකුත් කළ ණය සහ අනෙකුත් ණයට ගත් අරමුදල් | 2,000,000,000 | 2,000,000,000 | - | - | |
| **මුළු වගකීම්** | **219,253,401,799** | **50,977,767,644** | **83,100,207,098** | **43,160,107,939** | **42,015,319,117** |
| **පරතර** | **32,729,665,812** | **14,398,751,873** | **(23,402,451,240)** | **44,735,416,540** | **(3,002,051,360)** |

## පොලී අනුපාතික මිනුම් දඬු ප්‍රතිසංස්කරණ

අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) වැනි පොලී අනුපාතික මිනුම් සලකුණු ගෝලීය මෙන් ම දේශීය මූල්‍ය වෙළඳපොලවල වැදගත් කාර්ය-භාරයක් ඉටු කරයි. ප්‍රධාන පොලී අනුපාත මිනුම් සලකුණුවල මූලික ප්‍රතිසංස්කරණයක් ගෝලීය වශයෙන් සිදු කරන ලදී. ඇතැම් අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) වෙනුවට විකල්ප ආසන්න වශයෙන් අවදානම් රහිත අනුපාත (අන්තර් බැංකු අර්පණ අනුපාත ප්‍රතිසංස්කරණ ලෙස හැඳින්වේ) යොදවමින් ප්‍රධාන පොලී අනුපාත මිණුම් සලකුණුවල මූලික ප්‍රතිසංස්කරණයක් ගෝලීය වශයෙන් සිදු කෙරෙමින් පවතී.

අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) ප්‍රතිසංස්කරණයේ ප්‍රතිඵලයක් වශයෙන්, බැංකුව නිරාවරණය වී ඇති ප්‍රධාන අවදානම් මෙහෙයුම් අවදානම් වේ නිදසුනක් ලෙසෘ ගනුදෙනුකරුවන් සමග ද්විපාර්ශ්වික සාකච්ඡා මගින් ණය ගිවිසුම් නැවත සාකච්ඡා කිරීම, ගිවිසුම් කොන්දේසි යාවත්කාලීන කිරීම, අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) වක්‍ර භාවිතා කරන පද්ධති යාවත්කාලීන කිරීම සහ ප්‍රතිසංස්කරණ හා නියාමන අවදානම්වලට අදාළ මෙහෙයුම් පාලනයන් සංශෝධනය කිරීම. මූල්‍ය අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාත අවදානමට පමණක් සීමා වේ. ගෝලීය වශයෙන් සිදු වන මෙම වෙළඳපොළ මුලපිරීම්වල කොටසක් වශයෙන් ප්‍රතිසංස්කරණය කෙරෙන එහි මූල්‍ය උපකරණවල ඇතැම් අන්තර් බැංකු අර්පණ අනුපාතවලට (IBORs) බැංකුව නිරාවරණය වී ඇත.

අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) භාවිතයෙන් විකල්ප අනුපාත වෙත සංක්‍රමණය වීම වත්කම් සහ වගකීම් කමිටුව (ALCO) මගින් කළමනාකරණය කිරීමට බැංකුව අදහස් කරයි 2021 අග භාගයේ සිට ගෙවිය යුතු කොන්ත්‍රාත්තු බොහෝ දුරට ස්ථාවර මිල ගණන් මත පදනම්ව විකල්ප මිල ගණන් යටතේ මිල වෙනස් කරනු ලැබේ. නිතර මිල වෙනස් කිරීමේ දිනයන් පවතින දිගුකාලීන අත්තිකාරම්වල මිල වෙනස් කිරීමට අවශ්‍ය නම් 2023 මැද භාගය දක්වා බැංකු මණ්ඩල ඉදිරිපත් කිරීම් භාවිතා කරමින් අඛණ්ඩව ගණනය කරනු ලබන එක්සත් ජනපද ඩොලර් පදනමින් ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාත (LIBOR) පහේ සැකැස්ම භාවිත කරනු ලැබේ. කෙසේ වුවද, නව ව්‍යාපාර සඳහා මෙම එක්සත් ජනපද ඩොලර් පදනමින් ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය (LIBOR) භාවිතා කිරීම 2021 වර්ෂය අවසානයේ සිට සීමා කර ඇත.

අවදානම් කළමනාකරණ ක්‍රියාකාරිත්වයක් ලෙස (RMU) ඉදිරියට යමින්, ණය ඉදිරියට ගිය ප්‍රමාණයෘ ණය බැඳීම්, වගකීම් සහ ව්‍යුත්පන්න යොමුගත අන්තර් බැංකු අර්පණ අනුපාත (IBOR) මුදල් ප්‍රවාහ, අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) ප්‍රතිඵලයක් වශයෙන් එවැනි ගිවිසුම් සංශෝධනය කළ යුතු ද යන්න ඇගයීමට ලක් කරනු ඇත. පොලී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සඳහා මෙම සොයාගැනීම් වත්කම් සහ වගකීම් කමිටුවට (ALCO) සහ භාණ්ඩාගාරයට වාර්තා කරනු ලබන අතර මෙම සොයාගැනීම් පොලී අනුපාත අවදානම කළමනාකරණයට සහාය වීම සඳහා වත්කම් සහ වගකීම් කමිටුවට (ALCO) සහ භාණ්ඩාගාරය වෙත වාර්තා කරනු ලබන අතර මෙම අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) ප්‍රතිසංස්කරණවලින් පැන නගින මෙහෙයුම් සහ නියාමන අවදානම් හඳුනා ගැනීමට සහ ප්‍රතිපාර්ශව සමඟ අන්තර් බැංකු අර්පණ අනුපාත (IBORs) ප්‍රතිසංස්කරණ පිළිබඳ සන්නිවේදන කටයුතු කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳව වත්කම් සහ වගකීම් කමිටුව (ALCO) සහ භාණ්ඩාගාරය සමඟ සමීපව කටයුතු කරයි. මෙම සොයාගැනීම් කාර්තුමය වශයෙන් (BIRMC) වෙත වාර්තා කරනු ලබන අතර අවශ්‍ය පරිදි අනෙකුත් ව්‍යාපාරික කාර්යයන් සම්බන්ධයෙන් ද සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

## 44.4.3 වෙනත් වෙළඳපොල අවදානම්වලට නිරාවරණය වීම
## විදේශ මුදල් අවදානම

විදේශ විනිමය අනුපාත අවදානම පැන නගින්නේ එක් මුදල් ඒකකයක විනිමය අනුපාතය තවත් මුදලකට සාපේක්ෂව චලනය වීමෙන් වන අතර එමගින් බැංකුවේ ඉපැයීම හෝ හිමිකම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති වේ. පෙර පැවැති ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවෙන් පවරා ගත් විදේශ මුදල් වත්කම් හා බැරකම් සහ ආසියානු සංර්ධන බැංකුවෙන් ලබාගත් ණය හේතුවෙන් ඇති වන විදේශ මුදල් අවදානමට බැංකුව නිරාවරණය වේ. නුදුරු අනාගතයේ දී සිදුවිය හැකි විදේශ මුදල් අවදානම වළක්වා ගැනීම / අවම කිරීම සඳහා අවශ්‍ය පූර්වාරක්ෂක කටයුතු ක්‍රියාත්මක වේ.

මෙම වසර තුළ, විදේශ මුදල් ද්‍රවශීලතාවය, විශේෂයෙන් ම එක්සත් ජනපද ඩොලර් නොමැතිකම හේතුවෙන් බැංකු අංශයට වෙළඳපල තත්ත්ව පිළිබඳ අවිනිශ්චිතතාවයකට මුහුණ දීමට සිදු විය. මෙම තත්ත්ය වගකීම් පරිවර්තන ගනුදෙනුවල, විශේෂයෙන් වෙළඳාම හා සම්බන්ධ ගනුදෙනුවල, අපේක්ෂිත මට්ටම් සපුරාලීමට බැංකු කර්මාන්තයට නොහැකි වීමට බොහෝ දුරට හේතු විය. ඇතුළතට සිදු වන ප්‍රේෂණ ලැබීම් සහ අපනයන බිල්පත් වැනි වත්කම් පරිවර්තන ගනුදෙනුවල පහත වැටීමක් ද වෙළඳපොල විසින් අත්විඳ ඇත. මෙම තත්ත්වය හේතුවෙන්, ඇමෙරිකානු ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් අනුපාත අවප්‍රමාණය වූ අතර එය බොහෝ දුරට පාලිත විනිමය අනුපාතිකයක් වූ අතර එමගින් රු.200 සිට රු.203 යන මට්ටම් දක්වා ගනුදෙනු සිදු විය.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද නවතම උපදෙස්වල දක්වා ඇති පරිදි ද, දේශීය හා ගෝලීය වශයෙන් අනුගමනය කරනු ලබන යෝග්‍ය වෙළඳපොල පරිචයන්ට අනුකූලව සියලුම වෙළඳපොල අවදානම් ක්‍රියාමාර්ග අනුගමනය කරන බව බැංකුව සහතික කරයි.
බැංකුව ගනුදෙනු කරන ප්‍රධාන මුදල්වල විදේශ මුදල් නිරාවරණ සහ ඒවායේ රුපියල් වලට සමාන අගයන් පහත දැක්වේ

| දෙසැම්බර් 31 දිනට | මුල් විදේශ මුදල් ඒකකයෙන් 2022 | 2021 | බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකය 2022 | 2021 |
|---|---|---|---|---|
| | ඇ.ඩො. | ඇ.ඩො. | රු. | රු. |
| **ශුද්ධ විදේශ මුදල් නිරාවරණය** | | | | |
| විදේශ මුදල්වලින් නම් කරන ලද මූල්‍ය වත්කම් | 68,070,895 | 53,803,708 | 24,913,947,739 | 10,801,094,369 |
| විදේශ මුදල් වලින් නම් කරන ලද මූල්‍ය වගකීම් | 63,099,435 | 53,658,862 | 23,094,393,092 | 10,772,016,498 |

ප්‍රවර්තන විනිමය අනුපාතයේ ක්ෂයවීම් සහ සමස්ත විදේශ විනිමයේ ශුද්ධ විවෘත තත්ත්වය (ඇමෙරිකානු ඩොලර් වලින්) මත බලපෑම සහ ආදායම් ප්‍රකාශනයට ඇති බලපෑම සඳහා 5%, 10% සහ 15% කම්පන මට්ටම් යොදා ගනිමින් විදේශ විනිමයේ ශුද්ධ විවෘත තත්ත්වය (NOP) පිළිබඳ බලපෑම් විශ්ලේෂණයක් සිදු කරන ලදී.

| දෙසැම්බර් 31 දිනට | 2022 | | 2021 | |
|---|---|---|---|---|
| | ඇ.ඩො. | රු. | ඇ.ඩො. | රු. |
| ශුද්ධ විවෘත තත්ත්වය | 4,971,461.00 | 1,819,554,647.00 | 144,846.00 | 29,077,872.00 |

| දෙසැම්බර් 31 දිනට | සංශෝධිත රුපියල් තත්ත්වය | ආදායම් ප්‍රකාශනය මත බලපෑම | සංශෝධිත රුපියල් තත්ත්වය | ආදායම් ප්‍රකාශනය මත බලපෑම |
|---|---|---|---|---|
| 5% | 1,910,532,380 | 90,977,732 | 30,531,766 | 1,453,894 |
| 10% | 2,001,510,112 | 181,955,465 | 31,985,659 | 2,907,787 |
| 15% | 2,092,487,844 | 272,933,197 | 33,439,553 | 4,361,681 |

## 44.5 මෙහෙයුම් අවදානම

'මෙහෙයුම් අවදානම' යනු බැංකුවේ ක්‍රියාවලීන්, පිරිස් තාක්ෂණය සහ යටිතල පහසුකම්, ණය හැර බාහිර සාධක මගින් සහ නෛතික හා නියාමන අවශ්‍යතා සහ ආයතනික හැසිරීම් පිළිබඳ පොදුවේ පිළිගත් ප්‍රමිතීන් මගින් ඇති වන සෘජු හෝ වක්‍ර අලාභය පිළිබඳ අවදානමයි. මෙහෙයුම් අවදානම් බැංකුවේ සියලුම මෙහෙයුම් කටයුතුවලින් ඇති වේ.

සමස්ත පිරිවැය කාර්යක්ෂමතාව සහ නවෝත්පාදනය සමඟ මූල්‍ය පාඩු සහ බැංකුවේ කීර්තිනාමයට සිදුවන හානිය වළක්වා ගැනීම සමතුලිත කිරීම සඳහා මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම බැංකුවේ අරමුණයි. සෑම අවස්ථාවකදී ම බැංකු ප්‍රතිපත්තියට අදාළ සියලු නෛතික හා නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම අවශ්‍ය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහෙයුම් අවදානම් සඳහා විසඳුම් ලබා දීම සඳහා පාලන සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු බැංකුවෙහි මෙහෙයුම් අවදානම් කමිටුව වෙත මෙහෙයුම් අවදානම පිළිබඳ වගකීම පවරා ඇත. පහත සඳහන් ක්ෂේත්‍රවල මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සඳහා සමස්ත බැංකු ප්‍රමිතීන් සංවර්ධනය කිරීම මගින් මෙම වගකීමට සහාය දැක්වේ.

- ගනුදෙනු සඳහා ස්වාධීන අනුමැතිය ලබා දීම ඇතුළුව රාජකාරී නිසි ලෙස වෙන් කිරීම සඳහා වන අවශ්‍යතා;
- ගනුදෙනු සැසඳීම සහ අධීක්ෂණය කිරීම සඳහා පවතින අවශ්‍යතා
- නියාමන හා වෙනත් නෛතික අවශ්‍යතාවලට අනුකූල වීම;
- පාලන හා ක්‍රියා පටිපාටි ලේඛනගත කිරීම;
- මුහුණ දෙන මෙහෙයුම් අවදානම් පිළිබඳ වරින් වර තක්සේරු කිරීම සඳහා වන අවශ්‍යතා සහ හඳුනාගත් අවදානම් සඳහා විසඳුම් ලබා දිම සඳහා පාලන සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත්භාවය;
- මෙහෙයුම් අලාභ වාර්තා කිරීම සහ යෝජිත පිළියම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ අවශ්‍යතා;
- අවිනිශ්චිතතා සැලසුම් සංවර්ධනය කිරීම;
- පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය;
- සදාචාරාත්මක සහ ව්‍යාපාරික ප්‍රමිතීන්; සහ
- පිරිවැය ඵලදායී වන රක්ෂණය ඇතුළුව අවදානම් අවම කිරීම;

# 45. ප්‍රාග්ධන කළමනාකරණය

## 45.1 නියාමන ප්‍රාග්ධනය

බැංකුවේ ප්‍රධාන නියාමකයා වන ශ්‍රී ලංකා මහ බැංකුව සමස්තයක් වශයෙන් බැංකුවේ ප්‍රාග්ධන අවශ්‍යතා නියම කර එම අවශ්‍යතා අධීක්ෂණය කරයි. ප්‍රධාන නියාමකයින් විසින් තනි බැංකු මෙහෙයුම් ඍජුවම අධීක්ෂණය කරනු ලබයි. බැංකුවේ ප්‍රාග්ධන කළමනාකරණ ඉලක්ක පහත දක්වා ඇත.

අ. 12.5% ක් වූ නියාමන අවම ප්‍රාග්ධන ප්‍රමාණවත්භාවය පිළිබඳ අවශ්‍යතාව අවදානමට ලක් නොවන බවට සහතික වීම.
ආ. බැංකුවේ ජාත්‍යන්තර සහ දේශීය ණය ශ්‍රේණිගත කිරීම පවත්වාගෙන යාම සහ බැංකුවේ අවදානම් ප්‍රාග්ධනය පිරිහීමේ ප්‍රතිඵලයක් වශයෙන් කිසිදු අවශ්‍රේණිගත කිරීමක් සිදු නොවන බවට සහතික වීම.
ඇ. බැංකු ක්ෂේත්‍රය සඳහා වන සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය කර්මාන්ත සඳහා වූ අනුපාතයට ඉහළින් පවත්වා ගන්නා බවට සහතික කිරීම.
ඈ. ගුණාත්මක ප්‍රාග්ධනයක් පවත්වා ගැනීම සහතික කිරීම.
ඉ. නිෂ්පාදන සැලසුම් කිරීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලියේ දී ව්‍යාපාරික තීරණවල ප්‍රාග්ධන බලපෑම නිසි පරිදි තක්සේරු කර සැලකිල්ලට ගන්නා බව සහතික කිරීම.
ඊ. ව්‍යාපාර ක්‍රියාමාර්ග මගින් ප්‍රාග්ධන පරිභෝජනය ප්‍රමාණවත් ලෙස මිල කර ඇති බව සහතික කිරීම.
උ. බැංකුවේ සාමාන්‍ය දිගුකාලීන ලාභාංශ ගෙවීමේ අනුපාතය පවත්වා ගෙන යාම සහතික කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාව තනි පදනම මත නියම කර අධීක්ෂණය කරනු ලබයි. නියාමන ප්‍රාග්ධනය සම්බන්ධයෙන් බාසල් II සහ බාසල් III හි විධිවිධානවලට බැංකුව අනුගත වීම අවශ්‍ය වේ.

### ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන ප්‍රමාණවත්තාවය යනු බැංකුවකට තම ව්‍යාපාරය ආශ්‍රිත අවදානම්වලට ඔරොත්තු දීම සඳහා පවතින හැකියාව පිළිබඳ මිණුමකි. අපේක්ෂිත අවදානම් සම්බන්ධයෙන් ප්‍රවේශමින් කටයුතු කිරීම සඳහා බැංකුවේ නිෂ්පාදන සහ සේවා මිල කරන අතර ම, සෑම බැංකුවක්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත අනපේක්ෂිත අලාභ අවශෝෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් තබා ගැනීම අවශ්‍ය බව නියාමකයෝ සලකති. ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) බාසල් II යටතේ 2017 ජූනි 30 දක්වාත් ඉන් අනතුරුව බාසල් III යටතේ මනිනු ලබන අතර ණය, වෙළඳපොල සහ මෙහෙයුම් අවදානම් සැලකිල්ලට ගනියි. බැංකු රෙගුලාසි සහ අධීක්ෂණ පිළිවෙත් පිළිබඳ බාසල් කමිටුවේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව, ශ්‍රී ලංකාව 2017 ජූලි 1 වන දින සිට බාසල් III ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) ගණනය කිරීම අනුගමනය කරයි.

## 45.2 ප්‍රාග්ධනය වෙන් කිරීම

කළමනාකාරීත්වය බැංකුවේ ප්‍රාග්ධන පදනම අධීක්ෂණය කිරීම සඳහා නියාමන ප්‍රාග්ධන අනුපාත භාවිතා කරයි. නිශ්චිත මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් අතර ප්‍රාග්ධනය වෙන් කිරීම බොහෝ දුරට වෙන් කරන ලද ප්‍රාග්ධනය මත ලබාගත් ප්‍රතිලාභ ප්‍රශස්තකරණය මගින් මෙහෙයවනු ලබයි. එක් එක් මෙහෙයුම් හෝ ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රමාණය මූලික වශයෙන් නියාමන ප්‍රාග්ධන අවශ්‍යතා මත පදනම් වේ. නමුත්, ඇතැම් අවස්ථාවල දී නියාමන අවශ්‍යතා විවිධ ක්‍රියාකාරකම් හා සම්බන්ධ විවිධ අවදානම් මට්ටම් සම්පූර්ණයෙන් ම පිළිබිඹු නොකරයි.

නියාමන අරමුණු සඳහා අවශ්‍ය අවමයට වඩා අඩු නොවන විශේෂිත මෙහෙයුමක් හෝ ක්‍රියාකාරකමක් සඳහා සහාය වීම සඳහා ප්‍රාග්ධනයේ සමස්ත මට්ටමට යටත්ව එවැනි අවස්ථාවන්හි දී ප්‍රාග්ධන අවශ්‍යතා විවිධ අවදානම් පැතිකඩ පිළිබිඹු කිරීම සඳහා නම්‍යශීලී විය හැකිය. විශේෂිත මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාග්ධනය වෙන් කිරීමේ ක්‍රියාවලිය බැංකු අවදානම් සහ බැංකු ණය මගින් මෙහෙයවීම සඳහා වගකිව යුතු අයගෙන් ස්වාධීනව සිදු කරනු ලබන අතර බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව (ALCO) විසින් එම ක්‍රියාවලිය සමාලෝචනයට ලක් කෙරේ.

නිශ්චිත මෙහෙයුම් හෝ ක්‍රියාකාරකම් සඳහා බැංකුව තුළ ප්‍රාග්ධනය වෙන් කරන ආකාරය තීරණය කිරීමේ දී භාවිතා කරන ප්‍රධාන පදනම අවදානම ගළපන ලද ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ උපරිම කිරීම වුවද, තීරණ ගැනීම සඳහා භාවිතා කරන එකම පදනම එය නොවේ. අනෙකුත් මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සමඟ සහයෝගීතාවය, කළමනාකරණය සහ අනෙකුත් සම්පත් ලබා ගැනීමේ හැකියාව සහ බැංකුවේ දිගුකාලීන උපායමාර්ගික අරමුණු සමඟ ක්‍රියාකාරකම්වල ගැළපීම ද සැලකිල්ලට ගනී. ප්‍රාග්ධන කළමනාකරණය සහ වෙන් කිරීම සම්බන්ධයෙන් බැංකුවේ ප්‍රතිපත්ති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විධිමත්ව සමාලෝචනය කරනු ලැබේ.

## 45.3 ලබාගත හැකි ප්‍රාග්ධනය

බාසල් III ගිවිසුම මගින් CET 1 ප්‍රාග්ධනය෴ අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනය සහ ස්ථර 2 ප්‍රාග්ධනය යන ප්‍රාග්ධන අංග තුනක් හඳුනා ගනී.

CET 1 ප්‍රාග්ධනයට කොටස් ප්‍රාග්ධනය, සංචිත අරමුදල, ප්‍රකාශිත රඳවා ගත් ඉපැයීම් (සමුච්චිත රඳවා ගත් අලාභ), සාමාන්‍ය සහ අනෙකුත් සංචිත සහ ප්‍රකාශයට පත් නොකළ ප්‍රවර්තන වර්ෂයේ ලාභය/ (අලාභ) සහ OCI හි පිළිබිඹු වන ලාභ ඇතුළත් වේ. කීර්තිනාමය (ශුද්ධ), අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්, දේපළ, පිරියත හා උපකරණවල ප්‍රත්‍යාගණන අලාභ, විලම්භිත බදු වත්කම්, මුදල් ප්‍රවාහ හෙජ් සංචිතය, නිශ්චිත ප්‍රතිපාදන සඳහා සමුච්චිත හානිකරණයේ හිඟය, නිර්වචිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් අරමුදල් වත්කම්, ස්වකීය කොටස් සඳහා සිදු කරනු ලබන  ආයෝජන, බැංකු සහ මූල්‍ය ආයතනවල ප්‍රාග්ධනයේ ආයෝජන සහ නියාමන උපදෙස් අනුව වෙනත් ගැළපීම් CET 1 ප්‍රාග්ධනය ලබා ගැනීමේ දී අදාළ වන පරිදි අඩු කරනු ලැබේ.

අතිරේක ස්ථර 1 ප්‍රාග්ධනයට නියාමන උපදෙස් අනුව සුදුසුකම් ලබන උපකරණ ඇතුළත් වේ. ස්වකීය කොටස්වල ආයෝජන, බැංකු සහ මූල්‍ය ආයතනවල ප්‍රාග්ධනයේ ආයෝජන සහ නියාමන උපදෙස් අනුව අනෙකුත් ගැළපීම් අතිරේක ස්ථර I ප්‍රාග්ධනය ලබා ගැනීමේදී අදාළ වන පරිදි අඩු කරනු ලැබේ.

ස්ථර 2 ප්‍රාග්ධනයට සුදුසුකම් ලත් ස්ථර 2 ප්‍රාග්ධන උපකරණ, ප්‍රත්‍යාගණන ලාභ සහ සාමාන්‍ය ප්‍රතිපාදන ආදිය ඇතුළත් වේ. ස්වකීය කොටස්වල ආයෝජනය කිරීම, බැංකු හා මූල්‍ය ආයතනවල ප්‍රාග්ධනයේ ආයෝජනය කිරීම් සහ නියාමන උපදෙස් අනුව වෙනත් ගැළපීම් දෙවන පෙළ ප්‍රාග්ධනයට පැමිණීමේ දී අදාළ වන පරිදි අඩු කරනු ලැබේ.

2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වූ බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 දෙසැම්බර් 29 දිනැති 2016 අංක 01 දරන බැංකු පනත් විධානයට අනුව සහ 2019 දෙසැම්බර් 20 දිනැති 2019 අංක 11 දරන විධාන යටතේ ඊට සිදු කරන ලද සංශෝධන අනුව, බැංකුව විසින් පවත්වාගෙන යා යුතු අවම අවශ්‍ය ප්‍රාග්ධන අනුපාත පහත දක්වා ඇති.

- සෑම බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්ම. පහත වගුවේ දක්වා ඇති අවම ප්‍රාග්ධන අනුපාත සෑමවිට ම පවත්වා ගත යුතු අතර, බලපත්‍රලාභී බැංකු සඳහා වූ බාසල් III යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ 2016 අංක 01 දරන බැංකු පනත් විධාන 01 හි 1 වන උපලේඛනයට අනුකූල වන බව සහතික කළ යුතුය.
- වරින් වර දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු (D-SIB) ලෙස තීරණය කරනු ලබන බලපත්‍රලාභී විශේෂිත බැංකු පහත වගුවේ දක්වා ඇති පරිදි මුදල් මණ්ඩලය විසින් පොදු කොටස් ස්ථර 1 (CET 1) ලෙස දක්වා ඇති පරිදි ඉහළ අලාභ අවශෝෂණ (HLA) අවශ්‍යතා පවත්වා ගත යුතුය

| ප්‍රාග්ධනයේ සංරචක | බලපත්‍රලාභී බැංකුව විසින් පවත්වා ගත යුතු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය |
|---|---|
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව පොදු කොටස් ස්ථර 1 | 7.50% |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව මුළු ස්ථර | 8.50% |
| ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය ඇතුළුව මුළු ප්‍රාග්ධන අනුපාතය | 12.50% |

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 මාර්තු මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද අතිවිශේෂ නියාමන ක්‍රියාමාර්ගයන්ට අනුව, දේශීය පද්ධතියම වශයෙන් වැදගත් බැංකු (D-SIB) සහ දේශීය පද්ධතියම වශයෙන් වැදගත් නොවන බැංකුවලට 250bp වූ මුළු ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකයෙන් ඔවුන්ගේ ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂක වශයෙන් අනුපිළිවෙලින් 100bps ක් සහ 50bps ක් දක්වා අඩු කිරීමට අවසර ලබා දී ඇත.

දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රාග්ධන ප්‍රමාණවත් බව (බාසල් 111) විස්තර පහත දැක්වේ.

| දෙසැම්බර් 31 දිනට | බාසල් III 2022 රු. | 2021 රු. |
|---|---|---|
| **වත්කම්** | | |
| මුළු අවදානම් බර තැබූ මුදල (ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම ඇතුළුව) | 143,939,205,752 | 153,296,177,322 |
| ශේෂ පත්‍රයෙන් බැහැර නිරාවරණයේ අවදානම් බර තැබූ ප්‍රමාණය | 35,609,204 | 35,553,393 |
| **ප්‍රාග්ධනය** | | |
| පොදු කොටස් ස්ථරය 1 ප්‍රාග්ධනය | 11,932,386,377 | 14,189,229,195 |
| මුළු ස්ථරය 1 ප්‍රාග්ධනය | 11,932,386,377 | 14,189,229,195 |
| මුළු ප්‍රාග්ධනය | 21,908,992,974 | 20,168,998,565 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | |
| පොදු කොටස් ස්ථරය 1 ප්‍රාග්ධන අනුපාතය (%) | 8.29% | 8.72% |
| ස්ථරය 1 ප්‍රාග්ධන අනුපාතය (%) | 8.29% | 8.72% |
| මුළු ප්‍රාග්ධන අනුපාතය (%) | 15.22% | 14.27% |

## 46.මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම

## 46.1සාධාරණ වටිනාකම් තීරණය කිරීම

බැංකුව පහත සඳහන් සාධාරණ වටිනාකම් ධුරාවලිය භාවිතා කරමින් සාධාරණ අගයන් මනිනු ලබන අතර, එමගින් මිනුම් කිරීමේ දී භාවිතා කරන යෙදවුම්වල වැදගත්කම පිළිබිඹු වේ.
1 වන මට්ටම - සමාන උපකරණ සඳහා ක්‍රියාකාරී වෙළඳපොළවල වෙළඳපල මිල ගණන් (ගැළපීම් නොකළ) ඉදිරිපත් කරන යෙදවුම්.

2 වන මට්ටම - සෘජුවම (එනම් මිල ගණන් ලෙස) හෝ වක්‍රව (එනම් මිල ගණන්වලින් ලබා ගත්) නිරීක්ෂණය කළ හැකි 1 මට්ටම තුළ ඇතුළත් කර ඇති, ඉදිරිපත් කරන ලද මිල ගනන් හැර වෙනත් යෙදවුම් සමාන උපකරණ සඳහා ක්‍රියාකාරී වෙළඳපලවල ඉදිරිපත් කරන ලද වෙළඳපල මිල ගණන්, ක්‍රියාකාරී වෙළඳපොළවලට වඩා ක්‍රියාකාරීත්වයෙන් අඩු ලෙස සලකනු ලබන වෙළෙඳපලවල සර්වසම හෝ සමාන උපකරණ සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන්, හෝ සියලුම වැදගත් යෙදවුම් සෘජුව හෝ වක්‍රව වෙළඳපල දත්තවලින් නිරීක්ෂණය කළ හැකි අනෙකුත් තක්සේරුකරණ ශිල්පීය ක්‍රම භාවිතයෙන් තක්සේරු කරනු ලබන උපකරණ මෙම කාණ්ඩයට ඇතුළත් වේ.

3 වන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් තක්සේරුකරණ තාක්ෂණයට නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් ඇතුළත් වන සියලුම උපකරණ මෙම කාණ්ඩයට ඇතුළත් වන අතර මෙම නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් මගින් උපකරණයේ තක්සේරුවට සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. මෙම කාණ්ඩයට සමාන උපකරණ සඳහා ඉදිරිපත් කරන ලද මිල ගණන් මත පදනම්ව තක්සේරු කරනු ලබන උපකරණ ඇතුළත් වන අතර උපකරණ අතර වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි ගැළපීම් හෝ උපකල්පන අවශ්‍ය වේ.

## 46.2 තක්සේරු ආකෘති

නිරීක්ෂණය කළ හැකි වෙළඳපල මිල ගණන් පවතින සමාන උපකරණ සමග සංසන්දනය කිරීමේ දී, ශුද්ධ වර්තමාන වටිනාකම සහ වට්ටම් සහිත මුදල් ප්‍රවාහ ආකෘති තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රමවලට ඇතුළත් වේ. තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රම සඳහා භාවිතා කරන උපකල්පන සහ යෙදවුම්වලට අවදානම් රහිත හා සම්මත පොලී අනුපාත, ණය පැතිරීම සහ වට්ටම් අනුපාත ඇස්තමේන්තු කිරීමේදී භාවිතා කරන අනෙකුත් වාරික, බැඳුම්කර සහ හිමිකම් මිල ගණන්, විදේශ විනිමය හුවමාරු අනුපාත, හිමිකම් සහ හිමිකම් දර්ශක මිල ගණන් සහ අපේක්ෂිත මිල අස්ථාවරත්වයන් සහ සහසම්බන්ධතා ඇතුළත් වේ.

තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රමවල පරමාර්ථය වන්නේ වත්කම් විකිණීම සඳහා ලැබෙන මිල පිළිබිඹු කරන සාධාරණ වටිනාකම් මැනීම හෝ මිනුම් දිනයේ දී වෙළඳපල සහභාගී වන්නන් අතර විධිමත් ගනුදෙනුවක වගකීම මාරු කිරීම සඳහා ගෙවීම් කිරීමයි.

## 46.3 තක්සේරු රාමුව

සාධාරණ වටිනාකම් මැනීම සම්බන්ධයෙන් බැංකුවට ස්ථාපනය කළ පාලන රාමුවක් ඇත. මෙම රාමුවට වෙළඳපල අවදානම් ශ්‍රිතය මගින් පාලනය ඇතුළත් වන අතර එය කාර්ය මණ්ඩල සහ මෙහෙයුම් කළමනාකරණයෙන් ස්වාධීන වේ. වෙළඳ සහ ආයෝජන මෙහෙයුම්වල ප්‍රතිඵල සහ සියලුම සැලකිය යුතු සාධාරණ වටිනාකම් මිනුම් ස්වාධීනව සත්‍යාපනය කිරීමේ සමස්ත වගකීම වෙළඳපල අවදානම සතු වේ. මෙම නිශ්චිත පාලනයන්ට ඇතුළත් වන්නේ:

- නිරීක්ෂණය කළ හැකි මිල ගණන් තහවුරු කිරීම.
- ආදර්ශ ඇගයීම් නැවත ක්‍රියාත්මක කිරීම;
- නිෂ්පාදන පාලනය සහ කණ්ඩායම් වෙළඳපල අවදානම යන දෙකම සම්බන්ධ නව මාදිලි සහ ආකෘතිවල වෙනස්කම් සඳහා සමාලෝචනය කිරීමේ සහ අනුමත කිරීමේ ක්‍රියාවලියක්;
- නිරීක්ෂණය කරන ලද වෙළඳපළ ගනුදෙනුවලට එරෙහිව ආකෘතිවල කාර්තුමය ක්‍රමාංකනය සහ නැවත පරීක්ෂා කිරීම;
- සැලකිය යුතු දෛනික තක්සේරු චලන විශ්ලේෂණය කිරීම සහ විමර්ශනය කිරීම; සහ
- ඉකුත් කාලපරිච්ඡේදයට සාපේක්ෂව, සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්, තක්සේරු ගැළපීම් සහ 3 වන මට්ට මේ උපකරණවල සාධාරණ අගය මැනීමේ සැලකිය යුතු වෙනස්කම් සමාලෝචනය කිරීම.

තැරැව්කරුවන්ගේ මිල ඉදිරිපත් කිරීම් හෝ මිල ගණන් සේවා වැනි තෙවන පාර්ශවීය තොරතුරු සාධාරණ වටිනාකම මැනීම සඳහා භාවිතා කරන අවස්ථාවල, එවැනි තක්සේරු කිරීම් SLFRSs/LKASs හි අවශ්‍යතා සපුරාලන බව නිගමනය කිරීම සඳහා වෙළඳපල අවදානම තක්සේරු කර තෙවන පාර්ශවයන්ගෙන් ලබාගත් සාක්ෂි ලේඛනගත කරයි.

මෙයට ඇතුළත් වන්නේ,

- අදාළ වර්ගයේ මූල්‍ය උපකරණයේ මිල නියම කිරීම සඳහා භාවිතා කිරීම පිණිස තැරැව්කරුවා හෝ මිලකරණ සේවාව බැංකුව විසින් අනුමත කර ඇති බව තහවුරු කිරීම;
- සාධාරණ වටිනාකම පැමිණ ඇති ආකාරය තේරුම් ගැනීම එය තථ්‍ය වෙළඳපල ගනුදෙනු නියෝජනය කරන ප්‍රමාණය සහ එය සර්වසම උපකරණයක් සඳහා ක්‍රියාකාරී වෙළඳපොලක ඉදිරිපත් කරන ලද මිලක් නියෝජනය කරයි ද යන්න
- සාධාරණ වටිනාකම මැනීම සඳහා සමාන උපකරණ සඳහා වන මිල ගණන් භාවිතා කරන විට, මිනුම් වලට යටත්ව උපකරණයේ ලක්ෂණ පිළිබිඹු කිරීම සඳහා මෙම මිල ගණන් ගළපා ඇති ආකාරය; සහ
- එකම මූල්‍ය උපකරණය සඳහා මිල ඉදිරිපත් කිරීම් ගණනාවක් ලබාගෙන තිබේ නම්. එම මිල ඉදිරිපත් කිරීම් භාවිත කරමින් සාධාරණ වටිනාකම තීරණය කර ඇති ආකාරය.

## 46.4 සාධාරණ වටිනාකමින් මනිනු ලබන මූල්‍ය උපකරණ - සාධාරණ වටිනාකම් ධූරාවලිය

සාධාරණ අගය මිනුම් වර්ගීකරණය කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලියේ මට්ටම අනුව, වාර්තා කරන දිනයේ දී සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මූල්‍ය උපකරණ පහත වගුව මගින් විශ්ලේෂණය කරයි. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ පිළිගත් අගයන් මත මෙම ප්‍රමාණයන් පදනම් වේ. සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතා කරන තක්සේරු තාක්ෂණයක් මත පදනම් වූ විට, සාධාරණ වටිනාකම්වලට ගනුදෙනු මිල සහ මූලික පිළිගැනීම මත සාධාරණ අගය අතර යම් විලම්භිත වෙනස්කම් ඇතුළත් වේ.

| දෙසැම්බර් 31 දිනට | 2022 | | | |
|---|---|---|---|---|
| | 1 මට්ටම | 2 මට්ටම | 3 මට්ටම | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන කොටස් උපකරණ | 120,280 | - | - | 120,280 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන මූල්‍ය වත්කම් | - | - | 2,289,919 | 2,289,919 |
| | **120,280** | **-** | **2,289,919** | **2,410,199** |

| දෙසැම්බර් 31 දිනට | 2021 | | | |
|---|---|---|---|---|
| | 1 මට්ටම | 2 මට්ටම | 3 මට්ටම | එකතුව |
| | රු. | රු. | රු. | රු. |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන කොටස් උපකරණ | 188,140 | - | - | 188,140 |
| අනෙකුත් විස්තීර්ණ ආදායම් හරහා සාධාරණ වටිනාකමට මනිනු ලබන මූල්‍ය වත්කම් | - | - | 2,289,919 | 2,289,919 |
| | **188,140** | **-** | **2,289,919** | **2,478,059** |

## 46.5 සාධාරණ වටිනාකමට මනිනු ලබන වෙළඳ වත්කම් සහ වෙනත් වත්කම්

සාධාරණ වටිනාකමින් මනිනු ලබන මූල්‍ය වත්කම් ලැයිස්තුගත කළ කොටස් සහ ලැයිස්තුගත නොකළ කොටස් වේ. ලැයිස්තුගත කළ කොටස් සඳහා බැංකුව වාර්තාකරණ දිනට ක්‍රියාකාරී වෙළඳපොලවල දී ඉදිරිපත් කරන ලද වෙළඳපල මිල භාවිතා කරයි. සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස මැනිය නොහැකි බැවින් ලැයිස්තුගත නොකළ කොටස් පිරිවැයට මනිනු ලබයි.

## 46.6 සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ

පහත වගුව මගින් සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණවල සාධාරණ අගයන් නියම කර ඇති අතර එක් එක් සාධාරණ වටිනාකම් මිනුම වර්ගීකරණය කර ඇති සාධාරණ වටිනාකම් ධූරාවලියේ මට්ටම අනුව ඒවා විශ්ලේෂණය කරයි.

| | සාධාරණ වටිනාකම් ධූරාවලිය | 2022 | | 2021 | |
|---|---|---|---|---|---|
| | | ධාරණ අගය<br>රු. | සාධාරණ වටිනාකම<br>රු. | ධාරණ අගය<br>රු. | සාධාරණ වටිනාකම<br>රු. |
| **මූල්‍ය වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 මට්ටම | 2,889,883,677 | 2,889,883,677 | 1,486,878,989 | 1,486,878,989 |
| බැංකුවල ස්ථානගත කිරීම් | 2 මට්ටම | 6,133,705,351 | 6,133,705,351 | 6,596,072,932 | 6,596,072,932 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් ණය සහ අනෙකුත් උපකරණ | 2 මට්ටම | 65,079,635,908 | 65,079,635,908 | 54,856,210,318 | 54,520,749,578 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මූල්‍ය වත්කම් වෙනත් ගනුදෙනුකරුවන් වෙතින් ණය සහ ලැබිය යුතු දෑ | | | | | |
| උකස් | 2 මට්ටම | 42,234,452,674 | 42,234,452,674 | 20,173,958,657 | 20,173,958,657 |
| කාර්ය මණ්ඩල ණය | 2 මට්ටම | 5,501,098,905 | 5,501,098,905 | 4,614,968,345 | 4,470,424,793 |
| කෙටි කාලීන ණය | 2 මට්ටම | 13,716,623,362 | 13,716,623,362 | 9,989,450,293 | 9,989,450,293 |
| දිගු කාලීන ණය | 2 මට්ටම | 152,522,804,644 | 152,522,804,644 | 153,291,882,926 | 95,480,281,792 |
| වෙනත් වත්කම් | 2 මට්ටම | 6,018,325,952 | 6,018,325,952 | 3,721,641,936 | 3,721,641,936 |
| | | 295,096,530,472 | 294,096,530,472 | 254,731,064,396 | 196,439,458,971 |
| **මූල්‍ය වගකීම්** | | | | | |
| බැංකු වෙත ගෙවිය යුතු | 2 මට්ටම | 47,470,707,056 | 47,470,707,056 | 29,500,936,543 | 29,211,567,919 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු | 2 මට්ටම | 210,301,323,468 | 210,301,323,468 | 187,752,465,256 | 187,752,465,256 |
| නිකුත් කළ ණය හා ණයට ගත් වෙනත් අරමුදල් | 2 මට්ටම | - | - | 2,000,000,000 | 2,000,000,000 |
| වෙනත් වගකීම් | 2 මට්ටම | 6,426,430,198 | 6,426,430,198 | 5,514,857,775 | 5,514,857,775 |
| | | 264,198,460,722 | 264,198,460,722 | 224,768,259,574 | 224,478,890,950 |

## 46.7 සාධාරණ වටිනාකමට මනිනු නොලැබූ මූල්‍ය වත්කම් හා බැරකම්වල සාධාරණ වටිනාකම සඳහා මැනීමේ පදනම

### සාධාරණ වටිනාකම ධාරණ වටිනාකමට ආසන්න වන වත්කම්

කෙටි කල් පිරීමේ කාලයක් (වසරකට අඩු) සහිත මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සඳහා ධාරණ වටිනාකම ඒවායේ සාධාරණ වටිනාකමට ආසන්න වශයෙන් සමාන බව උපකල්පනය කෙරේ මෙම උපකල්පනය නිශ්චිත කල් පිරීමේ කාලයක් නොමැති ඉතුරුම් ගිණුම් සඳහා ද අදාළ වේ.

### ගනුදෙනුකරුවන්ට ණය සහ ලැබිය යුතු මුදල්

ගනුදෙනුකරුවන්ට ණය සහ අත්තිකාරම්වල මුළු කළඹෙන් 36%කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා වසරකට අඩු ඉතිරි කොන්ත්‍රාත් කල්පිරීමක් ඇති එබැවින් ගනුදෙනුකරුවන්ට කෙටිකාලීන ණය සහ අත්තිකාරම්වල සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනට ඒවායේ ධාරණ වටිනාකමට ආසන්න වේ.

ස්ථාවර අනුපාත සහිත ක්‍රමක්ෂිත පිරිවැයට ගන්නා ලද මූල්‍ය වත්කම් හා බැරකම්වල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කර ඇත්තේ සමාන මූල්‍ය උපකරණ සඳහා ප්‍රවර්තන වෙළඳපොළ අනුපාත සහිතව පළමු වරට හඳුනාගත් විට වෙළඳපල පොලී අනුපාත සංසන්දනය කිරීමෙනි. ස්ථාවර පොලී දරන තැන්පතුවල ඇස්තමේන්තුගත සාධාරණ වටිනාකම පදනම් වී ඇත්තේ සමාන ණය අවදානමක් සහ කල්පිරීමක් සහිත ණය සඳහා පවතින මුදල් වෙළඳපොළ පොලී අනුපාත භාවිතා කරමින් වට්ටම් කළ මුදල් ප්‍රවාහයන් මත ය. නිකුත් කරන ලද, මිල නියම කළ ණය සඳහා සාධාරණ වටිනාකම් තීරණය කරනු ලබන්නේ ඉදිරිපත් කරන ලද වෙළඳපල මිල ගණන් මත ය. නියම කරන ලද වෙළඳපොල මිල ගණන් නොමැතිව නිකුත් කරන ලද එම සටහන් සඳහා කල්පිරීම සඳහා ඉතිරි කාලය සහ ණය පැතිරීම සඳහා යෝග්‍ය ප්‍රවර්තන පොලී අනුපාත ඵලදා වක්‍රය මත පදනම්ව, වට්ටම් කළ මුදල් ප්‍රවාහ ආකෘතියක් භාවිතා කරනු ලැබේ. වෙනත් විචල්‍ය අනුපාත සහිත උපකරණ සඳහා එම උපකරණ මුලින්ම හඳුනාගත් දිනයේ සිට අවශ්‍ය ණය ව්‍යාප්තියේ වෙනස පිළිබිඹු කිරීම සඳහා ගැළපීමක් ද සිදු කෙරේ.

### ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ

පාරිභෝගික තැන්පතුවලින් 68%ක් පමණ ඉල්ලුම මත ආපසු ගෙවිය යුතු හෝ වසරකට අඩු ඉතිරි ගිවිසුම්ගත කල්පිරීමක් සහිත තැන්පතු වේ. වසරකට වඩා වැඩි ගිවිසුම්ගත කල්පිරීමක් සහිත ගනුදෙනුකරුවන්ගේ තැන්පතු කල්පිරීමට පෙර ඉවත් කර ගැනීමට යටත් වේ. කල් පිරීමට පෙර ගනුදෙනුකරුවන්ට ගෙවනු ලබන මුදල එදිනට එහි ධාරණ වටිනාකමට වඩා ප්‍රමාණාත්මක වශයෙන් වෙනස් නොවනු ඇත. එබැවින් පාරිභෝගික තැන්පතුවල සාධාරණ වටිනාකම වාර්තාකරණ දිනට ඒවායේ ධාරණ වටිනාකමට ආසන්න වේ.

කල්පිරීම සඳහා තබන ලද මූල්‍ය ආයෝජනවල සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කර ඇත්තේ සමාන මූල්‍ය උපකරණ සඳහා ප්‍රවර්තන වෙළඳපොල අනුපාතවලින් ඒවා මුල්වරට හඳුනාගත් විට, වෙළඳපල පොලී අනුපාත සමග සංසන්දනය කිරීමෙනි.



# අතිරේක තොරතුරු

පස් අවුරුදු සාරාංශය ........................................ 202
ආයෝජක තොරතුරු ........................................ 204
ශාඛාවල භූගෝලීය ව්‍යාප්තිය................................ 205
සටහන්.......................................................... 208
ආයතනික තොරතුරු ඇතුළත පිටුපස කවරය

# පස් අවුරුදු සාරාංශය

| විස්තරය | 2022<br>ශ්‍රී ලංකා රුපියල් | 2021<br>ශ්‍රී ලංකා රුපියල් | 2020<br>ශ්‍රී ලංකා රුපියල් | 2019<br>ශ්‍රී ලංකා රුපියල් | 2018<br>ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|---|---|
| **ලාභය සහ අලාභය** | | | | | |
| **මුළු ආදායම** | **36,202,749,629** | **24,492,768,957** | **24,354,246,869** | **27,507,821,054** | **26,070,610,605** |
| පොලී ආදායම | **35,273,433,857** | 23,545,299,165 | 23,182,459,141 | 26,357,071,298 | 24,865,108,981 |
| පොලී වියදම් | **(19,639,529,550)** | (9,893,373,234) | (12,294,380,832) | (13,903,881,276) | (12,959,526,709) |
| **ශුද්ධ පොලී ආදායම** | **15,633,904,307** | **13,651,925,931** | **10,888,078,309** | **12,453,190,022** | **11,905,582,272** |
| වෙනත් ශුද්ධ ආදායම | **574,130,849** | 635,357,741 | 899,852,505 | 872,445,458 | 946,396,458 |
| **මුළු මෙහෙයුම් ආදායම** | **16,208,035,156** | **14,287,283,672** | **11,787,930,814** | **13,325,635,480** | **12,851,978,730** |
| මූල්‍ය වත්කම්වල හානිකරණ අලාභය | **(2,852,677,176)** | (3,256,775,862) | (2,010,929,062) | (2,408,748,853) | (1,409,784,095) |
| **ශුද්ධ මෙහෙයුම් ආදායම** | **13,355,357,980** | **11,030,507,810** | **9,777,001,752** | **10,916,886,627** | **11,442,194,635** |
| පුද්ගලික වියදම් | **(8,739,537,602)** | (7,292,269,883) | (5,983,362,037) | (5,931,625,972) | (5,877,946,793) |
| ක්ෂයකිරීම් සහ ක්‍රමක්ෂිත වියදම් | **(532,733,987)** | (520,988,009) | (616,792,758) | (617,322,679) | (319,020,738) |
| වෙනත් වියදම් | **(2,084,970,281)** | (1,290,468,186) | (1,115,987,925) | (1,407,680,268) | (1,638,896,765) |
| **මෙහෙයුම් ලාභය** | **1,998,116,109** | **1,926,781,733** | **2,060,859,032** | **2,960,257,709** | 3,606,330,338 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | - | - | - | (123,625,704) | **(154,490,412)** |
| මූල්‍ය සේවා මත වැට් බද්ද | **(1,561,474,848)** | (1,151,277,133) | (1,047,410,630) | (1,012,948,950) | (1,158,678,090) |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | **(77,525,933)** | - | - | - | |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | - | - | (601,522,646) | (190,079,946) |
| **බදු ගෙවීමට පෙර ලාභය** | **359,115,328** | **775,504,600** | **1,013,448,401** | **1,222,160,409** | **2,103,081,890** |
| ආදායම් බදු (වියදම්) / ප්‍රත්‍යාවර්ත කිරීම | **990,279,323** | (469,201,889) | (609,412,349) | (723,565,878) | (1,029,495,530) |
| **බදු ගෙවීමෙන් පසු ලාභය** | **1,349,394,652** | **306,302,711** | **404,036,052** | **498,594,531** | **1,073,586,360** |
| | | | | | |
| **වත්කම්** | | | | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | **2,889,883,677** | **1,486,878,989** | **3,758,858,141** | **2,750,187,219** | **689,184,136** |
| බැංකුවල ස්ථානගත කිරීම් | **6,133,705,351** | 6,596,072,932 | 8,436,353,244 | 9,798,242,492 | 6,496,628,053 |
| ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමට මනින ලද කොටස් උපකරණ | **120,280** | 188,140 | 145,160 | 123,000 | 115,600 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මනින ලද මූල්‍ය වත්කම් - වෙනත් ගනුදෙනුකරුවන්ගෙන් ණය සහ ලැබිය යුතු දෑ | **198,008,145,155** | 175,229,666,656 | 156,694,052,473 | 136,205,641,441 | 133,432,804,004 |
| ක්‍රමක්ෂිත පිරිවැයට මනින ලද මූල්‍ය ආයෝජන - ණය සහ අනෙකුත් උපකරණ | **65,079,635,908** | 54,856,210,318 | 46,962,354,137 | 45,664,745,400 | 27,920,326,465 |
| වෙනත් විස්තීර්ණ ආදායම හරහා සාධාරණ වටිනාකමට මනින ලද කොටස් උපකරණ | **2,289,919** | 2,289,919 | 2,289,919 | 2,289,919 | 4,176,342,999 |
| දේපළ, පිරියත සහ උපකරණ | **926,615,241** | 928,568,438 | 970,538,655 | 1,228,419,894 | 1,275,785,603 |
| අස්පෘශ්‍ය වත්කම් | **68,867,744** | 113,688,780 | 21,272,699 | 45,356,343 | 60,787,719 |
| භාවිත හිමිකම් වත්කම් | **718,096,698** | 505,092,023 | 598,978,557 | 855,183,154 | - |
| විලම්භිත බදු වත්කම් | **3,525,174,919** | 1,263,795,071 | 903,720,969 | 696,316,484 | 467,332,859 |
| වෙනත් වත්කම් | **8,042,615,550** | 4,907,060,297 | 2,760,586,570 | 2,732,423,840 | 2,418,011,987 |
| **මුළු වත්කම්** | 285,395,150,443 | 245,889,511,562 | 221,109,150,524 | 199,978,929,186 | 176,937,319,425 |

| විස්තරය | 2022<br>ශ්‍රී ලංකා රුපියල් | 2021<br>ශ්‍රී ලංකා රුපියල් | 2020<br>ශ්‍රී ලංකා රුපියල් | 2019<br>ශ්‍රී ලංකා රුපියල් | 2018<br>ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|---|---|---|
| **වගකීම්** | | | | | |
| බැංකුවලට ගෙවිය යුතු දෑ | **47,470,707,056** | 29,500,936,543 | 21,796,679,350 | 22,050,009,005 | 11,098,334,822 |
| වෙනත් ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු දෑ | **210,301,323,468** | 187,752,465,256 | 172,882,632,278 | 149,599,829,047 | 141,559,973,557 |
| නිකුත් කරන ලද ණය සහ අනෙකුත් ණයට ගත් අරමුදල් | - | 2,000,000,000 | 2,000,000,000 | 4,707,852,534 | 4,707,852,534 |
| ප්‍රවර්තන බදු වගකීම් | **1,011,924,146** | 503,021,886 | 378,203,555 | 448,881,448 | 473,833,076 |
| වෙනත් වගකීම් | **7,293,487,262** | 7,693,300,812 | 6,154,443,776 | 5,970,920,446 | 2,460,286,430 |
| විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ බැඳීම් | **3,091,581,136** | 3,046,464,739 | 2,782,874,624 | 2,236,115,128 | 1,926,924,377 |
| **මුළු වගකීම්** | **269,169,023,068** | **230,496,189,235** | **205,994,833,583** | **185,013,607,608** | **162,227,204,796** |
| **කොටස්** | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | **8,221,864,565** | 8,047,229,930 | 8,047,229,930 | 8,047,229,930 | 8,047,229,930 |
| ව්‍යවස්ථාපිත සංචිත අරමුදල | **845,247,866** | 777,778,133 | 762,462,998 | 742,261,195 | 717,331,468 |
| රඳවා ගත් ඉපැයීම් | **2,889,785,536** | 2,636,433,521 | 2,449,318,947 | 2,421,534,400 | 2,315,905,812 |
| වෙනත් සංචිත | **4,269,229,407** | 3,931,880,743 | 3,855,305,066 | 3,754,296,053 | 3,629,647,420 |
| **මුළු කොටස් හිමි ස්කන්ධය** | 16,226,127,375 | **15,393,322,327** | **15,114,316,941** | **14,965,321,578** | **14,710,114,631** |
| **මුළු කොටස් සහ වගකීම්** | 285,395,150,443 | **245,889,511,562** | **221,109,150,524** | **199,978,929,186** | **176,937,319,426** |
| ද්‍රවශීල වත්කම් අනුපාතය | **27.83%** | 26.18% | 29.30% | 32.38% | 24.27% |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය - බාසල් III අනුව** | | | | | |
| පොදු කොටස් ස්ථරය 1 ප්‍රාග්ධන අනුපාතය | **8.29%** | 8.72% | 10.34% | 10.90% | 11.58% |
| මුළු ස්ථරය 1 ප්‍රාග්ධන අනුපාතය | **8.29%** | 8.72% | 10.34% | 10.90% | 11.58% |
| **මුළු ප්‍රාග්ධන අනුපාතය** | **15.22%** | 14.27% | 14.94% | 16.27% | 13.61% |

# ආයෝජක තොරතුරු

## වැදගත් අනුපාත

| අනුපාත | 31/12/2022 | 31/12/2021 |
|---|---|---|
| කොටසකට ශුද්ධ වත්කම් අගය (රු.) | 29.43 | 28.24 |
| ස්කන්ධයට ණය (%) | 6.93% | 12.99% |
| පොලී ආවරණය (වාර සංඛ්‍යාව) | 1.93 | 2.63 |

## කොටස් තොරතුරු

| කොටස් හිමියන් | ප්‍රවතර්න වර්ෂය 31/12/2022 | | ඉකුත් වර්ෂය 31/12/2021 | |
|---|---|---|---|---|
| | සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | කොටස් හිමිකාරීත්වය % වශයෙන් | සාමාන්‍ය කොටස් සංඛ්‍යාව | කොටස් හිමිකාරීත්වය % වශයෙන් |
| මහා භාණ්ඩාගාරය | 501,941,973 | 91% | 495,758,027 | 91% |
| ලංකා බැංකුව | 16,448,448 | 3% | 16,448,448 | 3% |
| මහජන බැංකුව | 16,448,448 | 3% | 16,448,448 | 3% |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 16,452,126 | 3% | 16,452,126 | 3% |
| | **551,290,995** | | **545,107,049** | |

# ශාඛාවල භූගෝලීය ව්‍යාප්තිය

## ශ්‍රී ලංකාවේ පළාත්

1 වයඹ පළාත
2 සබරගමුව පළාත
3 දකුණු පළාත
4 නැගෙනහිර පළාත
5 මධ්‍යම පළාත
6 බස්නාහිර පළාත
7 ඌව පළාත
8 උතුරු මැද පළාත
9 උතුරු පළාත

## ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක

1 කුරුණෑගල දිස්ත්‍රික්කය
2 පුත්තලම දිස්ත්‍රික්කය
3 කෑගල්ල දිස්ත්‍රික්කය
4 රත්නපුර දිස්ත්‍රික්කය
5 ගාල්ල දිස්ත්‍රික්කය
6 හම්බන්තොට දිස්ත්‍රික්කය
7 මාතර දිස්ත්‍රික්කය
8 අම්පාර දිස්ත්‍රික්කය
9 මඩකලපුව දිස්ත්‍රික්කය
10 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
11 මහනුවර දිස්ත්‍රික්කය
12 මාතලේ දිස්ත්‍රික්කය
13 නුවර එළිය දිස්ත්‍රික්කය
14 ගම්පහ දිස්ත්‍රික්කය
15 කළුතර දිස්ත්‍රික්කය
16 කොළඹ දිස්ත්‍රික්කය
17 බදුල්ල දිස්ත්‍රික්කය
18 මොණරාගල දිස්ත්‍රික්කය
19 අනුරාධපුර දිස්ත්‍රික්කය
20 කිලිනොච්චි දිස්ත්‍රික්කය
21 යාපනය දිස්ත්‍රික්කය
22 මුලතිව් දිස්ත්‍රික්කය
23 මන්නාරම දිස්ත්‍රික්කය
24 වවුනියාව දිස්ත්‍රික්කය
25 පොලොන්නරුව දිස්ත්‍රික්කය

| වයඹ පළාත | | සබරගමුව පළාත | |
|---|---|---|---|
| පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම | පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම |
| කුරුණෑගල | අලව්ව | කෑගල්ල | අරණායක |
| කුරුණෑගල | අඹන්පොල | කෑගල්ල | බුලත්කොහුපිටිය |
| කුරුණෑගල | ඇතුගල්පුර | කෑගල්ල | දෙහිඕවිට |
| කුරුණෑගල | ගල්ගමුව | කෑගල්ල | දැරණියගල |
| කුරුණෑගල | ගිරිඋල්ල | කෑගල්ල | දේවාලේගම |
| කුරුණෑගල | ඉබ්බාගමුව | කෑගල්ල | හෙම්මාතගම |
| කුරුණෑගල | කුලියාපිටිය | කෑගල්ල | කෑගල්ල |
| කුරුණෑගල | කුරුණෑගල | කෑගල්ල | කිතුල්ගල |
| කුරුණෑගල | මහව | කෑගල්ල | කොටියාකුඹුර |
| කුරුණෑගල | මාවතගම | කෑගල්ල | මාවනැල්ල |
| කුරුණෑගල | මැල්සිරිපුර | කෑගල්ල | නෙළුම්දෙනිය |
| කුරුණෑගල | නාරම්මල | කෑගල්ල | පිටගල්දෙනිය |
| කුරුණෑගල | නිකවැරටිය | කෑගල්ල | රඹුක්කන |
| කුරුණෑගල | පඩුවස්නුවර | කෑගල්ල | රුවන්වැල්ල |
| කුරුණෑගල | පරගහදෙනිය | කෑගල්ල | වරකාපොල |
| කුරුණෑගල | පැරකුම්පුර | රත්නපුර | යටියන්තොට |
| කුරුණෑගල | පොල්පිතිගම | රත්නපුර | බලන්ගොඩ |
| කුරුණෑගල | පොතුහැර | රත්නපුර | ඇහැලියගොඩ |
| කුරුණෑගල | රිදීගම | රත්නපුර | ඇඹිලිපිටිය |
| කුරුණෑගල | වාරියපොල | රත්නපුර | එරත්න |
| පුත්තලම | ආණමඩුව | රත්නපුර | ගොඩකවෙල |
| පුත්තලම | බෝවත්ත | රත්නපුර | කහවත්ත |
| පුත්තලම | හලාවත | රත්නපුර | කලවාන |
| පුත්තලම | දුම්මලසූරිය | රත්නපුර | කිරිඇල්ල |
| පුත්තලම | කල්පිටිය | රත්නපුර | කොලොන්න |
| පුත්තලම | කිරිමැටියාන | රත්නපුර | කුරුවිට |
| පුත්තලම | මහවැව | රත්නපුර | නිවිතිගල |
| පුත්තලම | මාම්පුරී | රත්නපුර | පැල්මඩුල්ල |
| පුත්තලම | මුන්දලම | රත්නපුර | පොතුපිටිය |
| පුත්තලම | නාත්තණ්ඩිය | රත්නපුර | පුලිගුපිටිය |
| පුත්තලම | නවගත්තේගම | රත්නපුර | රක්වාන |
| පුත්තලම | පාලකුඩා | රත්නපුර | රත්නපුර |
| පුත්තලම | පන්තල | රත්නපුර | ශ්‍රී පලාබද්දල |
| පුත්තලම | පුත්තලම | රත්නපුර | වැලිගේපොල |
| පුත්තලම | ශාන්ත ආනාපුර | | |
| පුත්තලම | වෙන්නප්පුව | | |

# ශාඛාවල භූගෝලීය ව්‍යාප්තිය

## දකුණු පළාත

| පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම |
|---|---|
| ගාල්ල | අහන්ගම |
| ගාල්ල | බද්දේගම |
| ගාල්ල | බලපිටිය |
| ගාල්ල | බටපොල |
| ගාල්ල | ඇල්පිටිය |
| ගාල්ල | ගාල්ල |
| ගාල්ල | ගෝනගලපුර |
| ගාල්ල | හික්කඩුව |
| ගාල්ල | ඉමදූව |
| ගාල්ල | කළුවැල්ල |
| ගාල්ල | කරන්දෙනිය |
| ගාල්ල | කරාපිටිය |
| ගාල්ල | නෙළුව |
| ගාල්ල | පිටිගල |
| ගාල්ල | තල්ගස්වල |
| ගාල්ල | උඩුගම |
| ගාල්ල | ඌරගස්මංහන්දිය |
| ගාල්ල | යක්කලමුල්ල |
| හම්බන්තොට | අඟුණකොළපැලැස්ස |
| හම්බන්තොට | අම්බලන්තොට |
| හම්බන්තොට | බරවකුඹුක |
| හම්බන්තොට | බෙලි අත්ත |
| හම්බන්තොට | හම්බන්තොට |
| හම්බන්තොට | කටුවන |
| හම්බන්තොට | ලුණුගම්වෙහෙර |
| හම්බන්තොට | මිද්දෙණිය |
| හම්බන්තොට | රන්න |
| හම්බන්තොට | සූරියවැව |
| හම්බන්තොට | තංගල්ල |
| හම්බන්තොට | තිස්සමහාරාමය |
| හම්බන්තොට | වලස්මුල්ල |
| හම්බන්තොට | වරාපිටිය |
| හම්බන්තොට | වීරකැටිය |
| මාතර | අකුරැස්ස |
| මාතර | දෙයියන්දර |
| මාතර | දෙනියාය |
| මාතර | දෙවිනුවර |
| මාතර | දික්වැල්ල |
| මාතර | ගන්දර |
| මාතර | හක්මණ |
| මාතර | කඹුරුගමුව |
| මාතර | කඹුරුපිටිය |

## දකුණු පළාත

| පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම |
|---|---|
| මාතර | කැකණදුර |
| මාතර | කිරින්ද |
| මාතර | මාතර නගර |
| මාතර | මාවරල |
| මාතර | මිරිස්ස |
| මාතර | මොරවක |
| මාතර | පඹුරණ |
| මාතර | පිටබැද්දර |
| මාතර | තිහගොඩ |
| මාතර | උරුබොක්ක |
| මාතර | වැලිගම |

## නැගෙනහිර පළාත

| පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම |
|---|---|
| අම්පාර | අක්කරෙයිපත්තු |
| අම්පාර | අම්පාර |
| අම්පාර | දමන |
| අම්පාර | දෙහිඅත්තකණ්ඩිය |
| අම්පාර | කල්මුණේ |
| අම්පාර | මහඔය |
| අම්පාර | නින්දවූර් |
| අම්පාර | පොතුවිල් |
| අම්පාර | සමන්තුරේ |
| අම්පාර | උහන |
| අම්පාර | මඩකලපුව |
| මඩකලපුව | මඩකලපුව (2) නගර |
| මඩකලපුව | වෙන්කලඩි |
| මඩකලපුව | එරාවූර් |
| මඩකලපුව | කලවංචිකුඩි |
| මඩකලපුව | කාත්තන්කුඩි |
| මඩකලපුව | කොක්කඩිචෝලෙ |
| මඩකලපුව | වාලච්චේන |
| මඩකලපුව | කන්තලේ |
| මඩකලපුව | මුතූර් |
| මඩකලපුව | ත්‍රිකුණාමලය |
| මඩකලපුව | |
| මඩකලපුව | |

## මධ්‍යම පළාත

| පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම |
|---|---|
| මහනුවර | දන්තුරේ |
| මහනුවර | දවුලගල |
| මහනුවර | ගම්පොල |
| මහනුවර | හතරලියැද්ද |
| මහනුවර | හැදෙනිය |
| මහනුවර | මහනුවර |
| මහනුවර | මහනුවර (2) නගර |
| මහනුවර | කටුගස්තොට |
| මහනුවර | මැණික්හින්න |
| මහනුවර | මාරස්සන |
| මහනුවර | මොරයාය |
| මහනුවර | නාවලපිටිය |
| මහනුවර | පේරාදෙණිය |
| මහනුවර | පූජාපිටිය |
| මහනුවර | සෙන්කඩගල |
| මහනුවර | තෙල්දෙණිය |
| මහනුවර | උඩවෙල |
| මහනුවර | උඩුදුම්බර |
| මහනුවර | වත්තේගම |
| මාතලේ | දඹුල්ල |
| මාතලේ | ගලේවෙල |
| මාතලේ | ලග්ගල |
| මාතලේ | මාතලේ |
| මාතලේ | නාඋල |
| මාතලේ | රත්තොට |
| මාතලේ | විල්ගමුව |
| නුවර එළිය | ආගරපතන |
| නුවර එළිය | ගිනිගත්හේන |
| නුවර එළිය | හඟුරන්කෙත |
| නුවර එළිය | කොටගල |
| නුවර එළිය | නිල්දණ්ඩාහින්න |
| නුවර එළිය | නුවර එළිය |
| නුවර එළිය | පූඩලුඔය |
| නුවර එළිය | රිකිල්ලගස්කඩ |

# ශාඛාවල භූගෝලීය ව්‍යාප්තිය

| බස්නාහිර පළාත | | ඌව පළාත | | උතුරු මැද සහ උතුරු පළාත | |
|---|---|---|---|---|---|
| පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම | පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම | පරිපාලන දිස්ත්‍රික් කාර්යාලය | ශාඛාවේ නම |
| ගම්පහ | අවිස්සාවේල්ල | බදුල්ල | බදුල්ල | අනුරාධපුර | අනුරාධපුර |
| ගම්පහ | හෝමාගම | බදුල්ල | බණ්ඩාරවෙල | අනුරාධපුර | ගලෙන්බිඳුණුවැව |
| ගම්පහ | කොලොන්නාව | බදුල්ල | බෝගහකුඹුර | අනුරාධපුර | ගල්නෑව |
| ගම්පහ | නුගේගොඩ | බදුල්ල | දියතලාව | අනුරාධපුර | ගෝනපතිරාව |
| ගම්පහ | පිලියන්දල | බදුල්ල | ගිරාඳුරුකෝට්ටේ | අනුරාධපුර | කහටගස්දිගිලිය |
| ගම්පහ | දිවුලපිටිය | බදුල්ල | හල්දුම්මුල්ල | අනුරාධපුර | කැකිරාව |
| ගම්පහ | ගම්පහ | බදුල්ල | හපුතලේ | අනුරාධපුර | මැදවච්චිය |
| ගම්පහ | ජා ඇල | බදුල්ල | කන්දෙකැටිය | අනුරාධපුර | මිහින්තලේ |
| ගම්පහ | කැලණිය | බදුල්ල | ලුණුගල | අනුරාධපුර | අනුරාධපුර නව නගරය |
| ගම්පහ | කිරිදිවෙල | බදුල්ල | මහියංගනය | අනුරාධපුර | රඹෑව |
| ගම්පහ | මාවරමණ්ඩිය | බදුල්ල | මීගහකිවුල | අනුරාධපුර | තලාව |
| ගම්පහ | මිනුවන්ගොඩ | බදුල්ල | පස්සර | අනුරාධපුර | තඹුත්තේගම |
| ගම්පහ | මීරිගම | බදුල්ල | රිදීමාලියද්ද | අනුරාධපුර | තඹුත්තේගම නගරය |
| ගම්පහ | මිරිස්වත්ත | බදුල්ල | මාලිගාතැන්න | අනුරාධපුර | තිරප්පනේ |
| ගම්පහ | මීගමුව | බදුල්ල | ඌව පරණගම | අනුරාධපුර | බෝගස්වැව |
| ගම්පහ | නිට්ටඹුව | බදුල්ල | වැලිමඩ | කිලිනොච්චිය | චුන්නාකම් |
| කළුතර | රාගම | බදුල්ල | බඩල්කුඹුර | කිලිනොච්චිය | යාපනය |
| කළුතර | බුලත්සිංහල | මොණරාගල | බිබිල | කිලිනොච්චිය | කිලිනොච්චිය |
| කළුතර | වලගෙදර | මොණරාගල | බුත්තල | කිලිනොච්චිය | මන්නාරම |
| කළුතර | අගලවත්ත | මොණරාගල | මඩුල්ල | කිලිනොච්චිය | වව්නියාව |
| කළුතර | මිල්ලණිය | මොණරාගල | මැදගම | කිලිනොච්චිය | කනකරායන්කුලම |
| කළුතර | ගෝනපොල | මොණරාගල | මොණරාගල | පොලොන්නරුව | අරලගංවිල |
| කළුතර | මොරොන්තුඩුව | මොණරාගල | සෙවණගල | පොලොන්නරුව | බකමූණ |
| කළුතර | බේරුවල | මොණරාගල | සියඹලාණ්ඩුව | පොලොන්නරුව | ගල් අමුණ |
| කළුතර | පානදුර | මොණරාගල | තණමල්විල | පොලොන්නරුව | හිඟුරක්ගොඩ |
| කළුතර | හොරණ | මොණරාගල | වැල්ලවාය | පොලොන්නරුව | කඳුරුවෙල |
| කළුතර | වරකාගොඩ | | | පොලොන්නරුව | මනම්පිටිය |
| කළුතර | ඉංගිරිය | | | පොලොන්නරුව | මැදිරිගිරිය |
| කළුතර | දොඩංගොඩ | | | පොලොන්නරුව | පොලොන්නරුව |
| කළුතර | මීගහතැන්න | | | පොලොන්නරුව | පුලස්තිගම |
| කළුතර | බදුරලිය | | | පොලොන්නරුව | සෙවණපිටිය |
| කළුතර | කළුතර | | | පොලොන්නරුව | සිරිපුර |
| කළුතර | මොරගහහේන | | | | |
| කළුතර | මතුගම | | | | |
| කළුතර | වාද්දුව | | | | |

# සටහන්

# ආයතනික තොරතුරු

## බැංකුවේ ලියාපදිංචි නාමය
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

## නෛතික තත්ත්වය
2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ස්ථාපනය කරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවකි

## ණය ශ්‍රේණිගත කිරීම
“BBB+” Negative ICRA Lanka Limited

## අධ්‍යක්ෂ මණ්ඩලය

## ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු
එම්. මහින්ද සාලිය මහතා - සභාපති
ලලිත් අබේසිරිවර්ධන මහතා
ඩබ්.එම්. කරුණාරත්න මහතා
මහාචාර්ය එච්.එම්.ඩබ්. ආරියරත්න හේරත්
ආචාර්ය නිර්මාල් ද සිල්වා
හිරන්ති කරුණාරත්න මහත්මිය

## ස්වාධීන නොවන විධායක නොවන අධ්‍යක්ෂවරුන්
කේ. රවීන්ද්‍රන් මහතා
ජී.ඒ.ජයශාන්ත මහතා
එම්.එස්.ඒ.සී.එස්. ප්‍රනාන්දු මහතා
වීකේ නාරංගොඩ මිය
ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා

## සාමාන්‍යාධිකාරී /ප්‍රධාන විධායක නිලධාරී
සුමේධ එදිරිසූරිය මහතා (වැඩ ආවරණ)

## අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
ආර්. එම්. ටි. රාජපක්ෂ මිය

## ශාඛා සංඛ්‍යාව
272

## ප්‍රධාන කාර්යාලය
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය
දුරකථන: + 94 112035454/+94112035455-9
ෆැක්ස්: +94112035467
විද්‍යුත් තැපැල: info@rdb.lk
වෙබ් අඩවිය: www.rdb.lk
බදු හැඳුනුම් අංකය (TIN) :409272339
VAT ලියාපදිංචි අංකය :409272339- 7000

## විගණකවරු

## විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය.
අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

## පළාත් කාර්යාල
උතුරු මැද පළාත් කාර්යාලය

අංක 65- ඩී, 4 වන පටුමග, අභය පෙදෙස, අනුරාධපුරය.

## ඌව පළාත් කාර්යාලය
අංක 1/315, පස්සර පාර, බදුල්ල.

## සබරගමුව පළාත් කාර්යාලය
අංක 510, කොළඹ පාර, වෙරළුපා, රත්නපුරය.

## දකුණු පළාත් කාර්යාලය
අංක 28 බී, එස්පිලනේඩ් පාර, උයන්වත්ත, මාතර.

## මධ්‍යම පළාත් කාර්යාලය
අංක 16, ධර්මාශෝක මාවත, මහනුවර.

## බස්නාහිර පළාත් කාර්යාලය
අංක 36, නුවර පාර, මිරිස්වත්ත, මුදුන්ගොඩ.

## වයඹ පළාත් කාර්යාලය
අංක 155, මීගමුව පාර, කුරුණෑගල.

## නැගෙනහිර පළාත් කාර්යාලය
අංක 51ඒ, නව කල්මුණේ පාර, කල්ලඩි, මඩකලපුව.

Designed by KONCEPT HIVE

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

අංක 933, නුවර පාර, වෙදමුල්ල,
කැලණිය, ශ්‍රී ලංකාව.
www.rdb.lk